ත්‍රිපිටකධර නා උයනේ ශ්‍රී අරියධම්මාභිධාන අනු නා හිමි
අනුස්මරණ පරිවර්තන ග්‍රන්ථ මාලා.

(පළමු ග්‍රන්ථය)

# කථාසල්ලාපසික්ඛා
# හෙවත්
# පාලි කථා පුහුණුව.

පටුනට

බුරුම ජාතික අග්ගමහා පණ්ඩිත
අති ගෞරවාර්හ ජනකාභිවංසාභිධාන මහා නාහිමි.

පරිවර්තක - වලවේ සුමේධාලෝක හිමි.

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති අග්ග මහා කම්මට්ඨානාචාර්ය ත්‍රිපිටකධර ත්‍රිපිටක කෝවිද ධර්ම භාණ්ඩාගාරික සාසනධජ ශ්‍රී ජිනවංසඤාණාරාම වංසාවතංස නා උයනේ ශ්‍රී අරියධම්ම අනු නාහිමි අනුස්මරණ පරිවර්තන ග්‍රන්ථ මාලා.

(පළමු ග්‍රන්ථය)

# කථාසල්ලාපසික්ඛා
# හෙවත්
# පාළි කථා පුහුණුව

බුරුම ජාතික ඡට්ඨසංගීති ඕවාදාචරිය සඞ්ඝනායක, ඡට්ඨසංගීති භාරනිත්ථාරක, ඡට්ඨසංගීති පාළිපටිවිසෝධක, ඡට්ඨසංගීති ඕසානසෝධෙය්‍යපත්තපාඨක, ශ්වේජින් නිකායේ අනු නායක, අනේක ගන්ථකාරක, මහා ගන්ධාරාමාධිපතිව වැඩවිසූ අපවත් වී වදාළ ජනකාභිවංස මහා තෙරුන් වහන්සේ විසින් සම්පාදිතයි.

# පටුන


පෙරවදන........................................................................iii - iv

පරිවර්තක සටහන .................................................................v - ix

උයෝජනකථා.....................................................................x -xi

01.පච්චූසසමයේ කථාසල්ලාපෝ ........................................ 01 - 03

02. සයනා වුට්ඨිතකාලේ කථාසල්ලාපෝ ................................ 04 - 07

03. බුද්ධානුස්සරණවේලායං කථාසල්ලාපෝ ........................... 08 - 10

04. හත්තපචනවේලායං කථාසල්ලාපෝ ................................ 11 - 14

05. යාවපක්කසමයා කථාසල්ලාපෝ .................................... 15 - 18

06. පාතරාසවේලායං කථාසල්ලාපෝ .................................... 19 - 22

07. හත්තකිච්චපරියෝසානේ කථාසල්ලාපෝ ............................. 23 - 27

08. භික්ඛාචරවේලායං කථාසල්ලාපෝ ................................... 28 - 32

09. පිණ්ඩචාරිකානං කථාසල්ලාපෝ ..................................... 33 - 37

10. පිණ්ඩපාතපටික්කන්තකාලේ කථාසල්ලාපෝ ........................ 38 - 41

11. අන්තෝදිවාහත්තේ කථාසල්ලාපෝ .................................. 42 - 46

12. වාචනකාලේ කථාසල්ලාපෝ ......................................... 47 - 50

13. දිවාහත්තවේලායං කථාසල්ලාපෝ.................................... 51 - 56

14. නහානවේලායං කථාසල්ලාපෝ ....................................... 57 - 61

15. වච්චකුටිපටිසංයුත්තෝ කථාසල්ලාපෝ ............................. 62 - 68

16. බුද්ධුපට්ඨානවේලායං කථාසල්ලාපෝ ............................... 69 - 73

17. ආගන්තුකේන සද්ධිං කථාසල්ලාපෝ..................................74 - 78

18. මහාථේරස්ස සම්පත්තකාලේ කථාසල්ලාපෝ ........................ 79 - 82

19. මහාථේරස්ස වත්තපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.................... 83 - 86

20. සජ්ඣායනපරිසමත්තකාලේ කථාසල්ලාපෝ ........................... 87 - 91

21. ජඞ්ඝාවිහරණකාලේ කථාසල්ලාපෝ .................................. 92 - 95

22. පානපටිසංයුත්තෝ කථාසල්ලාපෝ .................................. 96 - 100

23. පානවේලායං කථාසල්ලාපෝ........................................ 101 - 104

24. ගිලානපුච්ඡනසමයේ කථාසල්ලාපෝ................................ 105 - 109

25. සම්මජ්ජනපටිසංයුත්තෝ කථාසල්ලාපෝ ........................... 110 - 114

26. ආරාමසෝධනවේලායං කථාසල්ලාපෝ............................... 115 - 117

27. කල්ලතාපටිසංයුත්තෝ කථාසල්ලාපෝ .............................. 118 - 119

28. රුක්ඛපටිසංයුත්තෝ කථාසල්ලාපෝ ................................ 120 - 124

29. රුක්ඛරෝපනපටිසංයුත්තෝ කථාසල්ලාපෝ ........................ 125 -127

**30.** ජාතිභූමයාදිපුච්ඡනකථා ................................................ **128 - 137**
**31.** වසනට්ඨානාදිපුච්ඡනකථා ............................................ **138 - 139**
**32.** වාතවුට්ඨිපටිසංයුත්තකථාසල්ලාපො ............................ **140 - 141**
**33.** සීතපටිසංයුත්තකථා................................................... **142 - 144**
**34.** භික්ඛාචාරවේලායං මේඝවස්සනකථා............................ **145 - 146**
**35.** කල්ලභාවරක්ඛණකථා ................................................ **147 - 148**
**36.** වත්ථධෝවනකථා ....................................................... **149 - 150**
**37.** කේසෝරෝපනකථා..................................................... **151 - 153**
**38.** චීවරරජනපටිසංයුත්තකථා ......................................... **154 - 155**
**39.** සූපබ්‍යඤ්ජනපචනකථා .............................................. **156 - 158**
**40.** චේතියපූජාකථා .......................................................... **159 - 160**
**41.** ධම්මුස්සවකථා ........................................................... **161 - 162**
**42.** සයනාසන්නකථා ........................................................ **163 - 164**
**43.** සුත්තකාලේ පවත්තිකථා ............................................ **165 - 166**
**44.** පාචනග්ගිකථා............................................................ **167 - 168**
**45.** උදකවඩ්ඪනකථා ........................................................ **169 - 170**
**46.** පණ්ණපේසනකථා ...................................................... **171 - 172**

# පෙරවදන

බුදුරජාණන් වහන්සේගේ දේශනාව පළමුවෙන්ම සඳහන් වී ඇත්තේ මාගධී භාෂාවෙන්ය. එනම් "පාළි භාෂාවෙන්ය". ධර්මය හොඳින් දැන ගැනීමට නම් පාළි භාෂාව ගැන හසල දැනුමක් තිබිය යුතුය. යම් කිසි කෙනෙකුට පාළි භාෂාව යම්තමින් හෝ කථා කිරීමට හැකි නම් ඔහු පාළි භාෂාව ඉගෙනීමට තව තවත් උනන්දුවේ. පාළි භාෂාවෙන් කථා කිරීමට අත් වැලක් වශයෙන් බුරුම ජාතික අග්ග මහා පණ්ඩිත අති පූජනීය ජනකාභිවංස මහ නායක මාහිමිපාණන් වහන්සේ විසින් බුරුම බසින් රචිත "කථාසල්ලාපසික්ඛා" නමැති පොත සිංහල අකුරින් සන්න සහිතව ඉතා පැහැදිලිව පූජ්‍ය වලවේ සුමේධාලෝක ස්වාමින් වහන්සේ විසින් පරිවර්තනය කොට ඉදිරිපත් කෙරේ.

මේ පොතෙහි මුල් සම්පාදක ස්වාමින් වහන්සේ වන බුරුම ජාතික අග්ග මහා පණ්ඩිත අතිපූජනීය ජනකාභිවංස නාහිමිපාණන් වහන්සේ බුද්ධාංකුරයන් වහන්සේ නමකි. මෙම නාහිමි පාණන් වහන්සේ ඡට්ඨ මහා සංගීතියෙහි ඕවාදාචරිය තනතුර ද භාරනිත්ථාරක, පාළි පටිවිසෝධක, ඕසානසෝධෙය්‍යපත්තපාඨක තනතුරු දැරූ පාළි භාෂාව පිළිබඳ හසල දැනුමක් ඇති මහෝත්තමයන් වහන්සේ නමකි. මෙම ස්වාමින් වහන්සේ ශ්වේජින් නිකායේ අනු නායක පදවිය දරමින් ද මන්ඩලේ නුවර එක් දහස් පන්සියයක් පමණ භික්ෂූන් වහන්සේලා වැඩසිටින අමරපුර ගන්ධාරාමයෙහි අධිපතිව වෙසෙමින් ද සැටකටත් අධික ග්‍රන්ථයන් බිහි කොට බුරුම රජයෙන් පිරි
නමන "අග්ග මහා පණ්ඩිත" ධූරයෙන් පිදුම් ලත් පරියත්ති, ප්‍රතිපත්ති සාසනද්වයට මහඟු මෙහෙවරක් කළ උතුමෙකි.

මෙම පරිවර්තනය පූජ්‍ය වලවේ සුමේධාලෝක ස්වාමින් වහන්සේ ඉදිරිපත් කරන්නේ සිය උපාධ්‍යායෝත්තම අපවත් වී වදාළ අති පූජනීය නා උයනේ අරියධම්මාභිධාන අනු නායක මාහිමිපාණන් වහන්සේ අනුස්මරණය කිරීම් වශයෙන් කෙරෙන ග්‍රන්ථ මාලාවේ පළමු ග්‍රන්ථය ලෙසය. අපවත් වී වදාළ අති පූජනීය නා උයනේ අරියධම්ම අනු නායක මාහිමිපාණන් වහන්සේට කෘතගුණ සැළකීමේ ශීර්ෂයෙන් මෙම පරිවර්තනය ඉදිරිපත් කිරීමෙන් පූජ්‍ය වලවේ සුමේධාලෝක ස්වාමින්

වහන්සේට මහත් වූ කුසලයක් අත්පත් වේ. මෙම කුසලය නා උයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේට පැතුම් පරිදි උතුම් වූ සම්මා සම්බුද්ධත්වය අවබෝධය පිණිසම උපනිශ්‍රය වේවා. මෙම පොතෙහි මුල් කර්තෘන් වහන්සේ වන අග්ග මහා පණ්ඩිත අති පූජනීය ජනකාභිවංස නාහිමිපාණන් වහන්සේට මෙම කුසලය අත්පත් වීමෙන් පැතුම් පරිදි උතුම් වූ අමා මහ නිවනින් සැනසේවා.

මෙම පුස්තකයෙහි එදිනෙදා ජීවිතයේදී භික්ෂූන් වහන්සේ විසින් නොයෙක් අවස්ථාවලදී භාවිතයට සුදුසු පරිදි කථා සල්ලාප සකස් වී තිබීම ප්‍රශංසනීයය. මෙම පරිවර්තනය ඉදිරිපත් කරන පූජ්‍ය වලවේ සුමේධාලෝක ස්වාමීන් වහන්සේට තව තවත් මෙවැනි ග්‍රන්ථ ඉදිරිපත් කිරීමට තව තවත් ශක්තිය ලැබේවායි ආශිංසනය කරන අතර භාෂා ඥාණය වර්ධනය වී ධර්ම ඥාණයද වැඩී නිවන් අවබෝධ කිරීමට ලැබේවායි පතමි.

මෙම පුස්තකය පරිශීලනය කරන සියලුම දෙනාටද භාෂා ඥාණය දියුණු වී ධර්ම ඥාණය ද ලබා නිවනින් සැනසේවා. පරිවර්තක ස්වාමීන් වහන්සේ හැදූ වැඩූ දෙමාපියන්ට ද මෙලොව වශයෙන් ආයුරාරෝග්‍යාදී සම්පත් ලබමින් නිවනින් සැනසෙන්නට ලැබේවා.

මෙම පොත මනා ලෙස මුද්‍රණය කළ ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් මුද්‍රණාලයාධිපතිතුමන්ට හා සේවක මණ්ඩලයට ද මේ කුසලයෙන් නිදුක් නිරෝගී සුව හා නිවන් සුව ලැබේවා.

එසේම මෙම පොත මුද්‍රණය කිරීමට ආධාර උපකාර කළ දීපලාල් විජේරත්න මහතා ඇතුළු පවුලේ සැම දෙනාටද මෙම කුසලය අත්පත් වීමෙන් නිවනින් සැනසෙන්නට ලැබේවායි පතමි.

මෛත්‍රියෙනි.

මේ වගට,

සසුන් ලැදි,

අති පූජ්‍ය මීගොඩ සංඝසෝභන මහා ස්ථවිර

නා උයන අරණ්‍ය සේනාසනය.

**2016.12.02**

## පරිවර්තක සටහන

එක් ලෝකප්‍රකට චිත්‍ර ශිල්පියෙක් අවන්හලක සිය ආහාර වේල අනුභව කරමින් සිටියදී සිදු වූ සිදුවීමක් කෙටියෙන් මෙහිලා ගෙන හැර දැක්වීමට සිතුවෙමි. ලෝක කලා සාහිත්‍යයට අපූරු නිර්මාණ රැසක් දායද කළ මේ කලාකරුවා තමා සිටින අවන්හලට පැමිණි බව දත් තරුණ කතක් සිය අත් පිස්නාව ඔහු වෙත දිගු කොට එහි සිතුවමකුත් සමරු අත්සනත් තබන මෙන් අයැදීය. හේ තප්පර කිහිපයකින් අත්පිස්නාව මත යමක් කුරුටු ගා නැවත දෙමින් එය ඩොලර් විසි දහසක් වටනා බව කීවේය. ඒ ඇසූ තරුණ කත කලාකරුවාගෙන් ප්‍රශ්න කළේ ඒ සඳහා ඔබට ගතවූයේ තප්පර කිහිපයක් පමණක් නොවේදැයි කියායි. "දරුව! එසේ නොවේය, ඒ සඳහා මට මුළු දිවියම වැයවුණි" යැයි හේ කීවේලු. සැබැවින්ම ඔහු සිය දිවියෙහි සැදෑ සමයෙහි කළ කුරුටු ගෑමක් පවා දහස් ගණනින් අලෙවි විය. මෙයින් ශත වර්ෂයකටත් එහා ජීවත් වූ ඒ අපූරු කලාකරුවා අන් කවරෙක් හෝ නොව "පැබ්ලෝ පිකාසෝ"ය. අද හේ මෙලොව තුළ නැතත් එතුමාගේ නිර්මාණ පැබ්ලෝ පිකාසෝ කවරෙක්දැයි ලොවට කියාපාන්නේය.

මේ "කථාසල්ලාපසික්ඛාව" නම් ග්‍රන්ථය නිපදවූ ග්‍රන්ථකාරක තෙරුන් වහන්සේ පැබ්ලෝ පිකාසෝ තරම් ලෝපතළ නොවුවද උන්වහන්සේ සිදුකළ සසුන් මෙහෙවර අනුව කියතහොත් නම් පැබ්ලෝ පිකාසෝටත් වඩා කෙනෙකි. සිය දිවියම බුදු සසුන වෙත පුදමින් උන්වහන්සේ බුරුම රට පැවැත්වූ සවැනි ධර්ම සංගායනාවට ඕවාදචරිය සඞ්ඝනායක පදවියෙන් ද, භාරනිත්ථාරක පදවියෙන් ද, පාළිපටිවිසෝධක පදවියෙන් ද, ඕසානසෝධෙය්‍යපත්තපාඨක පදවියෙන් ද තමන් වහන්සේගේ දායකත්වය ලබාදුන් සේක. අද බුරුම රට පරියත්ති සසුනට ඉමහත් සවියක්ව පවත්නාවූ ද ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ධර්ම ඥානය වඩවන්නාවූ ද "ශාසනාලඞ්කාර" නම් විභාග ක්‍රමයේ සමුත්පාදකයන් වහන්සේ ද උන්වහන්සේමැයි. එපමණක් නොවේ සසුන් වන් කුලපුත්‍රයන්ට පහසුවෙන් බුදු සමය දැන ගනු පිණිස උන්වහන්සේ සැපයූ ග්‍රන්ථ ගණන සැටකට ද අධිකය.බෝධිසම්භාර පතා ප්‍රඥා පාරමිතා සැපිරූ උන්වහන්සේ

නාමයෙන් ගන්ධාරාමවාසී "මහා ගන්ධායොං සයාඩෝ හෙවත් ජනකාභිවංස මහ තෙරුන් වහන්සේය". උන්වහන්සේ එක් භවයෙක්හි බුදු සසුනෙහි චිරස්ථිතිය වෙනුවෙන් කළ මෙහෙය තතු දතුවන්හට දැක්වීමට මෙයම පමණ වේයැයි සිතමි. උතුම් ලොවුතුරු අර්ථයක් වෙනුවෙන් සසුන් වැඩ වැඩූ උන්වහන්සේ හැඳින්වීමට ලෞකිකාර්ථයක් උදෙසාම කැපවූ පැබ්ලෝ පිකාසෝ වැන්නෙකු කුමට ගෙන හැර දැක්වීදැයි ඔබට සිතේ නම් එයට සමාව භජනය කරමි. සැබැවින්ම අපට අවැසි වූයේ උන්වහන්සේ නිපදවූ සෙසු ග්‍රන්ථ හා සළකා බැලූ කල්හි මේ "කථාසල්ලාපසික්ඛාව" උන්වහන්සේ අතින් කළ කුරුටු ගෑමක් බවත් ග්‍රන්ථයෙන් සිදුවන ශාසනික සේවාව හේතුවෙන්ම එය මුදලින් මිළ කල නොහැකි බවත් ග්‍රන්ථකාරක තෙරුන් වහන්සේගේ ජීවිත පරිශ්‍රමයත් පැබ්ලෝ පිකාසෝතුමන්ගේ කථාවෙන් ගෙන හැර දැක්වීමටයි. අප විසින් මහත් පරිශ්‍රමයෙන් මේ ග්‍රන්ථය සීහළ බසට පරිවර්තනය කළේ ලක් බුදු සසුනට මෙවන් ග්‍රන්ථයකින් වන ඒ අමිළ සේවය ගැන සළකාගෙනය.

පොත් පත් සුලභ නොවූ මෙයින් අඩ සියවසකටත් එහා සමයෙක බුරුම රට මහ තෙරුන් වහන්සේලා මේ ග්‍රන්ථය සියතින් පිටපත් කොට එය තම ශිෂ්‍යයන්ට උගන්වා ශිෂ්‍යයන් පාළි භාෂාවෙන් කථා කරවීම් කායර්‍යයෙහි අති සාර්ථකවූ බැව් මුල් කෘතියේ පෙරවදනෙහි දක්නට ලැබුණි. එයින්ම මේ ග්‍රන්ථයෙහි වටිනාකම සිතා ගැන්මට පුළුවන. පාළියෙන් කථා කිරීමට උගන්වන තවත් ග්‍රන්ථ මෙරට ඇතත් හදාරන්නන්ගේ ශ්‍රද්ධාදී ගුණ ධර්ම නඟා සිටුවා ඔවුන් නිර්වාණාවබෝධයට උත්සුක කරවීමට සමත් ග්‍රන්ථයක් වීමත්, බුරුම රට ශාසනික සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වීමත් මේ පොත පරිවර්තනයෙහි අප දිරිමත් කළ තවත් කරුණෙකි.

ථේරවාද බුද්ධ ධර්මය පවත්නා බොහෝ රටවල දැන් දැන් පාළි බසින් කථා කිරීමේ පුනුරුදයක් ඇති වෙමින් පවතී. බුරුමය, සියම මෙන්ම ලක්දිව ද ගිහි පැවිදි උගතුන් එක්ව පාළි බසින් කථා සල්ලාපයෙහි යෙදෙන "පාළි භාෂා සම්මන්ත්‍රණ" කිහිපයකට අපිඳු සහභාගී වී ඇත්තෙමු. ඇතැම් බුරුම ජාතිකයන් ද සියම් ජාතිකයන් ද

සිය මව් භාෂා ව්‍යවහාර ශෛලියෙන් ඉතා වෙනස්වූ පාළි භාෂාව චතුර ලෙස හසුරුවනු එහිදී අපි දුටිමු. එපමණක් ද නොවේ එරට භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පවත්වනු ලබන බොහෝ විභාග වලදී පිළිතුරු පත්‍ර පාළි භාෂාවෙන් ලිවීමට ද අවස්ථාවක් සලසා ඇත. මෙසේ ඒ රටවල පාළි සාහිත්‍ය සුරැකීමට නිසි සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.

එනමුදු භාෂා ශෛලියෙන් සීහළ බසට ඉතා නුදුරින්ම පවත්නාවූ ද හෙළ බසට මව් භාෂාවක්වූ ද "පාළි භාෂාව" සම්බන්ධයෙන් දැන් දැන් ලාංකේය භික්ෂූන් වහන්සේලාගේ උත්සුකවීම ගැන කිවයුත්තේ එතරම් ප්‍රශංසනීය නොවන කථාවෙකි. පාළි භාෂාවේ සමතෙකු වන එක්තරා ගිහි භවතෙක් අපහට කියා සිටියේ අද පාළි භාෂාවෙන් ත්‍රිපිටකය හදාරන භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමාණය සියයට පහක් තරම් අල්ප බවය. එහෙයින්ම ලක්දිව තරම් ධර්ම විනය පිළිබඳ දූර්මත උපදිනා අන් රටක් ලොව නොමැති බවත් කිය යුතුය.පාළි බස වෙනුවෙන් රූපසිද්ධිය, මොග්ගල්ලානාදී මනරම් වියරණ ග්‍රන්ථ නිපදවූ භික්ෂූන් වැඩ සිටි අසිරිමත් ජාතික උරුමයක් ඇති වර්තමාන හෙළ භික්ෂූන් වහන්සේලා මේ පත්ව සිටින්නේ කෙතරම් අභාග්‍ය තත්ත්වයකට ද? එක් කලෙක පාසැල් විෂය නිර්දේශයේ අනිවාර්ය විෂයක් වූ පාළි භාෂාව අද විෂය නිර්දේශයෙන් පවා ඉවත් කොට තිබේ. මෙසේ වුවහොත් සිංහල භාෂාව පෝෂණය කළ පාළි භාෂාව නුදුරු අනාගතයේදීම ලක්දිවින් අතුරදහන් වනු නොඅනුමානය.ඒ අනතුරින් ලක් සසුන මුදවා ගැනීමට අපට කළ හැකි සේවාවක් ලෙසින් සළකා ද මෙහිලා උත්සකවීමි.

"කථාසල්ලාපසික්ඛාව" පාළි කථනයෙහි පරිචයට රුකුල් දෙන්නක් බැවින් මේ පොත උගැනීමට කැමතියන් විසින් අන් පාඩම් පොත් වලින් පාළි පෙරහුරුවක් ලබා තිබීම වඩා සුදුසුය. එසේ නොවතුදු පාළි නාමාඛ්‍යාත පද වර නැගීම් ආදියෙහි හුරුවක් ඇති ඥාණවන්තයකුට නම් කුඩා උත්සාහයකින්ම මේ පොතම පරිචය කරමින් පාළි භාෂාව උගැනීමට නොහැක්කේ යැයි ද අපි නොකියමු. ඊට උපකාරයක් වන ලෙසට මේ පාඩම් වැලෙහි සීහළ පරිවර්තනයක් ද පාඩම් වල එන අමාරු වචන ද හැකි තැනක කුඩා ව්‍යාකරණ

විවරණයක් ද ඒ ඒ පාඩම ආශ්‍රිත පද යොදා ගනිමින් පාළි රචනය හුරු කරවීමේ අදහසින් සීහළ බසින් අභ්‍යාස මාලාවක් ද ඇතුළු කළෙමි.

දැන් කිවයුත්තේ මේ පොතේ පහළවීමට උපකාරවූවන් පිළිබඳ කෘතවේදී කථාවකි. මේ කාර්යයෙහි අපට උපකාරවූවන් සළකා ඒ සියල්ලන්ගේම නම් මෙහි සඳහන් කළහොත් මේ සටහන කියවන්නන්ට නුරුස්නා “නම් පොත”ක් බඳු වනු ඇත. එහෙයින් කිසිවකුගේ නම් සඳහන් කිරීමක් නොමැතිව අප දිවියේ පූර්වාචාර්ය මව්පියන් දෙදෙනා පටන් සිප් සතර කියා දුන් දෙස් විදෙස් සියළු ගුරු උතුමන් සිතින් සළකා ඒ සියළු ගුරු උතුමන් වහන්සේලා හට මේ ග්‍රන්ථය ගුරු පඬුරක් වේවායි ගුරු පූජා පවත්වමි. එසේම මේ ග්‍රන්ථ පරිවර්තන කෘත්‍යයෙහිද, සෝදු පත් බැලීමෙන් ද නන් අයුරින් කල්‍යාණ මිත්‍රත්වයෙන් අපට අනුග්‍රහ කරමින් අපව ධෛර්යමත් කළ සියළු කල්‍යාණ මිත්‍රයන් වහන්සේලාට මේ පින චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධය පිණිස උපනිශ්‍රය වේවායි ඉත සිතින් පතමි. උන්වහන්සේලාගේ නම් මෙහි සඳහන් නොකිරීම සම්බන්ධයෙන් අප සිත හඳුනන ඒ උතුමෝ අප කෙරෙහි උපේක්ෂා වෙත්වා!!!

මේ ග්‍රන්ථය පරිගණක යතුරු ලියනය කොට අවසන් කළ අපි ලක්දිව බොහෝ පොත් ප්‍රකාශක සමාගම් හා සම්බන්ධ වී මෙනම් පොතක් මුද්‍රණයට දායක වන්නැයි ඉල්ලීමු. ඔවුහු පොත විකිණීමෙන් වන ලාභයම සිත්හි දරා ග්‍රන්ථය හොඳ නම් එය මුද්‍රණය කරන්නෙමුයි අපට පොරොන්දු වූහ. ඒ අසා උකටලීව සිටි අප හට මෙතරම් වටනා පොතක් මුද්‍රණයට ද්වාරයට පමුණුවන්නට හැකිවූයේ එක්තරා සත්පුරුෂයෙකුගේ හොඳ හිතේ බලයක් ලෙසය. මෙහිලා නම් සඳහන් නොකොටම බැරි, බුදු සසුනේ චිරස්ථිතියත් චතුරාර්ය සත්‍යය අවබෝධයත් යන පාරිශුද්ධ අදහස් සිත්හි තබාගෙන ධර්ම දානමය පින්කම සිදු කරන දීපලාල් විජේරත්න මහත්මා ඇතුළු සැමට මේ ධර්ම දානමය පුණ්‍ය කර්මයේ බලයෙන් පැතූ පරිදි සුවසේ නිර්වාණාවබෝධය වේවායි පතමි. එසේම මේ ග්‍රන්ථයෙහි සෝදු පත් බැලීමෙන් ද වටනා අදහස් දීමෙන් ද අපට අනුග්‍රහ කළ පූජ්‍ය ශ්‍රීසියේ ඤාණදස්සන ස්වාමින් වහන්සේටත්, පූජ්‍ය ගංගොඩවිල මුදිතමනෝ

ස්වාමින් වහන්සේටත්, පූජ්‍ය ලබුනෝරුවේ ධම්මවිහාරී ස්වාමින් වහන්සේටත්, පූජ්‍ය දිද්දෙණියේ අරියදස්සන ස්වාමින් වහන්සේට ත් නුවරඑළියේ ඤාණෝපම ස්වාමින් වහන්සේට ත් කෘතඥ පූර්වකව ස්තුති වන්ත වෙමි.බුදු සසුනෙහි කුඩා දරුවකු බඳු අප විසින් කළ මේ පරිවර්තනයෙහි නොයෙක් අඩුපාඩු තිබෙනු නොඅනුමානය. අපගේ යහපත පතන සුධීහු කුළුණු ගුණයෙන් ඒ අඩුපාඩු අප වෙත සැළ කරත්වා!. ඉදින් මේ ග්‍රන්ථය උපකාර කරගෙන එක් භික්ෂුවක් හෝ එක් ගිහි පින්වතෙකු හෝ පාළි බසෙහි පරිචයක් ලදහොත් එයම අපගේ මහන්සියට නිසි ඵලැයි සළකා ගෙන සතුටු වෙමි.

ඉදං මේ පුඤ්ඤං බෝධිඤාණස්ස පච්චයෝ හෝතු!!!

මෙයට,

ශාසනස්ප්‍රීතිකාමී,

වලවේ සුමේධාලෝක.

නා උයන අරණ්‍ය සේනාසනය.

ව්‍යවහාර වර්ෂ 2016 දෙසැම්බර් මස පළමු වැනි බ්‍රහස්පතින්දා.

# කථාසල්ලාපසික්ඛා

[කථා සල්ලාප ශික්ෂාව.]

## උය්‍යෝජනකථා

[උත්සාහවත් කිරීමේ කථාව]

01. පාළිභාසං ආවුසෝ සච්චං වා න වා භාසෙය්‍යාථ ඒව. බහුං භාසමානා පාළියං කුසලා භවිස්සථ.
[ඇවැත්නි, පාළි භාෂාව නිවැරදිව හෝ වැරදිව හෝ කථාම කරවු. බොහෝ කථා කරන්නාහු පාළි භාෂාවෙහි දක්ෂයෝ වන්නාහුය.]

02. අපි තු කත්තුකම්මක්‍රියාසු චෙව විසෙසනවිසේසෝසු ච සතිං පච්චුපට්ඨාපෙත්වා භාසෙය්‍යාථ.
[එනමුදු කර්තෘ, කර්ම, ක්‍රියාවන්හි මෙන්ම විශේෂණ,විශේෂ්‍ය පදයන් කෙරෙහි ද සිහි එළවා කථා කරවු.]

03.ආදිතෝ හි පට්ඨාය අපසද්දා මුඛාරුළ්හා සමානා පච්ඡා සාධුසද්දතං කාතුං දුක්කරා භවිස්සන්ති.
[ මුල පටන් වැරදි ව්‍යාකරණ කටට නැගුණෝ වන්නානාහු පසුව ව්‍යාකරණානුකූලව නිවැරදි බවට (පත් වීමට) දුෂ්කර වූවෝ වන්නාහ.]

තේනේව පාළියා වත්තුං-සමත්ථමාරභන්තු හේ
දන්තේ'භිදන්තමාධාය -තාලුං ආහච්ච ජිව්හයා[1].

අමාරු වචන.

01. පාළිභාසා (ඉ) - පාළි භාෂාව. සච්චං වා - නිවැරදි ලෙස හෝ. න සච්චං වා - වැරදි ලෙස හෝ. බහුං (නි) - බොහෝ. කුසල (ති) - දක්ෂ වූ, නිපුන වූ.

02. අපි තු - එසේ වුවද, පච්චුපට්ඨාපෙත්වා - එළඹවා (සිහිය යථා ස්ථානයට පමුණුවා)

03. පට්ඨාය - පටන්. අපසද්දා - ව්‍යාකරණානුකූලව සාවද්‍ය වූ.

---

[1] ''ජිව්හාය'' යැයි කීමට අවැසිව ඡන්දානුරක්ෂණය පිණිස ''ජිව්හයා'' යැයි යොදා තිබේ.

මුඛාරුළ්හ (ති) - කටට ආ, මුඛයට නැගුණු. සාධුසද්දතා - නිරවද්‍ය ව්‍යාකරණයාගේ භාවය(ව්‍යාකරණානුකූලව නිවැරදි බව).

(අ) සා මාගධී මූලභාසා- නරා යායාදිකප්පිකා
බ්‍රහ්මානෝ චා'ස්සුතාලාපා- සම්බුද්ධා චා'පි භාසරේ.
(රූපසිද්ධි)

(ආ) යං බුද්ධෝ භාසතේ වාචං - ඛේමං නිබ්බානපත්තියා
දුක්ඛස්ස'න්තකිරියාය- සා වේ වාචනමුත්තමා.
(සංයුත්තනිකාය)

යාය - යම් භාෂාවකින්. ආදිකප්පිකා - ආදි කල්පික වූ. නරා - මනුෂ්‍යයෝ ද. බ්‍රහ්මානෝ ච - බ්‍රහ්මයෝ ද. අස්සුතාලාපා - නො අසන ලද කථා හඬ ඇති දරුවෝ ද. සම්බුද්ධාචා'පි - බුදුවරයන් වහන්සේලා ද. භාසරේ - කථා කරත් ද. මාගධී - මගධ වැසියන්ට අයත් වූ. සා - ඒ භාෂාව. මූලභාසා - මුල් භෂාවයි.

(ආ) බුද්ධෝ - බුදුරජාණන් වහන්සේ. නිබ්බානපත්තියා - නිවනට පැමිණීම පිණිස ද. වට්ටදුක්ඛස්ස - ත්‍රෛභූමක වට්ට දුක්ඛයාගේ ද. අන්තකිරියාය - කෙළවර කිරීම පිණිස ද, ඛේමං - අන්තරායන් අවසන් කිරීමට සමත් වූ. යං වාචං - යම් භාෂාවක්. භාසතේ - දේශනා කරන සේක් ද, සා - ඒ භාෂාව. වේ - ඒකාන්තයෙන්ම. උත්තමා - උතුම් වෙයි.

ගාථාවේ අර්ථය.

හේ - පින්වත්නි, තේනේව - එසේ හෙයින්ම, දන්තේ - පහළ දත් වල, අභිදන්තං - ඉහළ දත්, ආධාය - තබා, ජිව්හාය - දිවෙන්, තාලුං ආහච්ච - තල්ල ස්පර්ෂ කොට, පාළියා - පාළි භාෂාවෙන්, වත්තුං - කථා කිරීමට, සමත්ථං - හැකිවීම පිණිස, ආරභන්තු - උත්සාහ කෙරෙත්වා!!!

## 01. පච්චූසසමයේ කථාසල්ලාපෝ
[ඉතා උදෑසන කාලයේ කථාසල්ලාපය]

**01. ආවුසෝ, ධම්මරක්ඛිත!**
[ඇවැත්නි, ධම්මරක්ඛිතය]

**02. කිං, භන්තේ?**
[ස්වාමීනි, කිම?]

**03.සයනා උට්ඨේහි.**
[ඇඳෙන් නැඟිටිනු.]

**04.උග්ගතෝ නු, භන්තේ, අරුණෝ?**
[ස්වාමීනි, අරුණ නැගුනේ ද?]

**05. න තාව උග්ගතෝ. අපි තු අරුණුග්ගමනවේලා උපකට්ඨා.**
[තවම (අරුණ) නො නැගුනේය. එනමුදු අරුණ උදාවන වේලාව සමීපය.]

**06.පහටා නු, භන්තේ, විහාරේසු ඝණ්ඨා?**
[ස්වාමීනි, විහාරයන්හි ඝණ්ඨාරය ගසන ලද ද?]

**07.මකුටාරාමවිහාරේ න පහටා, ගන්ධාරාමවිහාරේ පන පහටා.**
[මකුටාරාම විහාරයෙහි (ඝණ්ඨාරය) නො ගසන ලදී. ගන්ධාරාම විහාරයෙහි වනාහි ගසන ලදී.]

**08.සචේ අරුණෝ න උග්ගච්ඡති, නා'හං සයනා වුට්ඨහාමි. අලසෝ'ම්හි.**
[ඉදින් අරුණ නො නගියි ද, මම ඇඳෙන් නො නැගිටිමි. අලස වූයේ වෙමි.]

**09. මා හේවං අවච. " පුරා'රුණා සයනතෝ වුට්ඨාතබ්බං"ති ආචරියේන පඤ්ඤත්තං. තස්මා ත්වං අන්තෝඅරුණේ යේව සයනතෝ වුට්ඨේහි.**
[එසේ නො කියව. "අරුණට පෙර ඇඳෙන් නැගිටිය යුතු" යැයි ආචාර්යන් වහන්සේ විසින් පණවන ලදී. එහෙයින් නුඹ වහන්සේ අරුණ තුළදීම ඇඳෙන් නැගිටිනු.]

**10. යදි ඒවං වුට්ඨහිස්සාමි.**
[ එසේ වී නම් නැගිටින්නෙමි.]

**(අ) උට්ඨේහි භික්ඛු කිං සේසි - කෝ අත්ථෝ සුපිතේන තේ
ආතුරස්ස හි කා නිද්දා සල්ලවිද්ධස්ස රුප්පතෝ.
(සංයුත්තනිකාය)**

**අමාරු වචන.**

**01.** **පච්චූස (පු) - ඉතා උදෑසන (පශ්චිම යාමයෙහි අවසන් කාලය).
සමය (පු) - කාලය.**
**03.** **සයන (න) - ඇඳ, නිදන තැන. උට්ඨාති (උ√ඨා+අ+ති) - නැඟී
සිටියි.**
**04.** **උග්ගත (ති) - නැගුණු. අරුණ (පු) - සූර්යෝදයට පෙර අහසෙහි
ඇතිවන මද රතු පැහැති ආලෝකය.**
**05.** **න තාව උග්ගතෝ - තවම (අරුණ) නො නැගුණේය.
අරුණුග්ගමනවේලා (ඉ) - (අරුණ+උග්ගමන+වේලා) - අරුණ+
උදාවන + වේලාව. උපකට්ඨ (ති) - සමීප වූ, ළඟ වූ.**
**06.** **පහට (ති) - ගසන ලද. ඝණ්ට / ඝණ්ටී (ඉ) - සීනුව, ඝණ්ටාව.**
**08.** **උග්ගච්ඡති (උ√ගමු+අ+ති) - උදා වෙයි. වුට්ඨහති (උ√ඨා+අ+ති) -
නැගිටියි, නැගී සිටියි, පිබිදෙයි. අලස (ති) - කම්මැලි පුද්ගලයා,
කම්මැලි වූ.**
**09.** **අවච (වච) - කීය(භීයාත්තනී ආ විභක්තිය හට හ්‍රස්වාදේශයි).
පුරා’රුණා - අරුණට පෙර. පඤ්ඤත්ත (ති) - පණවන ලද.
යදි ඒවං - එසේ නම්.**

**ගාථාවේ අර්ථය.**

**(අ)- භික්ඛු - මහණ!. උට්ඨේහි - නැඟිටිනු. කිං - කවර හේතුවෙන්.
සේසි - නිදන්නෙහිද? තේ - තට. සුපිතේන - නිදා ගැනීමෙන්.
කෝ අත්ථෝ - කවර අර්ථයෙක් ද? සල්ලවිද්ධස්ස - (අවිද්‍යා විෂ
පෙවූ තෘෂ්ණා) ශල්‍යයෙන් විදින ලද. රුප්පතෝ - ගැටෙන්නා වූ.
ආතුරස්ස - ක්ලේශාතුර වූ තොපගේ. නිද්දා - නිදීම. කා - කවර**

අර්ථ ඇත්තේද?

## පාළියට නගනු

**01.** බුද්ධරක්ඛිත.
**02.** ස්වාමීනි.
**03.** ධම්මරක්ඛිත තවමත් ඇඳෙන් නො නැගිටුණිද? (අවදිවී ද?)
**04.** ස්වාමීනි, තවම නිදිය.
**05.** තවමත් නිදි ද? අරුණ නැගී අවසන්ය. අරුණට කලින් නැගිටීවා.
**06.** සඞ්ඝරක්ඛිතත් නිදිද?
**07.** ස්වාමීනි,මම නැගිටීමි.
**08.** හොඳයි.
**09.** හෙරණුනි, නිදීමෙන් තොපට කවර ඵලක්ද?

## උපකාරක පාඨ

**05.** තවමත් - ඉදානි'පි. නැගිටීවා - වුට්ඨහතු.
**06.** සඞ්ඝරක්ඛිතෝ'පි.
**07.** නැගිටීමි - වුට්ඨිතෝ'ම්හි.
**09.** නිදීමෙන් - සුපිතේන,නිද්දාය. ඵලය - අත්ථ.

## 02. සයනා වුට්ඨිතකාලේ කථාසල්ලාපෝ

[ඇඳෙන් නැගිටුණු කළ කථා සල්ලාපය.]

**01. ආවුසෝ බුද්ධරක්ඛිත.**
[ඇවැත්නි බුද්ධරක්ඛිතය,]

**02. භන්තේ.**
[ස්වාමීනි.]

**03. වුට්ඨිතෝ’සි නු සයනා ?**
[ඇඳෙන් නැගිටුණේ වෙහි ද?]

**04. ආම භන්තේ, වුට්ඨිතෝ’මහි.**
[ස්වාමීනි, එසේය. නැගිටුණේ වෙමි.]

**05. සයනතෝ වුට්ඨහිත්වා පඨමං වච්චට්ඨානං වා පස්සාවට්ඨානං වා ගච්ඡෙය්‍යාසි.**
[ඇඳෙන් නැගිට පළමුව වැසිකිළියට හෝ කැසිකිළියට හෝ යනු.]

**06. නත්ථි මෙ භන්තේ වච්චට්ඨානස්ස ගමනකිච්චං, පස්සාවට්ඨානමේව ගච්ඡෙය්‍යාමි.**
[ස්වාමීනි, මට වැසිකිළියට යාමේ කිසක් නැත. කැසිකිළියටම යමි.]

**07. තතෝ පරං දන්තේ දන්තපෝණෙන සෝධෙත්වා (සචේ ලෝණං වා දන්තසෝධනභෙසජ්ජං වා අත්ථි, තේන සෝධෙත්වා) ජිව්හං ච විලේඛෙත්වා මුඛං ධෝවෙය්‍යාසි.**
[ඉන් අනතුරුව දැහැටියෙන් දත් මැද (ඉඳින් ලුණු හෝ දත් බෙහෙත් හෝ ඇත්තේ ද එයින් මැද) දිව ද මැද මුහුණ සෝදනු.]

**08. ආම භන්තේ, මුඛෝදකං පන කත්ථ අත්ථි ?**
[ ස්වාමීනි, එසේය. මුහුණ සෝදන දිය වනාහි කොහි ඇත්ද?]

**09. න පස්සසි නු හෙට්ඨාවිහාරේ උදකඝටං ? තත්ථ මුඛෝදකං අත්ථි, මුඛං ධෝවිත්වා මුඛපුඤ්ඡනෙන පුඤ්ඡෙය්‍යාසි, මා චීවරේන.**
[ විහාරයෙහි පහළ ජල කළය නො දක්නෙහි ද? එහි මුහුණ සෝදන දිය ඇත. මුහුණ සෝදා මුහුණ පිසදමන තුවායෙන් පිසිනු. චීවරයෙන් නොපිසිනු.]

**10. නත්ථි මෙ මුඛපුඤ්ඡනං, ආයස්මතෝ සන්තකං තාවකාලිකං දේතු.**
[මගේ මුහුණ පිසින තුවාය නැත. ආයුෂ්මත් ස්වාමීන් වහන්සේ සතු තුවාය

තාවකාලිකව දෙනු මැනවි.]

**11.හන්ද..... මුඛං පුඤ්ඡිත්වා විවිත්තාසනේ නිසීද !**

[ මෙන්න... මුහුණ පිසදා හුදෙකලා අස්නෙක හිඳිනු!.]

**12. විවිත්තාසනේ නිසීදිත්වා කිං කරෙය්‍යාමි ?**

[හුදෙකලා අස්නෙක හිඳ කුමක් කරම්ද?]

**13. යාවඅරුණුග්ගමනා ජීවමානකං වා බුද්ධං අනුස්සරෙය්‍යාසි, මෙත්තං වා භාවෙය්‍යාසි, අරුණේ උග්ගතේ පාතරාසභත්තං භුඤ්ජිස්සසි.**

[අරුණ උදාවන තුරු ජීවමාන බුදු රජාණන් වහන්සේ හෝ සිහි කරනු, මෛත්‍රිය හෝ වඩනු. අරුණ නැගුණු කල්හි හීල දානය වළඳනු.]

**14. ආම භන්තේ.**

[ ස්වාමීනි, එහෙමයි.]

**( අ) යාය සද්ධාය පබ්බජිතෝ - අගාරස්මා අනගාරියං**
**තමේව සද්ධං බ්‍රෑහේහි - මා නිද්දාය වසං ගමි.**
**(සංයුත්තනිකාය)**

**අමාරු වචන.**

---

**05. වච්චට්ඨාන (න) - වර්චස්ථානය, මළ පහ කරන තැන.**
**පස්සාව (පු) - මූත්‍ර. ගමනකිච්ච (න) - ගමන් කිස.**

**07. තතෝ පරං - ඉන් පසුව. දන්ත (පු) - දත්, දළ. දන්තපෝණ (පු) - දැහැටි.**
**සෝධේති (√සුධ+ණෙ+ති) - සුද්ධ කෙරේ. ලෝණ (න) - ලුණු.**
**දන්තසෝධනභේසජ්ජ (න) - දත් බෙහෙත්. ජිව්හා (ඉ) - දිව.**
**විලේඛති (වි√ලිඛ+අ+ති) - මදියි. ධෝවති (√ධොවු +අ+ති) – සෝදයි.**

**08. මුඛෝදක (න) - මූණ සේදීමට පැන්. කත්ථ (නි) - කොහි, කොහේ.**

**09. හෙට්ඨාවිහාර (න) - විහාරය පහළ(අබ්‍යයීභාව සමාස පදයක් බැවින් නපුංසක ලිංගයි).**
**උදකඝට (පු) - ජල කළය. මුඛපුඤ්ඡන (න) - මුහුණ පිසින තුවාය.**
**පුඤ්ඡති (√පුඤ්ඡ+අ+ති) - පිසියි.**

**10. තාවකාලිකං - තාවකාලික ව.**

**11.** **හන්ද (නි) - එසේ නම්, ඒකාන්තයෙන්.**
**විවිත්තාසන (විවිත්ත+ආසන) - හුදෙකලා තැන.**

**13.** **යාවඅරුණුග්ගමනා - අරුණ නැගෙන තෙක්. ජීවමානක (ති) – ජීවත් වන, ජීවත් වෙමින්.**
**අනුස්සරති (අනු√සර+අ+ති) - සිහි කරයි.**
**භාවේති (√භූ+ණෙ+ති) - දියුණු කරයි, මෙනෙහි කරයි, වඩයි.**
**පාතරාසභත්ත [පාත+අස+භත්ත] (න) - උදෑසන + අනුභවයට සුදුසු+ බත, උදේ කෑම.**

**ගාථාවේ අර්ථය.**

**(අ)යාය සද්ධාය - යම් ශ්‍රද්ධාවකින්. අගාරස්මා - ගිහි ගෙයින් [නික්ඛමිත්වා- නික්ම]. අනගාරියං - බුදු සස්නෙහි. පබ්බජිතෝ - පැවිදි වූයෙහි ද. තමේව සද්ධං - ඒ (මුල්) ශ්‍රද්ධාව ම. බ්‍රෑහේහි - වඩව. නිද්දාය - නින්දට (නින්දේ). වසං - වසභයට. මා ගමි - නො යව.**

**පාළියට නගනු.**

**01.** **ඇවැත්නි බුද්ධරක්ඛිත, කැසිකිළියට ගියේ ද? (ගියේ වෙහිද?)**
**02.** **මට කැසිකිළි යාමට අවශ්‍ය නැත.**
**03.** **බුරුසුවක් (දැහැටි) තිබේද? දත් බෙහෙත් තිබේද?**
**04.** **තිබේ නම් බුරුසුවට දත් බෙහෙත් දමා දත් මදිනු.**
**05.** **නොමැති නම් සාමාන්‍ය බුරුසුවෙන් දත් මදිනු.**
**06.** **දිව ද බුරුසුවෙන් මදින්න.**
**07.** **තුවායක් තිබේද?**
**08.** **මූණ සෝදා තුවායෙන් මූණ පිසින්න. සිවුරෙන් පිසින්න එපා.**
**09.** **මූණ සෝදා (අවසන්ව) ජීවමාන බුදුන් වහන්සේව සිහි කරනු. නිදි නොකිරනු.**
**10.** **යම් ශ්‍රද්ධාවකින් ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවූවෝ වෙත් ද ඒ ශ්‍රද්ධාවම වඩත්.**

**උපකාරක පාඨ**

**01. ගියේ වෙහිද? - ගතෝ'සි (අගමාසි).**

**04. දමා - පක්ඛිපිත්වා.**

**05. සාමාන්‍ය දත් බුරුසුව (දැහැටි) - පාකතිකදන්තපෝණ.**

**වර්තමාන දත් බුරුසුව - දන්තපෝණ ලෙස යොදනු.**

## 03. බුද්ධානුස්සරණවේලායං කථාසල්ලාපෝ

[බුදු ගුණ මෙනෙහි කරන වේලාවෙහි කථා සල්ලාපය.]

**01.ආවුසෝ, සාමණේරා!**

[ඇවැත්නි, සාමණේරවරුනි!]

**02. භන්තේ ( භදන්තේ).**

[ස්වාමීනි]

**03. සුණිත්ථ නු ආයස්මතා චක්කපාලේන පහටං ඝණ්ටිසද්දං?**

[ආයුෂ්මත් චක්කපාල ස්වාමීන් වහන්සේ විසින් නගන ලද ඝණ්ඨාර ශබ්දය ඇසුවෙහු ද?]

**04. ආම භන්තේ සුණිම්හා.**

[ස්වාමීනි, එසේය. ඇසුවෙමු.]

**05. වුට්ඨිතා'ත්ථ නු සයනා ?**

[ඇඳෙන් නැගිටුණාහු වෙහු ද?]

**06.ආම භන්තේ, සයනා වුට්ඨිතා'ම්හ.**

[ස්වාමීනි, එසේය. ඇඳෙන් නැගිටුණෝ වෙමු.]

**07.ධෝවිතං නු මුඛං?**

[මුහුණ සෝදන ලද්දේ ද?]

**08.ආම භන්තේ මුඛං ධෝවිතං.**

[ස්වාමීනි, එසේය. මුහුණ සෝදන ලදී.]

**09.තේනහි තුම්හේ සකේ ආසනේ නිසීදෙය්‍යාථ.**

[එසේ වී නම් නුඹ වහන්සේලා තමන්ගේ ආසනයෙහි හිඳ ගනිවූ.]

**10.සකේ ආසනේ නිසීදිත්වා කිං කාතබ්බං ?**

[සිය අසුනේ හිඳ කුමක් කළ යුතු ද?]

**11. යාව ජීවමානකෝ බුද්ධෝ චිත්තේ න උපට්ඨාති, තාව පුනප්පුනං මනසිකාතබ්බෝ.**

[ජීවමාන බුදු රජාණන් වහන්සේ යම්තාක් සිතෙහි නො වැටහෙයි ද ඒතාක් (ඒ වැටහීම ලැබෙන තාක්) නැවත නැවතත් මෙනෙහි කළ යුතුය.]

**12.චිත්තේ උපට්ඨානතෝ පන පට්ඨාය කිං කාතබ්බං ?**

[සිතෙහි වැටහීමෙන් පටන් වනාහි කුමක් කළ යුතු ද ?]

**13.තස්ස අරහතාදිගුණා අනුස්සරිතබ්බා.**

[ඒ බුදු රජාණන් වහන්සේගේ අරහං ආදී ගුණ මෙනෙහි කළ යුතුය.]

**14. තත්ථ කීවචිරං වත්ථබ්බං ?**

[ එහි (අරහං ආදී බුදු ගුණ මනසිකාරයෙහි) කොතරම් කල් සිටිය යුතුද?]

**15.යාව අරුණුග්ගමනා වත්ථබ්බං.**

[අරුණ උදාවන තුරු සිටිය යුතුය.]

**16.අරුණස්ස උග්ගතභාවෝ පන කථං ඤාතබ්බෝ ?**

[අරුණ උදාවුණු බව වනාහි කෙසේ දත යුතු ද?]

**17. ගන්ධාරාමවිහාරේ ඝණ්ටිකසද්දං තික්ඛත්තුං සුණිස්සථ, තේන සඤ්ඤාණේන අරුණස්ස උග්ගතභාවෝ ඤාතබ්බෝ.**

[ගන්ධාරාම විහාරයෙහි ඝණ්ඨාර ශබ්දය තෙවරක් අසන්නාහු ද ඒ සළකුණෙන් අරුණ උදාවුණු බව දත යුතුය.]

**18. සුණිස්සථ, ඉදානේව ඝණ්ටිකා පහටා "ටාං ටාං"ති.**

[මේ දැන් "ටාං ටාං" හඬින් ඝණ්ඨාරය පහර දෙන ලදී, අසන්නෙහු ද?]

**19. ඒවං ඒවං.**

[එසේය, එසේය.]

**(අ) උට්ඨහථ නිසීදථ දළ්හං සික්ඛථ සන්තියා**
**මා වෝ පමත්තේ විඤ්ඤාය මච්චුරාජා ආකඩ්ඪතු.**

අමාරු වචන.

**02. භද්දන්තේ - ස්වාමීනි.**

**03. සුණාති (√සු+ණා+ති) - අසයි. ඝණ්ටිසද්ද (පු) - ඝණ්ටා ශබ්දය.**

**07. ධෝවිත (ති) - සෝදන ලද.**

**09. තේනහි - එසේ නම්. සක (ති) - තමා අයත්, ස්වකීය.**

**11. යාව (නි) - යම් තාක්, යම් පමණ. තාව (නි) - එතෙක් කල්, එපමණ, ඒතාක්.**

**උපට්ඨාති(උප√ඨා+අ+ති)- උපස්ථාන කෙරේ, වැටහේ.**

**12. පුනප්පුන (නි) - නැවත නැවත, පුන පුනා.**

**13. වත්ථබ්බ (ති) - විසිය යුතු, ආරම්භ කළ යුතු, පටන් ගත යුතු.**

**16. ඤාතබ්බ (ති) - දත යුතු.**

**17. ද්වික්ඛත්තුං (නි) - දෙවරක්, දෙවාරයක්.**

**සඤ්ඤාණ (න) - ලකුණ, සළකුණ.**

**(අ) උට්ඨහථ - නැගීසිටිවූ. නිසීදථ - හිඳගනිවූ. සන්තියා - (නිර්වාණ) ශාන්තිය පිණිස. දළ්හං- දැඩිව. සික්ඛථ - හික්මෙවූ. වෝ - තොප. පමත්තේ - පමාවූවන්. විඤ්ඤාය - දැන. මච්චුරාජා - මාර රාජයා. මා ආකඩ්ඪිතු - නො අදීවා.**

**පාළියට නගනු.**

**01. ගෙඩිය (සණ්ටිය) ගසන ලදී. නො ඇසුණෝ වෙහු ද?**
**02. මුහුණ සෝදා අවසන්ද?**
**03. එක් තැනක රැස්වවූ.**
**04. ජීවමාන බුදු රජාණන් වහන්සේව සිතෙහි වැටහෙන තුරු මනසිකාර කරනු.**
**05. අරුණ වැටුනු කළ ගන්ධාරාම විහාරයෙහි ගෙඩිය නාද කරනු ඇත.**
**06. අසන්න. ඒ කුමන ශබ්දයක් ද?**
**07. මේ දැන් ගෙඩිය නාද කරනු ලැබීය.**
**08. එහෙමයි. එහෙමයි.**
**09. නැගිටිනු මැනවි. විවේකස්ථානයක හිඳ ගනිවූ. නිවණ පිණිස දැඩිව හික්මෙවූ. ඔබ පමා වූ බැව් දැන මාරයා නො අදීවා.**

**උපකාරක පාඨ**

**01. නො ඇසුණෝ වෙහු ද? - සුණිත්ථ න නු ?**
**03. එක් තැනෙක - එකස්මිං ඨානේ. රැස්වවූ - සන්නිපතථ.**
**05. ගෙඩිය නාද කරනු ඇත - සණ්ටිං පහරිස්සති.**
**09. ප්‍රමාද - පමත්ත. අදියි - ආකඩ්ඪති.**

## 04. හත්තපචනවේලායං කථාසල්ලාපෝ.

[බත් පිසින වේලාවෙහි කථා සල්ලාපය.]

**01. ආවුසෝ ධම්මරක්ඛිත.**
[ඇවැත්නි ධම්මරක්ඛිතය.]

**02. භන්තේ.**
[ස්වාමීනි.]

**03. භත්තපචනවේලා නනු?**
[බත් පිසින වේලාව නොවේ ද?]

**04. ඒවං භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

**05. කට්ඨානි ඡින්ද චේව භින්ද ච, උදකං'පි ආහර.**
[දර සිඳිනු මෙන්ම බිඳිනු. දිය ද ගෙන එනු.]

**06. හියෝ සායන්හසමයමේව මේ කට්ඨානි ඡින්නානි චේව භින්නානි ච, උදකං'පි ආහතං.**
[ඊයේ සැන්දෑ වේලාවෙහි ම මා විසින් දර සිඳින ලද්දේ මෙන්ම බිඳින ලද්දේය. දිය ද රැගෙන එන ලදී.]

**07. උද්ධනං සජ්ජේහි.**
[ලිප පිළියෙළ කරනු.]

**08. සජ්ජිතං භන්තේ.**
[පිළියෙළ කරන ලදී.]

**09. යදි ඒවං අග්ගිං වඩ්ඪේහි.**
[එසේ නම් ගිනි වඩව.]

**10. නත්ථි මේ භන්තේ අග්ගිමඤ්ජූසා.**
[ස්වාමීනි, මට ගිනි පෙට්ටියක් නැත.]

**11. හන්ද.... අග්ගිං වඩ්ඪෙත්වා පටිදේහි.**
[මෙන්න... ගිනි වඩවා නැවත දෙනු.]

**12. හා..... නත්ථි වත අග්ගිමඤ්ජූසාදණ්ඩෝ.**
[හා... ගිනිකූරු නැත්තේය.]

**13.තේනහි හන්ද අභිනවං ගණ්හ.**
[එසේ වී නම් අළුත් ගිනිකූරු පෙට්ටියක් ගනු.]

**14. වඩ්ඪිතෝ භන්තේ අග්ගි.**

[ස්වාමීනි, ගිනි වඩන ලදී.]

**15. තණ්ඩුලං ධෝව, ධෝවිත්වා උක්ඛලියං පක්ඛිප.**

[සහල් සෝදනු. සෝදා සැළියෙහි දමනු.]

**16. පක්ඛිත්තෝ භන්තේ උක්ඛලියං තණ්ඩුලෝ.**

[ස්වාමීනි, සහල් සැළියෙහි දමන ලදී.]

**17. උක්ඛලිං උද්ධනං ආරෝපේහි.**

[සැළිය උඳුනෙහි නංවනු.]

**18. ආරෝපිතා භන්තේ උක්ඛලි.**

[ස්වාමීනි, සැළිය උඳුනෙහි නංවන ලදී.]

**19. ඕලෝකෙත්වා ඒකවාරමත්තං දබ්බියා මන්ථේහි.**

[පරීක්ෂා කොට එක් වරක් පමණ හැන්දෙන් කලතනු.]

**20. ආම භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**(අ) න තේ කට්ඨානි භින්නානි න තේ උදකමාභතං**
**අග්ගි'පි තේ න හාපිතෝ කින්නු මන්දෝ'ව ඣායසි.**

**(ජාතකට්ඨකථා)**

## අමාරු වචන

**03. භත්තපචනවේලා (ඉ) - බත් පිසින වේලාව.**

**05. කට්ඨ (න)- දර. ජින්න (ති)- සිඳින ලද, පලන ලද.**
**භින්දති (√භිදි+ංඅ+ති)- බිඳියි. ආහරති (ආ√හර+අ+ති)- ගෙන එයි.**

**06. භියෝ (නි)- ඊයේ. සායන්හ (පු)- සවස. භින්න (ති)- බිඳින ලද. ආභත (ති)- ගෙන එන ලද.**

**07. උද්ධන (න)- උඳුන, ලිප. සජ්ජේති (√සජ+ණෙ+ති)- පිළියෙල කරයි, සදයි.**

**09. වඩ්ඪේති (√වඩ්ඪ+ණෙ+ති)- වඩයි.**

**10. අග්ගිමඤ්ජූසා (ඉ)- ගිනි පෙට්ටිය.**

**11. පටිදේති- ආපසු දෙයි.**

**12.** නත්ථි වත- නැත්තේය. අග්ගිමඤ්ජුසාදණ්ඩ- ගිනිකූර.
**13.** අභිනව (ති) - අලුත්. ගණ්හාති (√ගහ+ණ්හා+ති) - ගනියි.
**14.** වඩ්ඪිත (ති) - වඩන ලද.
**15.** තණ්ඩුල (න) - සහල්. උක්ඛලි (ඉ) - සැළිය.
පක්ඛිපති (ප√ඛිප+අ+ති) - දමයි, බහාලයි.
**16.** පක්ඛිත්ත (ති) - දමන ලද.
**17.** ආරෝපේති (ආ√රුහ+ණෙ+ති) - නංවයි.
**18.** ආරෝපිත (ති) - නංවන ලද.
**19.** වාර (පු) - අවස්ථාව, වාරය.

(අ) තේ- තා විසින්. කට්ඨානි- දර. න භින්නානි- නොබිඳන ලද්දේය.
තේ- තා විසින්. උදකං- ජලය. න ආහතං- රැගෙන නො එන ලදී.
තේ- තා විසින්. අග්ගි'පි- ගිනි ද. න භාපිතෝ- නො දල්වන ලදී.
කින්නු (කිං+නු)- කවර හේතුවෙන්. මන්දෝ'ව- මන්ද බුද්ධිකයකු
මෙන්. ඣායසි- විතර්ක කරන්නෙහි ද?

පාළියට නගනු.

**01.** දර පලන ලද්දේ ද?
**02.** ස්වාමීනි, තවම දර නොපලන ලද්දේය.
**03.** වතුර ගෙන එන ලද්දේ ද?
**04.** ස්වාමීනි, තවම නොගෙන එන ලදී.
**05.** ලිප සකස් කරන ලද්දේද?
**06.** ස්වාමීනි, සකස් කරන ලදී.
**07.** ගිනි දෙන ලද්දේද? (ගිනි දැල්වීද?)
**08.** ගිනි පෙට්ටිය තිබේද?
**09.** ගිනි පෙට්ටියෙහි ගිනිකූරු නැත.
**10.** සහල් සෝදා අවසන් වීද? (සහල් සෝදන ලද ද?)
**11.** හැළිය කොහිද?
**12.** හැළිය ලිප මත තබනු.
**13.** එක් වරක් හැන්දෙන් කලතනු.

## උපකාරක පාඨ

**11. කොහිද ?- කහං, කත්ථ ?**

**12. නංවනු - ආරෝපේහි.**

## 05. යාවපක්කසමයා කථාසල්ලාපෝ
[පිසෙන තුරු කථා සල්ලාපය.]

**01.අග්ගිං ජාලේහි, අලාතං උක්ඛිප.**
[ගිනි දල්වනු. ගිනි පෙනෙල්ල ඔසවනු.]

**02.අග්ගි භන්තේ ජලතේ'ව.**
[ස්වාමීනි, ගිනි දැල්වේමය.]

**03.නිස්සාවං පරිස්සාවේහි.**
[බත් කැඳ පෙරනු.]

**04.පරිස්සාවිතෝ භන්තේ නිස්සාවෝ.**
[ස්වාමීනි, කැඳ පෙරන ලදි.]

**05.තේනහි අංගාරානං උපරි උක්ඛලිං ඨපෙත්වා සේදේහි.**
[එසේ වී නම් අඟුරු මත්තෙහි සැළිය තබා තම්බනු.]

**06.න ආගතෝ භන්තේ උස්මා.**
[ස්වාමීනි, හුමාලය එනු නො ලැබේ.]

**07.යදි ඒවං උදකේන පරිප්ඵෝසෙත්වා පුන සේදේහි.**
[එසේ නම් ජලයෙන් ඉස නැවත තම්බනු.]

**08.පක්කං මඤ්ඤේ, වීමංසාහි.**
[පැසෙන ලදැයි සිතමි, පරීක්ෂා කර බලනු.]

**09.දස්සේහි ආවුසෝ. හා......න පච්චති, උත්තණ්ඩුලමේව.**
[ඇවැත්නි, පෙන්නනු. හා.... පැසෙනු නො ලැබේ. නොතැම්බුණු සහල්මය.]

**10.ඒවං සති කිං කාතබ්බං ?**
[එසේ වන කල්හි කුමක් කළ යුතු ද?]

**11.නා'හං ජානාමි. ත්වමේව යථානුරූපං කරෝහි.**
[මම නොදනිමි. නුඹ වහන්සේම සුදුසු පරිදි කරව.]

**12.ඉදං කීදිසං ? මයා උදකේන පරිප්ඵෝසෙත්වා පුන සේදිතං.**
[මෙය කෙසේද? මා විසින් ජලය ඉස නැවත තම්බන ලදී.]

**13.ඉදං උත්තණ්ඩුලං, ඉදං පන අතිකිලින්නං.**
[මේ නොතැම්බුණු සහල්ය, මේ වනාහි බෙරි වූ සහල්ය.]

**14.ඒවං සති අජ්ජ සමපාකං කාතුං න සක්කා, ස්වේව සාධුකං පචිස්සාමි.**

[එසේ වන කල්හි අද (සහල්) හොඳින් පිසින ලද්දක් කිරීමට නො හැක්කේය, හෙටම හොඳින් පිසින්නෙමි.]

**15.හෝතු ආවුසෝ. භික්ඛුසාමණේරා ඉමමේව පරිභුඤ්ජිස්සන්ති. සමත්තං නනු ආවුසෝ පචනකිච්චං?**

[ඇවැත්නි වේවා (කම් නැත). භික්ෂු සාමණේරයන් වහන්සේලා මෙයම වළඳන්නාහ. ඇවැත්නි, පිසින කිස නොනිමි ද?]

**16.ඒවං භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**17.යදි ඒවං අග්ගිජාලං විජ්ඣාපේහි, අඞ්ගාරේ’පි නිබ්බාපේහි.**

[එසේ නම් ගිනි දැල් නිවනු. ගිනි අඟුරු ද නිවනු.]

**18.ආම භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**(ක) උත්තණ්ඩුලං කිලින්න’න්ති හත්තං දානි’වමඤ්ඤරේ**
**පෝරාණා යථාලද්ධේන ථේරා යාපෙන්ති සාසනේ.**

---

**අමාරු වචන.**

**01. ජාලේති (√ජල+ණෙ+ති) - දල්වයි. අලාත (න) - ගිනි පෙනෙල්ල. උක්ඛිපති (උ√ඛිප+අ+ති) - ඔසවයි.**

**02. ජලති (√ජල+අ+ති) - දිලිසෙයි, දැල්වේ.**

**03. නිස්සාව (පු) - බතින් පෙරූ කැඳ. පරිස්සාවේති (පරි√සව+ණෙ+ති)- පෙරයි.**

**04. පරිස්සාවිත (ති) - පෙරූ, පෙරන ලද.**

**05. අඞ්ගාර (පු/න)- අඟුරු. උපරි (නි)- මත. ඨපේති (√ඨා+ණාපෙ+ති) - පිහිටුවයි, තබයි. සේදේති (√සිද+ණෙ+ති) - හුමාලයෙන් තම්බයි.**

**06. උස්මා (ඉ)- හුමාලය.**

**07. පරිප්ඵෝසේති (පරි√ඵුස+ණෙ+ති) - ඉසියි, අනිකක් මත විසුරුවයි.**

**08. පක්ක (ති)- පැසුණු. මඤ්ඤේ (නි)- හඟිමි. වීමංසති (√මාන+ස+ති)- විමසයි.**

**09.** දස්සේති (√දිස+ණෙ+ති) - දක්වයි, පෙන්වයි. උත්තණ්ඩුල (ති) - නොතැම්බුණු සහල් ඇති.
**10.** ඒවං සති- එසේ ඇති කල්හි.
**11.** ජානාමි (√ඤා+නා+ති) - දනිමි. යථාරූපං - සුදුසු පරිදි.
**12.** කීදිස (ති) - කෙබඳු, කොයි ආකාර. සේදිත (ති) - තෙත් වූ.
**13.** අතිකිලින්න (ති) - අතිශයින් තෙත් වූ.
**14.** අජ්ජ- අද. සමපාක (ති) - හොඳින් පිසින ලද. සක්කා (නි) - හැකිය. (ආඛ්‍යාත පදයක් වශයෙන් "සක්කොමි" යනුවෙන් ද යෙදිය හැක.) සුවේ (ස්වේ) - හෙට
**15.** හෝතු - වේවා (එසේ වේවා!). භුඤ්ජති (පරිභුඤ්ජති) - වළදයි. සමත්ත (ති) - අවසන් කළ.
**17.** විජ්ඣාපේති - ( වි√ඣෙ+ණාපෙ+ති) නිවා දමයි. නිබ්බාපේති - (නි√වා+ණාපෙ+ති) නිවයි.
(ගිනිදැල්ල පමණක් නිවීමට "විජ්ඣාපේති" යන්න භාවිත කොට, සම්පූර්ණයෙන් ඉතිරි නොවන පරිදි ගිනි නිවීමට "නිබ්බාපේති" යන්න යොදනු.)

(අ) දානි - දැන්. භත්තං - බත. උත්තණ්ඩුලං ඉති - නොතැම්බුණු සහල් ඇතැයි ද. කිලින්නං ඉති - බෙරි වී ඇතැයි ද. අවමඤ්ඤරේ - පහත් කොට සිතත්. සාසනේ - බුදු සසුන්හි. පෝරාණා - පුරාණයෙහි සිටි. ථේරා - තෙරවරු. යථාලද්ධේන - ලැබුණු පරිද්දෙන්. යාපෙන්ති - යැපෙත්.

පාළියට නගනු.

**01.** ගිනි දල්වන්න.
**02.** ගිනි දැල්වේ.
**03.** (බතින් පෙරූ) කැඳ පෙරීමට කාලයයි. (කැඳ වෙන් කරගැනීමට කාලයයි).

**04.** හැළිය ලිපෙහි තබනු.

**05.** හුමාලය පැමිණේද?

**06.** ජලය ඉස තම්බනු.

**07.** නොපැමිණෙන ලදැයි සිතමි. පරීක්ෂා කොට බලනු.

**08.** පෙන්වන්න. පැසී ඇත්තේ නොවේ ද?

**09.** මේ බත් නොපැසී ඇත්තේය. මේ බත් බෙරි වී ඇත්තේය.

**10.** හෙට හොඳ හැටි බත් පිසින්න.

**11.** ගිනි නොනිවනු.

**12.** මෙකල භික්ෂූහු ලද දෙයින් නොයැපෙත්.

## 06. පාතරාසවේලායං කථාසල්ලාපෝ.

[හීල දන් වේලාවෙහි කථා සල්ලාපය.]

**01. සුණ භන්තේ, කිංසද්දෝ?**

[ස්වාමීනි, අසනු මැනවි කිනම් ශබ්දයෙක් ද?]

**02. පාතරාසවේලා ආවුසෝ, තස්මා භත්තග්ගේ භත්තසජ්ජනත්ථාය කාලාරෝචනසද්දෝ'යං.**

[ඇවැත්නි (මේ) හීල දන් වේලාවයි. එබැවින් මෙය බොජුන් හලෙහි බත් පිළියෙල කිරීම පිණිස කාලය දන්වන ශබ්දයයි.]

**03. න පහටෝ නු සජ්ජෙත්වා නිට්ඨිතකාලේ?**

[පිළියෙල කොට නිම කල්හි නොගසන ලද්දේ ද?]

**04. සජ්ජෙත්වා නිට්ඨිතකාලේ'පි දසවාරමත්තං අයෝදණ්ඩං පහරිස්සති.**

[පිළියෙළ කොට නිම කල්හි ද දස වරක් පමණ යකඩ දණ්ඩට පහරදෙන්නේය.]

**ටාං.....ටාං......ටාං.......**

**05. සච්චං භන්තේ, ඉදානේව පහටෝ.**

[ස්වාමීනි සත්‍යය, මේ දැන්ම ගසන ලදී.]

**06. අයං භත්තභුඤ්ජනත්ථාය කාලාරෝචනසද්දෝ. ගච්ඡාම භත්තග්ගං.**

[මේ (ශබ්දය) දන් වැළඳීම පිණිස කාලය දන්වන ශබ්දයයි. දන් හලට යමු.]

**07. ආරෝචේතු මේ භන්තේ, භත්තග්ගවත්තං.**

[ස්වාමීනි, මට බොජුන් හලෙහි වතාවත් සැළ කරන සේක්වා.]

**08. හත්ථඤ්ච ධෝවිත්වා මුඛඤ්ච වික්ඛාලෙත්වා පත්තෝ චේව භාජනං ච වාමහත්ථෙන පටිග්ගහේතබ්බං.**

[අත ද සෝදා මුහුණ ද දොවා පාත්‍රය ද භාජනය ද වමතින් පිළිගත යුතු.]

**09. සචේ භුඤ්ජමානස්ස යං කිඤ්චි උපනාමේති, කිං කාතබ්බං ?**

[ඉදින් වළඳන්නහු හට යම් කිසිවක් එළවයි ද (ගෙනැවිත් දෙයි ද) එවිට කුමක් කළ යුතු ද ?]

**10. හත්ථපාසං පාපෙත්වා පටිග්ගහේතබ්බං.**

[අත්පසට පමුණුවා පිළිගත යුතු.]

**11. භුඤ්ජමානේන කිං කාතබ්බං ?**
[වළඳන්නහු විසින් කුමක් කළ යුතු ද ?]

**12. භුඤ්ජමානේන සේඛියවත්තං පූරෙත්වා පටිසඞ්ඛා යෝනිසෝ ඛාදනීයං ච ඛාදිතබ්බං. භෝජනීයං ච භුඤ්ජිතබ්බං.**
[වළඳන්නහු විසින් සේඛියා වත් පුරා නුවණින් කරුණු බලා කෑ යුතු දෑ ද කෑ යුතු. බුදිය යුතු දෑ ද බුදිය යුතු.]

**13. කේසුචි විහාරේසු "ඉධ සූපං දේථ. ඉධ බ්‍යඤ්ජනං දෙථා"ති කථාසද්දේහි චේව කටච්ඡුපාතිසද්දේහි ච හත්තග්ගේ අතිවිය කෝලාහලෝ හෝති. කච්චි භන්තේ ඉධා'පි ඒදිසෝ'ව හෝති.**
[මෙහි සූප දෙව. මෙහි ව්‍යඤ්ජන දෙවැ යි කිසියම් විහාරයන්හි කථා ශබ්දයන්ගෙන් ද හැඳි භාජන ගැටීම් ශබ්දයන්ගෙන් ද බොජුන් හලෙහි බොහෝ කෝලාහලයක් වෙයි. ස්වාමීනි කිමෙක් ද ? මෙහිදු එලෙසටම වෙයි ද?]

**14. නයි'ධ කෝලාහලෝ හෝති. සබ්බේ තුණ්හීභූතා පටිසඞ්ඛාය යෝනිසෝ භුඤ්ජන්ති.**
[මෙහි කෝලාහලයෙක් නොවෙයි. සියල්ලෝම නිශ්ශබ්ද වූවාහු සිහි නුවණින් කරුණු සළකා දන් වළඳත්.]

**15. පමෝදාමි භන්තේ, හත්තග්ගවත්තං සුත්වා.**
[ස්වාමීනි, (මම) බොජුන් හලෙහි වතාවත් අසා සතුටු වෙමි.]

**(ක) යේභුයෙය්න හත්තග්ගම්හි- කටච්ඡුහි කථාහි ච**
**කෝලාහලෝ යථා හෝති- තථා මා හෝතු සෝ ඉධ.**

**(ඛ) සෙය්‍යෝ අයෝගුළෝ භුත්තෝ- තත්තෝ අග්ගිසිඛූපමෝ.**
**යඤ්චේ භුඤ්ජෙය්‍ය දුස්සීලෝ- රට්ඨපිණ්ඩං අසඤ්ඤතෝ.**

අමාරු වචන.

**01. සුණාහි- අසනු. කිං සද්දෝ- කිනම් ශබ්දයක් ද?**

**02.** **හත්තග්ග (න)- ආහාර අනුභව කරන තැන හෝ ශාලාව.**
**හත්තසජ්ජනත්ථ (හත්ත+සජ්ජන+අත්ථ)- බත්+ පිළියෙළ කිරීම+ අර්ථය (බත් පිළියෙළ කිරීම පිණිස)**
**කාලාරෝචනසද්ද (කාල+ආරෝචන+සද්ද)- කාලය+දන්වන+ හඬ**

**03.** **නිට්ඨිත (ති)- නිම වූ.**

**04.** **අයෝදණ්ඩ- යකඩ දණ්ඩ.**

**06.** **භුඤ්ජන (න)- අනුභව කිරීම.**

**08.** **හත්ථ (පු)- අත. වික්ඛාලේති (වි√ඛාල+ණෙ+ති)- සෝදයි. භාජන (න)- භාජනය. වාමහත්ථ- වම් අත. (මෙම වාක්‍යයෙහි "පත්තෝ" යන්න අපේක්ෂා නොකොට " පටිග්ගහේතබ්බං" යැයි තබා ඇත. පටිග්ගහේති (පටි√ගහ+ණෙ+ති)- පිළිගනියි. පටිග්ගහිත (ති)- පිළිගන්නා ලද.**

**09.** **භුඤ්ජමාන- අනුභව කරන්නේ. යං කිඤ්චි- යම් කිසි උපනාමේති (උප√නමු+ණෙ+ති)- එළවයි, ගෙනැවිත් දෙයි.**

**10.** **හත්ථපාස (පු)- දෙරියන් හමාරක් පමණ දුර. පාපේති (පා√අප+ණෙ+ති)- පමුණුවයි.**

**12.** **පූරෙත්වා- පුරා, සම්පූර්ණ කොට. ඛාදනීය (ති)- කඩා කෑ යුතු. කැවිලි. භොජනීය (ති)- අනුභව කළ යුත්ත (ආහාරය.) ඛාදති (√ඛාද+අ+ති)- කයි.**

**13.** **කේසු චි - කිසියම්. ඉධ- මෙහි (මේ හෝජුන් හලෙහි/ දාන ශාලාවෙහි). සූප (පු)- මැල්ලුම, වඤ්ජනය, හොදි නැති ව්‍යඤ්ජනය (පරිප්පු ආදී). බ්‍යඤ්ජන (න)- මාළුපිනි ආදිය. කථාසද්ද- කථා කරන ශබ්දය. කටච්ඡු (පු)- හැන්ද. පාති (ඉ)- තලිය, භාජනය. අතිවිය- අතිශයින්. කෝලාහල (පු/න) කෝලාහලය, දබරය. කච්චි (නි)- කිමෙක්ද?**

**14.** **තුණ්හීභූත (ති)- නිශ්ශබ්ද වූ.**

**15.** **පමෝදති (ප√මුද+අ+ති)- සතුටු වේ, ප්‍රීතිමත් වේ. සුත්වා- අසා.**

**(අ) යේභුයෙය්න - බොහෝ සෙයින්. හත්තග්ගම්හි- බොජුන් හලෙහි. කට්ච්ඡුහි- හැඳි වලින් ද. කථාහි ච- කථා කරන ශබ්දයෙන්ද. කෝලාහලෝ- කෝලාහල (කල කල ශබ්දය). හෝති යථා- වන්නාසේ. තථා- එසේ. සෝ- ඒ කෝලාහල ශබ්දය. ඉධ- මේ දන් හලෙහි. මා හෝතු- නොවේවා.**

**(ආ) තත්තෝ- රත් වූ. අග්ගිසිඛූපමෝ- ගිනි සිළක් හා සමාන. අයෝගුළො- යකඩ ගුළි. භුත්තෝ- අනුභව කළේ. [සමානෝ- සමානවූයේ, වූයේ]. සෙය්‍යෝ - උතුම්ය. දුස්සීලෝ- දුස්සීල තෙමේ.රට්ඨපිණ්ඩං- රට වැසියන්ගේ දානය. අසඤ්ඤතෝ- කාය වාග් සංවරය නොමැතිව. භුඤ්ජෙය්‍ය- වළඳන්නේ ද. යඤ්චෙ සෙය්‍යෝ- (එසේ වැළඳීම) උතුම් නොවේ.**

**["යඤ්ච" යන්න පටිසේධ අර්ථ ඇති නිපාතයකි. /ධම්මපදට්ඨකථා]**

**පාළියට නගනු.**

**01.** අසන්න. ඒ කිනම් ශබ්දයක් ද?

**02.** ඒ කාලය ගැන කියැවෙන හඬකි.

**03.** බත් පිළියෙළ කොට අවසන් වූ කල්හි ද ගෙඩිය ගසනු ලැබේද?

**04.** අත් සෝදනු. මුඛය ද සෝදනු.

**05.** උන්වහන්සේ දන් පිළිගන්වයි. පිළිගනු මැනවි.

**06.** අත්පස සිටින සේ සමීප වන්න.

**07.** බත් පිඬු කොට සකසනු.

**08.** මෙහි දානය ගෙන එනු මැනවි.

**09.** දාන ශාලාවෙහි කෝලාහල ශබ්දයකි.

**10.** හැඳි හා කෝප්ප තදින් නොගටනු.

**11.** නිශ්ශබ්දව වළඳනු.

**12.** ලෝ ගුළි කෑම උතුම්ය. සංවරයෙන් තොරව රට වැසියන්ගේ දානය වැළඳීම උතුම් නොවේ.

## 07. හත්තකිච්චපරියෝසානේ කථාසල්ලාපෝ.
[බත් කිස අවසානයෙහි කථා සල්ලාපය.]

**01. හත්තකිච්චපරියෝසානේ කිං කාතබ්බං ?**
[බත් කිස අවසානයෙහි කුමක් කළ යුතු ද?]

**02. පත්තධෝවනට්ඨානං ගන්ත්වා අත්තනෝ පත්තෝ ධෝවිතබ්බෝ.**
[පාත්‍ර සෝදන ස්ථානයට ගොස් තමන්ගේ පාත්‍රය සේදිය යුතුය.]

**03. කේසුචි විහාරේසු ධෝවනට්ඨානේ'පි යං වා තං වා මුඛාරුළ්හකථං කථෙන්ති, කිං පන භන්තේ, ඉධා'පි ඒවමේව හෝති ?**
[කිසියම් විහාරයන්හි පාත්‍ර සෝදන තැනෙහිදු යම් ඒ කටට ආ කථාවක් කථා කරත්. ස්වාමීනි කිමෙක් ද? මෙහිදු එසේම වෙයි ද?]

**04. න'යිධ ආචරියෝ අනුජානාති තාදිසං (කථං) කථේතුං.**
[ආචාර්යයන් වහන්සේ මෙහි එවැනි (කථාවක්) කථා කිරීමට නොම අනුදනියි.]

**05. යදි ආචරියෝ නා'නුජානාති, න කථෙන්ති නු දහරසාමණේරා යං වා තං වා මුඛාරුළ්හකථං ?**
[ඉදින් ආචාර්යයන් වහන්සේ අවසර නොදෙයි නම් කුඩා සාමණේරවරු යම් ඒ කටට ආ කථාවක් කථා නොකරත් ද?]

**06. ඒවං ආචරියේන වාරියමානා'පි දහරසාමණේරා කථෙන්තියේව යං වා තං වා මුඛාරුළ්හකථං.**
[මෙසේ ආචාර්යයන් වහන්සේ විසින් වළක්වනු ලබන්නාහු ද කුඩා සාමණේරවරු යම් ඒ කටට ආ කථාවක් කථා කරත්.]

**07. ඒවං නු ?**
[එසේද?]

**08. ඒවමේව.**
[එසේමය.]

**09. අහෝ අච්ඡරියෝ වානෙය්‍යකානං දුබ්බචභාවෝ.**
[වනයේ වසන්නවුන්ගේ අකීකරුබව අහෝ ආශ්චර්යය.]

**10. ආම ආවුසෝ.**
[ඇවැත්නි, එසේය.]

**11. යේභුයෝ්‍යන භාජනධෝවනට්ඨානේ උච්ඡිට්ඨෝදකේන චන්දනිකා විය හෝති. ඉධ පන කිං හෝති ?**

[බොහෝ සෙයින් බඳුන් සෝදන තැන ඉඳුල් වතුරෙන් ගවර වළක් මෙන් වෙයි.මෙහි වනාහි කෙසේ වෙයි ද?]

**12. ඉධ පන සසිත්තකං භාජනධෝවනං බහිආරාමං ඡඩ්ඩෙන්ති. අසිත්ථකං පන රජුට්ඨානට්ඨානේ වා මාලාවච්ඡේසු වා ඕසිඤ්චන්ති.**

[මෙහි වනාහි බත්තුළු සහිත වතුර ආරාමයෙන් පිටතට විසි කරත්. බත්තුළු රහිත වතුර වනාහි දූලි නගින තැන හෝ මල් ගස් වලට හෝ ඉසිත්.]

**13. කිං පන භන්තේ ඕළාරිකධෝවනමත්තේනේව ධෝවනකිච්චං නිට්ඨාති ?**

[කිමෙක්ද ස්වාමීනි දළ සේදීම් මාත්‍රයෙන්ම සෝදන කෘත්‍යය නිම වේද?]

**14. නා'වුසෝ තත්තකමත්තේන නිට්ඨාති, පුන නහානීයපිණ්ඩියා උබ්බට්ටෙත්වා ධෝවිතබ්බෝ.**

[ඇවැත්නි එපමණකින්ම නිම නොවෙයි, නැවත සබන් උලා සේදිය යුතු.]

**15. තතෝ පරං කිං කාතබ්බං ?**

[ඉන් අනතුරුව කුමක් කළ යුතු ද ?]

**16. තතෝ පරං පත්තපුඤ්ඡනේන පුඤ්ඡිත්වා පත්තථවිකායං පක්ඛිපිතබ්බෝ කාලේ සම්පත්තේ පිණ්ඩාය චරිතුං, අපිතු ඉමස්මිං විහාරේ පාතරාසභත්තපරියෝසානේ ඕවාදපටිග්ගහණත්ථාය චේව උග්ගහේතබ්බස්ස ච ගන්ථස්ස උග්ගහණත්ථාය පත්තපුඤ්ඡනපරියෝසානේ ආචරියුපට්ඨානං ගච්ඡන්ති.**

[ඉන් අනතුරුව කල් එළැඹි විට පිඩු පිණිස හැසිරීම පිණිස පාත්‍ර පිසිනයෙන් පිස පාත්‍ර ථවිකයෙහි බහාලිය යුතු, නමුදු මේ විහාරයෙහි හීල දානය අවසානයෙහි අවවාද ලබා ගැනීම පිණිස ද උගත යුතු ග්‍රන්ථයන් ඉගෙනීම පිණිස ද පාත්‍ර පිස දැමීම් අවසානයෙහි ගුරු උවැටන් පිණිස යත්.]

**17. කිං පන භන්තේ, පත්තථවිකායං පක්ඛිපිත්වා පුන ධෝවිතබ්බෝ ?**

[කිමෙක්ද ස්වාමීනි, පාත්‍ර ථවිකයෙහි බහා ලා නැවත (පාත්‍රය) සේදිය යුතු ද?]

**18. පත්තථවිකායං පක්ඛිපත්වා'පි අන්තෝපත්තේ සංසුද්ධඋදකං ආකිරිත්වා ආලෝළෙත්වා ඕසිඤ්චිතබ්බං. විනයධරා පන භික්ඛූ එවං කත්වා'පි පත්තං පුන පටිග්ගණ්හන්ති.**

[පාත්‍ර ථවිකයෙහි බහා ලා ද පාත්‍රය තුළට පිරිසිදු වතුර වත් කොට කළතා ජලය විසි කළ යුතු. විනයධර භික්ෂූහු වනාහි එසේ කොට ද පාත්‍රය නැවත

පිළි ගනිති.]

(අ) හිත්වා සතපලං කංසං - සෝවණ්ණං සතරාජිකං
අග්ගහිං මත්තිකාපත්තං තං දුතියාභිසේචනං

(ආ) ඒවං'භිසේකභණ්ඩං'ව බුද්ධාදීහි මමායිතං
තං පත්තං නා'තිමඤ්ඤෙය්‍ය- සද්ධාපබ්බජිතෝ යති.

අමාරු වචන.

**04.** නා'නුජානාති (න+අනුජානාති)- අවසර නොදෙයි.
**05.** දහර (පු)- තරුණ.
**06.** වාරියමාන (ති)- වළක්වනු ලබන. කථෙන්ති යේව- කථා කරත්මය.
**07.** ඒවං නු? - එසේද?
**08.** ඒවමේව- එසේමය.
**09.** අහෝ (නි)- විශ්මය ප්‍රකාශ කරන නිපාතයකි. අච්ඡරිය (ති)- විශ්මය ජනක. වානෙය්‍යක (ති)- වනයෙහි වසන. දුබ්බවභාව (පු)- අකීකරු බව.
**11.** භාජන (න)- භාජනය. උච්ඡිට්ඨෝදක (උච්ඡිට්ඨ+උදක)- ඉඳුල් වතුර. චන්දනිකා (ඉ)- ගවර වළ, ගම් අසළ අපිරිසිදු දිය එක් වන තැන.
**12.** සසිත්ථක (න)- බත්තුළු සහිත. භාජනධෝවන (න)- භාජන සේදීම. බහිආරාමං- ආරාමයෙන් පිට. ඡඩ්ඩෙති (√ඡඩ්ඩ+ණෙ+ති)- විසි කරයි. රජුට්ඨානට්ඨානං (රජ+උට්ඨාන+ඨාන)- දූවිලි+නගින+ස්ථානය. මාලාවච්ඡ (පු)- මල් ගස. ඔසිඤ්චති (අව√සිච+ංඅ+ති)- ඉසියි, වත් කරයි.
**13.** ඕළාරිකධෝවනමත්තං- දළ වශයෙන් සේදීම් මාත්‍රය. නිට්ඨාති (නි√ඨා+අ+ති)- නිමවෙයි, අවසන් වෙයි.
**14.** තත්තකමත්ත (ති)- එපමණක් පමණ. නහානීයපිණ්ඩි (ඉ)- සබන්. උබ්බට්ටෙති (උ√වට්ට+ණෙ+ති)- ඇඟ උළයි, (වකාරය හට

**බකාරාදේශව ද්විත්ව වෙයි).**

**16.** **පත්තපුඤ්ජන (න)- පාත්‍ර පිසිනය. පුඤ්ඡති (√පුඤ්ඡ+අ+ති)- පිස දමයි. පත්තථවිකා (ඉ)- පාත්‍ර ථවිකය. පක්ඛිපති (ප√ඛිප+අ+ති)- දමයි, ඇතුළේ බහයි. සම්පත්ත (ති)- පැමිණි, (වැටුණු). පිණ්ඩ (පු)- බත් පිඩ. අපිතු- නමුත්. ඕවාදපටිග්ගහණ (න)- අවවාද ගැනීම. උග්ගහේතබ්බ (ති)- උගත යුතු. ආචරියුපට්ඨානං- ගුරු උවටැන.**

**18.** **සංසුද්ධ (ති)- පිරිසිදු. ආකිරති (ආ√කිර+අ+ති)- වත්කරයි,භාජනයකට හලයි. ආලෝළෙත්වා (පූ.ක්‍රි) -කළඹා, කලතා. ඕසිඤ්චති (අව√සිච+ංඅ+ති)- ඉසියි,වත් කරයි. විනයධර (පු)- විනය ශික්ෂා ඉගෙන සිටින්නා.**

**(අ) සතපලං- පලම් සියයක් බරැති. සුවණ්ණං- රනින් කළ. සතරාජිකං- සියක් රේඛා ඇති. කංසං- තලිය. හිත්වා- හැර. මත්තිකාපත්තං - මැටි පාත්‍රය යන. යං අග්ගහිං - යමක් ගත්තෙම් ද. තං - ඒ මැටි පාත්‍රය ගැනීම. දුතියා'භිසේචනං - දෙවන අභිෂේකයයි.**

**(ආ) ඒවං - මෙසේ. අභිසේකභණ්ඩං'ව - අභිෂේක භාණ්ඩයක් මෙන්. බුද්ධාදීහි - බුද්ධාදී උත්තමයන් වහන්සේලා විසින්. මමායිතං - මමායනය කරන ලද. තං පත්තං - ඒ පාත්‍රය. සද්ධාපබ්බජිතෝ- ශ්‍රද්ධාවෙන් පැවිදි වූ . යති - යතිවරයාණන් වහන්සේ (භික්ෂුව). නා'තිමඤ්ඤෙය්‍යා (නා'වමඤ්ඤෙය්‍යා) - පහත් කොට නොසිතන්නේය.**

**පාළියට නගනු.**

**01.** පාත්‍රය සෝදන ස්ථානයට ගොස් පාත්‍රය සෝදනු.

**02.** කටට ආ වචන කථා නොකරන්න.

**03.** මෙවැනි කථාවන් කිරීමට ආචාර්‍යයින් වහන්සේගෙන් අවසර නැත.

**04.** භාජන සෝදන වතුර නිසා ගවර වළක් හට ගෙන ඇත.

**05.** බත් ඇට රහිත වතුර දූවිලි නගින තැනකට විසි කරනු. (වත් කරනු.)

**06. සාමාන්‍ය වතුරෙන් සෝදා හමාර නැත.**

**07. සබන් වලින් මැද පාත්‍රය සෝදනු.**

**08. පාත්‍රය පිසින තුවායෙන් පාත්‍රය පිසිනු. පාත්‍රය පාත්‍ර ථවිකයේ බහාලනු.**

**09. පාත්‍රය ථවිකයෙහි ලා නැවත වරක් පාත්‍රය ඇතුළ සෝදනු.**

**10. වතුර වත් කොට කලතා වත් කරනු.**

**11. ඔබවහන්සේගේ පාත්‍රය යකඩ පාත්‍රයක් ද? මැටි පාත්‍රයක්ද?**

**උපකාරක පාඨ**

**11. යකඩපාත්‍රය- අයෝපත්තෝ. මැටි පාත්‍රය- මත්තිකාපත්තෝ.**

## 08. භික්ඛාචරවේලායං කථාසල්ලාපෝ.

[පිඩු පිණිස හැසිරෙන වේලාවෙහි කථා සල්ලාපය.]

**01. කතිනාඩිකා භෝ ?**

[පින්වත, වේලාව කීයද ?]

**02. ඡන්නාඩිකා භන්තේ.**

[ස්වාමීනි, වේලාව හයයි.]

**03. ඒවං සති භික්ඛාචරවේලා උපකට්ඨා. පත්තං සජ්ජේහි.**

[එසේ වී නම් පිඩු පිණිස හැසිරෙන වේලාව සමීප
වීය. පාත්‍රය සූදානම් කරනු.]

**04. න තාව මේ පත්තෝ ධෝවිතෝ.**

[ (ස්වාමීනි) මාගේ පාත්‍රය තවම නො සෝදන ලදී.]

**05. කස්මා කාලස්සේව න ධෝවිතෝ ? ඉදානේව ධෝව. ධෝවිත්වා පත්තථවිකායං පක්ඛිප.**

[කවර හෙයින් කලියෙන්ම නොසෝදන ලද්දේ ද?
දැන්මම සෝදනු. සෝදා පාත්‍රථවිකයෙහි බහාලනු.]

**06. සජ්ජිතෝ මේ භන්තේ, පත්තෝ.**

[ස්වාමීනි, මාගේ පාත්‍රය සූදානම් කරන ලදී.]

**07. තේනහි ආයාම, නගරං පිණ්ඩාය පවිසිස්සාම.**

[එසේ වී නම් යමු, පිඩු පිණිස නගරයට පිවිසෙන්නෙමු.]

**08. සුකරං නු භන්තේ, ඉදං නගරං උඤ්ඡේන පග්ගහේන යාපේතුං ?**

[ස්වාමීනි, මේ නගරය පිඩු සිඟීමෙන් යැපීමට පහසු වේද?]

**09. න සුකරං ආවුසෝ, ත්වං චරන්තෝ "අතිච්ඡථ භන්තේ" ති සද්දං බහුං සුණිස්සසි.**

[ඇවැත්නි, පහසු නොවෙයි, නුඹ වහන්සේ (පිඩු පිණිස) හැසිරෙනුයේ
(නිවෙස් වලින්) "ස්වාමීනි අන් නිවෙසකට වඩිනු මැනවැ"යි ශබ්දය
බොහෝ අසන්නෙහිය.]

**10. ඒවං නු භන්තේ ?**

[ස්වාමීනි, එසේද?]

**11. ඒවමේව ආවුසෝ.**

[ඇවැත්නි, එසේමය.]

**12. න ලබ්භති නු පිණ්ඩෝ යාපනමත්තම්පි ?**

[යැපීමට තරම්වත් පිඩු නො ලැබේද?]

**13. යාපනමත්තං පන ලබ්භති. අපිතු අතිපාතෝ ගන්ත්වා අතිදිවා පච්චාගච්ඡති.**

[යැපීමට තරම් නම් ලැබේ. නමුදු ඉතා උදෑසන ගොස් ඉතා දිවා කල ආපසු පැමිණෙයි.]

**14. අතිදුක්කරං භන්තේ.**

[ස්වාමීනි, බොහෝ දුෂ්කරය.]

**15. ඒවමේව ආවුසෝ.**

[ඇවැත්නි, එසේමය.]

**16. පිණ්ඩාය ගච්ඡන්තේන පන කථං ගන්තබ්බං ?**

[පිඩු පිණිස යන්නහු විසින් කෙසේ යා යුතුද?]

**17. පිණ්ඩාය ගච්ඡන්තේනා'වුසෝ පරිමණ්ඩලං නිවාසෙත්වා සුප්පටිච්ඡන්නං පාරුපිත්වා ඔක්ඛිත්තචක්ඛුනා ගන්තබ්බං. න පන අන්තරවාසකඋත්තරාසඞ්ගෝ පුරතෝ වා පච්ඡතෝ වා ඔලම්බෙන්තේන තහං තහං ඔලෝකෙන්තේන ගන්තබ්බං.**

[ඇවැත්නි, පිඩු පිණිස යන්නහු විසින් (අඳනය) හාත් පසින් වට කොට හැඳ (සිවුර) මනා කොට පොරවා බිම හෙළූ නෙත් ඇතිව යා යුතු. අඳන සිවුරු ඉදිරියෙන් හෝ පිටු පසින් එල්ලෙමින් ඒ මේ අත බලනුයේ නො යා යුතු.]

**18. ඉදං සේඛියවත්තං අහම්පි ජානාමි.**

[මේ සේඛිය වතාවත මමත් දනිමි.]

**(අ) පච්චති මුනිනෝ භත්තං- ථෝකං ථෝකං කුලේ කුලේ**
**පිණ්ඩිකාය චරිස්සාමි - අත්ථි ජඞ්ගබලං මම.**

**(ධම්මපදට්ඨකථා-දන්තවග්ගෝ)**

**(ආ) කදා'හං සත්තාහසම්මේඝේ- ඔවට්ටෝ අල්ලචීවරෝ**
**පිණ්ඩිකාය චරිස්සාමි තං- කුදාස්සු භවිස්සති.**

**(මහාජනකජාතක)**

**(ඇ) කුතෝ ලබ්භා කුලේ යාචං- මහං දෙන්තු වරං තුරං**
**සක්කච්චාසක්කච්චං දන්ධං -මා ලූඛං මය්හමප්පකං.**

**(සංයුත්තනිකාය-කස්සපසංයුත්ත)**

**අමාරු වචන.**

**01.** **නාළිකා (ඉ) - වේලාව. හේ (නි)- එම්බා, පින්වත්නි.**
**03.** **භික්ඛාචරවේලා (ඉ)- පිඬු පිණිස හැසිරෙන වේලාව.**
**05.** **කාලස්සේව (කාලස්ස+ඒව)- කලියෙන්ම.**
**07.** **ආයාම (ආ+යාම) - එන්න, යමු.**
**08.** **උඤ්ඡා (ඉ)- ආයසීන් වහන්සේලාගේ ක්‍රමයට පිඬු සෙවීම,සිඟීම,ඉල්වීම.**
**09.** **අතිච්ඡථ හන්තේ (අති+ඉච්ඡථ+හන්තේ)- මේ නිවස අතහැර (ඉක්මවා) අර නිවසට වඩිනු මැනවි.**
**12.** **ලබ්භති (√ලභ+ය+ති)- ලැබේ.**
**13.** **යාපනමත්තං - යැපීමට සෑහෙන පමණ. අතිපාතෝ- බොහෝ වේලාසනින්. පච්ඡාගච්ඡති - ආපසු පැමිණෙයි.**
**14.** **අතිදුක්කරං - අති දුෂ්කරය.**
**17.** **පරිමණ්ඩලං (ක්‍රි.වි.)- වටරවුම සිටින සේ. නිවාසේති (නි√වස+ණෙ+ති)- අඳියි. පාරුපති (පා√රුප+අ+ති)- පොරවයි. සුපටිච්ඡන්නං - සුපිළිසන්ව. ඔක්ඛිත්තචක්ඛු - පහතට හෙළූ ඇස් ඇති. අන්තරවාසක (පු)- භික්ෂූන්ගේ අඳනය. උත්තරාසංග (පු)- උතුරුසළුව. පුරතෝ (නි)- ඉදිරියෙහි, ඉදිරියෙන්. ඔලම්බෙන්ත (ති)- එල්ලෙමින්, එල්ලෙන. තහං තහං - එහි මෙහි. ඔලොකෙන්ත (ති)- බලන, බලමින්.**

**ගාථා වල අර්ථය.**

**(අ)- මුනිනෝ - භික්ෂුව හට. කුලේ කුලේ- නිවසක් නිවසක් පාසා. ථෝකං ථෝකං - ටිකෙන් ටික. හත්තං - බත්. පච්චති - පිසිනු ලැබේ. පිණ්ඩිකාය - පිඬු පිණිස. චරිස්සාමි - හැසිරෙන්නෙමි. මම - මට. ජඞ්ගබලං - ඇවිදීමට ශක්තිය. අත්ථි -**

**ඇත්තේය.**

**[ධම්මපදට්ඨකථා/මණිකාරකුලූපකතිස්සත්ථේරවත්ථු.]**

**(ආ) අහං - මම. කදා - කවදා. සත්තාහසම්මේඝේ - දින හතක් පුරාවට අඛණ්ඩව වැසි ඇති කලෙක/ හත්දාවැසි ඇති කල්හි. ඔවට්ඨෝ - වැස්සට තෙමුණේ. අල්ලචීවරෝ - තෙමුණු චීවර ඇත්තේ. (හුත්වා - වී). පිණ්ඩිකාය - පිඩු පිණිස. චරිස්සාමි - හැසිරෙන්නෙම්ද?. තං - ඒ පිඩු පිණිස හැසීරීම. කුදා - කවර කලෙක. භවිස්සති - වන්නේද?**

**[මහාජනකජාතකය.]**

**(ඇ) කුලේ - අන් නිවෙසක. යාවං (යාවන්තෝ) - සිඟන. මය්හං - මා හට. මහං - ප්‍රත්‍ය රාශියක්. දෙන්තු - දෙත්වා. අප්පකං - අල්පයක්. මා (දෙන්තු) - නො දෙත්වා. වරං - උතුම් දෑ. දෙන්තු - දෙත්වා. ලූඛං - රූක්ෂ වූ දෑ. මා (දෙන්තු) - නොදෙත්වා. සක්කච්චං - සකස් කොට. දෙන්තු - දෙත්වා. අසක්කච්චං - සකස් නොකොට. මා (දෙන්තු) - නො දෙත්වා. ඉති - මෙසේ ප්‍රාර්ථනා කොට. කුතෝ ලබ්භා - කෙසේ නම් ලැබිය හැක්කේද?**

**[නිදානවග්ග/ කස්සපසංයුත්ත.]**

**පාළියට නගනු.**

**01.** වේලාව කීයද?

**02.** ස්වාමීනි, වේලාව එකයි.

**03.** එසේ නම් ඇඳෙන් නැගිටිනු.

**04.** එහෙමයි. නැගිටින්නෙමි.

**05.** ඔබවහන්සේගේ පාත්‍රය සෝදන ලද්දේ ද?

**06.** මගේ පාත්‍රය සෝදන ලදී. ථවිකයට බහාලන ලද්දේ නොවේ.

**07.** මේ ගමෙහි පිඩු ලැබීම ලෙහෙසිද?

**08.** එසේය. පහසුය.

**09.** ස්වාමීනි, නවතිනු මැනවි. (වැඩසිටිනු මැනවි.)

**10.** කුඩා තලිය දෙනු මැනවි.

**11. පිණ්ඩපාතය (පිඬු/දානය) සෑහේද? (යැපීමට සෑහේද?)**

**12. එසේය. යැපීමට සෑහේය.**

**13. නිවෙසක් නිවෙසක් පාසා තොප හට බත් ඉදෙයි.**

**14. කවදා මම දින සතක් පුරා අඛණ්ඩ වැසි ඇති සමයෙක තෙමුණු චීවර ඇත්තේ පිඬු පිණිස හැසිරෙම්ද?**

**15. පාත්‍රය ථවිකයෙහි බහාලුවේ ද?**

**උපකාරක පාඨ.**

**09. වැඩසිටිනු මැනවි- තිට්ඨථ.**

**10. කුඩා තැටිය/ කුඩා තලිය - ථාලකං.   දෙනු මැනවි - දේතු.**

## 09. පිණ්ඩචාරිකානං කථාසල්ලාපෝ.
[පිඬු පිණිස හැසිරෙන්නවුන්ගේ කථා සල්ලාපය.]

**01. පිණ්ඩචාරිකේන පිණ්ඩං උද්දිස්ස තිට්ඨන්තේන කීවචිරං ඨාතබ්බං ?**
[පිඬු පිණිස හැසිරෙන්නාහු පිඬු උදෙසා සිටියාවූ විසින් කොතරම් කල් නැවතී සිටිය යුතුද?]

**02. ගහට්ඨානං ආකාරං සල්ලක්ඛෙත්වා නා'තිචිරං නා'තිසීඝං ඨාතබ්බං.**
[ගෘහස්තයන්ගේ ආකාරය සළකා නොබොහෝ කල් ඉක්මන් නොවී සිටිය යුතු.]

**03. කතමෝ භන්තේ, දාතුකාමානං ආකාරෝ ? කතමෝ පන අදාතුකාමානං ?**
[ස්වාමීනි, දෙනු කැමැතියන්ගේ ආකාරය කවරේද? නොදෙනු කැමතියන්ගේ ආකාරය කවරේද?]

**04. යදි භාජනං වා ධෝවති. කටච්ඡුං වා ගණ්හාති උක්ඛලිං වා ආමසති. සල්ලක්ඛෙහි තං "දාතුකාමානං ආකාරෝ"ති. අථ පන තුණ්හීභූතෝ වා නිසීදති, පරම්මුඛං වා කරෝති, "අතිච්ඡථ භන්තේ"ති වා වදති. සල්ලක්ඛෙහි තං "අදාතුකාමානං ආකාරෝ"ති.**
[ඉදින් භාජනය හෝ සෝදයි ද, හැන්ද හෝ ගනියි ද, හැළිය හෝ ස්පර්ශ කරයි ද (මෙය) දෙනු කැමතියන්ගේ ආකාරය යැයි සළකනු. එසේ නොමව නිශ්ශබ්දව හෝ වාඩිවී හෝ අනෙක් පස හැරී සිටියි ද, "ස්වාමීනි, අන් නිවෙසකට හෝ වඩිනු මැනවැයි " කියයි ද එය නොදෙනු කැමැතියන්ගේ ආකාරය යැයි සළකනු.]

**05. කතමෝ භන්තේ, සූපං වා බ්‍යඤ්ජනං වා දාතුකාමානං ආකාරෝ ?**
[ස්වාමීනි, සූප හෝ බ්‍යඤ්ජන හෝ දෙනු කැමැත්තවුන්ගේ ආකාරය කවරේද? ]

**06. පඨමං පිණ්ඩං ආකිරිත්වා යදි බ්‍යඤ්ජනථාලකං[1] ගණ්හාති.**

---

[1] **බුරුම රටේ භික්ෂූන් වහන්සේලා ව්‍යඤ්ජන දැමීම සඳහා පාත්‍රය තුළ වෙනම භාජනයක් රැගෙන යති. මෙහි ඒ භාජනයට " බ්‍යඤ්ජනථාලකං" යැයි භාවිත කොට ඇත.**

**අයමේව සූපං වා බ්‍යඤ්ජනං වා දාතුකාමානං ආකාරෝ.**
[පළමුව පිඬු බෙදා ඉදින් ව්‍යඤ්ජන තළිය ගනියි ද මෙයම සූප හෝ බ්‍යඤ්ජන හෝ දෙනු කැමැත්තවුන්ගේ ආකාරයයි.]

**07. දුක්කරා වත භන්තේ, පරපටිබද්ධා පබ්බජ්ජා.**
[ස්වාමීනි, අනුන් අයත් දිවි පැවැතුම් ඇති පැවිද්ද වනාහි දුෂ්කරය.]

**08. ආමා'වුසෝ තස්මායේව සම්මාසම්බුද්ධේනා'පි ඔවාදෝ දින්නෝ "පරපටිබද්ධා මේ ජීවිකාති පබ්බජිතේන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බ"න්ති.**
[ඇවැත්නි එසේය. එසේ හෙයින් සම්බුද්ධයන් වහන්සේ විසිනුදු " මාගේ මේ ජීවිකාව අනුන් අයත් දිවි පැවැතුම් ඇත්තෙකැයි පැවිද්දහු විසින් නිතර නිතර ප්‍රත්‍යවේක්ෂා කළ යුතු "යැයි අවවාද දෙන ලදි.]

**(අ) පබ්බජ්ජා දුක්කරා තාත - ත්වං ච සුඛුමජාතිකෝ**
**සීතේන'ත්ථේ ලභේ උණ්හං - උණ්හේ'නත්ථේ ච සීතලං.**

**(ආ) උත්තිට්ඨේ නප්පමජ්ජෙය්‍ය - ධම්මං සුචරිතං චරේ.**
**ධම්මචාරී සුඛං සේති - අස්මිං ලෝකේ පරම්හි ච.**

**(ඇ) සම්මාසම්බුද්ධභූතෝ'පි - සබ්බදා පිණ්ඩචාරිකෝ**
**තස්මා කෝ අවමඤ්ඤෙය්‍ය - පිණ්ඩෝල්‍යං බුද්ධසේවිතං.**

**(ඈ) න වෝ අරියා යාචකා'ව - දේථ දෙථා'ති යාචරේ**
**උද්දිස්ස අරියා තිට්ඨන්ති - ඒසා අරියාන'යාචනා.**

**අමාරු වචන.**

**01. පිණ්ඩචාරිකෝ - පිඬු පිණිස හැසිරෙන වත ඇත්තේ (භික්ෂුව, හෙරණ). උද්දිස්ස (පූ.ක්‍රි.) - උදෙසා/සඳහා. කීවචිරං - කොපමණ වෙලාවක්. ඨාතබ්බ (ති) - සිටිය යුතු.**

**02. ගහට්ඨ (පු) - ගෘහස්ථයා. ආකාර (පු) - ආකාරය.**

නාතිචිරං - නොබෝ කල්. නාතිසීඝං - අති සීග්‍රයෙන් නොව.

**03.** දාතුකාමෝ - දෙනු කැමැත්තේ. අදාතුකාමෝ - නොදෙනු කැමැත්තේ.

**04.** භාජන (න) - භාජනය. කටච්ඡු (පු) - හැන්ද.
ආමසති (ආ√මස+අ+ති) - අත පත ගායි, ස්පර්ශ කරයි. අථ පන - එසේ නොවී. පරමුඛ (ති) - ඉවතට හරවා ගත් මුහුණ ඇති.

**06.** බ්‍යඤ්ජනථාලකං - ව්‍යඤ්ජන තළිය.

**07.** පරපටිබද්ධ (ති) - අනුන් හා සම්බන්ධ වූ.

**08.** දින්න (ති) - දෙන ලද.

(අ) තාත - පුතණුවෙනි!. පබ්බජ්ජා - පැවිද්ද. දුක්කරා - දුෂ්කරය. ත්වං ච - තෝ ද. සුඛුමජාතිකෝ - සුවසේ වැඩුනේ වූයේය. සීතේන - ශීතයෙන්. අත්ථේ (සති) - අවැසි කල්හි. උණ්හං - උණු (ආහාර) ලභේ - ලබන්නේය. උණ්හේන ච - උණුසුමෙන් (උණුසුම් අහරින්). අත්ථේ (සති) - ප්‍රයෝජන ඇති කල්හි. සීතං - ශීත (ආහාර). ලභේ - ලබන්නේය.

(ආ) උත්තිට්ඨේ - පිඬු සිඟීමෙහි. නප්පමජ්ජෙය්‍ය - පමා නොවන්නේය. ධම්මං - පිඬු සිඟීම නැමැති චාරිත්‍රය. සුචරිතං - මනා කොට. චරේ - හැසිරෙන්නේය. ධම්මචාරී - පිඬු සිඟීමේ චාරිත්‍රයෙහි හැසිරෙන්නේ. සුඛං- සුවසේ. අස්මිං ලොකේ - මෙලොවෙහි ද. පරම්හිච - පරලොවෙහි ද. සේති - නිදයි/ වාසය කරයි.

(ඇ) සම්මාසම්බුද්ධභූතෝ (සමානෝ)'පි - ඒකාන්තයෙන් බුදු බවට පත් වූ බුදුරජාණන් වහන්සේ ද. සබ්බදා - හැම කල්හි. පිණ්ඩචාරිකෝ - පිඩු පිණිස හැසිරුනේ. (හෝති - වෙයි). තස්මා - එසේ හෙයින්. බුද්ධසේවිතං - බුදු වරයන් වහන්සේලා විසින්

සේවනය කරන ලද. පිණ්ඩෝල්‍යං - පිඬු සිඟීම් චාරිත්‍රය. කෝ - කවරෙක්. අවමඤ්ඤෙය්‍යා - පහත් කොට සිතයිද?

(ඇ) අරියා - ආයුෂ්මත් වහන්සේලා. යාචකා'ව - සිඟන්නෝ මෙන්. දේථ දේථා'ති - දෙව දෙවැයි. ඛෝ - ඒකාන්තයෙන්. න යාචරේ - සිඟා නොකන්නාහු වෙත්. අරියා - ආයුෂ්මත් වහන්සේලා. උද්දිස්ස - (ප්‍රයෝජන ඇති චිත්තයෙන්ම) පිඬු සඳහා. තිට්ඨන්ති - නවතිත්. ඒසා - ඒ පිඬු පිණිස නැවතීම. අරියානං - ආයුෂ්මත් වහන්සේලාගේ. යාචනා - සිඟීමයි.

## පාළියට නගනු.

01. පිඬු සිඟා වඩින භික්ෂුවක් දොර ඉදිරිපිට වැඩ සිටින්නේය.
02. මගේ පාත්‍රයෙහි පිඬු දමන්නේද? නොදමන්නේදැයි ගෘහස්ථයන්ගේ ආකාරය සලකුණු කරනු.
03. බුද්ධරක්ඛිත හෙරණ බොහෝ වේලාවක් ද නොවී කෙටි වේලාවක් ද නොවී පිඬු පිණිස නැවතී සිටින්නේය.
04. පාත්‍රය සෝදා පිඬු රැගෙන එනු.
05. ස්වාමීනි, අන් නිවෙසකට වඩින සේක්වා.
06. ව්‍යඤ්ජන භාජනය රැගෙන එන්න.
07. ඤාණවතී උපාසිකාව පිඬු දීම පිණිස නිවසින් පැමිණේ.
08. මාගේ ජීවිකාව අන්‍යයන් හා සම්බන්ධ වූවෙක.
09. ඔබ පිඬු සිඟායෑමේ චාරිත්‍රයෙහි අප්‍රමාද වන්න.
10. භාග්‍යවතුන් වහන්සේද පිඬු පිණිස හැසිරෙනා සේක. කවර හෙයින් මම පිඬු පිණිස නොහැසිරී ජීවත්වෙම්ද?

## උපකාරක පාඨ

01. දොර ඉදිරිපිට - ගේහද්වාර.

**02. මගේ පාත්‍රයෙහි - මම පත්තේ.**

**04. පිඬු රැගෙන එන්න - ආහාර.**

**07. ඤාණවතී උපාසිකාව- ඤාණවතී උපාසිකා.**

**10. කවර හෙයින් මම පිඬු පිණිස නොහැසිරී ජීවත්වෙම්ද? - නා'හං කස්මා පිණ්ඩාය චරිස්සාමි.**

## 10. පිණ්ඩපාතපටික්කන්තකාලේ කථාසල්ලාපෝ.

[පිණ්ඩපාතය අවසන්වී නැවත පැමිණෙන කළ කථා සල්ලාපය.]

**01. පිණ්ඩපාතතෝ පටික්කන්තකාලේ කිං කාතබ්බං ?**

[පිණ්ඩපාතය අවසන්වී පැමිණි කළ කුමක් කට යුතුද?]

**02. උදකට්ඨානං ගන්ත්වා පාදේ පක්ඛාලෙත්වා පාදපුඤ්ඡනේන පුඤ්ඡිතබ්බා.**

[ජලය ඇති ස්ථානයට හෝ ගොස් පා සෝදා පා පිස්නා තුවායෙන් පිසිය යුතු.]

**03. නිවාසනපාරුපනචීවරානි කථං කාතබ්බානි ?**

[හඳන පොරවන සිවුරු කෙසේ කටයුතු ද?]

**04. විහාරචීවරේන පරිවත්තෙත්වා ගාමචීවරං චීවරවංසේ වා චීවරරජ්ජුයං වා පත්ථරිතබ්බං.**

[(ගමට පොරවන සිවුර) විහාරයෙහි පොරවන සිවුරෙන් මාරු කොට ගමට පොරවන සිවුර සිවුරු දැමීමට යෙදූ උණ ලීයෙහි හෝ සිවුරු වැලෙහි හෝ ඇතිරිය යුතු.]

**05. යදි භන්තේ, චීවරං සින්නං හෝති, කිං කාතබ්බං ?**

[ස්වාමීනි, ඉදින් චීවරය තෙත් වේ නම් කුමක් කළ යුතුද?]

**06. මුහුත්තං උණ්හේ ඕතාපේතබ්බං, න ච චිරං නිදහිතබ්බං. දිවාභත්තේ අභුත්තේයේව සඞ්සරිත්වා යථාට්ඨානේ ඨපේතබ්බං.**

[මොහොතක් අව්වේ වියළිය යුතු. බොහෝ කල් (අව්වේ) තැන්පත් නො කටයුතු. දිවා දානය නොවැළඳූ කල්හිම (වැළදීමට පෙරම) නවා සුදුසු තැනක තැබිය යුතු.]

**07. පත්තෝ පන කථං කාතබ්බෝ ?**

[පාත්‍රය වනාහි කෙසේ කළ යුතු ද?]

**08. පිණ්ඩපාතපටික්කන්තසමනන්තරේයේව පත්තථවිකතෝ ඔමුඤ්චිත්වා පත්තා'ධාරකේ ඨපේතබ්බෝ.**

[පිඬු ගෙන ඒමෙන් අනතුරුවම පාත්‍ර ථවිකයෙන් ගළවා පාත්‍ර ආධාරකයෙහි තැබිය යුතු.]

**09. පත්තථවිකා පන කත්ථ ඨපේතබ්බා ?**

[පාත්‍ර ථවිකය වනාහි කවර තැනෙක්හි තැබිය යුතු ද?]

**10. භිත්තියං අයෝදණ්ඩෝ වා වංසෝ වා භවිස්සති, තත්ථ ලග්ගෙත්වා ඨපේතබ්බා.**

[බිත්තියෙහි ඇණයක් හෝ උණ ලීයක් හෝ වන්නේ ද එහි එල්වා තැබිය යුතු.]

**(අ) යස්ස විහාරවත්තේසු - සමාචාරෝ න විජ්ජති.**
**පරිහායති වුඩ්ඪියා - කාළපක්ඛේ'ව චන්දිමා.**

**(ආ) යස්ස විහාරවත්තේසු - සමාචාරෝ සංවිජ්ජති.**
**න සෝ හායති වුඩ්ඪියා - සුක්කපක්ඛේ'ව චන්දිමා.**

## අමාරු වචන.

**01. පිණ්ඩපාතෝ - පිඬු ලබන ගම. ("පිණ්ඩපාත" යන තැන්හි පිඬු අදහස් වුවද ඨානූපචාර වශයෙන් පිඬු ලබන ග්‍රාමය ගත යුතුය.) පටික්කන්තකාලෝ - නැවත පැමිණෙන කාලය.**

**02. උදකට්ඨානං - වතුර ඇති ස්ථානය. පක්ඛාලෙත්වා (පූ.ක්‍රි.)- සෝදා. (කට සෝදන තැන්හි "වික්ඛාලෙත්වා" යැයි යොදන්න). පාදපුඤ්ඡනං - පාපිස්ස.**

**03. නිවාසන (න) - අඳනය. පාරුපන (න) - තනි පට සිවුර, පොරෝනාව.**

**04. විහාරචීවරං - විහාරයෙහි පොරවන සිවුර. පරිවත්තෙත්වා (පූ.ක්‍රි.) - මාරු කොට. ගාමචීවරං - ගමෙහි පොරවන සිවුර. චීවරවංසං - සිවුරු දැමීමට යෙදූ උණ ලීය. චීවරරජ්ජු (ඉ) - සිවුරු දැමීමට යෙදූ වැල. පත්ථරති (ප√ථර+අ+ති) - පතුරුවයි, දිග හරියි.**

**05. සින්න (ති) - දහඩියෙන් තෙත්වූ.**

**06. මුහුත්ත (න) - මොහොත. උණ්හ (න) - උණුසුම, අව්ව. ඕතාපේති (අව√තප+ණෙ+ති) - රත් කරවයි, වේලයි. චිරං (නි) - බොහෝ වේලා. නිදහති (නි√දහ+අ+ති) - නිදන් කරයි, තැන්පත් කරයි. නිදහිතබ්බ (ති) - තැන්පත් කළ යුතු. දිවාභත්ත (න) - දිවා භෝජනය. භුත්ත (ති) - අනුභව කරන ලද. අභුත්ත (ති) - අනුභව**

නොකරන ලද. සඞ්සරති (සං√සර+අ+ති) - නවයි. යථාට්ඨාන (න)- සුදුසු තැන. ඨපේති (√ඨප+ණෙ+ති) - තබයි, තැන්පත් කරයි. ඨපේතබ්බ (ති) - තැබිය යුතු.

**08.** සමනන්තර (ති) - ළඟම තිබෙන, සමීපයෙහි වූ. සමනන්තරා (ක්‍රි.වි.) - ඊට අනතුරුව. ඕමුඤ්චති (අව√මුච+ංඅ+ති) - ගලවා තබයි. පත්තාධාරක (පු) - පාත්‍රාධාරකය. භිත්ති (ඉ) - බිත්තිය. අයෝදණ්ඩ (පු) - යකඩ ඇණය. වංස (පු) - උණ ලීය. ලග්ගේති (√ලග හෝ ලග්ග+ණෙ+ති) - එල්වයි. ලග්ගෙත්වා (පූ.ක්‍රි.) - එල්වා.

ගාථා වල අර්ථ.

(අ) යස්ස - යමෙකු හට ("සමාචාරෝ" යන්න හා ක්‍රියා කාරක පද සම්බන්ධය දැක්විය යුතු). විහාරවත්තේසු - විහාර වත්හි. සමාචාරෝ - මනා පිළිපැදීමෙක්. න විජ්ජති - විද්‍යමාන නොවේද. (සෝ- හෙතෙමේ). කාළපක්ඛේ - කාල පක්ෂයෙහි. චන්දිමා ඉව - සඳ මෙන්. වුඩ්ඪියා - අභිවෘද්ධියෙන්. පරිහායති - පිරිහෙන්නේය.

(ආ) යස්ස -පෙ- සංවිජ්ජති - විද්‍යාමාන වෙයිද. (සෝ- හෙතෙමේ). සුක්ඛපක්ඛේ - ශුක්ල පක්ෂයෙහි. චන්දිමා ඉව - සඳ මෙන්. වුඩ්ඪියා - අභිවෘද්ධියෙන්. න හායති - නොපිරිහෙන්නේය.

පාළියට නගනු.

**01.** ඔබ කොහි සිට පැමිණෙන්නේද?
**02.** ස්වාමීනි, මම පිඩු පිණිස ගමට ගොස් නැවත එන්නෙමි.
**03.** විහාර චීවරයෙන් ග්‍රාම චීවරය මාරු කොට චීවරය චීවර දැමීමට යෙදූ උණ ලීයේ දමන්න.
**04.** ඩහදියෙන් තෙත් වූ සිවුර ටික වේලාවක් අව්වේ වේළන්න.

**05.** සිවුර බොහෝ වේලාවක් අව්වෙහි නොවියළන්න.

**06.** පාත්‍රය ථවිකයෙන් ගලවා තබන්න.

**07.** අතන බිත්තියෙහි ඇණයක් ඇත්තේය.

**08.** විහාර වත් වල මැනවින් හැසිරෙන්න.

**09.** කාල පක්ෂයෙහි සඳ පිරිහෙන්නාක් මෙන් විහාර වත්හි මැනවින් නො යෙදෙන්නේ අභිවෘද්ධියෙන් පිරිහෙන්නේය.

**10.** ශුක්ල පක්ෂයේ සඳ වැඩෙන්නාක් මෙන් විහාරවත්හි මැනවින් යෙදෙනුයේ අභිවෘද්ධියෙන් වැඩෙයි.

### උපකාරක පාඨ.

**01.** කොහි සිට - කුතෝ. පැමිණෙන්නේ ද? - පච්චාගච්ඡති නු? පටික්කමති නු?

**02.** පිණ්ඩපාතතෝ.

**09.** යථා කාළපක්ඛෙ චන්දිමා පරිහායති. තථා විහාරවත්තං සම්මා අචරන්තෝ වුඩ්ඪියා පරිහායති.

**10.** සැපතින් - වුඩ්ඪියා (වුඩ්ඪති, වුඩ්ඪන්ති ලෙසින් වර නගනු).

## 11. අන්තෝදිවාභත්තේ කථාසල්ලාපෝ.

[දිවා දන් වේලාව තුළ කථා සල්ලාපය.]

**01. කතිසටිකං ආවුසෝ?**
[ඇවැත්නි, වේලාව කීයද?]

**02. අට්ඨසටිකතෝ තිංසපලං අතික්කන්තං.**
[අට පසුවී මිනිත්තු තිහක් ඉක්මීය.]

**03. යදි ඒවං පාළියා චේව අට්ඨකථාදීනඤ්ච උග්ගහනවේලා උපකණ්ඨා (උපකට්ඨා), ආයාම විජ්ජාගබ්භං.**
[එසේ වී නම් පෙළ ද අර්ථ කථා ආදිය ද ඉගෙන ගන්නා වේලාව සමීපය, ඉගෙන ගන්නා ශාලාව වෙතට යමු.]

**04. ඒවං භන්තේ, කතරවිජ්ජාය වාරෝ ?**
[ස්වාමීනි, එසේය. කිනම් විෂයක් ඉගෙනීමට කාලය ද?]

**05. බ්‍යාකරණස්ස වාරෝ.**
[ව්‍යාකරණයාගේ (උගැන්මට) කාලයයි.]

**06. නත්ථි කිර ආචරියෝ, කෝ නු බ්වජ්ජ වාචෙස්සති ?**
[ආචාර්‍යයන් වහන්සේ නැත්තේ ලු, අද කවරෙක් උගන්වන්නේ ද?]

**07. යදි ඒවං උපාචරියෝ වාචෙස්සති.**
[එසේ වී නම් උප ගුරුන් වහන්සේ උගන්වන්නේය.]

**08. සක්ඛිස්සති නු උපාචරියෝ බ්‍යාකරණං වාචේතුං ?**
[උප ගුරුවරයන් වහන්සේ ව්‍යාකරණ උගැන්වීමට සමත් වන්නේ ද?]

**09. අගරු ආවුසෝ, උපාචරියස්ස බ්‍යාකරණමත්තවාචනේ.**
[ඇවැත්නි, ව්‍යාකරණය පමණක් උගැන්වීම උප ගුරුන් වහන්සේට බරක් නොවේ.]

**10. ඒවං නු ?**
[එසේ ද?]

**11. ඒවමේව.**
[එසේමය.]

**12. උපාචරියෝ ආගච්ඡති, ආසනා වුට්ඨහථ.**
[උප ගුරුන් වහන්සේ වැඩම කරන සේක, අසුනින් නැගිටිවු.]

**13. ආම භන්තේ.**
[ ස්වාමීනි, එසේය.]

**14. නිසීදෙය්‍යාථා'වුසෝ සකේ ආසනේ, මෝනං සමාචරථ, මා සද්දමකරිත්ථ.**
[ඇවැත්නි, තමන්ගේ අසුනෙහි හිඳ ගනිවු, නිශ්ශබ්ද බවෙහි මනාව හැසිරෙවු, ශබ්ද නොකරවු.]

**15. යථාඋග්ගහිතං අවිරාධෙත්වා ලේඛාඵලකේ වා ලේඛාපොත්ථකේ වා අක්ඛරානි ලිඛෙය්‍යාථ.**
[ඉගෙන ගත් පරිද්දෙන් නොවරදවා කළු ලෑල්ලෙහි[1] හෝ ලියන පොතෙහි හෝ අකුරු ලියවු.]

**16. ලිඛිතං භන්තේ.**
[ස්වාමීනි, ලියන ලදී.]

**17. ලිඛිතං දස්සේහි.**
[ලියන ලද්ද පෙන්වනු.]

**18. ඉදං සුට්ඨු, න පනිදං.**
[මෙය හොඳය, මෙය වැරදිය.]

**(අ) සිප්පසමං ධනං නත්ථි - සිප්පං චෝරා න ගණ්හරේ**
**ඉධ ලෝකේ සිප්පං මිත්තං - පරලෝකේ සුඛාවහං.**

**(ආ) විද්වත්තං ච නරිපත්තං ච - නේව තුල්‍යං කුදාචනං**
**සදේසේ පූජ්ජතේ රාජා - විද්වා සබ්බත්ථ පූජ්ජතේ.**

**( ඇ) සබ්බං සුතමධීයේථ - හීනමුක්කට්ඨමජ්ඣිමං**
**සබ්බස්ස අත්ථං ජානෙය්‍යා - න ච සබ්බං පයෝජයේ.**

**අමාරු වචන.**

**01. කතිසටිකං - වේලාව කීයද?**
**[අට වැනි පාඨමෙහි ''කති නාඩිකා'' යනුවෙන් යොදා ඇත. දියෙන්**

---

[1] **ලේඛාඵලක යන්නෙන් ගල් ලෑල්ල අදහස් වේ. පරිවර්තන පහසුවට කළු ලෑල්ල යැයි යොදන ලදි.**

**කරන ලද ද්‍රව ඔරලෝසුව "ඝටිකා" නම්. එයටම "නාඩිකා" යනුවෙන් ද භාවිත කෙරේ. අද භාවිත කරන ඔරලෝසුව (යන්ත්‍ර ඔරලෝසුවට) "ඝටිකා" "නාඩිකා" යැයි යොදනු ලැබේ.]**

**02.** **තිංසපලං - මිනිත්තු තිහක්. අතික්කන්ත (ති) - අතික්‍රාන්ත, ඉක්ම ගිය.**

**03.** **විජ්ජාගබ්භෝ - ඉගෙන ගන්නා තැන. කතරවිජ්ජා - කිනම් විද්‍යාවක් (කවර පොතක්).**

**05.** **බ්‍යාකරණ (න) - ව්‍යාකරණය.**

**06.** **නත්ථි කිර - නැත්තේලු. කෝ නු බ්වජ්ජ (කෝ+නු බො+ අජ්ජ) අජ්ජ - අද. කෝ - කවරෙක්. වාචෙස්සති නු බෝ - උගන්වන්නේද? (වාචනය කරන්නේද?) [පොත් පත් ආදිය නොවූ අතීතයෙහි ගුරුවරයා විසින් කියන දේ ගෝලයන් විසින් අනුව කීම/ නැවත කීමට "වාචනය කරයි" යැයි කියති.]**

**07.** **උපාචරියෝ - දෙවැනි ගුරුතුමා.**

**08.** **සක්ඛිස්සති නු - සමත් වන්නේද? (වර්තමාන විභක්තියෙහි "සක්කොති, සක්කුණාති" ලෙසින් ද අන්‍ය විභක්තීන්හි "සක්කුණෙය්‍ය, සක්කුණි, අසක්ඛි, සක්කුණිස්සති, සක්ඛිස්සති" මෙසේ රූප වෙත්).**

**09.** **අගරු (ති) - සැහැල්ලු, බර නැති. බ්‍යාකරණමත්තවාචනං - ව්‍යාකරණය පමණක් ඉගැන්වීම.**

**12.** **උපාචරියෝ ආගච්ඡති - දෙවැනි ආචාර්‍යයන් වහන්සේ පැමිණේය.**

**13.** **මෝන (න) - නිශ්ශබ්ද බව. සමාචරති (සං+ආ+√චර+අ+ති) - හැසිරේ, පිළිපදියි.**
**මා අකරිත්ථ (මා අකත්ථ) - නො කරනු. (අකාසි, අකරා, අකාසුං, අකංසු, අකාසි, අකත්ථ, අකාසිං, අකම්හා, අකරි, අකරුං ආදී වශයෙන් වර නගනු).**

**15.** **යථාඋග්ගහිත - යම් සේ උගත් (ඉගෙන ගත් පාඩම්).**
**විරෝධෙති (වි√රුධ+ණෙ+ති) - වරද්දවයි. අවිරාධෙත්වා - නොවරද්දවා.**
**ලේඛාඵලකං - කළු ලෑල්ල ආදිය. ලේඛාපොත්ථකං - පොත් ආදිය.**

**අක්ඛරං (අක්ඛරා) අකුරු. ලිඛති (√ලිඛ+අ+ති) - ලියයි.**
**16. ලිඛිත (ති) - ලියන ලද.**
**17. දස්සේති (√දිස+ණෙ+ති) - පෙන්වයි, දක්වයි.**
**18. සුට්ඨු (නි) - මනාසේ, නිවැරදිව.**

**ගාථාවල අර්ථය.**

**(අ) සිප්පසමං - ශිල්පය හා සම වූ. ධනං - ධනයක්. නත්ථි - නැත්තේය. සිප්පං - ශිල්පය. චෝරා - සොරු. න ගණ්හරේ - නො ගනිත්. ඉධ ලෝකේ - මේ ලෝකයෙහි. සිප්පං - ශිල්පය.**
**මිත්තං - මිතුරෙකි. [පුල්ලිංගික "මිත්ත" පදය නපුංසක ලිඟුවට පෙරළා දක්වා ඇති ලිංගවිපල්ලාසයකි]. පරලෝකේ - පර ලෙව්හි. සුඛාවහං - සැප ගෙන දෙයි.**

**(ආ) විද්වත්තං ච - විද්වත්භාවය ද. නරිපත්තං ච - රජ භාවය ද. කුදාචනං - කිසි කලෙක. නේව තුල්‍යං - සම නොවේ. රාජා - රජතුමා. සදේසේ - තම දේශයෙහි. පූජ්ජතේ - පිදෙනු ලැබේ. විද්වා - ප්‍රඥා ඇත්තේ. සබ්බත්ථ - සැම තන්හි. පූජ්ජතේ - පිදෙනු ලැබේ.**
**[චාණක්‍යනීති/ නරිපත්තං යන තැන්හි නරි සද්දූපපද පා ධාතුව+ත ප්‍රත්‍යයි. නරි ශබ්දය මනුෂ්‍ය අර්ථ වාචකයි.ථෝමනිධි පාළියෙහි "නරින්දත්තං" යැයි පෙනේ.]**
**(ඇ) හීනමුක්කට්ඨමජ්ඣිමං - පහත්, උසස්, මධ්‍යස්ථ වූ. සබ්බං - සියළු. සුතං - අසන ලැබූ ශිල්ප. අධීයේථ - ඉගෙන ගනිවු (සත්තමී එථ විභක්තියයි). සබ්බස්ස - සියළු ශිල්පයන්ගේ. අත්ථං - අර්ථය. ජානෙය්‍ය - දැන ගන්නේය. ච - නමුදු. සබ්බං - සියල්ල. න පයෝජයේ - ප්‍රයෝජනයට නොගන්නේය.**

**පාළියට නගනු.**

**01.** **වේලාව එක හමාරයි. පාඩම් කළ දෑ නැවත ආවර්ජනය කරනු.**

**02.** **පන්ති කාමරයට තවම නොගියෙවු ද?**

**03.** **දැන් මහාවග්ග පාළිය ඉගෙන ගන්නා කාලය නොවේද?**

**04.** **අද ගුරුවරයා එන්නෙ නැතිලු.**

**05.** **මට මහාවග්ගය ඉගෙනීමට අපහසුවක් නැත.**

**06.** **ඇත්තද?**

**07.** **ඇත්තමයි.**

**08.** **ඔන්න, ගුරුතුමා එනවා. නැගිටින්න.**

**09.** **නිශ්ශබ්ද වවු. ශබ්ද නොකරවු.**

**10.** **ප්‍රඥාව හා සම ආලෝකයක් නොමැත්තේය.**

**11.** **සියළු ශිල්පයන්ගේ අර්ථ, අධිප්‍රායන් අවබෝධ කටයුතු. නමුත් සියල්ල ප්‍රයෝජනයට නොගත යුතු.**

**උපකාරක පාඨ.**

**03.** **ඇයි - කස්මා. ගනියි - ගණ්හාති.**

**04.** **නත්ථි කිර අජ්ජ ආචරියෝ.**

**09.** **මෝනං සමාචරථ, තුණ්හී හෝථ.**

**10.** **ආලෝකය - ආභා.**

## 12. වාචනකාලේ කථාසල්ලාපෝ.
[ඉගැන්වීම් කාලයෙහි කථා සල්ලාපය]

**01. පොත්ථකං අනෝලෝකෙත්වා හියෝ උග්ගහිතවිජ්ජං පුන සජ්ඣායථ.**
[පොත නොබලා පෙර දින උගත් දෑ නැවත සජ්ඣායනා කරවු.]

**02. උපරිවිජ්ජං උග්ගණ්හිස්සථ, පඨතු බුද්ධරක්ඛිතෝ අඤ්ඤේ සුණන්තු.**
[මතු පාඩම් උගනිවු, බුද්ධරක්ඛිත, (පාඩම) කියාවා, අන් අය ඇහුම් කන් දෙත්වා.]

**03. මා විරාධෙහි, ඒවං වදේහි.**
[නොවරදවනු, මෙසේ කියනු.]

**04. හරේ සාමණේර..... මා ත්වං පුනප්පුනං විරාධෙහි.**
[බොල සාමණේරය... නුඹ වහන්සේ නැවත නැවත නො වරදවනු.]

**05. ඉමං පන සීහළභාසාය පරිවත්තේහි " බුද්ධං පූජේමී"ති.**
["බුද්ධං පූජේමි" යන මේ පාළිය සිංහළ බසට නගනු.]

**06. ඉමං පන පාළිභාසාය පරිවත්තේහි "ධර්මය වන්දනා කරමි"ති.**
[" ධර්ම රත්නය පුදමි" යන සිංහල පාඨය පාළි බසට නගනු.]

**07. ඉමිස්සා පාළියා අත්ථං යෝජේහි "සංඝං පූජේමී"ති.**
["සංඝං පූජේමි" යන මේ පාළි බසට අර්ථ සපයනු.]

**08. ඉමස්ස වාක්‍යස්ස අධිප්පායං වදේහි "බුද්ධෝ ධම්මං දේසේතී"ති.**
["බුද්ධෝ ධම්මං දේසේති" යන මේ වාක්‍යයට අධිප්‍රාය කියනු.]

**09. අලමෙත්තාවතා, යදි සක්කුණෙය්‍යාථ, වාචුග්ගතං පරිචිනාථ, නෝ චේ වාචුග්ගතං පරිචිනිතුං සක්කුණෙය්‍යාථ, පුනප්පුනං පඨෙය්‍යාථ.**
[මෙපමණක් සෑහේය (ඇතිය), ඉදින් සමත් වවුද කට පාඩම් කරවු, වන පොත් කල දෑ නැවත (සිතින්) අහුලවු, වන පොත් කල දෑ ඇහිලීමට සමත් නොවවු ද නැවත නැවත කියවවු.]

**10. අප්පසද්දා සජ්ඣායථ, මා උච්චාසද්දමහාසද්දා, මා ච විජ්ජාගබ්භේ කෝලාහලං කරෝථ.**
[නිශ්ශබ්ද වූවාහු සජ්ඣායනා කරවු, උස් හඬ ඇත්තෝ මහත් හඬ ඇත්තෝ නො වවු, ඉගෙන ගන්නා ශාලාවෙහි කෝලාහල ද නොකරවු.]

**11. සචේ ඉච්ඡථ, ඒකතෝ'ව සජ්ඣායථ, නෝ චේ, ඒකකෝ'ව**

**සජ්ඣායථ, අත්තනෝ වාචුග්ගතවිජ්ජං අවිරෝධෙත්වා ලිඛථ.**
[ඉදින් කැමැති වවු ද එකටම සජ්ඣායනා කරවු, එසේ නොවන්නේ ද තනිවම සජ්ඣායනා කරවු, තමන් උගත් ශිල්පය නොවරදවා ලියවු.]

**12.** ටාං.....ටාං....ටාං......

**13. සුණාථ, කතිනාඩිකා?**
[අසවු, වේලාව කීයද?]

**14. දසනාඩිකා භන්තේ.**
[ස්වාමීනි, වේලාව දහයයි.]

**15. තේනහි ගච්ඡථ යථාවිහාරං, මා ච උපාහනසද්දං සාවෙයාථ, මන්දං මන්දං ගච්ඡථ.**
[එසේ වී නම් තම තමන්ගේ විහාරයට යවු, සෙරෙප්පු හඬ (අන් අයට) නොම අස්වවු, සෙමෙන් සෙමෙන් යවු.]

**(අ) ද්වාසීති බුද්ධතෝ ගණ්හිං - ද්වේසහස්සානි භික්ඛුතෝ**
**චතුරාසීතිසහස්සානි - යේ මේ ධම්මා පවත්තිනෝ.**

**(ආ) ඒවං ආනන්දථේරස්ස - හදයම්හි පවත්තිනං**
**ධාරයේ වාචයේ ධම්මං - පග්ගණ්හේ ඉසිනං ධජං.**

**අමාරු වචන.**

**01. ඕලෝකේති (අව√ලෝක+ණෙ+ති) - බලයි. අනෝලෝකෙත්වා (න + ඕලෝකෙත්වා) (පූ.ක්‍රි) - නොබලා. හියෝ - ඊයේ. උග්ගහිතවිජ්ජා - උගත් ශිල්පය.**

**02. උපරිවිජ්ජා - පිටුවෙහි උඩ ඇති අකුරු. පඨති (√පඨ+අ+ති) - කියවයි.**

**04. භරේ සාමණේර - බොල සාමණේරය.**

**05. සීහළභාසාය - සිංහළ භාෂාවට. පරිවත්තේති ( පරි√ වතු+**

**ණෙ+ති) - පෙරළයි, මාරු කරයි, අන් බසකට නගයි.**

**07. යෝජේති (√යුජ+ණෙ+ති) - යොදයි (මෙතැන්හි අර්ථ යෙදීම ලෙස ගනු).**

**08. වාක්‍යං - වාක්‍යය. අධිප්පායෝ - අධිප්‍රාය.**

**09. අලං (නි ) ඔය ඇති, සෑහේ, ප්‍රමාණයි. එත්තාවතා - මෙපමණකින්. සක්කුණෙය්‍යාථ (√සක+උණා+ එය්‍යාථ) - සමත් වවු. වාචුග්ගත (වාචා + උග්ගත) කට පාඩම් කළ, පාඩම් කළ. පරිචිනාථ (පරි√චි+නා+ථ) රැස්කරවු.**

**10. උච්චාසද්දො - උස් වූ හඬ ඇත්තේ. මහාසද්දෝ - මහත් වූ හඬ ඇත්තේ.**

**11. ඒකතෝ (නි) - එකවිට. ඒකකෝ - තනිව (ඒකකාව යනුවෙන් ද භාවිත කළ හැක. ධම්මපදට්ඨකථාවෙහි වජ්ජිපුත්තභික්ඛු වස්තුවෙහි "ඒකකා මයං අරඤ්ඤේ විහරාම" යනුවෙන් පෙනේ).**

**සජ්ඣයථ*(සං පුබ්බ අධි පුබ්බ√ඉ ධාතුව ඉ හට ඒ ආදේශයි. ඒ හට අයාදේශයි. සජ්ඣයථ යනුවෙන් පමණක් තිබිය යුතුය. සජ්ඣායථ යනුවෙන් නොතිබිය යුතුය) - පාඩම් කරයි, සජ්ඣායනා කරයි. යථාවිහාරං - තම තමන්ගේ විහාරයන්ට. උපාහන (න) - පාවහන්. සාවේති (√සු+ණෙ+ති) - අස්වයි, ප්‍රකාශ කරයි. මන්දං මන්දං - සෙමෙන් සෙමෙන් ( සණිකං සණිකං යනුවෙන් ද භාවිත කළ හැක).**

**(අ) බ්‍රාහ්මණ - බ්‍රාහ්මණය. ද්වාසීතිසහස්සානි - ධර්මස්කන්ධයන් දෙ අසූදහසක්. බුද්ධතෝ - බුදුරජාණන් වහන්සේගෙන්. ගණ්හිං - උගත්තෙමි. ද්වේසහස්සානි - ධර්මස්කන්ධයන් දෙදහසක්. භික්ඛුතෝ - සාරිපුත්තාදී තෙරුන් වහන්සේලාගෙන් (ගණ්හිං - උගත්තෙමි). යේ ධම්මා - යම් ධර්මයක්හු. මේ - මාගේ (ජීවිහග්ගේ - දිවග). පවත්තිනෝ - පවත්නා වේද. (තේ ධම්මා - ඒ ධර්මයෝ). චතුරාසීතිසහස්සානි - සූ අසූ දහසක් වෙති.**

**[ඛුද්දකනිකාය- ථේරගාථා]**

**(ආ) ඒවං - මෙසේ. ආනන්දථේරස්ස - අනඳ තෙරුන් වහන්සේගේ. හදයම්හි - හදවතෙහි. පවත්තිනං - පවතින්නා වූ. ධම්මං - ධර්මය. ධාරයේ - වාචෝද්ගත කිරීම් වශයෙන් දරන්නේය. වාචයේ- වාචනය කරන්නේය. ඉසිනං - ඉසිවරුන්ගේ. ධජං - ප්‍රතිවේධ ධර්ම ධජය. පග්ගණ්හේ - ඔසවන්නේය.**

**[(අ) ගාථාව අනඳ තෙරුන් විසින් ගෝපකමොග්ගල්ලාන බ්‍රාහ්මණයා හට කියන ලද්දකි].**

**(ආ) ගාථාවෙහි *<u>පවත්තිනං</u>* යන තැන්හි ප පුබ්බ √වතු ධාතුව + ණී ප්‍රත්‍යයයි. දුතියා විභක්ති බැවින් දණ්ඩිනං සේ පවතී.**

**පාළියට නගනු.**

**01.** ඊයේ ඔබ වහන්සේ කට පාඩම් කළ දෑ නැවත සජ්ඣායනා කරනු.
**02.** පොත නොබලා කියනු.
**03.** වරද්දන්න එපා.
**04.** මෙසේ ව්‍යක්තව කියනු.
**05.** පාළිය සිංහළයට නගන්න.
**06.** අර්ථ දෙනු.
**07.** අධිප්‍රාය කියනු.
**08.** සමත් නම් ධාරණය වනතුරු වන පොත් කරනු.
**09.** වාචුද්ගත පාඩම් නොවරදවා ලිවීමට ද සමත් වවූ.
**10.** සවන් දෙන්න. දහය හමාර පසුවීය.

## 13. දිවාභත්තවේලායං කථාසල්ලාපෝ.

[දිවා දන් වේලාවෙහි කථා සල්ලාපය.]

**01. අඩ්ඪාධිකා දසඝටිකා.**

[වේලාව දහය හමාරයි.]

**02. සම්පත්තෝ දිවාභත්තපටිසඞ්ඛරණකාලෝ, ද්වික්ඛත්තුං අයෝදණ්ඩං පහර!**

[(වැළඳීම පිණිස) දිවා දානය සූදානම් කිරීමට කාලය ප්‍රාප්ත විය, දෙවරක් යකඩ දණ්ඩට ගසනු!]

**03. පහටෝ භන්තේ, අයෝදණ්ඩෝ.**

[ස්වාමීනි, යකඩ දණ්ඩට ගසන ලදී.]

**04. පටිග්ගහිතං නු භෝජනපීඨං ?**

[කෑම මේසය[1] පිළිගන්නා ලද්දේ ද?]

**05. න පටිග්ගහිතං භන්තේ.**

[ස්වාමීනි, නො පිළිගන්නා ලදී.]

**06. භෝජනපීඨම්පි පටිග්ගහේතබ්බං.**

[කෑම මේසය ද පිළිගත යුතු.]

**07. කිං කාරණා?**

[කාරණය කිම්ද?]

**08. අත්ථි ආවුසෝ භෝජනපීඨේ රජං, යදි තං අප්පටිග්ගහිතං භවෙය්‍ය. තේන සම්ඵුට්ඨං ඛාදනීයං වා භෝජනීයං වා මූලපටිග්ගණං විසජ්ජති. භෝජනපීඨේ පන පටිග්ගහිතේ තත්‍රට්ඨං'පි රජං පටිග්ගහිතමේව හෝති. තස්මා භෝජනපීඨම්පි පටිග්ගහේතබ්බං.**

[ඇවැත්නි, කෑම මේසයෙහි දූලි ඇත්තේය. ඉදින් ඒ දූලි පිළි නොගන්නා ලද්දේ වන්නේ නම්, එයින් ස්පර්ශ වූ කෑ යුතු දෑ හෝ බුදිය යුතු දෑ (සිය) මුල් පිළි ගැනීම අත හරින්නේය. කෑම මේසය පිළි ගත් කල්හි එහි වූ දූලි ද පිළි ගන්නා ලද්දේම වන්නේය. එසේ හෙයින් කෑම මේසය ද පිළි ගත යුතු.]

---

[1] බුරුම රට භික්ෂූන් දන් වළඳනුයේ දානය තබා ඇති රවුම් හැඩයේ මේසයක් වටා හිඳ ගෙනය. මෙහි කෑම මේසය යැයි කියා ඇත්තේ ඒ මේසයටයි.

**09. සාධු භන්තේ.**

[ස්වාමීනි, මැනව.]

**10. අභිසඞ්ඛතං ආවුසෝ, භෝජනපීඨං, සංඝස්ස ආගමනත්ථාය අයෝදණ්ඩං දසවාරමත්තං පහර!**

[ඇවැත්නි, කෑම මේසය සකස් කරන ලදී, සඞ්ඝයා වහන්සේලාට වැඩම කරනු පිණිස දස වරක් පමණ යකඩ දණ්ඩට ගසනු!]

**11. නිසීදථා'වුසෝ, අත්තනෝ පත්තාසනේ!**

[ඇවැත්නි, තමන්ට (වැඩිහිටි පිළිවෙළින්) පැමිණි ආසනයෙහි හිඳ ගනිවු!]

**12. දෙථා'වුසෝ පරිබ්බාජකා, සූපං චේව බ්‍යඤ්ජනං ච. තුම්හාකම්පි අත්ථාය අවසිස්සෙයාථ!**

[ඇවැත්නි උපාසකයෙනි, සූප මෙන්ම ව්‍යඤ්ජන ද දෙවු. නුඹලා හට ද අවශේෂ කරවු!]

**13. භොන්තෝ පරිබ්බාජකා, තුම්හේ ඕලෝකෙය්‍යාථ, බ්‍යඤ්ජනථාලකේ යං ඛීණං (සචේ තං අත්ථි) අනුදදෙය්‍යාථ!**

[ඇවැත්නි,  තොපි බලවු, ව්‍යඤ්ජන තැටියෙහි යමක් ඉවර වී ද (ඉදින් ව්‍යඤ්ජන ඇත්තේ නම්) තවත් දෙවු!]

**14. තත්‍ර පීඨේ සුරුසුරුසද්දෝ චේව කටච්ඡුසද්දෝ ච සූයති, මා සූපං සුරුසුරුකාරකං පිවථ. සබ්බස්මිං භුඤ්ජනකිච්චේ සේඛියවත්තං මනසි කරෙය්‍යාථ, මා ච කටච්ඡුසද්දං සාවෙය්‍යාථ!**

[ඒ ආසනයෙහි සුරු සුරු යන ශබ්දය ද හැඳි ශබ්දය ද ඇසේ, සුරු සුරු හඬ ඇසෙන පරිද්දෙන් සූප පානය නොකරවු. සියළු භෝජන කිසෙහි සේඛියා වතාවත් මනසිකාර කරවු, හැඳි ශබ්ද ද නො අස්වවු!]

**15. භත්තකිච්චං පරියෝසිතං. සචේ ඛාදනීයං අත්ථි, උපනාමේථ!**

[බත් කිස නිමවන ලදී. ඉදින් කෑ යුත්තක් ඇත්තේද, ගෙනැවිත් දෙවු!]

**16. දුග්ගන්ධං පරිහරිතුං පත්තං නහානීයපිණ්ඩියා උබ්බට්ටෙත්වා ධෝවථ, ධෝවිත්වා වෝදකං කාතුං පත්තපුඤ්ඡනේන පුඤ්ඡථ!**

[දුර්ගන්ධය ඉවත් කිරීමට පාත්‍රය සබන් උලා සෝදවු, සෝදා ජලය රහිත කිරීමට පාත්‍ර පිස්නාවෙන් පිස දමවු!]

**17. තතෝ පරං මුහුත්තං උණ්හේ ඔතාපේථ, මා ච උණ්හේ**

**පත්තචීවරං නිදහථ, පත්තා'සනේයේව පත්තපිධානං විවරිත්වා නිසාමේථ!**

[ඉන් පසුව මොහොතක් අව්වේ රත් කරවු, පාත්‍ර සිවුරු අව්වේ තැන්පත් නොකරවු, පාත්‍ර තබන ආසනයෙහිම පාත්‍ර පියන විවර කොට ඇහුම් කන් දෙවු.]

**18. ලද්ධෝ නු ඛෝ ඉමස්මිං විහාරේ ඕකාසෝ තම්බූලං ඛාදිතුං ?**

[මේ විහාරයෙහි බුලත් වැළඳීමට[2] අවසර ලැබේ ද?]

**19. ඉමස්මිං විහාරේ යේභුයෝන්න තම්බූලං නත්ථි. සචේ අත්ථි, පුබ්බණ්හේ ඛාදිතබ්බං. ධූමවට්ටි පන යදා කදාචි'පි න පාතබ්බා, තම්බකූටම්පි න ඛාදිතබ්බං.**

[මේ විහාරයෙහි බොහෝ සෙයින් බුලත් නැත්තේය. ඉදින් ඇත්තේ ද උදෑසන වැළඳිය යුතුය. දුම් වැටි වනාහි කිසි කලෙක නොබිය යුතු, දුම් කොළ ද නො කෑ යුතු.]

**(අ) සල්ලේඛං අච්චජන්තේන - අප්පමත්තේන භික්ඛුනා**
**කප්පියේ'පි න කාතබ්බා - ආමිසත්ථාය ලෝලතා.**

**අමාරු වචන.**

**01. අඩ්ඪාධිකා (අඩ්ඪ + අධිකා) - අර්ධයකට + අධික වූ. දසඝටිකා - පැය දහයකි. (වේලාව දහය හමාරයි යනුයි. දස වැනි පාඩමේ ආ පරිද්දෙන් "දසඝටිකතෝ තිංසපලං" යනුවෙන් ද යෙදිය හැක.)**

**02. සම්පත්ත (ති) - පැමිණි. පටි (අභි) සඞ්ඛරණ (න) - සකස් කිරීම. දිවාභත්තපටිසඞ්ඛරණකාලෝ - දහවල් බත් සකස් කරණ කාලය (සයවැනි පාඩමේ දී "භත්තසජ්ජන" ලෙස දක්වා ඇත).**

**04. පීඨ (න) - පුටුව. භෝජනපීඨ (න) - ආහාර තබන මේසය.**

**05. පටිග්ගහිත (ති) - පිළිගන්නා ලද.**

---

[2] විකාලයෙහි බුලත් වැළඳීම වරදක් බැව් බුරුම රට විනයධරයින්ගේ මතයයි.

**07.** **කිං කාරණා? - කාරණා කිම්ද ?**

**08.** **තත්‍රට්ඨ (ති) - එහි වූ.**

**10.** **ආගමනත්ථෝ ( ආගමන + අත්ථෝ) - පැමිණීම පිණිස.**

**11.** **පත්තාසනේ - පැමිණි අසුනෙහි.**

**12.** **පරිබ්බාජකා - විහාරයන්හි භික්ෂූන් වහන්සේලා හට උවැටැන් කරන සුදු වතින් සැරසී සිටින නෙක්කම්මය සිදු කළා වූ ගිහි පිරිමි උදවිය ("සුත්තපාඨෙය්‍යවග්ග සම්පසාදනීය" සූත්‍රයට අනුව ඔවුන්ට "පරිබ්බාජකා" යනුවෙන් ව්‍යවහාර කළ හැක. එවැනි ස්ත්‍රීන් හට "පරිබ්බාජිකා" යනුවෙන් යෙදිය හැක).**

**අවසිස්සති (අව√සිස+ය+ති) - ඉතිරි වේ.**

**13.** **ඛීණ (ති) - ක්ෂය වූ. අනුදදෙය්‍යාථ - තව දෙවු (දදාති, දදන්ති, දදාතු, දදෙය්‍ය ආදී ලෙසින් වර නගන්න).**

**14.** **සූයති (√සූ+ය+ති) අසනු ලැබේ (සූය්‍යති ආදී ලෙසින් ද යෙදිය හැක).**

**පිවති / පිබති (√පා+අ+ති ) පා හට පිබ ආදේශයි. - බොයි, පානය කරයි.**

**15.** **පරියෝසිත (ති) - අවසන් කළ, නිමවූ. උපනාමේති (උප√නමු+ණේ+ති) - එළවයි, ගෙනැවිත් දෙයි.**

**16.** **පරිහරිතුං - පාවිච්චි කිරීමට (ඉවත් කිරීමට) [අපනේතුං යන්න ද යෙදිය හැක.]**

**වෝදක (ති) - දිය රහිත. වෝදකං කාතුං - දිය රහිත කිරීමට.**

**පත්තාසනං - පාත්‍ර තබන ස්ථානය. [පත්තමාළකෝ යන්න ද යෙදිය හැක.]**

**අපිධානං - පාත්‍රයේ පියන. විවරති (වි√වර+අ+ති) - විවර කරයි. (විවරිතුං, විවරිත්වා ආදී වශයෙන් යෙදිය හැක).**

**18.** **ලද්ධ (ති) - ලැබූ. ඔකාසෝ - අවකාශය, අවසරය. තම්බූල (න) - බුලත් (කොළ).**

**19.** **ධූමවට්ටි (ඉ) - දුම් වැටි. පාතබ්බ (ති) - බීමට සුදුසු. (පිවති, පිවෙය්‍ය**

ආදී. පිවන්තෝ, පිවිතුං/පාතුං ලෙසින් රූප වෙත්). තම්බකූට - දුම් කොළ. (ධූමපණ්ණං, ධූමපත්තං යනුවෙන් ද භාවිත කළ හැක.) (මේ "තම්බකූට" ශබ්දය පිටකත්‍රයෙහි නැත).

(අ) සල්ලේඛං - කෙලෙස් තුනී කිරීමේ ප්‍රතිපදාව. අච්චජන්තේන - අත් නොහරින්නා වූ. අප්පමත්තේන - අප්‍රමාදී වූ. භික්ඛුනා - භික්ෂුව විසින්. කප්පියේ'පි - කැප සරුප් වස්තූන්හි ද (අපි ශබ්දය අකැප වස්තූන් කෙරෙහි පවත්නා ආශාවට ගරහා කෙරෙන ගරහා වාචකයි). ආමිසත්ථාය - ආහාර වස්ත්‍ර යැයි කියන ලද ආමිස සඳහා. ලෝලතා - ලොල් බව. න කාතබ්බා - නො කට යුතු.

පාළියට නගනු.

01. වේලාව දහය හමාරයි.
02. ඇඳෙන් අවදිවීමට පස් වරක් පමණ ගෙඩිය ගසන්න.
03. බත් සකස් කිරීමට කාලය නොවේ.
04. භාජන මේසය සෝදනු.
05. (ආහාර) පිළිගන්නා ලද්දේ නොවේද? ඇයි නැවත පිළිගන්නේ?
06. මේසය මත දූවිලි නැත් ද? කෑ යුතු බුදිය යුතු දෑ දූලි වලින් තැවරුණෝ වන්නාහ. මේසය ද පිළිගන්න.
07. උපාසකවරුන් හට ද ඉතිරි කරන්න.
08. තවත් පිළිගන්වන්න.
09. පාත්‍රය සබන් වලින් මැද සෝදන්න.
10. පාත්‍රය මොහොතක් අව්වේ වේලා පාත්‍රමාළකයේ තැන්පත් කරන්න.
11. බුලත් ඇත් නම් උදය වරුවෙහි කන්න. සවස් කාලයෙහි නොකන්න.

**උපකාරක පාඨ.**

**02.** **අවදි වීමට - වුට්ඨහිතුං**

**03.** **නා’යං හත්තාභිසඞ්ඛරණකාලො. (න කාලො’යං හත්තං අභිසඞ්ඛරිතුං)**

**05.** **නනු පටිග්ගහිතං? කස්මා පටිග්ගණ්හසි?**

**06.** **ඛාදනීයභොජනීයානි රජේන සම්ඵුට්ඨානි භවිස්සන්ති.**

**08.** **අනුදදෙය්‍යාථ (පුන දදෙය්‍යාථ).**

**11.** **මා විකාලේ පන තම්බූලං චෙව ධූමපණ්ණං ච ඛාද.**

## **14. නහානවේලායං කථාසල්ලාපෝ.**

[පැන් පහසු වන වේලාවෙහි කථා සල්ලාපය.]

**01. නන්වා'වුසෝ ධම්මරක්ඛිත....නහානකාලෝ. උදපානා උදකමාකඩ්ඪාහි.**
[ඇවැත්නි ධම්මරක්ඛිතය... පැන් පහසු වන කාලය නොවේද? ළිඳෙන් වතුර අදිනු!]

**02. අත්ථි හන්තේ, උග්ඝාතනඤ්චේව උදකභාජනඤ්ච ?**
[ස්වාමීනි, කප්පියක් මෙන්ම බාල්දිය ද ඇත්තේද ?.]

**03. න පස්සසි නු ත්වං උදපානස්ස උපරි උග්ඝාතනඤ්චේව සහ රජ්ජුයා තස්මිං උග්ඝාතනේ යෝජිතං උදකභාජනඤ්ච ?**
[නුඹ වහන්සේ ළිඳට ඉහළින් ඇති කප්පිය මෙන්ම ලණුව සමඟින් ඒ කප්පියෙහි යොදා ඇති බාල්දිය ද නො දක්නෙහි ද?]

**04. උදකං ආකඩ්ඪිත්වා කත්ථ පක්ඛිපෙය්‍යාමි ?**
[(මම) ජලය ඇද කොතැනක දමන්නෙම් ද?]

**05. සංවිජ්ජෙය්‍ය නහානකොට්ඨකේ මත්තිකාවාරකෝ වා දෝණී වා, තත්ථ පක්ඛිපෙය්‍යාසි!**
[නාන කොටුවෙහි මැටි කළයක් හෝ ජල ඔරුව හෝ තිබේ නම් එහි දමනු.]

**06. සීතකාලෝ ආවුසෝ, තස්මා උදකං තාපේහි!**
[ඇවැත්නි, (මේ) ශීත කාලයයි, එසේ හෙයින් ජලය රත් කරනු!]

**07. කුහිං හන්තේ, උදකතාපනභාජනං ?**
[ස්වාමීනි, ජලය උණු කරන බඳුන කොහිද?]

**08. නා'හං ජානාමි, ත්වමේව පරියේසාහි!**
[මම නොදනිමි, නුඹ වහන්සේම සොයනු!]

**09. ඨපිතං හන්තේ, නහානකොට්ඨකේ උදකං සද්ධිං උණ්හෝදකේන.**
[ස්වාමීනි, නාන කොටුවෙහි උණු පැන් සමඟ ජලය තබන ලදී.]

**10. ඨපිතා නු උදකසාටිකා'පි ?**
[නාන කඩය ද තබන ලදි ද?]

**11. න ඨපිතා හන්තේ, අහං පමත්තෝ'ම්හි.**
[ස්වාමීනි, නොතබන ලදී, මම ප්‍රමාදී වීමි.]

**12. නත්ථි වතා'වුසෝ නහානසරාවකෝ චේව නහානීයපිණ්ඩි ච**

**නහානචුණ්ණඤ්ච.**
[ඇවැත්නි, නාන කෝප්පය මෙන්ම සබන් ද සබන් කුඩු ද නැත.]

**13. මුහුත්තං භන්තේ, තාව ආගමේථ, ගණ්හිස්සාමි.**
[ස්වාමීනි, මොහොතක් බලාපොරොත්තු වනු මැනවි,
ගන්නෙමි (ගෙනෙන්නෙමි).]

**14. නිට්ඨිතමාවුසෝ නහානකිච්චං. උදකසාටිකං පීළෙත්වා මුහුත්තං උණ්හේ ඔතාපෙත්වා සුක්ඛසමනන්තරමේව පටිසංහරාහි!**
[පැන් පහසු වීමේ කෘත්‍යය නිමවන ලදී. නාන කඩය මිරිකා මොහොතක් අව්වේ වියළා වේළුණු අනතුරුවම හකුළනු!]

**15. නහානකාලේ සම්පත්තේ'පි සචේ වෝ නහායිතුකාමතාචිත්තං නත්ථි, මා නහායථ!**
[ඉදින් නාන වේලාව එළඹුණු කල්හිදු නුඹ වහන්සේලා හට නැමට කැමති සිතක් නැත්තේ නම් නො නානු!]

**16. සති'පි නහායිතුකාමචිත්තේ මා භුසං වායනට්ඨානේ නහායථ!**
[නැමට කැමති සිත ඇති කල්හිදු බොහෝ සෙයින් සුළං හමන තැන්හි නො නානු!]

**17. සචේ හි තාදිසේ ඨානේ නහායථ, සීතේන ඵුට්ඨා (හුත්වා) ජරාතුරා භවිස්සථ.**
[ඉදින් එවන් තැනෙක පැන් පහසු වන්නාහු ද ශීතයෙන් ස්පර්ශ කරන ලද්දාහු (වී) උණ රෝගයෙන් ආතුර වූවාහු වන්නාහුය.]

**18. නහානකිච්චපරියෝසානේ කායපුඤ්ඡනේන පුඤ්ඡෙය්‍යාථ. තතෝ පරං කායස්ස උතුගහාපනත්තං මුහුත්තං පාවුරණං පාරුපෙය්‍යාථ!**
[නාන කිස අවසානයෙහි කය පිස්නා තුවායෙන් පිස දමවු. ඉන් අනතුරුව කය උණුසුම් කිරීම ටික වේලාවක් පිණිස පොරෝනාව පොරවවු!]

**නහානකාලේ සම්පත්තේ - නෝ ච'ත්ථි න්හායිතුං මනෝ**
**මා නහායව්හෝ සවාතේ'පි - සීතඵුට්ඨයෝ හි බ්‍යාධිකෝ.**

**අමාරු වචන.**

**01. නහානකාලෝ - ස්නානයට වේලාවයි. (නහාන යන්නට න්හාන**

**යන පදය ද යෙදිය හැක). උදපාන (පු) - ළිඳ.**
**ආකඩ්ඪති (ආ√කඩ්ඪ+අ+ති) - අදී.**
**(ආකඩ්ඪිත - අදින ලද. ආකඩ්ඪිත්වා, ආකඩ්ඪිතුං ආදී ලෙසින් රූප වෙත්).**
**උග්ඝාතන - කප්පිය. ("චක්කවට්ටකං" යනුවෙන් චූළවග්ගපාළියෙහි ඇත). උදකභාජන (න) - වතුර භාජනය.**

**03.** **රජ්ජු (ඉ) - ලණුව. යෝජේති (√යුජ+ණෙ+ති) - යොදයි. යෝජිත (ත) - යෙදූ, බඳින ලද, යොදවන ලද.**

**04.** **පක්ඛිපති (ප√ඛිප+අ+ති) - ඇතුළේ දමයි, බහයි. (චූළවග්ගපාළියෙහි ජන්තාඝර වතෙහි "උදකදෝණිකාය උදකං ආසිඤ්චිතබ්බං" යනුවෙන් වතුර දැමීමට "ආසිඤ්චති" යන ක්‍රියා පදය භාවිත කර ඇත).**

**05.** **සංවිජ්ජති (සං+√විද+ය+ති) - විද්‍යාමාන වේ, තිබේ, පවතී. නහානකොට්ඨක (පු) - නාන කාමරය, නාන කොටුව. මත්තිකාවාරකෝ - මැටි කළය. දෝණි (ඉ) - ඔරුව.**

**06.** **තාපේති (√තප+ණෙ+ති) - තවයි, රත් කරයි, දුක් දෙවයි.**

**07.** **උදකතාපනභාජන (න) - වතුර උණු කරන කේතලාදිය.**

**08.** **පරියේසති (පරි√ඒස+අ+ති) - සොයයි, ආශා කරයි.**

**09.** **ඨපිත (ත) - තබන ලද.**

**10.** **උදකසාටිකා (ඉ) - නාන කඩය (නාන විට අඳින වස්ත්‍රය).**

**12.** **සරාවක (පු) - නැබිලිය, කුඩා කෝප්පය. නහානසරාවකෝ - නාන කෝප්පය. නහානචුණ්ණ (න) - නාන කුඩු.**

**13.** **ආගමේති (ආ√ගමු+ණෙ+ති) - බලාපොරොත්තු වේ.**

**14.** **පීළේති (√පීළ+ණෙ+ති) - පෙළයි, මඩියි, මිරිකයි. පීළෙත්වා (පූ.ක්‍රි) - මිරිකා. සුක්ඛසමනන්තර - වේළුණු පසුව. පටිසංහරති (පටි+සං√හර+අ+ති) - එක්තැන් කරයි, හකුළුවයි.**

**15.** **නහායිතුකාමචිත්තං - නෑමට කැමති සිත.**

**16.** **භුස (ති) - බොහෝ වූ, අධික වූ. වායනට්ඨාන - සුළං හමන ස්ථානය.**

**17.** **ජරාතුරෝ - උණ රෝගයෙන් පෙළුණේ.**

**18.** **උතුගාහාපන (න) - උණුසුම් කිරීම. පාවුරණ (න) - පෙරවීමට ගන්නා වස්ත්‍රය.**

**ගාථාවෙහි අර්ථය.**

**(අ) නහානකාලේ - ස්නාන කාලය. සම්පත්තේ'පි - පැමිණි කල්හි ද . නහායිතුං - නෑමට. මනෝ - මනසක්.**
**නෝ'වත්ථි (නෝ ව+ අත්ථි) - ඇත්තේ නොවේද. (ඒවං සති - එසේ නෑමට මනසක් නොමැති කල්හි).**
**මා නහායව්හෝ - නොනාන්නාහු වවු. සීතඵුට්ඨයෝ හි - සීතලෙන් ස්පර්ශවූයේ. බ්‍යාධිතෝ - ගිලන්වූයේ. (භවිස්සති - වන්නේය).**

**පාළියට නගනු.**

**01.** **ඇවැත්නි නෑමට වෙලාව පැමිණ ඇත්තේය.**
**02.** **කප්පිය සහ පනිට්ටුව ඇත්තේ නොවේද?**
**03.** **ළිඳ ළඟ ඇත්තේය.**
**04.** **නාන කාමරයේ මැටි කළයක් නොවන්නේද?**
**05.** **මැටි කළයක් නැත්තේය.**
**06.** **සීත කාලයේදී උණු වතුරෙන් ස්නානය කළ යුතු.**
**07.** **කේතලයක් තිබේද? මම සොයා ගෙන එන්නෙමි.**
**08.** **කේතලය තිබෙන තැන මම දනිමි. සෙවීමට අවශ්‍යතාවයක් නැත.**
**09.** **සොයා ගත්තෙමි. මට අමතක විය.**
**10.** **මොහොතක් රැඳී සිටින්න. මම පැමිණෙන්නෙමි.**
**11.** **නාන කඩය බොහෝ වේලා අව්වෙහි නො වියළනු.**
**12.** **ඇවැත්නි ඔබ සුළං හමන ස්ථානයෙක පැන් පහසු වී ද?**
**13.** **ඔහු උණ රෝගයෙන් පෙළෙයි.**
**14.** **කය රත් වීම පිණිස වස්ත්‍රයක් පොරවන්න.**

## උපකාරක පාඨ.

**02.** **න නු උග්ගාතනඤ්චේව උදකභාජනඤ්ච අත්ථී?**

**08.** **අහං ජානාමි. න තයා පරියේසිතබ්බං (මෙම වාක්‍යයෙහි කර්ම පදය තිලිංගික පදයක් බැවින් තුන් ලිඟුවම භාවිත කළ හැක).**

**09.** **ජානාමි, ජානාමි, අහං පමත්තෝ'ම්හි.**

**12.** **නහායසි නු ත්වං ආවුසෝ භුසං වායනට්ඨානේ? (නහාතෝ'සි නු ත්වං භුසං වායනට්ඨානේ?).**

**14.** **කායස්ස උතුගාහාපනත්ථං පාවුරණං පාරුපාහි.**

## 15. වච්චකුටිපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.

[වැසිකිළිය සම්බන්ධ කථා සල්ලාපය.]

**01. භන්තේ බුද්ධරක්ඛිත, වච්චකුටි නාම කත්ථ පතිට්ඨාපේතබ්බෝ?**
[ස්වාමීනි බුද්ධරක්ඛිතය, වැසිකිළිය වනාහි කවර තැනෙක්හි පිහිටුවිය යුතු ද?]

**02. පෝරාණකත්ථේරා ආවුසෝ, වච්චකුටිං යේභුයෝ්‍යන විහාරපච්චන්තේ පතිට්ඨාපේසුං.**
[ඇවැත්නි, පුරාණ තෙරුන් වහන්සේලා බොහෝ සෙයින් වැසිකිළිය විහාර කෙළවරෙහි පිහිටුවූහ.]

**03. වච්චකුටිං පවිසන්තේන කථං (කුටි) පවිසිතබ්බා ?**
[වැසිකිළියට පිවිසෙන්නහු විසින් කෙසේ පිවිසිය යුතු ද?]

**04. වච්චකුටිං පවිසන්තේන බහියීතේන උක්කාසිතබ්බං, අන්තෝ නිසින්නස්ස අත්ථිභාවං වා නත්ථිභාවං වා ඤාතුං.**
[(වැසිකිළියෙන්) පිටත සිටියාවූ වැසිකිළියට පිවිසෙන්නහු විසින් වැසිකිළිය තුළ හිඳින්නහුගේ ඇති බැව් හෝ නැති බැව් දැන ගැනීම පිණිස උගුර පෑදිය යුතු.]

**05. සච’ස්ස අන්තෝ නිසින්නෝ, තේනා’පි උක්කාසිතබ්බං.**
[ඉදින් වැසිකිළිය ඇතුළේ හිඳින්නේ වේද, ඔහු විසින් ද උගුර පෑදිය යුතු.]

**06. තතෝ පරං බහි චීවරවංසේ වා චීවරරජ්ජුයං වා චීවරං නික්ඛිපිත්වා සාධුකං අතරමානේන වච්චකුටි පවිසිතබ්බා.**
[ඉන් අනතුරුව සිවුර දැමීමට ඇති උණ ලීයෙහි හෝ සිවුරු වැලෙහි හෝ සිවුර තබා ඉක්මන් නොවන්නේ මනාව වැසිකිළියට පිවිසිය යුතු.]

**07. කිං කාරණා චීවරං බහි නික්ඛිපිතබ්බං ?**
[කවර හේතුවක් නිසා සිවුර පිටත තැබිය යුතුද?]

**08. යදි චීවරං පාරුපිත්වා පවිසති, චීවරං දුග්ගන්ධං හෝති. තස්මා බහි චීවරං නික්ඛිපිතබ්බං.**
[ඉදින් සිවුර පොරවා පිවිසෙයි ද, සිවුර දුගඳ වෙයි. එහෙයින් සිවුර පිටත තැබිය යුතු.]

**09. කත්ථ ඨිතේන උබ්භජිතබ්බං ? කථඤ්ච වච්චං න කාතබ්බං?**
[කොතැනක හුන්නහු විසින් (අඳනය) එසැවිය යුතු ද? කෙසේ වර්චස් නොකළ යුතු ද?]

**10. පාදුකාසු ඨිතේනේ’ව උබ්භජිතබ්බං. න නිත්ථුනන්තේන, නා’පි දන්තකට්ඨං ඛාදන්තේන වච්චං කාතබ්බං. න ච පස්සාවදෝණිකාය ඛේළෝ කාතබ්බෝ.**

[වැසිකිළි පාදුකාවන්හි (අඩිය තැබීමට යෙදූ පඩි) සිටින්නහු විසින් ම අඳනය එසැවිය යුතු. තතනමින්, දැහැටි වළඳමින් වර්චස් නො කළ යුතු. මුත්‍රා කරන ඔරුවෙහි කෙළ නොගැසිය යුතු.]

**11. වච්චේ නිට්ඨිතේ කථං කාතබ්බං?**

[වර්චස් කිරීම නිම කල්හි කෙසේ කළ යුතු ද?]

**12. අවලේඛනපිඨරේ වා අවලේඛනමාළකේ වා අවලේඛනකට්ඨං භවිස්සති, තේන අවලිඛිතබ්බං. න ඵරුසේන කට්ඨේන අවලිඛිතබ්බං. න අවලේඛනකට්ඨං වච්චකූපම්හි පාතේතබ්බං. යථාපඤ්ඤත්තේයේව ඨානේ ඨපේතබ්බං. සචේ බහි ඌහදං හෝති, උදකේන ධෝවිතබ්බං.**

[පුසන් කූරු සැළියේ හෝ පුසන් කූරු මාලකයෙහි පුසන් කූරු වන්නේ ද එයින් සූරා දැමිය යුතු. රළු කූරු වලින් නො සීරිය යුතු. පුසන් කූරු වැසිකිළි වලෙහි නොහෙළිය යුතු. පැනවූ තැන එපරිද්දෙන්ම තැබිය යුතු. ඉඳින් පිටත මළ වෙයි නම් ජලයෙන් සේදිය යුතු.]

**13. තතෝ පරං කිං කාතබ්බං ?**

[ඉන් පසු කුමක් කළ යුතු ද?]

**14. තතෝ පරං ආචමනකුම්භිතෝ උදකං ගහෙත්වා ආචමේතබ්බං. න චපුචපුකාරකං ආචමේතබ්බං, න ච ආචමනසරාවකේ උදකං සේසේතබ්බං, අපිධානේන ආචමනකුම්භී පටිච්ඡාදේතබ්බා.**

[ඉන් පසු වර්චස් සෝදන බඳුනෙන් ජලය ගෙන වර්චස් සේදිය යුතු. චපු චපු හඬින් මළ නො සේදිය ද යුතු, වර්චස් සෝදන (ජලය ඇති) බඳුනෙහි ජලය ඉතිරි නොකළ යුතු ද, පියනෙන් වර්චස් සෝදන (ජලය ඇති) බඳුන වැසිය යුතු.]

**15. තතෝ පරං කිං කාතබ්බං?**

[ඉන් අනතුරුව කුමක් කළ යුතු ද?]

**16. තතෝ පරං පාදුකාසු ඨිතේනේ’ව පටිච්ඡාදෙත්වා නා’තිසහසා නික්ඛමිත්වා බහි නික්ඛිත්තචීවරං පාරුපිතබ්බං.**

[ඉන් අනතුරුව පාදුකාවන්හි සිටිමින්ම අඳනයෙන් වසාගෙන නො ඉක්මන්ව නික්ම පිටත තබන ලද සිවුර පෙරවිය යුතු.]

**17. වච්චකුටිවත්තං කරොන්තේන කිං කාතබ්බං ?**

[වැසිකිළි වත කරන්නහු විසින් කුමක් කළ යුතු ද?]

**18. වච්චකුටිවත්තං කරොන්තේන,**

[වැසිකිළි වත කරන්නහු විසින්]

**(අ) අනුදිනං ආචමනකුම්භියං පුරාණෝදකං ඡඩ්ඩෙත්වා නවං උදකං ආසිඤ්චිතබ්බං.**

දිනපතා වර්චස් සෝදන (ජලය ඇති) බඳුනෙහි පරණ වතුර විසි කොට අළුත් වතුර වත් කර යුතු.

**(ආ) සචේ වච්චකුටි උක්ලාපා හෝති, සම්මජ්ජිතබ්බා.**

[ඉඳින් වැසිකිළිය හැඩි වී ඇත් ද, හැමදිය යුතු.]

**(ඉ) සචේ අවලේඛනපියරෝ පූරෝ හෝති, අවලේඛනකට්ඨං ඡඩ්ඩේතබ්බං. අම්හාකං පන විහාරේ අවලේඛනකට්ඨං සයමේව ධෝවිත්වා මාළකේ ඨපෙන්ති. තස්මා වත්තකාරකස්ස භාරෝ නත්ථි.**

[ඉඳින් පුසන් කූරු සැළිය පිරී ඇත්තේ නම් පුසන් කූරු විසි කළ යුතු. අපගේ විහාරයෙහි වනාහි තමාම පුසන් කූරු සෝදා මාලකයෙහි තබත්. එහෙයින් වත් කරන්නහුට බරක් නොවේ.]

**19. අඤ්ඤේසු පන විහාරේසු අභිනවා'වලේඛනානං චේව පුරාණා'වලේඛනානං ච පක්ඛිපනත්ථාය "අභිනවපියරෝ, පුරාණපියරෝ"ති නාමසඤ්ඤං ලිඛිත්වා පියරේ ඨපෙන්ති. තේ'පි එත්ථ න සන්ති.**

[අන්‍ය විහාරයන්හි නව පුසන් කූරු මෙන්ම පැරණි පුසන් කූරු ද බහාලනු පිණිස "නව පුසන් කූරු, පැරණි පුසන් කූරු" යනුවෙන් නම් ලියා පුසන් කූරු බඳුනෙහි තබත්. ඒවා ද මෙහි නොවෙත්.]

**20. ඉදානි පන අවලේඛනකට්ඨං න වළඤ්ජන්ති. උදකේනේව සංසුද්ධං කරොන්ති.**

[දැන් වනාහි පුසන් කූරු පරිභෝග නොකරත්. ජලයෙන් ම පිරිසිදු කරත්.]

**(අ) පවිසෙය්‍යු'බ්භජිත්වා නෝ - සහසා පවිසෙය්‍යා ච**
**උක්කාසිත්වාවු'බ්භජෙය්‍යා - පාදුකාස්වේව සණ්ඨිතෝ.**

15. වච්චකුටිපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.

**(ආ) න කරේ නිත්ථුනං වච්චං - දන්තකට්ඨං ච ඛාදයං**
**වච්චපස්සාවදෝණීනං - න කරෙය්‍යු'භයං බහි.**

**(ඉ) කූපේ කට්ඨං න පාතෙය්‍ය - ඛේළං පස්සාවදෝණියා**
**නා'වලේඛෙය්‍ය ඵරුසේ නු හතඤ්චා'පි ධෝවයේ.**

**(ඊ) න නික්ඛමෙය්‍ය සහසා - උබ්භජිත්වා න නික්ඛමේ**
**චපුචපු නා'චමෙය්‍ය - උක්ලාපඤ්ච විසෝධයේ.**

අමාරු වචන.

**01.** පතිට්ඨාපේති (පති√ඨා+ණාපේ+ති) - පිහිටුවයි, තබයි.
**02.** පෝරාණක (ති) - පුරාණ වූ,පෙර සිටි. පච්චන්ත (පු) - ප්‍රත්‍යන්ත.
**04.** බහි (නි) - පිටත, පිටත්හි. ඨිතෝ - සිටියේ.
අන්තෝ (නි) ඇතුළත. නිසින්නෝ - හුන්නේ.
අත්ථිභාවෝ - ඇති බව. ඤාතුං (අඤ්ඤාතුං, ජානිතුං) - දැන ගැනීම පිණිස.
**05.** උක්කාසති (උ√කාස+අ+ති) - උගුර පාදයි. උක්කාසිතබ්බං - උගුර පැදිය යුතුය. ("තේනා'පි උක්කාසිතබ්බං" යන චුල්ලවග්ගපාළියෙහි වත්තක්ඛන්ධකයේ එන පාඨයට අනුව මෙහිද යොදන ලදී). පච්චුක්කාසිතබ්බං - නැවත උගුර පැදිය යුතුය.
**06.** නික්ඛිපති (නි√ඛිප+අ+ති) - තබයි. අතරමානෝ - ඉක්මන් නොවන්නේ. දුග්ගන්ධ (පු) - දුර්ගන්ධය, දුගඳ.
**09.** උබ්භුජති (උ√භුජ+අ+ති) - උඩට හකුළුවයි, ඔසවයි. උබ්භුජිතබ්බං - (අඳනය එසවිය) යුතු. කථඤ්ච - කෙසේ. වච්ච (පු) - අසුචි.
**10.** පාදුකා (ඉ) වැසිකිලි කැසිකිලි වල අඩිය තැබීමට යෙදූ පඩිය.
නිත්ථුනාති (නි√ථු+නා+ති) - කෙඳිරි ගායි, දුර්වල ශබ්ද පවත්වයි.
පස්සාවදෝණිකා (පස්සාවදෝණි) (ඉ) - වැසිකිලි ඔරුව.
ඛේළෝ (පු) - කෙළ.
**12.** පියරෝ (පු) -සැළිය. මාළකෝ (පු) - මාලකය.

**අවලේඛනකට්ඨ (න) - වැසිකිළියෙහි පරිභෝග කරණ පුසන්කූර.**
**අවලිඛති (අව√ලිඛ+අ+ති) - සූරා දමයි, පීරයි. කූප (පු) -වළ.**
**පාතේති (√පත+ණෙ+ති) - හෙළයි, වැටෙන්නට සළස්වයි.**
**යථාපඤ්ඤත්ත (ති) - පණවන ලද අයුරින්.**
**ඌහදති (උ√හද+අ+ති) - මළ පහ කරයි.**

**14.** **ආචමන (න) -වැසිකිළි කොට වර්චස් සේදීම. ආචමේතබ්බං - වර්චස් සේදිය යුතු. (ආචමේති, ආචමෙන්ති යනාදී ලෙසින් වර නැගිය යුතු). ආචමනසරාවක (න) - වැසිකිළියේදී මළ සේදීමට ගන්නා භාජනය. සිසති (√සිස+අ+ති) - ඉතිරි කරයි. (කාරිත ක්‍රියාපදය සේසේති (ඉතිරි කරයි) යැයි සිටී). සෙසේතබ්බං - ඉතිරි කළ යුතු. (චුල්ලවග්ගයෙහි වච්චකුටි වතෙහි "න ආචමනසරාවකේ උදකං සේසේතබ්බං" යනුවෙන් ඇත). දහතුන් වැනි පාඩමෙහි කාරිත නොවන දිවාදි ගණික රූපය වූ "අවසිස්සෙය්‍යාථ" භාවිත කරන ලදි. එහි "අවසේසෙය්‍යාථ" යනුවෙන් ද භාවිත කළ හැක). පටිච්ඡාදේති (පටි√ඡද+ණෙ+ති) - වසයි, ප්‍රතිච්ඡාදනය කරයි. අතිසහසා (නි) - ඉතා ඉක්මනින්. නික්ඛිත්ත (ති) - දමනු ලැබූ, තබනු ලැබූ, තැබූ. අනුදිනං - දිනපතා. පුරාණෝදකං - කලින් (තැබූ) වතුර. නවං - අළුත්. ඡඩ්ඩේති (√ඡඩ්ඩ+ණේ+ති) - විසි කරයි. උක්ලාප (පු) -කසළ, කුණු, රොඩු. සම්මජ්ජති (සං√මජ්ජ+අ+ති) - හමදියි. සම්මජ්ජනී (ඉ) - මුස්න, කොස්ස. පූර (ති) - සම්පූර්ණ, පිරුණු. කාරකෝ (පු) - කරන්නා. භාරෝ (පු) - බර.**

**19.** **අභිනව (ති) - නවීන, අළුත්.**

**20.** **වලඤ්ජති (√වලජී+ණෙ+ති) - පාවිච්චි කරයි. පරිභෝග කරයි. සංසුද්ධ (ති) - පිරිසිදු, පවිත්‍ර. (චුල්ලවග්ගපාළියෙහි ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි "අවලේඛනපීඨරෝ" යැයි දිස්වේ. වත්තක්ඛන්ධකයෙහි "අවලේඛනපීඨරෝ" යැයි ඇත).**

**ගාථාවල අර්ථය.**

**(අ)උබ්භුජිත්වා - අඳනය ඔසවා ගෙන. නෝ පවිසෙයා - (වැසිකිළියට) ඇතුළු නොවන්නේය. සහසා ච - ඉක්මනින් ද. නෝ පවිසෙයා - ඇතුළු නොවන්නේය. උක්කාසිත්වා - කාරා (උගුර පාදා). පවිසෙයා - පිවිසෙන්නේය. පාදුකාසු - වැසිකිළි පාදුකාවන්හි. සණ්ඨිතෝ - මනාව සිටියේ. (හුත්වා - වී). උබ්භුජෙයා - අඳනය ඔසවන්නේය.**

**(ආ)නිත්ථුනං (නිත්ථුනන්තෝ) - තතනමින්. වච්චං - වර්චස්. න කරේ - නො කරන්නේය. දන්තකට්ඨං - දැහැටි දඬු. ඛාදයං ච - කමින් ද. වච්චං න කරේ - වර්චස් නොකරන්නේය. වච්චපස්සාවදෝණිනං - වර්චස් මුත්‍ර ඔරුවේ. බහි - පිටත. උභයං - වර්චස් මුත්‍රා යන දෙවර්ගය. න කරෙයා - නො කරන්නේය.**

**(ඉ) කූපෙ - වැසිකිළි වළෙහි. කට්ඨං - පුසන් දඬු. න පාතෙයා - නො හෙළන්නේය. පස්සාවදෝණියා - කැසිකිළි ඔරුවෙහි. ඛේළං - කෙළ. න පාතෙයා - නො හෙළන්නේය. ඵරුසේන - රළු වූ පුසන් දණ්ඩෙකින්. නා’වලේඛෙයා - නො සූරන්නේය (පිස නොදමන්නේය). ඌහතඤ්චාපි - වැසිකිළියේ මළයෙන් දූෂිතස්ථාන ද. ධෝවයේ - සෝදන්නේය.**

**(ඊ) සහසා - ඉක්මනින්. න නික්ඛමෙයා - නො නික්මෙන්නේය. උබ්භුජිත්වා - අඳනය ඔසවා. න නික්ඛමේ - නො නික්මෙන්නේය. චපුචපු - චපු චපු යන හඬ නිකුත් කරමින්. නා’චමෙයා - මළ නොසෝදන්නේය. උක්ලාපඤ්ච - කැලිකසළ. විසෝධයේ - පිරිසිදු කරන්නේය. [බුද්දසික්ඛා]**

## පාළියට නගනු.

**01.** ඔබ වැසිකිළි කොට පුසන් දඬු වලින් පිසදමයි ද? නොඑසේනම් කොළ වලින් පිසදමයි ද?

**02.** පුසන් දඬු වලින් පිසදමා සෝදන්නෙහි ද?

**03.** ඉඳින් ජලයෙන් නො සෝදන්නේ නම් මළ මාර්ගය මැනවින් පිරිසිදු වන්නේද?

**04.** වැසිකිළියට ඉක්මනින් ඇතුළු නොවනු.

**05.** වැසිකිළි පාදුකා වල සිටින්නේ වී අඳනය ඔසවනු.

**06.** අඳනය ඔසවාගෙන ඉක්මනින් පිට නොවනු.

**07.** ඇඟ වසාගෙන සෙමෙන් වැසිකිළියෙන් පිටවනු.

**08.** සෝදන භාජනයෙහි ජලය නොමැත්තේ ද?

**09.** පුසන් දඬු වලින් පුසන් දඬු බහාලනය පිරුණේ වේද?

## උපකාරක පාඨ

**01.** කිං නු ත්වං වච්චං කත්වා කට්ඨේන අවලේඛසි? උදාහු පණ්ණේන?

**02.** ආචමේසි නු කට්ඨේන අවලේඛෙත්වා ?

**03.** සංසුද්ධො නු බෝ වච්චමග්ගෝ යදි උදකේන න ධෝවසි.

**06.** උබ්භුජන්තෝ.

**09.** පූරෝ (පුණ්ණෝ) වත අවලේඛනපිඨරෝ අවලේඛනකට්ඨේහි.

## 16. බුද්ධුපට්ඨානවේලායං කථාසල්ලාපෝ.

[බුදු උවටැන් කරන වේලාවෙහි කථා සල්ලාපය.]

**01. ආවුසෝ, අඤ්ඤේසු විහාරේසු බුද්ධුපට්ඨානවේලායං පටිමාය පුරතෝ බුද්ධගුණං සජ්ඣායිත්වා පරිත්තාදිං ඒකතෝ සජ්ඣායන්ති, ඉධ පන සායන්හසමයේ ඒකේ බුද්ධුපට්ඨානං ගන්ත්වා පුප්ඵාදීහි පූජෙත්වා සූරියත්ථඞ්ගමනවේලාය අපරභාගේ "ඉතිපි සෝ භගවා" ත්‍යාදිරතනත්තයගුණං චේව පාතිමොක්ඛාදිං ච ඒකතෝ සජ්ඣායන්ති.**

[ඇවැත්නි, අන්‍ය විහාරයන්හි බුද්ධ උපස්ථාන වේලාවෙහි ප්‍රතිමාව ඉදිරියෙහි බුදු ගුණ සජ්ඣායනා කොට පිරිත් ආදිය එකට සජ්ඣායනා කෙරෙත්, මෙහි වනාහි සන්ධ්‍යාවෙහි එක් වහන්දෑ නමක් ගොස් මල් ආදියෙන් පුදා ඉර අවරට යන වේලාවට පසුව "ඉතිපි සෝ භගවා" ආදී රත්නත්‍රයේ ගුණ මෙන්ම ප්‍රාතිමෝක්ෂාදිය ද එකට සජ්ඣායනා කරත්.]

**02. අවුසෝ ධම්මරක්ඛිත, බුද්ධුපට්ඨානකාලෝ'යං අන්තරවාසකං චේව උත්තරාසඞ්ගං ච පරිමණ්ඩලං නිවාසෙත්වා ඒකංසං උත්තරාසඞ්ගං කරෝහි! සව'ත්ථි චිත්තපාතිං ච ගණ්හාහි!**

[ඇවැත්නි ධම්මරක්ඛිතය, මේ බුද්ධුපස්ථාන කාලයයි. අඳනය මෙන්ම තනිපට සිවුර ද වට කොට හැඳ තනිපට සිවුර එකස් කොට පොරවනු! ඉදින් ඇත්තේ නම් නව ගුණ වැල ද ගනු!]

**03. ආම භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**04. තව නිවාසනං න පරිමණ්ඩලං, ඒවං නිවාසේතබ්බං. පුන පරිමණ්ඩලං නිවාසේහි!**

[නුඹ වහන්සේගේ අඳනය වටකුරු (වටකුරුව පෙරවී ඇත්තේ) නොවේ, මෙසේ හැඳිය යුතු. නැවත වට රවුම සිටින සේ හඳිනු!]

**05. න ඒවං න ඒවං, ඒවං නිවාසේහි!**

[එසේ නොවේ, එසේ නොවේ, මෙසේ හඳිනු!]

**06. උත්තරාසඞ්ගම්පි පුන පරිමණ්ඩලං පාරුපාහි!**

[තනි පට සිවුර ද නැවත හාත්පසින් වට කොට පොරවනු!]

**07. තව චීවරකණ්ණෝ පුරතෝ'පි ඔලම්බති, පච්ඡතෝ'පි ඔලම්බති,**

**දක්ඛිණතෝ'පි ඔලම්බති, වාමතෝ'පි ඔලම්බති, පුන පාරුපාහි!**
[නුඹ වහන්සේගේ සිවුරු කොණ ඉදිරියෙන් ද එල්ලෙයි, පිටු පසින් ද එල්ලෙයි, දකුණු පසින් ද එල්ලෙයි, වම් පසින් ද එල්ලෙයි, නැවත පොරවනු!]

08. **ඒවං සාධු, පච්ඡා'පි ඒවමේව නිවාසේහි පාරුපාහි ච!**
[මෙසේ මැනව, පසුව ද මෙසේම හඳිනු පොරවනු!]

09. **ආම භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

10. **ආවුසෝ, අඤ්ඤේ ගන්ධමාලාදිහත්ථා බුද්ධුපට්ඨානං ගච්ඡන්ති, මයං පන කේන බුද්ධං පූජෙය්‍යාම ?**
[ඇවැත්නි, අන් අය සුවඳ මල් ආදිය අතැත්තාහු බුද්ධුපස්ථානයට යත්, අපි වනාහි කුමකින් බුදු රජාණන් වහන්සේ පුදම්ද?]

11. **සාමණේරා පුප්ඵානි න ඔචිනිතුකාමා මඤ්ඤේ. රුක්ඛේසු'පි පුප්ඵානි නත්ථි, මයං උදකේනේව බුද්ධං පූජෙය්‍යාම.**
[සාමණේර හිමිවරු මල් නෙළනු නො කැමැත්තාහු වෙතැයි සිතමි. ගස් වල ද මල් නොවෙත්, අපි පැනින්ම බුදු රජාණන් වහන්සේ පුදමු.]

12. **ඒවමාවුසෝ, උදකකුම්භිකං පරිසුද්ධං ධෝවිත්වා උදකං පරිස්සාවෙත්වා ආහර.**
[ඇවැත්නි, එසේය, ජල බඳුන පිරිසිදුව සෝදා පැන් පෙරා රැගෙන එනු.]

13. **ඒවං භන්තේ, පරිසුද්ධං බුද්ධං පරිසුද්ධේනේව උදකේන පූජිතුං යුත්තං.**
[ස්වාමීනි, එසේය. පාරිශුද්ධ බුදු රජාණන් වහන්සේ පිරිසිදු පැනින්ම පිදීමට සුදුසුය.]

14. **ඒවමාවුසෝ, ආයාම. බුද්ධාරම්මණං සතිං පච්චුපට්ඨාපේහි! "ඉතිපි සෝ භගවා අරහං -පෙ- භගවා"ති.**
[ඇවැත්නි, එසේය. යමු, "ඉතිපි සෝ භගවා අරහං -පෙ- භගවා" යැයි බුද්ධාරම්මණ සිහිය පිහිටුවනු!]

**(අ) තදහු පබ්බජිතෝ සන්තෝ - ජාතියා සත්තවස්සිකෝ**
**සෝ'පි මං අනුසාසෙය්‍ය - සම්පටිච්ඡාමි මත්ථකේ.**

**(ආ) බුද්ධෝ'ති කිත්තයන්තස්ස - කායේ භවති යා පීති**
**වරමේව හි සා පීති - කසිණේනා'පි ජම්බුදීපස්ස.**

**අමාරු වචන.**

**01.** **බුද්ධුපට්ඨානවේලා (ඉ) - බුද්ධ උපස්ථානයට වේලාව. පටිමා (ඉ) - පිළිමය. පරිත්ත (න) - පිරිත. සූරියත්ථඞ්ගමනවේලා (ඉ) - ඉර අවරට යන වේලාව. රතනත්තය (න) - රත්නත්‍රය. පාතිමොක්ඛ (පු) - ප්‍රාතිමෝක්ෂය.**

**02.** **පරිමණ්ඩල (පු) - හාත්පස මඬුල්ල, හාත්පසින් වටවීම. පරිමණ්ඩලං (ක්‍රි.වි) - හාත්පසින් වට කොට. ඒකංස (පු) - එක්පැත්ත. උත්තරාසඞ්ග (න) - උතුරු සළුව, තනිපොට සිවුර. කරිත්වා (පූ.ක්‍රි) - කොට. චිත්තපාති (ඉ) - නවගුණ වැල.**

**05.** **න ඒවං - එසේ නොවෙයි.**

**07.** **චීවරකණ්ණ (පු) - සිවුරු කොණ, සිවුරු කෙළවර. පුරතෝ'පි - ඉදිරියෙන් ද. ඔලම්බති (අව√ලම්බ+අ+ති) - එල්බෙයි, එල්ලෙයි. (අට වැනි පාඩමෙහි කාරිත ප්‍රත්‍යයෙන් නිපන් "ඔලම්බෙන්තේන" යන පදය යෙදීය.)**

**08.** **ඒවං සාධු - එසේ හොඳය.**

**10.** **අඤ්ඤ (ති) - අන්‍ය, අනෙක්. ගන්ධමාලාදිහත්ථෝ - සුවඳ+මල් ආදිය+අතැත්තේ. ඔචිනාති (අව√චි+නා+ති) - මල් නෙලයි. ඔචිනිතුකාමෝ - නෙලනු කැමැත්තේ. පූජේති (√පූජ+ණේ+ති) - පූජා කරයි.**

**12.** **උදකකුම්භිකා (උදකකුණ්ඩිකා) - ජල සැළිය. පරිස්සාවේති (පරි√සව+ණේ+ති) - පෙරයි.**

**14.** **බුද්ධාරම්මණ (න) - බුදුරජාණන් වහන්සේ ආරම්මණය කොට ඇති. පච්චුපට්ඨාපේති (පති+උප√ඨා+ණාපෙ+ති) - සිහිය යථා ස්ථානයට පමුණුවා ගනියි, ගෙනැවිත් දෙයි, එළවයි. (මෙ කාරිත ක්‍රියා රූපයයි. "පච්චුට්ඨාති" යන්න කාරිත නොවන ක්‍රියා පදයයි).**

**ගාථාවල අර්ථ.**

**(අ) තදහු - එදින (තමාට අවවාද කරන්නා වූ දින). පබ්බජිතෝ - ප්‍රව්‍රජ්‍යාවට. සන්තෝ - පත්වූයේ. ජාතියා - වයසින්. සත්තවස්සිකෝ - සත්හැවිරිදි වූ. සෝ'පි - ඒ සාමණේරයන් වහන්සේ ද. මං - මට. අනුසාසෙය්‍ය - අනුශාසනා කරන්නේ ද. මත්ථකේ - මස්තකයෙන්(තතියාර්ථ සත්තමියයි). සම්පටිච්ඡාමි - මැනවින් පිළිගනිමි.**

**(මේ ගාථාව සාරිපුත්ත මහා ස්ථවිරයන් වහන්සේ හට සිවුර හරි හැටි නොපෙරවී ඇතැයි පෙන්වා දුන් සාමණේරයන් වහන්සේ නමක්හට සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ විසින් ඇඟිලි බැඳ ගෞරවයෙන් වදාළ ගාථාවෙකි).**

**[ඛුද්දකනිකාය-මිළින්දපඤ්හපාළි].**

**(ආ) බුද්ධෝ'ති - බුදුරජාණන් වහන්සේ යැයි. කිත්තයන්තස්ස - කීර්තනය කරන්නහුට. කායේ - කයෙහි. යා පීති - යම් ප්‍රීතියක්. හවති - වෙයි ද. සා පීති - ඒ ප්‍රීතිය. ජම්බුදීපස්ස - ජම්බුද්වීපයාගේ. කසිණේන - වස්තූන් සියල්ලට වඩා. වරමේව - උතුම් වන්නේමය.**

**[දීඝනිකායට්ඨකථා]**

**පාළියට නගනු.**

**01.** අඳනයත් තනිපට සිවුරත් පරිමණ්ඩල වන පරිදි පොරවන්න.
**02.** නැවත පොරවන්න.
**03.** මෙසේ පෙරවිය යුතු.
**04.** වම් පැත්තෙන් සිවුරු කොණ එල්ලෙයි.
**05.** එහෙම හොඳයි.
**06.** දැන් බුද්ධෝපස්ථානයට යමු.

**07.** **ඔබ වහන්සේ බුදුරජාණන් වහන්සේව කවරකින් පුදන්නෙහිද?**

**08.** **ඔබ මල් නෙලීමට නො කැමැත්තෙහිද?**

**09.** **පැන් බඳුන මැනවින් සෝදන්න.**

**10.** **පැන් පෙරා ගෙන එනු.**

**11.** **බුදුරජාණන් වහන්සේ සිහි කොට නිදන්නේ වෙහි.**

**12.** **ඉතිපි සෝ පාඨයෙහි බුදු ගුණ නවය පාළියෙන් වෙන් කොට දක්වනු.**

**උපකාරක පාඨ.**

**07.** **කේන පූජෙස්සසි?**

**08.** **න නු ත්වං පුප්ඵං න ඔචිනිතුකාමෝ'සි?**

**11.** **බුද්ධං අනුස්සරිත්වා'ව (මනසි කරිත්වා'ව) සය!**

**12.** **පාළියා විභජිත්වා දස්සේහි.**

## 17. ආගන්තුකේන සද්ධිං කථාසල්ලාපෝ.

[ආගන්තුකයකු සමඟ කථා සල්ලාපය.]

**01. කච්චි භන්තේ, ඛමනීයං කච්චි යාපනීයං? (අඤ්ජලිං පග්ගය්හ පුච්ඡිතබ්බං).**

[ස්වාමීනි, කෙසේද ඉවසිය හැකි ද? යැපිය හැකි ද? (ඇඟිලි බැඳ විමසිය යුතු).]

**02. ආමා'වුසෝ ඛමනීයං යාපනීයං.**

[ඇවැත්නි, එසේය. ඉවසිය හැකිය, යැපිය හැකිය.]

**03. ඉදං භන්තේ, උදකං පරිභෝජනීයං. යදි භවං ඉච්ඡති, පාදේ පක්ඛාලේතු!**

[ස්වාමීනි, මේ පරිභෝජනීය ජලයයි. ඉදින් පින්වත් ස්වාමීන් වහන්සේ කැමති වේද, දෙපා සෝදනු මැනවි.]

**04. ඒවමාවුසෝ, පාදේ පක්ඛාලෙස්සාමි.**

[ඇවැත්නි, එසේය. දෙපා සෝදන්නෙමි.]

**05. ඉදං භන්තේ, පානීයං, පිවතු ආයස්මා!**

[ස්වාමීනි, මේ පානීය ජලයයි. ආයුෂ්මත් ස්වාමීන් වහන්සේ පැන් වළඳන සේක්වා!]

**06. අලං ආවුසෝ, නා'හං පිපාසිතෝ'ම්හි.**

[ඇවැත්නි, කම් නැත, මම පිපාසිත නොවෙමි.]

**07. ඉදං භන්තේ, ආසනං, ඉධ භවං නිසීදතු!**

[ස්වාමීනි, මේ ආසනයයි, පින්වත් ස්වාමීන් වහන්සේ මෙහි හිඳගනු මැනවි!]

**08. හෝතු ආවුසෝ, හෝතු! එත්ථේව නිසීදිස්සාමි.**

[ඇවැත්නි (එය එසේ) වේවා! මෙහිම හිඳින්නෙමි.]

**09. කුතෝ භවං ආගච්ඡති ? අප්පකිලමථේන අද්ධානං ආගමි ? අන්තරාමග්ගේ ච පිණ්ඩකේන න කිලමි ?**

[පින්වතුන් වහන්සේ කොහි සිට වැඩම කරන්නේ ද? අපහසුවකින් තොරව ගමන පැමිණියේ ද? අතරමඟ පිණ්ඩපාතයෙන් ද අපහසු නොවූයේ ද?]

**10. යැන්ගුන්නගරතෝ ආවුසෝ, ආගච්ඡාමි. අප්පකිලමථේන අද්ධානං ආගමිං, අන්තරාමග්ගේ ච පිණ්ඩකේන න කිලමිං.**

[ඇවැත්නි, යැන්ගුන් නගරයේ සිට පැමිණෙමි, නො ද ක්ලාන්තව ගමන් මග ආමි, අතර මග පිණ්ඩපාතයෙන් ද අපහසු නො වීමි.]

**11. කීවචිරං භන්තේ, ඉධ වසිස්සසි ?**

[ස්වාමීනි, මෙහි කොතරම් කල් වසන්නෙහි ද?]

**12. න චිරා'හං ආවුසෝ, කතිපාහමේව වසිස්සාමි.**

[ඇවැත්නි, බොහෝ කල් නොවේ, දින කිහිපයක් පමණක්ම වසන්නෙමි.]

**13. චිරං වා න වා යථාසුඛං වසතු! භන්තේ,**

[ස්වාමීනි, බොහෝ කල් හෝ නො බෝ කල් හෝ පහසු පරිද්දෙන් (සුවසේ) වැඩ වසන සේක්වා!]

**14. ඒවමාවුසෝ, බහූපකාරෝ'සි ත්වං මය්හං, සචේ අම්හාකං යැන්ගුන්නගරං ආගන්තුකාමෝ, අම්හාකං විහාරමේව උජුකං ආගන්ත්වා යථිච්ඡිතං වසාහි.**

[ඇවැත්නි, එසේය, නුඹ වහන්සේ මට බොහෝ උපකාර ඇත්තේ වෙහිය, ඉදින් අපගේ යැන්ගුන් නුවරට පැමිණෙනු කැමැත්තේ නම් කෙළින්ම අපගේ විහාරයටම පැමිණ කැමති පරිද්දෙන් වසනු.]

**15. අභිප්පමෝදාමි භන්තේ.**

[ස්වාමීනි, අතිශයින් සතුටු වෙමි.]

**(අ) කච්චි නු භෝතෝ කුසලං - කච්චි භෝතෝ අනාමයං**
**සබ්බේ ච සිස්සකා තුය්හං - ආරෝගා හොන්ති දායකා.**

**(ආ) කුසලඤ්චේව මේ තාත - අථෝ තාත අනාමයං**
**සබ්බේ ච සිස්සකා මය්හං - ආරෝගා හොන්ති දායකා.**

**(ඉ) යස්ස රුක්ඛස්ස ඡායාය - නිසීදෙය්‍ය සයෙය්‍ය වා**
**න තස්ස සාඛං භඤ්ජෙය්‍ය - මිත්තදූබ්භෝ හි පාපකෝ.**

**අමාරු වචන.**

**01.** ආගන්තුක (පු) - ආගන්තුකයා, අමුත්තා (මෙතැන්හි ආගන්තුකව පැමිණෙන භික්ෂු සාමණේරයන් ගනු ලැබේ. ගිහි ආගන්තුකයන්ට

**"අතිථි" යන පදය භාවිත කරනු).**
**යාපනීය (ති) - යැපීමට උපකාර දෙන, පැවැත්මට උපකාර වන.**
**ඛමනීය (ති) (ඛමු+අනීය) - ඉවසිය හැකි.**
**අඤ්ජලි (න) - ඇඳිලි බැඳීම. ( පුල්ලිංග ඊකාරන්ත වශයෙන් ගෙන "අඤ්ජලී" ලෙස කඞ්ඛාවිතරණීඅභිනව ටීකාවෙහි දක්වා ඇත).**
**පග්ගණ්හාති (ප+√ගහ+ණ්හා+ති) - දිගු කරයි, ඔසවයි, ආධාර කරයි, උත්සාහ කරයි. පග්ගය්හ (පූ.ක්‍රි) - ඔසවාගෙන, උස් කොට.**

**03.** **පරිභෝජනීය (ති) - පරිභෝග කටයුතු, වැළඳිය යුතු.**

**04.** **ඒවං (නි) - එසේය.**

**05.** **පානීය (න) - පිය යුතු ජලය.**

**06.** **අලං (නි) - ඇති, සෑහේය. සමහර තැනෙක්හි සුදුසු නොවේ, ප්‍රයෝජන නැත්තේය යන අරුත් දෙයි. පිපාසිත (ති) - පිපාස ඇතිවූ.**

**08.** **හෝතු - (එය එසේ) වේවා.**

**09.** **කිලමථ (පු) - ක්ලාන්තය, වෙහෙස. අප්පකිලමථේන - මහන්සියක් නොමැතිව.**
**අද්ධාන (න) - දීර්ඝ ගමන. (යොදුන් භාගයකට වැඩිනම් "අද්ධාන" යැයි කිව හැක. යොදුනක් යන්නට සැතපුම් එක හමාරේ සිට සැතපුම් දොළහ හමාරක් දක්වා නොයෙක් විදියේ ගණන් දැක්වීම් ඇත්තේය).**
**ආගමි - පැමිණියේ ද? ( අජ්ජතනී ඊ විභක්තිය හට ඉ ආදේශයි).**
**අන්තරාමග්ග (පු) - අතර මග.**
**පිණ්ඩකෝ (පිණ්ඩෝ) - දන් පිඬු. කිලමති (√කිලමු+අ+ති) – ක්ලාන්ත වෙයි, වෙහෙස වෙයි. කීවචිරං - කොපමණ කල්.**

**12.** **න චිරං - බොහෝ කල් නොවේ.**
**කතිපාහං (න) (කතිපි+අහං) - දින කීපයක්, කීප දිනක්.**
**යථාසුඛං - පහසු පරිද්දෙන්.**

**14.** **මය්හං - මට. බහූපකාරෝ (බහු+උපකාර) - බොහෝ උපකාර ඇත්තේ. උජුක (පු) - ඍජු, ඇද නැති. යථිච්ඡිත (ති) - කැමති පරිදි, සිත් සේ.**

**15.** **අභිප්පමෝදාමි (අභි+ප√මුද+අ+මි) - ඉතා සතුටු වෙමි.**

**ගාථා වල අර්ථය.**

**(අ) හෝතෝ - භවත්හුගේ. කුසලං - ආරෝග්‍ය භාවය. කච්චි නු - කෙසේ වෙයිද?. හෝතෝ- භවත්හුගේ. අනාමයං- නිරෝගී බව. කච්චි නු- කෙසේ වේද?. සබ්බේ - සියළු. සිස්සකා ච - ශිෂ්‍යයෝ ද. දායකා ච - දායකයෝ ද. ආරෝගා - රෝග නැත්තාහු. හොන්ති (නු) - වෙත් ද? (ආසීසත්ථ යැයි කියන ලද අන් අය හට ප්‍රාර්ථනා කිරීම් අර්ථයේ නොවී ප්‍රශ්න කරණයේ බැවින් කුසල, අනාමය පදය තිබුණ ද හෝතෝ යන්න සම්ප්‍රදාන විභක්ති නොවෙයි, සම්බන්ධ විභක්තියම වේ.)**

**(ආ) තාත - ඇවැත්නි. මේ - මාගේ. කුසලඤ්චේව - ආරෝග්‍ය බව මෙන්ම. (හෝති- වෙයි). අථෝ- ඊට අමතරව. -පෙ- ආරෝගා හොන්ති.**

**[තේමිය ජාතකයෙහි එන ගාථාවන් සුළු වශයෙන් සංස්කරණය කොට මෙම ගාථා සකස් කරන ලදි.]**

**(ඉ) යස්ස රුක්ඛස්ස - යම් වෘක්ෂයකගේ. ඡායාය - සෙවණෙහි. නිසීදෙය්‍ය වා - හිඳ ගන්නේ හෝ වේද. සයෙය්‍ය වා - සැතපෙන්නේ හෝ වේද. තස්ස - ඒ වෘක්ෂයාගේ. සාඛං - ශාඛාවක්. න භඤ්ජෙය්‍ය - නො බිඳින්නේය. හි - එය සත්‍යක්මය. මිත්තදූබ්භෝ - මිත්‍ර ද්‍රෝහී වූ. පාපකෝ - පාපී පුද්ගලයෙකි.**

**(මේ ගාථාව තේමිය ජාතකයෙහි බෝසතාණන් වහන්සේ විසින් සුනන්ද රථාචාර්යා හට කියන ලද්දකි. අන් ජාතකයන්හි ද දිස්වේ.)**

**පාළියට නගනු**

**01.** **සැප සනීප කෙසේද?**

**02.** පාද සෝදා පිස දා ගන්න.
**03.** මේ පානීය ජලයයි. අවැසි නම් වළඳනු මැනවි.
**04.** පිපාසිත වෙමි, පානීය ජලය දෙනු මැනවි.
**05.** කොහි සිට පැමිණ කොහි යන්නෙහි ද?
**06.** යැන්ගුන් සිට පැමිණ කොළඹ යන්නේ වෙමි.
**07.** යැන්ගුන් නුවර කෙතෙක් කල් විසුවෙහි ද?
**08.** මසක් පමණ විසීමි.
**09.** එහි පහසුවෙන් වැඩ විසුවෙහි ද?
**10.** ඇවැත්නි ඔබ මාහට බොහෝ උපකාරය, යැන්ගුන් නුවරට පැමිණි කල්හි කෙලින්ම අපගේ විහාරය වෙත වඩින්න.
**11.** නුඹ වහන්සේලා ආචායයීන් වහන්සේ වෙත කෙලින්ම නොපිවිසෙවු. උපාචාර්යායන් වහන්සේ වෙත එළැඹ ආචාර්යායන් වහන්සේ වෙත එළඹෙවු.

**උපකාරක පාඨ.**

**05.** කුතෝ ආගන්ත්වා කුහිං ගමිස්සසි ?
**08.** මාසමත්තං.
**09.** එහි - තත්ථ.
**10.** සම්පත්තකාලේ (යැන්ගුන්නගරං සම්පත්තෝ සමානෝ යනුවෙන් ද යෙදිය හැක).

## 18. මහාථේරස්ස සම්පත්තකාලේ කථාසල්ලාපෝ.

[මහ තෙරුන් වහන්සේගේ පැමිණි කල්හි කථා සල්ලාපය.]

**01. ඒකෝ භන්තේ, මහාථේරෝ ගිඤ්ජකාවසථේ සම්පත්තෝ.**

[ස්වාමීනි, එක් මහ තෙරුන් වහන්සේ නමක් ගඩොලින් තැනූ විහාරයෙහි සම්ප්‍රාප්ත වූයේ වෙයි.]

**02. කීවවුඩ්ඪෝ ?**

[කොතරම් වැඩිමහල් ද?]

**03. අතිමහල්ලකෝ භන්තේ.**

[ස්වාමීනි, අතිශයින් මහළුය (වැඩිමල්ය.)]

**04. මයා දහරෝ නු උදාහු වුඩ්ඪෝ?**

[මට වඩා බාල ද? නො එසේ නම් වැඩිමල් ද?]

**05. ආචරියතෝ වුඩ්ඪෝ.**

[ආචාර්‍යයන් වහන්සේට වඩා වැඩිමහල්ය.]

**06. යදි ඒවං ආගමිස්සාමි.**

[එසේ වී නම් පැමිණෙන්නෙමි.]

**07. භෝ.... අම්හාකං ආචරියභූතෝ මහාථේරෝ ආගතෝ, තුම්හේ ආගච්ඡථ!**

[පින්වත්නි..... අපගේ ගුරුවූ මහා තෙරුන් වහන්සේ සපැමිණි සේක. නුඹ වහන්සේලා වඩිනු මැනවි!]

**08. ආගන්තුකභූතස්ස මහාථෙරස්ස පානීයං උපනාමේථ! පාදේ පක්ඛාලේථ! ආසනං පඤ්ඤපේථ! සයනං සජ්ජේථ!**

[ආගන්තුක මහ තෙරුන් වහන්සේට පැන් එළවවු! පා දොවවු! ආසනයක් පණවවු! ඇඳක් පිළියෙළ කරවු!]

**09. ගිඤ්ජකාවසථං සෝධේථ! සකලං ආරාමං පාතෝ සම්මජ්ජථ!**

[ගඩොලින් කරවූ වෙහෙර පිරිසිදු කරවු! සියළු වෙහෙර උදෑසන හමදිවු!]

**10. යථා කස්සචි ථේරස්ස සම්පත්තකාලේ අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං ආසනාභිහාරෝ සෙයාාභිහාරෝ කාතබ්බෝ, තථෙව යථානුරූපං කරෝථ!**

[යම් තෙරුන් වහන්සේ නමකගේ සම්ප්‍රාප්ත කාලයෙහි යම් සේ පඤ්චාංග නමස්කාරයෙන් වැඳීම, උපස්ථාන කිරීම, ඇඳිලි බැඳීම, සුව දුක් පිළිබඳ කථා කිරීම, අසුන් ගෙන ඒම (ගෙනැවිත් පැණවීම), ඇඳ ගෙන

ඒම(ගෙනැවිත් පැණවීම) කළ යුතු ද එසේම සුදුසු පරිදි කරවු!]

**11. පච්චූසසමයේ පබුද්ධකාලේ මුඛධෝවනත්ථාය දන්තකට්ඨඤ්චේව සහ මුඛධෝවනපිණ්ඩියා මුඛෝදකං ච මුඛපුඤ්ඡනං ච උපට්ඨාපේථ!**

[ඉතා උදෑසන පිබිදුනු කල්හි මුව දෙවීම පිණිස දැහැටි මෙන්ම දත් බෙහෙත් ද සබන් සමඟ මුහුණ සෝදන ජලය ද මුහුණ පිස්නාව ද ගෙනැවිත් දෙවු!]

**(අ) යම්හා ධම්මං විජානෙයාා - සම්මාසම්බුද්ධදේසිතං**
**සක්කච්චං තං නමස්සෙයාා - අග්ගිහුතං'ව බ්‍රාහ්මණෝ.**

**අමාරු වචන.**

**01. ථේරෝ - තෙරුන් වහන්සේ. මහාථේරෝ - මහ තෙරුන් වහන්සේ. ගිඤ්ජකාවසථ (පු) - ගඩොලින් තැනූ ගෙය.**

**03. මහල්ලක, වුඩ්ඪ (පු) - මහළු, වෘද්ධ, වැඩිහිටි. දහරෝ - බාලයා. (මේ පද මහල්ලිකා, වුඩ්ඪා, දහරා යනුවෙන් ස්ත්‍රී ලිංගයෙහි වේ. "වුඩ්ඪ" යන තැන්හි "වුද්ධ" යන්න ද භාවිත කළ හැක). ආචරියභූතෝ - ආචාර්යන් වහන්සේ.**

**08. පඤ්ඤපේති (ප√ඤා+ණාපෙ+ති) - ආසන පනවයි.**

**09. සෝධේති (√සුධ+ණේ+ති) - සුජ්ඣති යන්නෙහි කාරිත රූපයයි. සුද්ධ කෙරේ.**

**10. අභිවාදන (න) - පඤ්චාංග නමස්කාරය. පච්චුට්ඨාන (න) - උපස්ථාන කිරීම, ළඟට පැමිණීම, පෙර ගමන් කිරීම. (පච්චුක්කමනං - ආගන්තුකයන්ට පෙර ගමන් කොට පිළිගැනීම). අඤ්ජලිකම්ම (න) - ඇඳිලි බැඳීම. සාමීචිකම්ම (න) - සුදුසු දේ කීම, සුවදුක් පිළිබඳ විමසීම. ආසනාභිහාර (ආසන+අභි+හාර) - ආසන ගෙන ඒම.**

**(“අභිවාදනං -පෙ- සෙය්‍යාභිහාරෝ කාතබ්බෝ” යන වාක්‍යයෙහි අභිවාදනං යනාදීන්ගේ ලිඟු නොසළකා අවසන් පදය වූ “සෙය්‍යාභිහාරෝ” යන පදයේ ලිංගය සළකා ක්‍රියා පදය තබන ලදි).**

**පබුද්ධ (ති) - අවදි වූ. පබුද්ධකාල (පු) - අවදි වූ කාලය.**

**උපට්ඨාපේති (උප√ඨා+ණාපේ+ති) - උපස්ථාන කරවයි.**

**ගාථාර්ථය.**

**(අ) බ්‍රාහ්මණෝ - බ්‍රාහ්මණ තෙමේ. අග්ගිහුත්තං - පුදන ලද ගින්න. සක්කච්චං - සකස් කොට. (නමස්සති) ඉව - නමස්කාර කරන්නාක් මෙන්. ඒවං - මෙසේ. යම්හා - යම් ගුරුවරයෙක් වෙතින්. සම්මාසම්බුද්ධදේසිතං - සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද. ධම්මං - ධර්මය. විජානෙය්‍ය - දැනගන්නේ ද. තං - ඒ ගුරුවරයාට. සක්කච්චං - සකස් කොට. නමස්සෙය්‍ය - නමස්කාර කරන්නේය.**

**පාළියට නගනු.**

**01.** **තෙරනමක් වැඩමකළේය. ගඩොලින් කළ විහාරයෙහි වැඩ සිටින සේක.**

**02.** **උන්වහන්සේ වයසින් වඩා වැඩි නොවේ. නමුත් ආචාර්යන් වහන්සේට වඩා වයසින් වැඩියි කියා සිතමි.**

**03.** **මාගේ මිත්‍රයන් වහන්සේයි. ඔබ වහන්සේලා පැන් පිළි ගන්වන්නෙවු.**

**04.** **ගඩොලින් කළ ආරාමය පිරිසිදු කරන ලදී.**

**05.** **ඇමදීම ද සිදු කරනු.**

**06.** **ඔබ වහන්සේලා පෙර ගමන් කරන්නෝ වවු.**

**07.** **සුදුසු පරිදි සිදු කරවු.**

**08.** **මුව දොවන පැන් පනවන ලද්දේ ද?**

## උපකාරක පාඨ.

**01. පැමිණියේය - ආගතෝ, සම්පත්තෝ.**

**02. වයසින් වැඩි යැයි සිතමි - වුඩ්ඪෝ'ති මඤ්ඤේ.**

**03. මිත්‍රයා - මිත්තෝ.**

**04. සෝදන ලද - ධෝවිත.**

**07. සුදුසු පරිදි - යථානුරූපං.**

**08. පනවන ලද - උපට්ඨාපිත.**

## 19. මහාථේරස්ස වත්තපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.
[මහ තෙරුන් වහන්සේගේ වතාවත් සම්බන්ධ කථා සල්ලාපය.]

**01. මහාථේරස්ස වසනකාලං භත්තං චේව සූපබ්‍යඤ්ජනං ච පණීතපණීතං පරිපාචේථ!**
[මහ තෙරුන් වහන්සේගේ වසන කාලයෙහි බත් මෙන්ම සූපව්‍යඤ්ජන ද ප්‍රණීත ප්‍රණීත පරිද්දෙන් පිසවවු!]

**02. භෝජනට්ඨානඤ්චේව භෝජනපීඨඤ්ච සුපරිසුද්ධං සජ්ජේථ!**
[දන් වළඳන තැන මෙන්ම දන් මේසය ද සුපිරිසිදුව පිළියෙළ කරවු!]

**03. භෝජනකාලේ'පි යෝ කෝචි සාමණේරෝ වා දහරෝ වා උපතිට්ඨතු යං ඉච්ඡති තං සුලභාය.**
[දන් වළඳන කල්හි ඳු (තෙරුන් වහන්සේ) යමක් (වළඳනු) කැමැති වේද එය පහසුවෙන් ලැබිය හැකි වනු පිණිස යම් කිසි සාමණේරයෙක් හෝ තරුණ භික්ෂුවක් හෝ ළඟ සිටීවා!]

**04. දිවසස්ස ද්වික්ඛත්තුං පිණ්ඩපාතං උපනාමේථ! පාතෝ පඤ්චනාඩිකාමත්තේ[1] දිවා අඩ්ඪේකාදසනාඩිකාමත්තේ ච කාලේ.**
[උදෑසන පහට පමණ ද දිවා කාලයෙහි දහය හමාරට පමණ ද දිනකට දෙවරක් පිණ්ඩපාතය ගෙනැවිත් දෙවු!]

**05. භෝජනට්ඨානේ උදපත්තං චේව පානීයත්ථාලකං ච පටිග්ගහං ච උපට්ඨාපේථ!**
[දන් වළඳන තැන වතුර ජෝගුව මෙන්ම පැන් තලිය ද පඩික්කම ද එළවවු!]

**06. භත්තකිච්චාවසානේ සහ දේවපණ්ණෝදකේන[2] ඛාදනීයං උපනාමේථ!**
[බත් කිස අවසානයෙහි තේ කොළ සමඟ කැවිලි එළවවු.]

**07. සායන්හේ'පි යං කිඤ්චි පානං පරිසුද්ධං පරිස්සාවෙත්වා උපනාමේථ! මා ච පානං සකසටං  සරජං හෝතු!**
[හවස් කාලයෙහි ද කිසියම් පානකයක් පිරිසිදුව පෙරා එළවවු! රේණු (රොඩු) සහිත ධූලි සහිත පානකයක් නොවේවා!]

---

[1] **පහට පමණ යැයි කියා ඇත්තේ අරුණ උදාවූ පසු බැව් හැඟවීමටයි.**

[2] **අමු තේ කොළ තම්බා කැවිලි සමඟ ආහාරයට ගැනීමේ පුරුද්දක් ඒ රට ඇත.**

**08. මහාථේරස්ස වසනට්ඨානං අනුදිනං සම්මජ්ජිත්වා සයනම්පි පටිසංහරථ!**
[මහ තෙරුන් වහන්සේ වසන තැන දිනපතා හැමද නිදන අසුන ද හකුළුවවු!]

**09. අයං මහාථේරෝ න යෝ වා සෝ වා හෝති. අත්තනෝ ජනපදේ පාකටානං ගණාචරියානං අඤ්ඤතරෝ, තුම්හාකම්පි පාචරියෝ. තස්මා යාව ඉමස්මිං විහාරේ වසති, තාව සක්කත්වා ගරුං කත්වා මානෙත්වා පූජෙත්වා වත්තපටිවත්තං කරෝථ!**
[මේ මහ තෙරුන් වහන්සේ එසේ මෙසේ අයෙකු නොවේ. තමන් වහන්සේගේ ජනපදයෙහි ප්‍රකට වූ ගණාචාර්‍යයන් වහන්සේලා (සමූහයකට උගන්වන ගුරුවරු) අතුරෙන් එක්තරා කෙනෙකි. නුඹ වහන්සේලාගේ ද ප්‍රාචාර්‍යයන් වහන්සේය (ගුරුවරයාගේ ගුරුවරයා). එහෙයින් උන්වහන්සේ යම් තාක් කල් මේ විහාරයෙහි වාසය කරන සේක්ද ඒ තාක් කල් සත්කාර කොට ගරු කොට බුහුමන් කොට පුදා වත් පිළිවෙත් කරවු.]

**(අ) න තේන ථේරෝ සෝ හෝති - යේන'ස්ස පලිතං සිරෝ**
**පරිපක්කෝ වයෝ තස්ස - මෝඝජිණ්ණෝ'ති වුච්චති.**

**(ආ) යම්හි සච්චඤ්ච ධම්මෝ ච - අහිංසා සංයමෝ දමෝ**
**සවේ වන්තමලෝ ධීරෝ - ථේරෝ ඉති පවුච්චති.**

**අමාරු වචන.**

**01. වසනකාලෝ - වාසය කරන කාලය. පණීතපණීතං - ප්‍රණීත ප්‍රණීත වූ. පරිපාචේති (පරි√පාච+ණෙ+ති) - පිසවයි, මෝරවයි (පරිපාචති යන්නෙහි කාරිත ක්‍රියා පදයයි).**

**02. භෝජනට්ඨාන (න) - භොජුන් හල. සුපරිසුද්ධ (ති) - විශේෂයෙන් පිරිසිදු වූ. උපතිට්ඨති (උප√ඨා+අ+ති) - වෙත එළඹෙයි, ළඟට පැමිණෙයි. සුලභ (ති) - පහසුවෙන් ලැබිය හැකි. දිවා (නි) - දිවා කාලයෙහි. අඩ්ඪේකාදසනාඩිකාමත්තේ - දහය හමාරට පමණ.**

**05.** **උදපත්තෝ - වතුර ජෝගුව. පානීයථාලක (න) - පැන් තලිය. පටිග්ගහ (පු) - පඩික්කම.**

**07.** **යං කිඤ්චි - යම් කිසි. පාන (න) - අඹ යුෂාදී පානක. කසට (පු) - රොඩු, රේණු. සරජ (ති) - ධූලි සහිත, කෙලෙස් සහිත.**

**09.** **ජනපද (පු) - ජනපදය. පාකට (ති) - ප්‍රසිද්ධ වූ. ගණ (පු) - සමූහය. අඤ්ඤතර (ති) - එක්තරා, ඇතැම්. තාව (නි) - අපරිච්ඡේදාර්ථයෙහි, එපමණක්. සක්කත්වා (පූ.ක්‍රි) - සත්කාර කොට. ගරුං කත්වා - ගරු කොට. මානේති (√මාන+ණේ+ති) - පුදයි, බුහුමන් කරයි. මානෙත්වා (පූ.ක්‍රි.) - බුහුමන් කොට, පුදා. වත්තපටිවත්ත (න) - වත් පිළිවෙත්.**

**ගාථා වල අර්ථය.**

**(අ) යේන - යම් හේතුවකින්. (යස්ස - යමකුගේ). සිරෝ - හිස (හිසකේ) පලිතං - සුදු වූයේ. අස්ස - වන්නේද. තේන - ඒ හිසකේ පැසුණ කාරණයෙන්. සෝ - හෙතෙමේ. ථේරෝ - තෙරුන් වහන්සේ නමක්. න හෝති - නො වන්නේය. පරිපක්කෝ - පැසුණා වූ. වයෝ - වයස ඇති. තස්ස - ඔහු හට. මෝඝජිණ්ණෝ'ති - ථේර කාරක ධර්මයන් නැති බැවින් හිස් මහල්ලා යැයි. වුච්චති - කියනු ලැබේ.**

**(ආ) යම්හි - යම් පුද්ගලයෙකු කෙරෙහි. සච්චඤ්ච - වචී සත්‍යය ද. ධම්මෝ ච - නව ලොවුතුරු දහමද. අහිංසා - අවිහිංසාව ද. සංයමෝ - කාය වාග් සංවරය නම් වූ සීල සංවරය ද. දමෝ - ඉන්ද්‍රිය සංවරය ද. (අත්ථි - ඇත්තේ ද). වන්තමලෝ - මාර්ග ඤාණයෙන් වමාරන ලද කෙලෙස් ඇතියේ. ධීරෝ - ධෛර්යවත් වූ. ස (සෝ) - හෙතෙමේ. වේ - ඒකාන්තයෙන්. ථේරෝ'ති - තෙරුන් වහන්සේ යැයි. පවුච්චති - කියනු ලැබේ.**

**පාළියට නගනු.**

**01.** තෙරුන් වහන්සේ මෙහි වැඩන වසන කාලයෙහි වත් පිළිවෙත් දක්වවු!

**02.** ප්‍රණීත දන් උන්වහන්සේට පිළිගන්වවු!

**03.** උන්වහන්සේ දානය වළඳන ස්ථානයට මේසය රුගෙන යන්න.

**04.** සාමණේර හිමි නමක් හෝ දරුවෙක් හෝ පැමිණේවා!

**05.** අවශ්‍ය දෑ පහසුවෙන් ලබනු පිණිස උන් වහන්සේගේ ළඟ වෙසෙනු!

**06.** දිනකට දෙවරක් දන් පිළිගන්වනු!

**07.** දිවා දානය දහය හමාරට පමණ පිළිගන්වවු!

**08.** මට උදෑසන පහට පමණ දන් වැළඳීම පිණිස ගමන් කිසක් ඇත්තේය.

**09.** වතුර ජෝගුව ද පඩික්කම ද මෙහි ගෙන එනු.

**10.** දිනපතා විහාරය ඇමද ආසනය අතුරනු!

**11.** තෝ මා කවරෙක් කියා සිතහිද? එසේ මෙසේ අයෙක් යැයි සිතන්නේ වෙහිද?

උපකාරක පාඨ.

**04.** ආගච්ඡතු යෝ කෝචි සාමණේරෝ වා දාරකෝ වා.

**08.** අත්ථි මේ පඤ්චනාඩිකාමත්තේ හත්තභුඤ්ජනත්ථාය ගමනකිච්චං.

**11.** කිං මඤ්ඤසි මං ත්වං? මඤ්ඤසි නු යං වා තං වා?

## 20. සජ්ඣයනපරිසමත්තකාලේ කථාසල්ලාපෝ.

[පාඩම් කොට අවසන් වූ කල්හි කථා සල්ලාපය.]

**01. ආවුසෝ ධම්මරක්ඛිත,ආයාම, ජඞ්ඝාවිහාරං අනුචඞ්කමිස්සාම, අනුවිචරිස්සාම.**
[ඇවැත්නි ධම්මරක්ඛිතය, යමු! ශරීර සුඛය පිණිස ඔබ මොබ සක්මන් කරමු, ඇවිදිමු.]

**02. සජ්ඣයනකිච්චං මේ භන්තේ, න සමත්තං.**
[ස්වාමීනි, මාගේ හැදෑරීම් කිස නොනිමිය.]

**03. සමාපේහි ආවුසෝ, සජ්ඣයනකිච්චං, පඤ්චසට්කතෝ තිංසපලං අතික්කන්තං. ආචරියේනා'පි පඤ්ඤත්තං "සායන්හේ පඤ්චසට්කකාලේ සජ්ඣයනං සමාපේතබ්බ"න්ති.**
[ඇවැත්නි, හදෑරීම් කිස අවසන් කරනු! පහ පසුවී මිනිත්තු තිහක් ඉක්මීය. "සවස පහට හැදෑරීම අවසන් කළ යුතු" යැයි ආචාර්‍යයන් වහන්සේ විසින් ද පණවන ලදී.]

**04. අතික්කන්තං නු භන්තේ, පඤ්චසට්කතෝ තිංසපලං ?**
[ස්වාමීනි, පහ පසුවී මිනිත්තු තිහක් ඉක්මී ද?]

**05. ඒවමාවුසෝ.**
[ඇවැත්නි, එසේය.]

**06. තේනහි සජ්ඣයනකිච්චං සමාපෙස්සාමි.**
[එසේ වී නම් හදාරන කෘත්‍යය නිම කරන්නෙමි.]

**07. ආයාම, ජඞ්ඝවිහාරං  අනුචඞ්කමිස්සාම, අනුවිචරිස්සාම.**
[යමු. ශරීර සුඛය පිණිස ඔබ මොබ සක්මන් කරමු, ඇවිදිමු.]

**08. තාව ගච්ඡථ භන්තේ, අත්ථි මේ උදකා'හරණවත්තං.**
[නුඹ වහන්සේ පළමුව වැඩම කෙරේවා! මට ජලය රැගෙන ඒමේ වත ඇත්තේය.]

**09. මය්හම්පි වත්තං අත්ථි, පච්චාගමනකාලේයේව කරිස්සාම.**
[මටද වතක් ඇත්තේය, නැවත පැමිණෙන කාලයෙහිම කරමු.]

**10. න යුත්තං භන්තේ, භාරනිත්ථාරකා අම්හාකං දෝසං ආරෝපෙස්සන්ති.**
[ස්වාමීනි, (එය) නුසුදුසුය. වත් භාරව සිටින ස්වාමීන් වහන්සේලා අපට දොස් නගන්නාහුය.]

**11. ආරෝපෙන්තු වා න වා, ආගච්ඡාහි. තමහං දෝසං පරියායේන පරිහරිස්සාමි.**

[දොස් නගත් හෝ නො නගත් හෝ වේවා, පැමිණෙනු.(අප වෙත නගන) ඒ දෝෂය පරියායෙන් පරිහරණය කරමි.]

**12. න භන්තේ, ඉමස්මිං විහාරේ ඒදිසං චිත්තං පට්ඨාපේතබ්බං, ඉච්ඡති ආචරියෝ සකලා'රාමස්ස උජුකභාවං. යස්ස අනුජුකභාවෝ පාකටෝ, තස්ස වාසම්පි න ඉච්ඡති.**

[ස්වාමීනි, මේ විහාරයෙහි එවැනි සිතක් නොපිහිටුවිය යුතු. ආචාර්‍යයන් වහන්සේ සියළු ආරාමයේ (ආරාමවාසීන්ගේ) ඍජු බව අපේක්ෂා කරන සේක. යමෙකුගේ (යමෙකු හට) ඍජු නොවන බවක් ප්‍රකට වෙයි ද, ඔහුගේ වාසය කිරීම ද අපේක්ෂා නොකරයි. ]

**13. සුණාහි භන්තේ, ආචරියස්ස සද්දෝ මඤ්ඤේ "සජ්ඣායනස්ස පරිසමාපනකාලෝ ආවුසෝ, වත්තං කත්වා'ච ජඞ්ඝවිහාරං අනුවඞ්කමථ, අනුවිචරථ".**

[ස්වාමීනි, අසනු මැනවි. ගුරුන් වහන්සේගේ හඬ යැයි සිතමි, " ඇවැත්නි, පාඩම් කිරීම අවසන් කිරීමට කාලයයි. වත් පිළිවෙත් කොට ශරීර සුඛය පිණිස ඔබමොබ ඇවිදිවු, සක්මන් කරවු".]

**14. නනු භන්තේ සුණිත්ථ ? අම්හාකං ආචරියස්ස කත්ථචි'පි පමාදවිහාරෝ නත්ථි. අත්තනෝ නිස්සිතකේසු සදා මනසි කරෝත්වේව.**

[ස්වාමීනි, නො ඇසුණි ද? අපගේ ආචාර්යන් වහන්සේගේ (ආචාර්යන් වහන්සේ හට) කිසි තැනෙකුදු ප්‍රමාද විහාරයෙක් නොවේ. තමන් වහන්සේ ඇසුරු කොට වසන්නවුන් කෙරෙහි සැම කල්හි සිහි කරන සේක්මය.]

**15. සච්චං ආවුසෝ, පඨමං වත්තං කරිත්වා පච්ඡා ජඞ්ඝාවිහාරං අනුවඞ්කමිස්සාම, අනුවිචරිස්සාම.**

[ඇවැත්නි, සත්‍යයය. පළමුව වත් කොට පසුව ශරීර සුඛය පිණිස ඇවිදිමු, සක්මන් කරමු.]

**(අ) ඵන්දනං චපලං චිත්තං - දූරක්ඛං දුන්නිවාරයං**
**උජුං කරෝති මේධාවී - උසුකාරෝ'ච තේජනං.**

## අමාරු වචන

**01. ජඞ්ඝවිහාරෝ / ජඞ්ඝාවිහාර (පු) - ශරීර සුඛය සඳහා ඇවිදීම.**
**අනුචඞ්කමති (අනු√කමු+අ+ති) - අනුව සක්මන් කෙරේ, කෙණ්ඩා වල ආබාධ වළකනු පිණිස ඔබ මොබ සක්මන් කරයි.**
**අනුවිචරති (අනු+වි√චර+අ+ති) - හැසිරෙයි, සක්මන් කරයි.**
**සජ්ඣායන (න) - හැදෑරීම, ඉගෙනීම. සම්පත්ත (ති) - පැමිණි.**
**03. සමාපේති (සං√අප+ණෙ+ති) - අවසන් කරයි.**
**08. තාව ගච්ඡථ - නුඹ වහන්සේ පළමුව වැඩම කෙරේවා.**
**උදකාහරණවත්ත (න) - ජලය ගෙන ඒමේ වත.**
**09. පච්චාගමන (න) (පති+ආගමන) - ආපසු පැමිණීම.**
**භාරනිත්ථාරක (පු) - කාර්‍ය්‍ය නිමකරවන්නා.**
**ආරෝපේති (ආ√රුප+ණෙ+ති) - දොස් නංවයි, පටවයි.**
**11. පරියාය (පු) - කෙළින් නොකියා අන්‍ය වචන වලින් කීම.**
**පරිහරති (පරි√හර+අ+ති) - පරිහරණය කරයි.**
**12. ඒදිස (ඊදිස) (ති) - මෙවැනි.**
**පට්ඨාපේති (ප√ඨා+ආපෙ+ති) - පිහිටුවයි. න පට්ඨාපේතබ්බං- නො පිහිටුවිය යුතු.**
**අනුජුක (ති) - ඍජු නොවූ. පමාදවිහාරෝ - ප්‍රමාද විහාරය.**
**නිස්සිතකෝ (නිස්සිතෝ) - ආශ්‍රිත වූයේ, ආශ්‍රය කොට වසනුයේ, අන්‍යයකුගෙන් යැපෙනුයේ.**

## ගාථාවේ අර්ථය.

**(අ) ඵන්දනං - පඤ්චවිධ කාමාරම්මණයෙහි නිතර සැලෙන්නා වූ. චපලං - චපල වූ. දුරක්ඛං - රැකිය නොහැකි වූ. දුන්නිවාරයං - විසභාග ආරම්මණැයි කියන ලද ස්ත්‍රී පුරුෂාරම්මණයෙන් වැළකිය නොහැකි වූ. චිත්තං - සිත. උසුකාරෝ - හී වඩුවා. තේජනං - හී දණ්ඩ. උජුං කරෝති ඉව - ඇද නැති කරන්නාක් මෙන්. (ඒවං) - මෙසේ. මේධාවී - ඥානවන්ත තෙමේ. (චිත්තං - සිත).**

උජුං - ඇද නැති (ඍජු). කරෝති - කරන්නේය.

[ධම්මපද-චිත්තවග්ග].

### පාළියට නගනු.

01. සවස පාඩම් කොට අවසන් වුණු කල්හි ඇවිදීමට යාම මේ විහාරයේ පුරුද්දකි.
02. පාඩම් කොට අවසන් වුණු කල්හි ඇවිදින්නෝ වවු.
03. සංඝරක්ඛිත සාමණේරය, පැමිණෙන්න ඇවිදීමට යමු.
04. දැන් පාඩම් කරන කාලය අවසන් වීද?
05. සවස සය වීය.
06. සය වී නැත, වේලාව පහය.
07. ඔබ වහන්සේ වඩිනු මැනවි. මම පසුව එන්නෙමි.
08. නැවත වඩින කල්හි අපි පාළියෙන් කථා කරමු.
09. බොරු කීම හොඳ නැතැයි සිතමි. ඍජුව කථා කිරීම ම හොඳ වන්නේය.
10. ඉදින් ඍජු නොවන කථාවක් වන්නේද එය විහාරයෙන් පිටතට විසි කරනු.
11. අසන්න. ඒ ගුවන් යානා හඬකි.
12. බිය නොවන්න. තම වැඩය පමණක් කරනු.
13. ආචාර්යන් වහන්සේලා සැම කල්හි ශිෂ්‍යන් කෙරෙහි සොයා බලන සිත් ඇත්තාහු වෙත්.

### උපකාරක පාඨ.

01. ධම්මතායේවේසා ඉමස්මිං විහාරේ යදිදං සායන්හේ සජ්ඣායනපරිසමත්තකාලේ ජඞ්ඝාවිහාරං අනුවඞ්කමෝ් අනුවිචාරෝ
("ජඞ්ඝාවිහාරං අනුවඞ්කමෝ් අනුවිචාරෝ" යන්න වෙනුවට චඞ්කමන යැයි ද භාවිත කළ හැක.)
04. ඉදානි'පි සජ්ඣායනං න පරිසමත්තං නු ?

**05. ඡන්නාඩිකා'පි හෝති.**
**06. න ඛෝ වේලා ඡන්නාඩිකා. පඤ්චනාඩිකායේව.**
**07. තාව ගච්ඡථ.**
**08. කථාසල්ලාපං කරිස්සාම.**
**09. වඤ්චෙත්වා කථනං න සුන්දරං මඤ්ඤේ. උජුකකථනමේව සුන්දරං භවෙය්‍ය.**
**10. යදි අනුජුකතා පාකටා.**
**13. සැම කල්හි - සබ්බදා, සදා.**

**(පටිගත - නැවත යාම. ආගත - පැමිණීම.**
**පච්චාගත (පටි+ආගත) - ආපසු පැමිණීම.)**

## 21. ජඞ්ඝාවිහරණකාලේ කථාසල්ලාපෝ.

[සක්මන් කරන කාලයෙහි කථා සල්ලාපය.]

**01. ආවුසෝ ධම්මරක්ඛිත, න ආගිලායති නු තේ පිට්ඨී ?**

[ඇවැත්නි ධම්මරක්ඛිතය, නුඹ වහන්සේගේ කොන්ද නොරිදෙයි ද? ]

**02. ආම භන්තේ, පිට්ඨී මේ ආගිලායති.**

[ස්වාමීනි, එසේමය. මාගේ කොන්ද රිදෙයි.]

**03. මය්හං පන න පිට්ඨීයේව ආගිලායති. පාදා'පි ඌරූ'පි ආගිලායන්ති. තස්මායේව අනුදිනං ඉමස්මිං කාලේ ජඞ්ඝාවිහාරං අනුචඞ්කමාමි, අනුවිචරාමි.**

[මට වනාහි පිට කොන්ද පමණක්ම රිදෙන්නේ නොවේ. දෙපාත් කලවාත් රිදෙත්. එහෙයින්ම දිනපතා මේ වේලාවෙහි ශරීර සුඛය පිණිස ඔබ මොබ ඇවිදිමි, සක්මන් කරමි.]

**04. අම්හාකං ආචරියෝ'පි චඞ්කමනබහුලෝ, ගන්ථම්පි චඞ්කමන්තෝයේව වාචේති ඨපෙත්වා මහාගන්ථේ. තස්මායේව ආචරියෝ පුබ්බේ අකල්ලා'පි ඉදානි කල්ලෝ විය දිස්සති.**

[අපගේ ආචාර්යන් වහන්සේ ද බහුල සක්මන් ඇත්තේ, පෙළ අටුවා ආදී මහා පොත් හැර (අන්) ග්‍රන්ථ ද සක්මන් කරන්නේ ම උගන්වන සේක. එහෙයින්ම උන්වහන්සේ පෙර රෝගී වූයේ දැන් නිරෝගී මෙන් පෙනේ.]

**05. සච්චං ආවුසෝ, භගවතා පඤ්චචඞ්කමානිසංසා වුත්තා - පඤ්චිමේ භික්ඛවේ, චඞ්කමේ ආනිසංසා. කතමේ පඤ්ච ?**

I. **අද්ධානක්ඛමෝ හෝති.**
II. **පධානක්ඛමෝ හෝති.**
III. **අප්පාබාධෝ හෝති.**
IV. **අසිතං පීතං ඛායිතං සායිතං සම්මාපරිණාමං ගච්ඡති.**
V. **චඞ්කමාධිගතෝ සමාධි චිරට්ඨිතිකෝ හෝති. ඉමේ ඛෝ භික්ඛවේ චඞ්කමේ ආනිසංසා'ති. [අංගුත්තර නිකාය]**

[ඇවැත්නි, සත්‍යය. “ මහණෙනි, සක්මන් කිරීමෙහි මේ පස් ආනිසංසයෝ වෙත්,

I. [දීර්ඝ ගමන් ඉවසිය හැක්කේ වෙයි.]
II. [පධන් වීයර්‍යයට ක්ෂම (සුදුසු) වූයේ වෙයි.]
III. [අල්පාබාධ ඇත්තේ වෙයි.]
IV. [වැළඳූ ආහාර මනාව දිරවන්නේය.]
V. [සක්මන් කිරීමෙන් ලබා ගත් සමාධිය බොහෝ කල් පවත්නේ වෙයි.]

මහණෙනි, සක්මන් කිරීමෙහි ආනිසංස මේ පස් දෙනෙක්හු යැ''යි භාග්‍යවතුන් වහන්සේ විසින් සක්මන් කිරීමෙහි ආනිශංසයෝ පසක් දේශනා කරණ ලදී.]

**06. විහාරං නිවත්තිස්සාම, අකාලෝ අජ්ජ ඉමං ඨානං අතික්කමිත්වා ගන්තුං.**

[විහාරයට ආපසු හැරෙන්නෙමු, අද මේ ස්ථානය ඉක්මවා යෑමට කාලය නොවේ.]

**07. සුණෝහි, අනුවඞ්කමිත්වා අනුවිචරිත්වා නිවත්තානං උපාහනසද්දෝ මඤ්ඤේ.**

[ඔබ මොබ ඇවිද සක්මන් කොට ආපසු හැරෙන්නවුන්ගේ පාවහන් හඬැයි සිතමි. අසනු මැනවි.]

**(අ) පඤ්චිමේ චඞ්කමේ අත්ථා - ඛමෝ අද්ධෙ පධානියෝ**
**අප්පා'බාධෝ පරිණාමෝ - සමාධි චිරට්ඨිතිකෝ.**

**අමාරු වචන.**

**01. ආගිලායති (ආ√ගිලා+ය+ති) - රිදෙයි, ගිලන් වෙයි, රුජා කෙරෙයි.**
**03. පිට්ඨියේව - පිට කොන්ද පමණක් ම. ඌරු (පු) - කලව.**
**04. මහාගන්ථෝ - මහා ග්‍රන්ථය (පාළි, අට්ඨකථා).**
**ඨපෙත්වා - හැර. කල්ල (පු /න) - නිරෝගී. අකල්ලෝ - රෝගියා.**
**දිස්සති (√දිස+ය+ති) - පෙනේ.**
**චඞ්කමානිසංසෝ(චඞ්කමේ+ආනිසංසෝ > චඞ්කම + ආනිසංසෝ)**
**- ඇවිදීමෙහි ආනිසංස.**

**වුත්ත (ති) - කියන ලද. අද්ධානක්ඛමෝ - දුර ගමන් ඉවසිය හැක්කේ/ දීර්ඝ ගමන් සැහිය හැක්කේ. පධානක්ඛමෝ - පධන් වීයායයට සුදුසු වූයේ.**
**ආබාධෝ - ආබාධ ඇත්තේ. අප්පාබාධෝ - අල්පාබාධ ඇත්තේ. අසිත (න) - කන ලද ආහාරය(පඤ්චභෝජන). පීත (ති) - බොන ලද. ඛායිත (ති) - කන ලද(කැවිලි ආදිය). සායිත (ති) - දිවෙන් රස විඳින ලද.        පරිණාම (පු) - ආහාර දිරවීම.**
**චඞ්කමාධිගතෝ (චඞ්කම + අධිගතෝ) - සක්මන් කිරීමෙන් ලැබූ. චිරට්ඨිතික (ති) - දිගු කල් පවත්නා.**

**06.** **නිවත්තති (නි√වතු+අ+ති) - නවතී, ආපසු හැරේ. අකාලෝ - අකාලය.**

**07.** **නිවත්තෝ - නැවතුනේ.**

**ගාථාවේ අර්ථය.**

**(අ) චඞ්කමේ - සක්මන් කිරීමෙහි. අත්ථා - ආනිසංසයෝ. ඉමේ පඤ්ච - මේ පස්දෙනෙක්හුය. අද්ධෙ - දීර්ඝ ගමනෙහි. ඛමෝ - ඉවසිය හැක්කේය. පධානියෝ - කමටහන් වැඞීමෙහි දැරිය හැක්කේ. ඛමෝ - ඉවසිය හැක්කේය. අප්පාබාධෝ - අල්පාබාධ ඇත්තේය. පරිණාමෝ - වළඳන ලද අහර මනාව දිරවන්නේය. සමාධිචිරට්ඨිතිකෝ - සමාධිය දිගු කල් පවත්නේ වේ.**

**පාළියට නගනු.**

**01.** **නුඹ වහන්සේගේ දෙපා නොරිදේද?**

**02.** **පාද පමණක් නොවේ තුනටිය ද රිදෙන්නේ වෙයි.**

**03.** **එසේ නම් ඇවිදින්න.**

**04.** **ඇවිදීමට කැමැත්තෙමි. නමුත් තෙරුන් වහන්සේගේ වචනයෙන්**

බිය වෙමි.

**05.** තෙරුන් වහන්සේ කිසිවක් නොකියන සේක. තෙරුන් වහන්සේ හට සක්මන් කිරීම රුචි වෙයි.

**06.** තෙරුන් වහන්සේ සක්මන් කරමින් උගන්වන සේක.

**07.** බුදුරජාණන් වහන්සේ විසින් සක්මනෙහි ආනිසංස පහක් දේශනා කොට වදාරා ඇත.

**08.** මට බොහෝ දුර ගමන් යා හැක්කේය.

**09.** හෙතෙමේ කර්මස්ථාන වැඩීමෙහි ඉවසිය හැක්කෙක්ය.

**10.** නවතිවු, මෙතැන ඉක්මවා ඉදිරියට යෑමට දැන් අකාලයයි.

උපකාරක පාඨ.

**01.** න ආගිලායන්ති තේ පාදා ?

**02.** තුනටිය - කටි.

**03.** ත්තේන හි චඞ්කමාහි.

**04.** චඞ්කමිතුං පන ඉච්ඡාමි. තථා'පි ථෙරස්ස වචනතෝ භායාමි.

**05.** න වක්ඛති, රුච්චති ථේරස්ස චඞ්කමනං.

**10.** නිවත්තථ, අකාලෝ ඉමං ඨානං අතික්කමිත්වා පුරතෝ ගන්තුං.

## 22. පානපටිසංයුත්තො කථාසල්ලාපො.

[පානක සම්බන්ධ කථා සල්ලාපය.]

**01. ආවුසො ධම්මරක්ඛිත, අහං පිපාසිතො'ම්හි. න සම්පත්තා නු පානවේලා ?**

[ඇවැත්නි ධම්මරක්ඛිතය, මම පිපාසිතවූයේ වෙමි. පානක වළඳන වේලාව එළැඹුණේ නොවේද?]

**02. න සම්පත්තා භන්තෙ, පානවේලා, අපිතු උපකට්ඨා, ඉදානි ඡග්ඝටිකා හොති. ඡග්ඝටිකතො තිංසවිඝටිකා'තික්කන්තසමයෙ කාලං ඝොසෙස්සති.**

[ස්වාමීනි, පානක වළඳන වේලාව එළැඹුණේ නොවේ, නමුදු සමීප විය. දැන් වේලාව සයයි. සය පසුවී විනාඩි තිහක් ඉක්ම වුණු කල කාලය දන්වන්නේය.]

**03. අජ්ජ කිං පායෙස්සති? පක්කං ගුළොදකං? උදාහු යං කිඤ්චි පානං ?**

[ස්වාමීනි, අද කිනම් දෙයක් වළඳවන්නේද? උණු කරන ලද සකුරු පැන් ද ? නො එසේ නම් යම් කිසි පානකයක් ද?]

**04. (දහරේන කථිතං) ගුළොදකං මඤ්ඤෙ. භත්තපචනට්ඨානෙ අග්ගි දිස්සති. (සාමණේරේන කථිතං) "පක්කං භන්තෙ ගුළොදකං", (දහරේන කථිතං) අයොදණ්ඩං පහර!**

[බත් පිසින තැන්හි ගිනි දිස්වේ. සකුරු පැන් (යැයි) හඟිමි. "ස්වාමීනි, සකුරු පැන් උණු කරන ලදී", යකඩ දණ්ඩට පහර දෙනු.]

**05. න නු මයා වුත්තං "ගුළොදකං මඤ්ඤෙ'ති, භත්තපචනට්ඨානෙ අග්ගි දිස්සති"ති ?**

["බත් පිසින තැන්හි ගිනි දිස්වේ. සකුරු පැන් (වන්නේ යැයි) හඟිමි" යනුවෙන් මා විසින් කියන ලද්දේ නොවී ද?]

**06. සච්චං ආවුසො, මුඛෙ තෙ අපිහිතෙ'යෙව සාමණෙරො කාලං ඝොසෙති.**

[ඇවැත්නි, නුඹ වහන්සේගේ කට වැසීමට පෙරම සාමණේරයන් වහන්සේ කාලය දන්වයි.]

**07. ස්වෙ පන මාතුලුඞ්ගපානං පායෙස්සති.**

[හෙට වනාහි නස් නාරන් යුෂ වළඳවන්නේය.]

**08. කථං ජානාසි ?**

[කෙසේ දන්නෙහි ද?]

**09. සගායින් පබ්බතේ ඒකාය උපාසිකාය පානතුම්බෝ සහ සක්ඛරාය ආචරියස්ස සන්තිකං පේසිතෝ. තේන සඤ්ඤාණේන ජානාමි.**

[සගායින් පර්වතයෙහි (වසන්නා වූ) එක් උපාසිකාවක් විසින් හකුරු සමඟ යුෂ බෝතලයක් ආචාර්යන් වහන්සේ වෙත එවන ලදී. ඒ ලකුණෙන් දනිමි.]

**10. කතමං ආනිසංසං අපෙක්ඛිත්වා අනුසායං ආචරියෝ නිස්සිතකේ පානං වා ගුළෝදකං වා පායේති ?**

[කිනම් ආනිසංසයක් අපේක්ෂා කොට ආචාර්යන් වහන්සේ සැම සවසකම (තම) ශිෂ්‍යයන්ට පානකයක් හෝ හකුරු පැන් හෝ වළඳවන්නේ ද?]

**11. ආචරියෝ සයං පිපාසබහුලෝ, තස්මා අත්තානං උපමං කත්වා අනුසායං පානං පායේති, අපිච සයං සෝතුභාවේ ඨිතෝ තාදිසස්ස උපත්ථම්භනස්ස අලද්ධත්තා දුබ්බලෝ'ව ගන්ථේසු මහුස්සාහං අකාසි. තප්පච්චයා ච පච්ඡා නානාරෝගී අහෝසි. අත්තනෝ පන නිස්සිතකේ තබ්භාවං අපාපේතුකාමතාය'පි අනුසායං පානං පායේති.**

[ආචාර්යන් වහන්සේ තෙමේ බොහෝ පිපාස ඇත්තේයි, එහෙයින් තමන් වහන්සේ උපමා කොට සැම සන්ධ්‍යාවකම පානකයක් වළඳවන සේක. තවද තමන් වහන්සේ ශිෂ්‍ය භාවයෙහි සිටි කළ එවැනි උපකාරයක් නොලැබූ බැවින් ග්‍රන්ථයන්හි මහත් උත්සාහයක් කළ සේක. එකරුණින් ද පසු කලෙක බොහෝ රෝග ඇත්තේ විය. තමන් වහන්සේගේ සිසු දරුවන් එවැනි තත්ත්වයකට නොපමුණුවනු කැමති බැවින් ද සවසක් පාසා පානකයක් වළඳවන සේක.]

**12. සාධු වත ආවුසෝ, ආචරියස්ස මනසිකාරෝ.**

[ඇවැත්නි, ආචාර්යන් වහන්සේගේ මනසිකාරය වනාහි හොඳය.]

**(අ) සතියා පිපාසායේව - කප්පතේ යාමකාලිකං**
**තස්මා හේතං පටිග්ගාහේ - පච්චවෙක්ඛෙය්‍ය පානනේ.**

**අමාරු වචන.**

**01. පානවේලා (ඉ) - පානක වළඳන වේලාව. ("උපකණ්ඨා" යන්න**

වෙනුවට "උපකට්ඨා" යන්නද පරිහරණය කළ හැක).
ඡග්ඝටිකා - වේලාව හයයි. විඝටිකා - මිනිත්තු (මුල් පාඩමෙක "පලං" යැයි දක්වන ලදි).
ඝෝසේති (√ඝුස+ණෙ+ති) - ඝෝෂා කරයි, ශබ්ද කරයි.

03. පායේති (√පා+ණෙ+ති) - "පිවති" යන්නෙහි කාරිත ක්‍රියා රූපයයි. පක්ක (ති) - පිසින ලද. යං කිඤ්චි පානං - යම් කිසි පානකයක්.

04. භත්තපචනට්ඨානං - බත් පිසින තැන.

05. වුත්තං න නු - කියන ලද්දේ නොවේද?

06. පිහිත (ති) - වසන ලද.

07. මාතුලුඞ්ග (පු) - නස්නාරන්. මාතුලුඞ්ගපාන (ති) - නස්නාරන් යුෂ. නාරඞ්ගෝ - දොඩම්.

08. කථං (නි) - කෙසේ.

09. පානතුම්බෝ - යුෂ දමන බෝතලය. පේසිත/ පහිත (ති) - යවන ලද.
සඤ්ඤාණ (න) - ලකුණ, සලකුණ.

10. අපෙක්ඛති (අප√ඉක්ඛ+අ+ති) - අපේක්ෂා කරයි.
අනුසායං - සවසක් පාසා. සයං (නි) - තෙමේ, තමා විසින්.
පිපාසිත (ති) - පිපාසා ඇති. පිපාසිතබහුලෝ - බොහෝ පිපාසා ඇත්තේ.
උපමා (ඉ) - සමාන කිරීම, උදාහරණය.
සෝතු (සෝතා) - අසන්නා, ඇහුම් කන් දෙන්නා (මේ "සෝතු" යන පදය "සත්ථු" පදය මෙන් වර නැගිය යුතු. ප්‍රථමා විභක්ති ඒකවචනයෙහි "සෝතා" වශයෙන් වර නැගෙයි. "සෝතුජන" යන පදය ද මේ "සෝතු" පදය වෙනුවට යෙදිය හැක).
තාදිස, තාදිසක (ති) - එවැනි, එබඳු.
උපත්ථම්භන (න) - උපකාර වීම. ලද්ධ (ති) - ලැබූ. ලද්ධත්තං - ලැබූ බව. දුබ්බලෝ - දුර්වල වූයේ. උස්සාහෝ - උත්සාහය, උත්සාහ ඇත්තේ. තප්පච්චයෝ - ඒ හේතුව, ඒ කාරණය. නානාරෝගී - නොයෙක් රෝග ඇත්තේ. තබ්භාවෝ - ඒ භාවය. අපාපේතුකාමතා - නොපමුණුවනු කැමති බව.

**12. සාධු (සුන්දරෝ) වත - සුන්දරය, කදිමය.**

**13. මනසිකාරෝ - මනසිකාරය, සිතිවිල්ල, මෙනෙහි කිරීම.**

**ගාථාවේ අර්ථය.**

**(අ) පිපාසාය - පිපාසය. සතියා ඒව - ඇති කල්හිම. යාමකාලිකං - යාම කාලිකය. කප්පතේ - කැපය. තස්මා හි - එසේ පිපාසකාරණයෙන්ම. ඒතං - මේ යාමකාලිකය. පටිග්ගහේ - පිළිගනීමෙහි ද. පානනේ - පානය කිරීමෙහි ද. පච්චවෙක්ඛෙය්‍ය - ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය.**

**පාළියට නගනු.**

**01. ස්වාමීනි, පානක වැළඳීමට කාලය එළඹී ඇත්තේය.**
**02. ගෙඩිය නාද කරනු.**
**03. වේලාව පහයි මිනිත්තු පහයි.**
**04. වේලාව පහහමාරයි.**
**05. පානක කොහි ඇත්තේද?**
**06. බත් පිසින තැන්හි ගිනි දිස්වේ. කුමක් පිසින්නේද?**
**07. උණු සකුරු පැන් පිසින්නේය.**
**08. ගෙඩිය ගසන්න යැයි කියා කට වැසීමට කලින්ම ම ගෙඩිය ගැසීය.**
**09. මේ යුෂ බෝතලය සමඟ හකුරු තෙරුන් වහන්සේට පිළිගන්වන්න.**
**10. කවර ආනිසංස දැන පානක වළඳන්නේද?**
**11. මා මෙන් ඔවුහු ද පිපාසිතවන්නාහු යැයි තමා උපමා කරයි.**
**12. ඔබේ සිතුවිල්ල හොඳ නැත.**

**උපකාරක පාඨ.**

**01. පානවේලා භන්තේ.**
**04. අඩ්ඪඡග්ඝටිකා (විසිවැනි පාඩමෙහි අංක තුනෙහි දැක්වූ පරිදි ද**

**යෙදිය හැක.)**

**06. කිං පචිස්සති ?**

**09. ඉමිනා පානතුම්බේන සද්ධිං සක්ඛරං ජේරස්ස දේහි.**

**11. අහං විය තේ'පි පිපාසිතා භවෙය්‍යුන්ති අත්තානං උපමං කරෝති.**

## 23. පානවේලායං කථාසල්ලාපෝ.
[පානක වළඳන කල්හි කථා සල්ලාපය.]

**01. සුණොහි භන්තේ, අයං කිංසද්දෝ ?**
[ස්වාමීනි, අසනු මැනවි. මේ කිනම් ශබ්දයක් ද?]

**02. අයං කාලාරෝචනසද්දෝ, ගච්ඡාම පානට්ඨානං.**
[මේ කාලය දන්වන ශබ්දයයි. පානක වළඳන තැනට[1] යමු.]

**03. කිං පන භන්තේ, තුච්ඡහත්ථේනේව ගන්තබ්බං.**
[ස්වාමීනි, කිම් ද? හිස් අතින්ම යා යුතු ද? ]

**04. නා'වුසෝ තුච්ඡහත්ථේනේව ගන්තබ්බං. යථාසකං පානථාලකං ගහෙත්වා ගන්තබ්බං. තස්මා තව ථාලකං ගණ්හාහි.**
[ඇවැත්නි, හිස් අතින් ම නොයා යුතු. තම තමා සන්තක පානක වළඳන කෝප්පය ගෙන යා යුතු. එහෙයින් නුඹ වහන්සේ සතු කෝප්පය ගනු.]

**05. අප්පකං මඤ්ඤේ අජ්ජ ගුළෝදකං.**
[අද සකුරු පැන් ස්වල්ප (යැයි) හඟිමි.]

**06. සච්චං ආවුසෝ, පචනසටෝ නප්පහෝති. තස්මා සඞ්ඝප්පමාණේන පමීයමානං ගුළෝදකං අප්පකං විය දිස්සති. ස්වේ පන මහාපචනසටං ලභිස්සති.**
[ඇවැත්නි, සත්‍යයය. පානක පිසින සැළිය පොහෝනා ( ප්‍රමාණ) නොවෙයි. එහෙයින් ස්වාමින් වහන්සේලා ප්‍රමාණයෙන් මනිනු ලබන (ගණිනු ලබන කල්හි) සකුරු පැන් ස්වල්පයක් මෙන් දිස්වේ. හෙට වනාහි විශාල පිසින සැළියක් ලැබෙන්නේය.]

**07. පක්ඛිප ආවුසෝ, මම ථාලකේ.**
[ඇවැත්නි, මගේ කෝප්පයට වත් කරනු!]

**08. මම ථාලකේ'පි පක්ඛිප!**
[මගේ කෝප්පයෙහි ද වත් කරනු.]

**09. මා සුරුසුරුකාරකං පිවථ!**
[සුරු සුරු යන හඬ නගමින් නො බොවු!]

**10. භගවතා ආවුසෝ අට්ඨපානානි පිපාසිතානං යේව විකාලේ පානාය**

---

**[1] නා උයන ආරණ්‍යයෙහි වනාහි මෙතැනට ගිලන් පස ශාලාව යැයි කියත්.**

**අනුඤ්ඤාතානි. සෙය්‍යථීදං? අම්බපානං, ජම්බුපානං, චෝචපානං, මෝචපානං, මධූකපානං, මුද්දිකපානං, සාලූකපානං, ඵාරුසකපාන’න්ති. විඤ්චමාතුලුඞ්ගාදිපානානි පන තේසං අනුලෝමානි නාම.**

[ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් පිපාසිතයන් හටම විකාලයෙහි බොනු පිණිස පානක අටක් අනු දැන වදාරණ ලදී. කවර අටක් ද? අඹ පැන්, දඹ පැන්, ඇට කෙසෙල් පැන්, කෙසෙල් පැන්, මී පැන් යුෂ, මුද්දරප්පලම් යුෂ, මානෙල් ගෙඩි යුෂ, උගුරැස්ස යුෂ යන මේ අටයි. සියඹලා, නස් නාරන් ආදී යුෂ ඔවුනට අනුලෝම පානකයෝයි.]

**11. ඒතානි ආවුසෝ පානානි අග්ගිසන්තත්තානි න වට්ටන්ති. මද්දිත්වා නික්කසටං පරිස්සාවෙත්වා පටිග්ගහිතානි පානානියේව වට්ටන්ති. සචේ පරිස්සාවිතේ’පි පානේ කසටං සන්දස්සියමානං හෝති. න වට්ටතී’ති දට්ඨබ්බං.**

[ඇවැත්නි, ගින්නෙන් රත් කරන ලද ඒ (අෂ්ටාදී) පානකයෝ නො වටිත්. මිරිකා රොඩු නොමැති වන පරිදි පෙරා පිළිගන්නා ලද පානකයෝම යෝග්‍ය වෙත්. ඉදින් පෙරනු ලැබූ කල්හි ද රොඩු දක්නට ලැබේ වේ නම් නුසුදුසු යැයි දත යුතු.]

**(අ) මධුමුද්දිකසාලූක - චෝචමෝච’ම්බජම්බුජං**
**ඵාරුසං නා’ග්ගිසන්තත්තං - පානකං යාමකාලිකං.**
**(බුද්දසික්ඛා)**

**අමාරු වචන.**

**01. පානට්ඨානං - පානක වළඳන ස්ථානය.**
**03. තුච්ඡහත්ථෝ - හිස් අත් ඇත්තේ. (“තුච්ඡහත්ථේනේව හුත්වා” යැයි අර්ථ ගනු.)**
**04. යථාසකං - තමතමන්ගේ. අප්පක (ති) - ස්වල්ප.**
**06. පචනසට - පිසින හැළිය. පහෝති (ප√හූ+අ+ති) - සෑහෙයි, පොහෝනා. නප්පහෝති - නොසෑහෙයි. පමාණ (න) - ප්‍රමාණය. සඞ්ඝප්පමාණ - සඞ්ඝප්‍රමාණය. පමීයති (ප√මා+ය+ති) - ප්‍රමාණය**

**කරනු ලැබේ.**

**10. විකාල - ඉර මුදුන්වීමේ සිට පසුදා අරුණ නැගෙන තුරු කාලය.**
**පානං - පානය, පානය කිරීම. පානාය - පානය කිරීම පිණිස.**
**අනුඤ්ඤාත (ති) - අනුදත්, අවසර ලත්.**
**සෙය්‍යථීදං (නි) - කෙසේද යත්.**
**අම්බපානං - අඹ පැන්. ජම්බුපාන - ජම්බු (දඹ) යුෂ. චෝචපාන - ඇටි කෙසෙල් යුෂ. මෝචපාන - කෙසෙල් යුෂ. මධූකං - මී පැන් යුෂ. මුද්දිකං - මුද්දරප්පලම් යුෂ. සාලූකං - මානෙල් ගෙඩි යුෂ. ඵාරුසකං - උගුරැස්ස යුෂ. ඉති - මේ යුෂ අට වර්ගයෝයි.**
**මාතුලුඞ්ගං - නාරන්. අනුලෝමානි - යෝග්‍ය වූ.**

**11. අග්ගි + සන්තත්ත - ගින්නෙන් රත් කළ. වට්ටති - වටනේය.**
**මද්දති (√මද්ද+අ+ති) - මඩියි, මිරිකයි, පාගයි.**
**මද්දිත්වා - මැඩ. නික්කසටං - රොඩු නැති.**
**පරිස්සාවේති (පරි√සව+ණෙ+ති) - පෙරයි. පරිස්සාවිත (ති) - පෙරන ලද.**
**සන්දස්සියමාන - මනා සේ දකිනු ලබන ("දිස්සමාන" යනුවෙන්ද භාවිත කළ හැක).**
**දට්ඨබ්බ - දත යුතු.**

**ගාථාවේ අර්ථය.**

**(අ) මධුමුද්දිකසාලූකචෝචමෝච'ම්බජම්බුජං (පානකං) - මී, මුද්දරප්පලම්,මානෙල්,ඇටි කෙසෙල්, කෙසෙල්, අඹ, දඹ (පානක ද) ඵාරුසකං (පානකං) - උගුරැස්ස පානයද. නා'ග්ගිසන්තත්තං - ගින්නෙන් රත් නො කරන ලද්දේ. පානකං - පානක. යාමකාලිකං - යාමකාලික වේ.**

## පාළියට නගනු.

01. අසන්න. ඒ කිනම් ශබ්දයක් ද?
02. ඒ කාලය මතක් කරන ගෙඩියේ හඬයි.
03. හිස් අතින් නොයනු. තමන්ගේ කෝප්පය ද රැගෙන යනු.
04. සඞ්ඝයා වහන්සේලා ප්‍රමාණයෙන් ගණිනු ලැබූ කල්හි පැන්යුෂ මද යැයි සිතමි.
05. මගේ කෝප්පයට වත්කරනු.
06. පානකය පළමුව ඇල් පැනින් මැඩ පෙරිය යුතු. ඉන් පසුව පිළිගත යුතු.
07. ගින්නෙන් රත් කළ පානකය අකැප යැයි දත යුතු.
08. අද සියඹලා යුෂ පෙරනලදී.
09. හෙට නාරන් යුෂ කරන්නෙමි.

## උපකාරක පාඨ.

01. කිං සද්දෝ'ති.
02. කාලාරෝචනඅයෝදණ්ඩසද්දෝ.
06. පානං තාව සීතෝදකේන මද්දිත්වා පරිස්සාවේතබ්බං. තතෝ පරං පටිග්ගහේතබ්බං.
08. අජ්ජ චිඤ්චපානං පරිස්සාවිතං.
09. සුවේ මාතුලුඞ්ගපානං කරිස්සාමි.

## 24. ගිලානපුච්ඡනසමයේ කථාසල්ලාපෝ.

[ගිලන් වූවකු විමසන කළ කථා සල්ලාපය.]

**01. ඒකං සමයං ආයස්මා ධම්මරක්ඛිතෝ ආබාධිකෝ හෝති දුක්ඛිතෝ බාළ්හගිලානෝ, තදා ආයස්මා බුද්ධරක්ඛිතෝ ගිලානපුච්ඡනත්ථාය ආගච්ඡති.**

[එක් කලෙක්හි ආයුෂ්මත් ධම්මරක්ඛිත ස්වාමින් වහන්සේ දුකට පත් වූයේ දැඩි සේ ගිලන් වූයේ රෝගයෙන් පීඩිත වූයේ වෙයි, එකල්හි ආයුෂ්මත් බුද්ධරක්ඛිත ස්වාමින් වහන්සේ ගිලන් බැව් විමසනු පිණිස පැමිණෙයි.]

**02. කච්චි ආවුසෝ ධම්මරක්ඛිත ඛමනීයං ? කච්චි යාපනීයං ?කච්චි තේ බාළ්හා දුක්ඛා වේදනා පටික්කමන්ති ? නෝ අභික්කමන්ති? පටික්කමෝසානං පඤ්ඤායති ? නෝ අභික්කමෝ ?**

[ඇවැත්නි ධම්මරක්ඛිත, කිමෙක් ද ඉවසිය හැකි ද? කිමෙක් ද යැපිය හැකි ද? කිමෙක් ද නුඹ වහන්සේගේ දැඩි දුක්ඛ වේදනාවෝ අඩු වෙත් ද? නො වැඩෙත් ද? ඒ වේදනාවන්ගේ අඩුවෙන මගක් පෙනෙයි ද ? වැඩිවෙන මගක් නො පෙනෙයි ද?]

**03. න මේ භන්තේ බුද්ධරක්ඛිත, ඛමනීයං, න යාපනීයං. බාළ්හා මේ දුක්ඛා වේදනා අභික්කමන්ති නෝ පටික්කමන්ති අභික්කමෝ--සානං පඤ්ඤායති, නෝ පටික්කමෝ.**

[ස්වාමීනි බුද්ධරක්ඛිතයන් වහන්ස, ඉවසිය නොහැකිය, යැපීමට නොහැකිය. මාගේ දැඩි වූ දුක් වේදනාවෝ වැඩෙත්, අඩු නොවෙත්. ඒ වේදනාවන්ගේ නැග්මක් පෙනේ, බැස්මක් නොපෙනේ.]

**04. ඉදානි කස්ස වෙජ්ජස්ස භේසජ්ජං පටිසේවසි ?**

[දැන් කිනම් වෛද්‍යවරයකුගේ බෙහෙත් සේවනය කරහි ද?]

**05. පඨමං ගුණපාලවෙජ්ජස්ස භෙසජ්ජං පටිසේවිං, සෝ නා'සක්ඛි අරෝගං කාතුං. තතෝ ඤාණපාලවෙජ්ජං පක්කෝසාපේසිං, සෝ'පි නාසක්ඛියේව අරෝගං කාතුං. තස්මා ඉදානි අත්තානං "කම්මස්සකෝ"ති අජ්ඣුපෙක්ඛිත්වා න කස්සචි'පි භේසජ්ජං පටිසේවාමි.**

[පළමුව ගුණපාල වෛද්‍යවරයාගේ බෙහෙත් සේවනය කළෙමි. ඔහු (මාව) සුව කිරීමට සමත් නොවීය. ඉන් අනතුරුව ඤාණපාල වෛද්‍යවරයා කැඳවීමි. ඔහුද (මාව) සුව කිරීමට අසමත් විය. එහෙයින් දැන් (මම) තමාව "කර්මය අයත් කොට ඇත්තේ" යැයි මධ්‍යස්ථ වී කිසිවකුගේ බෙහෙතක් සේවනය නොකරමි.]

**06. මා හේවං කරෝහි, සති ආබාධෙ තදනුරූපං භේසජ්ජම්පි අත්ථියේව. පුනපේකං වෙජ්ජං පක්කෝසාපේහි, සප්පායං භේසජ්ජං ලභිත්වා සප්පායං භෝජනං භුඤ්ජන්තස්ස කථං රෝගෝ භවිස්සති?**

[එසේ නොකරනු. ආබාධයක් ඇති කල්හි ඊට අනුරූප බෙහෙතක් ද ඇත්තේමය. නැවත ද එක් වෛද්‍යවරයෙකු කැඳවනු. යෝග්‍ය බෙහෙත් ලැබ යෝග්‍ය භෝජන වළඳන්නහු හට කෙසේ නම් රෝගයක් වන්නේද?]

**07. ආම භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**08. ද්වත්තයෝ දිවසේ අතික්කමිත්වා ආයස්මා බුද්ධරක්ඛිතෝ පුන ගිලානපුච්ඡනත්ථාය ආගච්ඡන්තෝ ආයස්මන්තං ධම්මරක්ඛිතං ථොකං කල්ලරූපං දිස්වා පුච්ඡි.**

[දින දෙක තුනක් ඉක්මවා ආයුෂ්මත් බුද්ධරක්ඛිත ස්වාමීන් වහන්සේ ගිලන් බැව් විමසීම සඳහා පැමිණෙනුයේ තරමක් නිරෝගී බැව් ඇති ආයුෂ්මත් ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේව දැක (පහත පරිදි) විමසූ සේක.]

**09. න නු ආවුසෝ ඛමනීයං යාපනීයං ? ඉදානි පන ඛමනීයාකාරෝ දිස්සති.**

[ඇවැත්නි, ඉවසිය හැකි ද? යැපිය හැකි ද? දැන් වනාහි නිරෝගී ආකාරයක් දිස්වේ.]

**10. ආම භන්තේ, ආයස්මතෝ ඕවාදං සුණිත්වා මය්හං සප්පායානි භේසජ්ජානි සප්පායානි ච භෝජනානි සේවමානස්ස ථෝකං ඛමනීයං යාපනීයං. දුක්ඛා වේදනා පටික්කමන්ති, නෝ අභික්කමන්ති, පටික්කමෝ සානං පඤ්ඤායති, නෝ අභික්කමෝ.**

[ස්වාමීනි, එසේය. අයුෂ්මත් ස්වාමීන් වහන්සේගේ අවවාදය අසා යෝග්‍ය

වූ බෙහෙත් ද යෝග්‍ය වූ භෝජන ද සේවනය කරන්නා වූ මට තරමක් ඉවසිය හැකිය, යැපිය හැකිය. දුක් වේදනාවෝ පහළ බසිති, නො නඟිති. ඒ වේදනාවන්ගේ බැස්මක් පෙනේ, නැගීමක් නො පෙනේ.]

**11. සාධු ආවුසෝ, ඒවං සති න චිරස්සේව ආරෝග්‍යලාභං ලභිස්සසි.**
[ඇවැත්නි, මැනව. එසේ ඇති කල්හි නොබෝ කලකින්ම නීරෝගී ලාභය ලබන්නෙහි ?]

**12. ඒවං භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

**(අ) ආරෝග්‍යපරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං**
**විස්සාසාපරමා ඤාතී - නිබ්බානපරමං සුඛං.**
**(ධම්මපද-සුඛවග්ග)**

**අමාරු වචන.**

**01. ගිලාන (පු) - ලෙඩා, රෝගියා. පුච්ඡන (න) - විමසීම. ආබාධ (පු) - රෝගය. ආබාධික (ති) - රෝගියා, රෝග පීඩිත වූ. දුක්ඛිත (ති) - දුකට පත් වූයේ, දුප්පත් (සඤ්ජාත අස්සත්ථි අර්ථයේ ඉත ප්‍රත්‍යයයි). බාළ්හගිලාන (ති) - බොහෝ සේ ගිලන් වූයේ. බාළ්හ (ක්‍රි.වි) - දැඩි සේ, අධික සේ.**

**02. ඛමනීය (ති) - ඉවසිය හැකි. යාපනීය (ති) - යැපීම ගෙන දෙන, පැවැත්මට උපකාර වන. පටික්කම (පු) - අඩුවීම,ඉවත්වීම, පස්සට යාම.**
**අභික්කම (පු) - වැඩිවීම,ඉදිරියට යාම. සානං - ඒ වේදනාවන්ගේ (ඡට්ඨී බහුවචන ස්ත්‍රී ලිංග "ත" ශබ්දයයි. තේසුවුද්ධි ආදී සූත්‍රයෙන් "ත" කාරය හට "ස"කාරාදේශයි. නිරුත්තිදීපනී/ සද්දනීතිසුත්තමාලාවෙහි වෙනම සූත්‍රයක් වේ). කච්චි - කෙසේද?. තේ - තට. ඛමනීයං - දුක් ඉවසිය හැකි ද?.**

**("කච්චි ඛමනීයං" යන්න සූත්‍ර පිටකයෙහි හා විනය පිටකයෙහි එකසේ ම පෙනෙතුදු අදිප්‍රාය සමාන නොවේ.)**

**04.** **වෙජ්ජ (පු) - වෛද්‍යවරයා. භේසජ්ජ (න) - බෙහෙත.**
**නා'සක්ඛි (න+අසක්ඛි) - නොහැකි විය (අසක්ඛි, අසක්ඛිංසු ලෙසින් අජ්ජතනී විභක්තියෙහි වර නැගිය යුතු. භවිස්සන්ති විභක්තියෙහි සක්ඛිස්සති, සක්ඛිස්සන්ති ලෙසින් වර නැගිය යුතු).**
**අරෝගෝ - නිරෝගී වූයේ.**
**පක්කෝසාපේති (ප√කුස+ණාපෙ+ති) - කැඳවයි.**
**කම්මස්සක (ති) - කර්මය අයිති කොට ඇති.**
**අජ්ඣුපෙක්ඛති (අධි+උප√ඉක්ඛ+අ+ති) - මධ්‍යස්ථ වෙයි.**

**06.** **හේවං (හ+එවං) මෙසේ (හකාරාගමයි). තදනුරූප (නි) - ඊට යෝග්‍ය වූ, ඊට ගැළපෙන.**
**අත්ථියේව - ඇත්තේමය. පුනපේකං (පුන+අපි+ඒකං) - තවත් එක් අයෙක්.**
**සප්පාය (ති) - යෝග්‍ය ආහාරාදිය, ගැළපෙන දෙය.**

**08.** **ද්වත්තයෝ - දෙක තුනක් (දැන් පෙළෙහි ද්වේ තයෝ යනුවෙන් පෙනේ). රූප (න) - ආකාර ඇති. කල්ලරූප (ති) - නිරෝගී ආකාර ඇති.**

**11.** **නචිරස්සේව (න+චිරස්සං+ඒව) - නොබෝ කලකින්ම.**
**ආරෝග්‍ය (න) - නිරෝගී බව.**

**ගාථාර්ථය.**

**(අ)** **ලාභා - සියළු ලාභයෝ. ආරෝග්‍යපරමා - නිරෝග බව පරම කොට ඇත්තාහ. ධනං - ධනය. සන්තුට්ඨීපරමං - සතුට පරමකොට ඇත්තේය. ඤාතී - නෑයෝ. විස්සාසපරමා - විශ්වාසය පරම කොට ඇත්තේය. සුඛං - සුවය. නිබ්බානපරමං - නිවන පරම කොට ඇත්තේය.**

**පාළියට නගනු.**

**01.** සඞ්ඝරක්ඛිත සාමණේර නම ගිලන් වූයේ වෙයි.

**02.** බුද්ධරක්ඛිත හිමියෝ ගිලන් බව විමසීම පිණිස පැමිණියේය.

**03.** වේදනාව අඩුවන්නේද?

**04.** වෛද්‍යවරයකු සමීපයට ගියෙහි ද?

**05.** කිනම් වෛද්‍යවරයෙකු කැඳවීද?

**06.** ඔහුට සුව කළ හැකි වීද?

**07.** ලෙඩක් ඇත්තේ නම් බෙහෙත් ද ඇත.

**08.** තමන් කර්මය අයිති කොට ඇත්තේ යැයි සළකන්නෙහි ද?

**09.** දැන් නම් සුව බවක් පෙනේ.

**10.** නිරෝගීකම පරම ලාභයක් සේම ලද දෙයින් සතුටු වීම ද පරම ලාභයකි.

**11.** විශ්වාසය පරම ඥාතියෙක් වන්නා සේම නිර්වාණය ද උතුම් සතුට වේ.

**උපකාරක පාඨ.**

**08.** අත්තානං කම්මස්සකෝ’ති අජ්ඣුපෙක්ඛෙය්‍යාසි.

**10.** ලද දෙයින් සතුටු වීම - සන්තුට්ඨී (ඉ)

## 25. සම්මජ්ජනපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.

[හැමදීම ප්‍රතිසංයුක්ත කථා සල්ලාපය.]

**01. අතිබහුලා භෝ තුම්හාකං සම්මජ්ජනියෝ ලද්ධා.**

[පින්වත්නි, නුඹ වහන්සේලාට ලැබුණු ඉදල් ඉතා බහුලය.]

**02. ආම හන්තේ, බහූදණ්ඩසම්මජ්ජනියෝ මහාගන්ධාරාමේ විනයුස්සවතෝ ඒකේකස්ස ඒකේකා ලද්ධා.**

[ස්වාමීනි, එසේය. ගන්ධාරාම විහාරයෙහි (පවත්වන ලද) විනය (විභාග) උත්සවයෙන්[1] එක් එක් අයෙකුට එක එක බැගින් ලැබුණි.]

**03. නත්ථි නු නාළිකේරදණ්ඩමයා හත්ථසම්මජ්ජනියෝ ?**

[පොල් මිටෙන් කරන ලද කොසු නැත්තේ ද?]

**04. අත්ථි හන්තේ, ද්වේ වා තිස්සෝ වා.**

[ස්වාමීනි, දෙකක් හෝ තුනක් ඇත්තේය.]

**05. න එත්තකාහි පහෝති.**

[මෙපමණකින් පොහෝනා (ප්‍රමාණ) නොවේ.]

**06. අත්ථි හන්තේ තිණමයා සම්මජ්ජනියෝ, න තාව තා සබ්බත්ථ වළඤ්ජන්ති.**

[ස්වාමීනි, තෘණ වලින් කරන ලද කොසු ඇත්තේය. තවම ඒ සියල්ල සියළු තැන්හි පරිභෝග නොකෙරෙත්.]

**07. කස්මා තුම්හාකං ආචරියෝ අනුදිනං සම්මජ්ජාපේති ?**

[කවර හෙයින් නුඹ වහන්සේලාගේ ආචාර්යන් වහන්සේ දිනපතා හමදවන්නේ ද?]

**08. "පාතෝ වුට්ඨාය කම්මට්ඨානං මනසි කරිත්වා සම්මජ්ජනාදිවත්තකරණං නාම සප්පුරිසානං ලක්ඛණ"න්ති කත්වා අම්හාකං ආචරියෝ අනුදිනං සම්මජ්ජාපේති.**

["උදෑසන නැගිට කර්මස්ථානය මෙනෙහි කොට හැමදීම් ආදී වතාවත් කිරීම සත්පුරුෂයන්ගේ ලක්ෂණයකැ"යි (මෙසේ සිහි) කොට දිනපතා

---

[1] **බුරුම රටෙහි විභාග උත්සව ශ්‍රීයෙන් පවත්වනු ලැබේ. එහෙයින්ම විභාගයන්ට විභාග උත්සවය යැයි ව්‍යවහාර කරත්.**

ආචාර්යන් වහන්සේ හමදවන සේක.]

**09. සාධු වතා'වුසෝ, භගවතා'පි පඤ්චසම්මජ්ජනියා ආනිසංසා වුත්තා. සෙය්‍යථීදං?**

- i. **සකචිත්තං පසීදති.**
- ii. **පරචිත්තං පසීදති.**
- iii. **දේවතා අත්තමනා හොන්ති.**
- iv. **පාසාදිකසංවත්තනිකකම්මං උපචිනාති.**
- v. **කායස්ස භේදා පරං මරණා සුගතිං සග්ගං ලෝකං උපපජ්ජති.**

**අපරේ'පි පඤ්චානිසංසා සම්මජ්ජනියා...**

- i. **සකචිත්තං පසීදති.**
- ii. **පරචිත්තං පසීදති.**
- iii. **දේවතා අත්තමනා හොන්ති.**
- iv. **සත්ථුසාසනං කතං හෝති.**
- v. **පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජතී'ති.**

[ඇවැත්නි, මැනව. භාග්‍යවතුන් වහන්සේ විසින් ද හැමදීමේ ආනිශංස පහක් වදාරණ ලදී. (ඒ පඤ්ච ආනිශංසයෝ) කවරේද යත්?

- **i.** තම සිත පහදී.
- **ii.** අනුන් සිත පහදී.
- **iii.** දෙවිවරු සතුටු වෙත්.
- **iv.** ප්‍රසාදය ඇති කිරීමට හේතු වන කර්මයක් රැස්වෙයි.
- **v.** කය බිඳී මරණින් පසු සුගති ලෝකයෙහි උපදී.

අන්‍ය වූ ද හැමදීමේහි ආනිශංස පහක් වෙත්.

- **i.** සිය සිත පහදී.
- **ii.** අන් සිත පහදී.
- **iii.** දෙවිවරු සතුටු සිත් ඇත්තාහු වෙත්.
- **iv.** බුදු රජාණන් වහන්සේගේ අනුශාසනාව කරන ලද්දේ වෙයි.
- **v.** පශ්චිම ජනතාව දිට්ඨානුගතියට (දුටු දේ අනුව යාම) පැමිණෙයි.]

**10. ආම භන්තේ, සම්මජ්ජනං නාම කල්ලභාවස්ස'පි කාරණං හෝති.**

**සම්මජ්ජනකාලේ හි හත්ථා'පි චාලිතා. පාදා'පි චාලිතා. සකලකායෝ'පි චාලිතෝ. තස්මා නහාරූ සිථිලා හොන්ති. තතෝ සකලසරීරේ අඞ්ගමඞ්ගානුසාරිනෝ වාතලෝහිතා අනුස්සාරෙන්ති. තප්පච්චයා ලෝහිතං පසීදති. අත්තනෝ සම්මජ්ජනට්ඨානං ඔලෝකයතෝ චිත්තං පසීදති. ඒවං කල්ලකායෝ හෝති.**

[ස්වාමීනි, එසේය. හැමදීම වනාහි නිරෝගී භාවයට ද කරුණක් වෙයි. හමදින කල්හි අත් ද සෙලවුනේ වෙත්. පාද ද සෙලවුනේ වෙත්. සියළු කය ද සෙලවුනේ වෙත්. එහෙයින් නහර ලිහිල් වෙති. එහෙයින් සකල ශරීරයෙහි ලොකු කුඩා අංග අනුව යන වාත-රුධිරයෝ (අංග අනුව මනාව) යවත්. ඒ කරුණින් රුධිරය පිරිසිදු වේ. තමන් හැමදූ තැන බලන්නහුගේ සිත පහදී. මෙසේ නිරෝගී කයක් ඇත්තේ වෙයි.]

**අමාරු වචන.**

**01. අතිබහුල (ති) - ඉතා බහුල වූ, අධික වූ. භෝ (නි) - එම්බා, පින්වත්නි.**
**(මේ "භෝ" ශබ්දය වනාහි කච්චායන වියරණයෙහි "භෝ ගේ තු" යන සූත්‍රයට අනුව ඒකවචන රූපයක් වුවද සද්දනීතිසුත්තමාලාවෙහි ඒකවචන බහුවචන අර්ථ දෙකම වාචක නිපාතයක් යැයි දැක්වේ).**
**සම්මජ්ජනී (ඉ) - ඉදල, මුස්න. විනයුස්සවෝ - විනය විභාගය.**
**(බුරුම භාෂාවට අනුගතව පාළියට නගා ඇති බැවින් විනයුස්සවෝ යනුවෙන් සිටී.)**
**03. නාළිකේරදණ්ඩමය (ති) - පොල් ලී මිටක් යොදා කරන ලද.**
**05. පහෝති (ප√භූ+අ+ති) - සෑහෙයි.**
**06. තිණමය (ති) - තෘණයෙන් කරන ලද.**
**සබ්බත්ථ (නි) - හැම තැන්හි. වළඤ්ජේති (√වලජි+ණෙ+ති) - පාවිච්චි කරයි, පරිභෝග කරයි.**

**න තාව වළඤ්ජෙන්ති - තවම පාවිච්චි නොකරත්.**

**07. සම්මජ්ජාපේති (සං√මජ්ජ+ණාපෙ+ති) - හමදවයි.**

**08. පාතෝ - උදැසන. සම්මජ්ජනාදිවත්ත - හැමදීම් ආදි වත්.**

**ලක්ඛණ (න) - ලකුණ, සලකුණ.**

**ඉති කත්වා - මෙසේ කොට හෝ මේ කාරණය හේතුවෙන්.**

**09. සෙය්‍යථීදං (සෙය්‍යථා+ඉදං) (නි) - කෙසේද යත්.**

**සක (ති) - ස්වකීය, තමා අයත් (න) - තමාට අයත් දෙය, ධනය.**

**පසීදති (ප√සිද+අ+ති) - පහදී, පිරිසිදු වේ, සතුටු වේ.**

**අත්තමන (ති) - සතුටු සිතැති. (ස්ත්‍රී ලිංගයෙහි "අත්තමනා" ලෙස සිටී).**

**පාසාදික (ති) - පැහැදීම ඇති කරන, සතුටු එළවන.**

**සංවත්තනික (ති) - පවත්වන, පමුණුවන.**

**උපචිනාති (උප√චි+නා+ති) - රැස් කෙරේ. කායෝ - කය.**

**මරණ (න) - මරණය. සුගති (ඉ) - සුගතිය, සැපැති භාවය.**

**සග්ගෝ (සු+අග්ගෝ) - ස්වර්ගය, දෙව්ලොව.**

**උපපජ්ජති (උප√පද+ය+ති) - පැමිණේ, උපදී.**

**සාසන (න) - අවවාදය. කත (ති) - කරන ලද.**

**පච්ඡිම (ති) - පසුවූ, අන්තිම වූ. ජනතා (ඉ) - ජන සමූහය.**

**දිට්ඨානුගති (දිට්ඨි+ අනුගති) - දුටු දෙය අනුව යාම.**

**ආපජ්ජති (ආ√පද+ය+ති) - පැමිණේ. සම්මජ්ජනං - හැමදීම.**

**කල්ලභාවෝ - නිරෝගී බව. චාලිත (ති) - සොලවන ලද.**

**නහාරු (පු) - නහරය.**

**සිථිල (ති) - ලිහිල් වූ, බුරුල් වූ, ශක්තිමත් නොවූ.**

**අඞ්ගමඞ්ගානුසාරී (අඞ්ග+අඞ්ග+අනුසාරී) (ති) - ලොකු කුඩා අංග අනුව යන්නා වූ, පිළිපදින්නා වූ. වාතෝ - වාතය. ලෝහිත (න) - රුධිරය.**

**අනුස්සාරේති (අනු√සර+ණෙ+ති) - අනුව යවයි.**

**සම්මජ්ජනට්ඨානං - හමදින ස්ථානය.**

**ඕලෝකේති (අව√ලෝක+ණෙ+ති) - බලයි.**

**පාළියට නගනු.**

**01.** සාමණේර බුද්ධරක්ඛිතය, කොස්ස රැගෙන එනු!

**02.** ඔය කොස්ස නොවේ. පොල් මිටෙන් කරන ලද කොස්ස ගෙන එනු.

**03.** මෙතැන හමදිනු.

**04.** විහාරය ඇමදිය යුතු.

**05.** හැමදීම වනාහි සත්පුරුෂයන්ගේ පුරුද්දකි.

**06.** හැමදීම නිරෝගීකමට හේතුවක් ද වේ.

**07.** උෂ්ණ කාලයේදී අළුයම නැගිට හැමද පැන් පහසු වී තමන් හැමදූ තැන අධ්‍යයනයෙහි යෙදෙන්නේ සැපයට පත් වේ.

(“සම්මජ්ජනී” යන්නට දුතියපාරාජිකාවෙහි “සම්මුඤ්ජනී” යන්න ද දිස්වේ.)

## 26. ආරාමසෝධනවේලායං කථාසල්ලාපෝ.
[ආරාමය පිරිසිදු කරන වේලාවෙහි කථා සල්ලාපය.]

**01. ආවුසෝ ධම්මරක්ඛිත, ස්වේ උපෝසථදිවසෝ. තස්මා භික්ඛුසාමණේරා පාතෝ වුට්ඨාය ආරාමං සෝධෙස්සන්ති, කාලේ සම්පත්තේ අත්තනෝ සම්මජ්ජනිං ගහෙත්වා ඒකමන්තං සම්මජ්ජාහි!**

[ඇවැත්නි ධම්මරක්ඛිතය, හෙට උපෝසථ දිනයයි. එහෙයින් භික්ෂු සාමණේරවරු උදෑසන නැගිට ආරාමය පිරිසිදු කරන්නාහුය, කල් එළඹුණු විට තම මුස්න ගෙන එක් පසෙක හමදිනු!]

**02. සම්මජ්ජනකාලේ කචවරෝ කත්ථ සංකඩ්ඪිතබ්බෝ ?**

[හමදින කල්හි කසළ කොහි එකතු කළ යුතු ද?]

**03. ඒකමන්තං සංකඩ්ඪිතබ්බෝ.**

[එකත් පසෙක එකතු කළ යුතු.]

**04. කෝ කචවරරාසිං ඡඩ්ඩෙස්සති ?**

[කවරෙක් කසළ ගොඩ විසිකරත් ද?]

**05. කචවරඡඩ්ඩනකපච්ඡි චේව දෝණි ච අත්ථි, තත්ථ පක්ඛිපිත්වා දාරකා නින්නට්ඨානං පරිපූරෙස්සන්ති.**

[කසළ එකතු කරන කූඩයක් මෙන්ම  කසළ බාල්දියක් ද ඇත්තේය, එහි බහා ලා දරුවෝ පහත් ස්ථාන ගොඩ කරන්නාහුය.]

**06. ගිම්හකාලේ පන කථං සම්මජ්ජිතබ්බං ?**

[ග්‍රීෂ්ම කාලයෙහි වනාහි කෙසේ හැමදිය යුතු ද?]

**07. පඨමං උදකේන පරිප්ඵෝසිත්වා පච්ඡා සම්මජ්ජිතබ්බං.**

[පළමුව ජලයෙන් ඉස තෙත් කොට පසුව හැමදිය යුතු.]

**08. උදකේන පරිප්ඵෝසනං කිමත්ථියං ?**

[ජලයෙන් ඉස තෙත් කිරීම කුමක් පිණිස ද ?]

**09. රේණූනං අනුට්ඨහනත්ථං. රේණූසු හි උට්ඨිතේසු සේනාසනානි චේව සේනාසනපරිභෝගා ච රජෝකිණ්ණා හොන්ති, තස්මා තන්නිවාරණත්ථං පුරා සම්මජ්ජනා උදකේන පරිප්ඵෝසනං ඒකං**

**සම්මජ්ජනවත්තං.**

[ධූලි නොනැගීම පිණිසයි. ධූලි නැගුණු කල්හි විහාර මෙන්ම විහාරයෙහි පරිභෝග භාණ්ඩ ද ධූලියෙන් ගැවසී ගත්තාහු වෙති, එසේ හෙයින් එය වළකනු පිණිස හැමදීමට පෙර ජලයෙන් ඉස තෙත් කිරීම එක් හැමදිම් වතකි.]

## අමාරු වචන.

**01. උපෝසථදිවසෝ (පු) - උපෝසථ දවස. සෝධෙති (√සුධ+ණෙ+ති) - සුද්ධ කෙරේ, පරීක්ෂණය කෙරේ. ණය ආපසු ගනී.**

**02. කචවරෝ - කසළ, කුණු. සංකඩ්ඪති (සං√කඩ්ඪ+අ+ති) - එකතු කරයි, අදියි, විමසයි. සංකඩ්ඪිතබ්බ (ති) - එකතු කළ යුතු.**

**04. කචවරරාසි (පු) - කසළ ගොඩ. ඡඩ්ඩෙති (√ඡඩ්ඩ+ණෙ+ති) - විසි කරයි, ඉවත දමයි.**

**05. කචවරඡඩ්ඩනපච්ඡි (ඉ) - කසළ එකතු කොට විසි කරන කූඩය. දෝණි (ඉ) - ඔරුව. නින්නට්ඨාන (න) - ගැඹුරු, පහත් බිම. පරිපූරේති (පරි√පූර+ණෙ+ති) - සම්පූර්ණ කරයි.**

**06. ගිම්හකාලෝ - උෂ්ණ කාලය.**

**07. පරිප්ඵෝසති (පරි√ඵුස+ණෙ+ති) - ඉසියි, අනිකක් මත විසුරුවයි.**

**08. පරිප්ඵෝසනං - ඉසීම. කිමත්ථිය (ති) - කුමක් පිණිස, කිනම් ඕනෑකමක් ඇති.**

**09. රේණු (පු /ඉ) - දූවිලි,මල් රේණු (රජ යන පදයද භාවිත කළ හැක). අනුට්ඨහනත්ථං - නො නැගීම පිණිස. උට්ඨිත (ති) - නැගිටි, නැගී සිටි, හටගත්. සේනාසනපරිභෝගෝ - ඇඳ, මදුරු දැල් ආදී සේනාසනයෙහි භාවිත කරන උපකරණ. රජෝකිණ්ණ (ති) - ධූලියෙන් ගැවසී ගත්. තන්නිවාරණත්ථං - එය වැළක්වීම පිණිස. පුරාසම්මජ්ජනා - හැමදීමට පෙරාතුව. සම්මජ්ජනවත්තං - හැමදීමේ**

වත.

## පාළියට නගනු.

01. ඇවැත්නි අනිද්දා උපෝසථ දවසයි. හෙට මුළු විහාරයම පිරිසිදු කළ යුතුය.
02. කසළ, කසළ බඳුනෙහි බහා ගැඹුරු තැනක් පුරවන්න.
03. කසළ කැළෑ ස්ථානයක එකතු කරන්න.
04. දරුවෙනි, බල්ලන්ගේ වර්චස් විසි කරවවු.
05. ජලය ඉස අමදින්න. එසේ නොවුවහොත් දූවිලි නැගේය.
06. දූවිලි නැගුණහොත් විහාරය දූලි ගැවසුනේ වෙයි.
07. එසේ වුවහොත් හැමදීමෙන් ප්‍රයෝජන නැතිවාටත් වඩා දෝෂයක් (වරදක් ද) වන්නේය.
08. කොතැන වුවද විමසා කරන ලද කටයුත්ත සාර්ථකැයි දත යුතු.

## උපකාරක පාඨ

01. අනිද්දා - පරසුවේ.
04. බල්ලන්ගේ වර්චස් - සුනඛඡකණං. විසිකරවවු - ඡඩ්ඩාපේථ.
05. එසේ නොවුවහොත් - ඉතරථා.
07. යදි ඒවං සම්මජ්ජනං න කේවලං නිරත්ථකමේව. අථ ඛෝ දෝසෝ'පි භවිස්සති.
08. යත්ථ කත්ථචි වීමංසෙත්වා වීමංසෙත්වා කතකම්මං සාත්ථක'න්ති දට්ඨබ්බං.

## 27. කල්ලතාපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.

[නිරෝගී බව ප්‍රතිසංයුක්ත කථා සල්ලාපය.]

**01. භන්තේ බුද්ධරක්ඛිත, රමණීයෝ වත තුම්හාකං ආරාමෝ. අථ ච පන ඉමං ආරාමං අචිරාගතා ජරා හොන්ති.**

[ස්වාමීනි බුද්ධරක්ඛිතය, සත්තකින්ම නුඹ වහන්සේගේ ආරාමය රමණීයය. එනමුදු පැමිණ බොහෝ කල් නොවූවාහු (අළුතින් පැමිණියෝ) උණ රෝගය වැළඳුනාහු වෙත්.]

**02. සච්චං ආවුසෝ, කල්ලභාවස්ස උපායං අජානන්තා උණ්හදේසතෝ ආගතා විසභාගඋතුතාය යේභුයෝ්න පඨමසංවච්ඡරේ ජරා හොන්ති. දුතියා'දි සංවච්ඡරේසු පන නිජ්ජරා.**

[ඇවැත්නි, සත්‍යය. උෂ්ණ පළාතෙන් පැමිණියා වූ නිරෝගී බවේ උපාය නොදන්නාහු බොහෝ සෙයින් පළමු වසරෙහි උණ රෝගය වැළඳුනාහු වෙත්. දෙවැනි ආදී වර්ෂයන්හි වනාහි උණ නොවැළඳුනාහු වෙත්.]

**03. ඒකන්තතෝ පන භන්තේ, ඉදං ඨානං කල්ලභාවස්ස පටිලද්ධට්ඨානං විය දිස්සති.**

[ස්වාමීනි, ඒකාන්තයෙන් වනාහි මේ ස්ථානය නිරෝගී භාවයට ලැබුණු තැනක් මෙන් දිස් වෙයි.]

**04. ආම ආවුසෝ, කල්ලභාවස්ස උපායකෝවිදෝ ආරාමස්ස පුබ්බභාගේ සන්නිවිට්ඨමහාසරඤ්චේව පරිසුද්ධවායුං ච මහාසරස්ස උදකපිට්ඨං අතික්කමිත්වා යාවපබ්බතා දස්සනීයට්ඨානඤ්ච ඕලෝකෙත්වා කල්ලභාවස්ස පටිලද්ධට්ඨාන'න්ති වදන්ති. අනුපායකෝවිදානං පන දහරසාමණේරානං තං සබ්බං අකල්ලභාවකාරණං විය හෝති.**

[ඇවැත්නි, එසේයි. නිරෝගී බව පිණිස උපායෙහි දක්ෂ වූවාහු ආරාමයාගේ පූර්ව භාගයෙහි මනා සේ පිහිටියා වූ විලක් මෙන්ම පිරිසිදු වාතය ද විශාල විලෙහි ජලය මතු පිට ඉක්මවා පර්වතය දක්වා දර්ශනීය ස්ථානය ද බලා නිරෝගී බව පිණිස ලැබුණු තැනෙකැයි කියති. උපායෙහි දක්ෂ නොවූ තරුණ භික්ෂූන්ට හා හෙරණුන්ට වනාහි ඒ සියල්ල රෝගී

බවට කරුණක් මෙන් වෙයි.]

**05. සච්චං භන්තේ, "නත්ථිභාවතෝ අඤ්ඤාණභාවෝයේව දුක්ඛෝ"ති පෝරාණා'පි වදන්ති.**

[ස්වාමීනි, සත්‍යය. " නැති බවට වඩා නොදන්නාකම දුකෙකැ"යි පෞරාණිකයෝ ද කියත්.]

**අමාරු වචන.**

**01. රමණීය (ති) - සිත් කලු, සිත් ඇලවිය යුතු.**
**අථ ච පන - එනමුදු. අචිරාගත (අචිර+ආගත) - පැමිණ බොහෝ කල් නොවූ. ජරෝ - උණ රෝගය වැළඳුනේ.**

**02. උපායෝ - ප්‍රයෝගය, උපක්‍රමය.**
**උණ්හදේසෝ - උෂ්ණ පළාත. විසභාගඋතුතා - අසමාන (විෂම) ඍතු ඇති බව. සංවච්ඡර (පු / න) - අවුරුද්ද. නිජ්ජරෝ - උණ රෝග නැත්තේ.**

**03. ඒකාන්ත (ති) - ඒකාන්ත වූ. කල්ලභාවස්ස - නිරෝගී බව පිණිස. පටිලද්ධට්ඨානං - ලැබුණු තැන.**

**04. උපායකෝවිදෝ - උපායෙහි දක්ෂ වූයේ. පුබ්බභාගෝ - පූර්ව භාගය. පෙරදිග දිසාව. සන්නිවිට්ඨ (ති) - මනා සේ ඇලුණු, පිළියෙල කළ, පිහිටියා වූ. මහාසරෝ - මහා විල. පරිසුද්ධවායු - පිරිසිදු වාතය.**
**උදකපිට්ඨ (න) - ජලය මතුපිට, දිය පිට. යාවපබ්බතා - පර්වතය තෙක්. දස්සනීයට්ඨාන (ති) - දැකිය යුතු තැන. අනුපායකෝවිදෝ - උපායෙහි දක්ෂ නොවූයේ.**
**නත්ථිභාවෝ - නැති බව. අඤ්ඤාණභාවෝ - නොදන්නා බව. දුක්ඛෝ - දුක. පෝරාණෝ - පෞරාණිකයා.**

**(මෙතැන් පටන් පාළියට නැඟීමේ අභ්‍යාස නොදක්වමි.මේ පොත උගන්වන ගුරුවරු ශිෂ්‍යයන් අභ්‍යාසකරණයෙහි යොදවත්වා!!!)**

## 28. රුක්ඛපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.

[ගස් ප්‍රතිසංයුක්ත කථා සල්ලාපය.]

**01. භන්තේ බුද්ධරක්ඛිත, කස්මා තුම්හේ මහාරුක්ඛේ සමූලං පාතේථ ?**
[ස්වාමීනි බුද්ධරක්ඛිතය, කවර හෙයින් නුඹ වහන්සේලා මුල් සහිතව මහා ගස් බිම වට්ටවහු ද?]

**02. ආවුසෝ, ඡායාබහුලට්ඨානේ ජනා සීතාභිභූතා ජරරෝගිනෝ හොන්ති. සූරියාලෝකෝ ච කල්ලභාවකාරණං හෝති. ඉමස්මිං විහාරේ අචිරාගතා ලද්ධවිසභාගඋතුකා දහරසාමණේරා කාලේන කාලං ජරා හොන්ති. තස්මා ඝනච්ඡායං අපනෙත්වා ආලෝකපටිලාභාය ආචරියෝ කේසඤ්චි රුක්ඛානං පාතනත්ථාය ඔකාසං කරෝති.**
[ඇවැත්නි, සෙවණ බහුල ස්ථානයෙහි ජනයා සීතලෙන් මඩින ලද්දේ උණ රෝගය වැළඳුනාහු වෙත්. හිරු එළිය ද නිරෝගී භාවයට කරුණක් වෙයි. මේ විහාරයෙහි අළුත පැමිණියා වූ, ලැබුණු වෙනස් ඍතු ඇත්තාවූ කුඩා සාමණේරයන් වහන්සේලා කලින් කල උණ රෝගය වැළඳුනාහු වෙත්. එහෙයින් ඝන සෙවණැලි සහිත ගස් ඉවත් කොට හිරු එළිය ලැබීම පිණිස ආචාර්යන් වහන්සේ සමහර වෘක්ෂයන්ගේ බිම හෙළීමට අවසර දෙන සේක.]

**03. යදි ඒවං කස්මා මාලාවච්ඡාදයෝ බුද්දකරුක්ඛේ රෝපාපේති ?**
[එසේ වී නම් කවර හේතුවෙන් කුඩා මල් ගස් ආදී  කුඩා ගස් රෝපණය කරවයි ද? ]

**04. ආරාමෝ නාම ආවුසෝ, තාදිසරුක්ඛේහි රමණීයෝ, තස්මා මාලාවච්ඡේ චේව සුපත්තරුක්ඛකේ ච රමණීයභාවාය රෝපාපේති. අපි ච ආචරියස්ස සමණානං ආවාසස්ස රමණීයතරත්තං අතිවිය රුච්චති. තස්මා පක්ඛස්ස දික්ඛත්තුං විසමභූමිභාගං සමං කාරාපෙන්තෝ රුක්ඛකේ ච රෝපෙන්තෝ ආරාමං රමණීයතරං කාරාපේති.**
[ඇවැත්නි, ආරාමය වනාහි එවැනි ගස් වලින් සිත් කළු වෙයි. එසේ

හෙයින් කුඩා මල් ගස් මෙන්ම ශෝභන පත්‍ර ඇති වෘක්ෂ ද රමණීය භාවය පිණිස රෝපණය කරවයි. නමුදු ආචාර්යන් වහන්සේ හට ශ්‍රමණයන්ගේ ආවාසයේ රමණීයතර බව අතිශයින් රුචි වේ. එහෙයින් පක්ෂයකට දෙවරක් සම නොවූ බිම සම කරවන්නේ ගස් ද සිටුවන්නේ ආරාමය රමණීයතර කරවයි.]

**05. සාධු භන්තේ, තුම්හාකං ආරාමෝ සුනිවත්ථසුපාරුතේහි දහරසාමණේරේහි චේව සමභූමිභාගේහි ච යුත්තට්ඨානේ රෝපිතරුක්ඛේහි ච ඒකන්තේන රමණීයෝ.**

[ස්වාමීනි, හොඳය. නුඹ වහන්සේගේ ආරාමය මනා ලෙස හදින ලද අඳන ඇති මනා සේ පොරවන ලද සිවුරු ඇති කුඩා සාමණේරයන් වහන්සේලාගෙන් මෙන්ම සම වූ බිමෙන් ද සුදුසු තැන්හි සිටුවන ලද වෘක්ෂයන්ගෙන් ද ඒකාන්තයෙන් රමණීයය.]

**06. පුන ච පරං ආවුසෝ, නානාවේරජ්ජකා සුතේසකා ගමිකා සමණානං ආවාසං පත්වා දුන්නිවත්ථදුප්පාරුතේ කෝලාහලං කරොන්තේ චිත්තරූපං කීළන්තේ දහරසාමණේරේ ච යථිච්ඡකං විරුළ්හපාදපේ ච විසමභූමිභාගං ච දිස්වා සබ්බේ'පි භික්ඛූ අවමඤ්ඤන්ති. මරම්මරට්ඨිකෝ'පි "මරම්මජාතිකා ඒතාදිසේ සරණං ගතා"ති අවහසන්තා අඞ්ගුලේන නිදස්සෙන්ති. තබ්භාවම්'පි අක්ඛමමානෝ ආචරියෝ නිස්සිතකේ කේවලපරිපුණ්ණං සික්ඛං සික්ඛාපේති.**

[ඇවැත්නි, නැවතද අනෙකක් කියමි. නොයෙක් රට වලට අයත් ගමනෙහි යෙදුනාවූ ගවේෂකයෝ ශ්‍රමණයන්ගේ ආවාසයට පැමිණ නොමනා ලෙස හඳනා ලද පොරවන ලද්දාවූ කෝලාහල කරන්නාවූ කැමති පරිදි සෙල්ලම් කරන්නාවූ කුඩා සාමණේරයන් දැක කැමති පරිදි අක්‍රමවත්ව වැඩුණා වූ ගස් ද සම නොවූ බිම ද දැක සියළු භික්ෂූන් පහත් කොට සිතත්. (ඔවුහු) " බුරුම ජාතිකයෝ මෙවැන්නන් සරණ ගියාහු"යැයි අපහාස කරමින් බුරුම ජාතිකයන්ව ද ඇඟිල්ලෙන් පෙන්වත්. මේ බැව්ද නො ඉවසන්නාවූ ආචාර්යන් වහන්සේ ශිෂ්‍යයන්ට හැම ආකාරයකින්ම පරිපූර්ණ වූ ශික්ෂාව උගන්වයි.]

**07. සාධු භන්තේ, නිච්චකාලං ඒවං සික්ඛාපෙන්තානං තුම්හාකං ආරාමෝ කාලේ ගච්ඡන්තේ අඤ්ඤාරාමානං නයග්ගාහට්ඨානං භවිස්සන්ති.**

[ස්වාමීනි, යෙහෙක. මෙසේ නිරන්තරයෙන් උගන්වන්නාවූ නුඹ වහන්සේගේ ආරාමය කලක් යන විට අන්‍ය ආරාමයන්ට උදාහරණ ගත යුතු (ආදර්ශවත්) තැනක් වන්නේය.]

**අමාරු වචන.**

**01. මහාරුක්ඛෝ - මහත් වෘක්ෂය. සමූල (ති) - මුල් සහිතව. පාතේති (√පත+ණෙ+ති) - හෙළයි, බිම දමයි. පාතනං - බිම හෙළීම.**

**02. ඡායාබහුලට්ඨානං (ඡායා+බහුල+ ඨාන) - සෙවනැල්ල බහුල තැන. සීතාභිභූතෝ - සීතලෙන් මඩින ලද්දේ, සීතලෙන් යටත් කරන ලද්දේ. ජරරෝගී - උණ රෝගීයා. සූරියාලෝකෝ - සූර්‍යාලෝකය.**

**ලද්ධවිසභාගඋතුකෝ - ලැබූ වෙනස් වූ සෘතු ඇත්තේ. කාලේන කාලං - කලින් කලට. සනච්ඡායෝ - ඝන සෙවනැලි සහිත ගස. අපනෙත්වා - ඉවත් කොට. පටිලාභ (පු) - ලැබීම.**

**03. යදි ඒවං - එසේ නම්. මාලාවච්ඡෝ - කුඩා මල් ගස. රෝපාපේති (√රුහ+ණාපෙ+ති) - රෝපණය කරවයි.**

**04. සුපත්තරුක්ඛෝ - ශෝභන පත්‍ර ඇති වෘක්ෂය.**

**රමණීයභාවෝ - රමණීය බව. අපි ච (නි) - තවද / එසේද වුවත්. ආචරියස්ස - ගුරුන් වහන්සේට ("රුච්චති" යන්න සමඟ ක්‍රියාකාරක පද සම්බන්ධය දැක්විය යුතු). රුච්චති (√රුච+ය+ති) - රුචිවේ.**

**රමණීයතරත්තං - රමණීයතර බව. පක්ඛෝ - අඩමස / කාල පක්ෂ ශුක්ල පක්ෂ දෙක. විසමභූමිභාගෝ - සම නොවූ බිම් පෙදෙස. කාරාපේති (√කර+ණාපෙ+ති) - කරවයි.**

**05.** **සුනිවත්ථෝ - මනා සේ අඳින ලද අඳන ඇතියේ. සුප්පාරුතෝ - මනා සේ පොරවන ලද සිවුරු ඇත්තේ. යුත්තට්ඨානං - යෝග්‍ය තැනක්. රෝපිත (ති) - සිටුවන ලද.**

**06.** **නනාවේරජ්ජක (ති) - නොයෙක් රටවලට අයත්. සුතේසකෝ - ගවේෂකයා. ගමිකෝ - යාමට සැරසුනහු.**
**චිත්තරූපං - සිත් සේ. කීළන්තෝ - සෙල්ලම් කරනුයේ. යථිච්ඡකං - කැමැති පරිදි. විරූළ්හපාදපෝ - අක්‍රමවත් ව වැඩුණු ගස.**
**අවමඤ්ඤන්ති (අව √මන+ය+ති) අවමන් කෙරේ, පහත් කොට සිතයි. මරම්මරට්ඨිකෝ - බුරුම රට වැසියා. මරම්මජාතිකෝ - බුරුම ජාතිකයා.**
**("මරම්මරට්ඨික" යන පදයෙන් එරට වසන විවිධ ජාතීන් එක් කොට ගැනේ.)**
**ඒතාදිසෝ (ති) - මෙබඳු, මෙවැනි, මේ ආකාර.**
**අවහසන්ති (අව√හස+අ+ති) - අවමන් කොට සිනාසෙයි.**
**අඞ්ගුල (න) - අඟල, ඇඟිල්ල.**
**නිදස්සේති (නි√දිස+ණෙ+ති) - පෙන්වයි, නිදර්ශනය කරයි.**
**තබ්භාවෝ - ඒ බව, ස්වකීය ප්‍රකෘතිය.**
**අක්ඛමමානෝ - නොඉවසනුයේ. සික්ඛා (ඉ) - ශික්ෂාව, නීතිය, පුහුණුව, ඉගෙනීම. සික්ඛාපේති (√සික්ඛ+ණාපෙ+ති) - උගන්වයි.**

**07.** **නයග්ගාහට්ඨානං - උදාහරණ ගත යුතු (ආදර්ශවත්) තැනක්.**

**ගස් වල නම්.**

**වටෝ නිග්‍රෝධෝ - නුග ගස.**

**පිලක්ඛෝ - පුලිල ගස.**

**කපිත්ථෝ - දිවුල් ගස.**

**අස්සත්ථෝ බෝධිදුමෝ - බෝ ගස (පෙළ පොත් වල බෝධිරුක්ඛමූලේ යනාදී තැන්හි "බෝධිරුක්ඛෝ" යනුවෙන් භාවිත කොට ඇත. අභිධානප්පදීපිකාවෙහි "බෝධි" යන්න පමණක් දිස්වේ.)**

**තාලෝ - තල් ගස.**

**තින්දුකෝ - තිඹිරි ගස. අගරු (පු) - අගිල්. කප්පූරමාරං/ කප්පූර (පු/න) - කපුරු.**

**පුන්නාගෝ - දොඹ ගස. නාගෝ - නා ගස.**

**කරවීරෝ - කනේරු ගස.**

**කුඩකුමෝ - කොකුම් ගස.**

**මහාසතා (ඉ) - රෝස ගස.**

**මල්ලිකා (ඉ) - දෑසමන්, සමන් පිච්ච.**

**යූථිකා (ඉ) - සීනිද්ද**

**සේඵාලිකා (ඉ) - සේපාලිකා ගස.**

**බේලුව (පු) - බෙලි ගස.**

**අම්බාටක (පු) - අඹරැල්ල ගස.**

**සෝභඤ්ජනෝ (පු) - මුරුංගා ගස.**

**චිඤ්චා (ඉ) - සියඹලා. බදරී (ඉ) - ඩෙබර ගස.**

**නාළිකේර (පු) - පොල් ගස.**

## 29. රුක්ඛරෝපනපටිසංයුත්තෝ කථාසල්ලාපෝ.
[ගස් සිටුවීම සම්බන්ධ කථා සල්ලාපය.]

**01. රුක්ඛපාතාපනං සමණවෝහාරේන කථං වෝහරිතබ්බං ?**
[ශ්‍රමණ ව්‍යවහාරයෙන් ගස් බිම වැට්ටවීම කෙසේ ව්‍යවහාර කළ යුතු ද? ]

**02. රුක්ඛපාතාපනං සමණවෝහාරේන "කප්පියං කරෝහී"ති වෝහරිතබ්බං. තස්මා රුක්ඛං පාතාපේතුකාමේන භික්ඛුනා "ඉමං රුක්ඛං කප්පියං කරෝහී"ති ආණාපේතබ්බං.**
[ " කප්පියං කරෝහි ( කැප කරනු)" යැයි ගස් බිම වැට්ටවීම ශ්‍රමණ ව්‍යවහාරයෙන් ව්‍යවහාර කළ යුතු. එහෙයින් ගසක් බිම වැට්ටවීමට කැමැති භික්ෂුව විසින් " මේ ගස කැප කරව"යි අණ කළ යුතු.]

**03. සාඛාඡේදාපනං පන සමණවෝහාරේන කථං වෝහරිතබ්බං ?**
[අතු කැප්පවීම වනාහි ශ්‍රමණ ව්‍යවහාරයෙන් කෙසේ ව්‍යවහාර කළ යුතු ද?]

**04. සාඛාඡේදාපනං පන සමණවෝහාරේන "කප්පියං කරෝහී"ති වා "ජාන" ඉති වා වෝහරිතබ්බං. තස්මා සාඛං ඡේදාපේතුකාමේන භික්ඛුනා "ඉමං සාඛං කප්පියං කරෝහී"ති වා "ඉමං සාඛං ජාන" ඉති වා ආණාපේතබ්බං.**
[අතු කැප්පවීම වනාහි " කැප කරවයි" කියා හෝ " දැන ගනුව" යි කියා හෝ ව්‍යවහාර කළ යුතු. එහෙයින් අත්තක් කැප්පවීමට කැමති භික්ෂුව විසින් " මේ ගස කැප කරවයි" කියා හෝ " මේ අත්ත දනුව"යි කියා හෝ අණ කළ යුතු.]

**05. පඨවිඛණාපනං පන සමණවෝහාරේන කථං වෝහරිතබ්බං ?**
[පොළොව කැණවීම ශ්‍රමණ ව්‍යවහාරයෙන් කෙසේ ව්‍යවහාර කළ යුතු ද?]

**06. පඨවිඛණාපනම්පි සමණවෝහාරේන තදුභයේනේව වෝහරිතබ්බං. තස්මා පඨවිං ඛණාපේතුකාමේන භික්ඛුනා "ඉමං කප්පියං කරෝහී"ති වා "ඉමං පඨවිං ජාන" ඉති වා ආණාපේතබ්බං.**
[පොළොව කැණවීම ද ශ්‍රමණ ව්‍යවහාරයෙන් ඒ (ආකාර) දෙකින් ම ව්‍යාවහාර කළ යුතු. එහෙයින් පොළොව කැණවීමට කැමැති භික්ෂුව විසින් " මේ පොළොව කැප කරව"යි හෝ " මේ පොළොව දනුව"යි හෝ අණ කළ යුතු.]

**07. රුක්ඛරෝපාපනං පන සමණවෝහාරේන කථං වෝහරිතබ්බං ?**
[ගස් සිටුවවීම ශ්‍රමණ ව්‍යාවහාරයෙන් කෙසේ ව්‍යවහාර කළ යුතු ද?]

**08. රුක්ඛරෝපාපනං පන සමණවෝහාරේන "ජාන" ඉත්වේව වෝහරිතබ්බං. තස්මා රුක්ඛං රෝපාපේතුකාමේන භික්ඛුනා "ඉමං රුක්ඛං ජාන" ඉති ආණාපේතබ්බං.**

[ගස් සිටුවවීම ශ්‍රමණ ව්‍යවහාරයෙන් "දනුවැ"යි ම ව්‍යවහාර කළ යුතු. එහෙයින් ගස් සිටුවවනු කැමැති භික්ෂුව විසින් "මේ ගස දනුවැ"යි අණ කළ යුතු.]

**09. උදකසිඤ්චාපනං පන සමණවෝහාරේන කථං වෝහරිතබ්බං ?**

[ගස් වලට වතුර ඉසවීම ශ්‍රමණ ව්‍යවහාරයෙන් කෙසේ ව්‍යවහාර කළ යුතු ද?]

**10. උදකසිඤ්චාපනම්පි තථෙව වෝහරිතබ්බං. තස්මා උදකං සිඤ්චාපේතුකාමේන භික්ඛුනා "ඉමස්මිං රුක්ඛේ උදකං ජාන" ඉති ආණාපේතබ්බං.**

[ගස් වලට වතුර ඉසවීම ද එසේම ව්‍යවහාර කළ යුතු. එහෙයින් ජලය ඉසවීමට කැමැති භික්ෂුව විසින් "මේ ගස මත්තෙහි ජලය දනුවැ"යි අණ කළ යුතු.]

**11. ඡායත්ථාය වනත්ථාය රෝපිතරුක්ඛේසු උපසම්පන්නේහි'පි සයං උදකං සිඤ්චිතුං කප්පතියේව. තථා'පි පුප්ඵූපගඵලූපගරුක්ඛේසු සයං අසිඤ්චිත්වා සාමණේරදාරකානං කප්පියවෝහාරේන ආණාපනමේව සමණසාරුප්පං.**

[සෙවණ පිණිසත්, කැළෑව පිණිසත් සිටුවන ලද ගස් මත්තෙහි උපසපන් භික්ෂූන් විසින් ද තෙමේම ජලය ඉසීම කැපමය. එනමුදු මල් සඳහා සහ ගෙඩි ලබා ගැනීම සඳහා සිටවූ ගස් මත්තෙහි තෙමේ නො ඉස සාමණේරයන් වහන්සේලා, ආරාමික දරුවන්ට කැප ව්‍යවහාරයෙන් අණ කිරීමම ශ්‍රමණ සාරුප්‍යය.]

**12. යං කිඤ්චි ඵලං ඕචිනාපනං සමණවෝහාරේන කථං වෝහරිතබ්බං?**

[යම් කිසි ඵලයක් කැඩවීම ශ්‍රමණ ව්‍යවහාරයෙන් කෙසේ කළ යුතු ද? ]

**13. ඵලාවචිනාපනං "කප්පියං කරෝහී"ති වා "ජාන" ඉති වා වෝහරිතබ්බං. තස්මා යං කිඤ්චි ඵලං අවචිනාපේතුකාමේන භික්ඛුනා "ඉමං ඵලං කප්පියං කරෝහී"ති වා "ඉමං ඵලං ජාන" ඉති වා ආණාපේතබ්බං.**

[ගෙඩි කැඩවීම " කැප කරවැ"යි කියා හෝ " දනුවැ"යි කියා හෝ ව්‍යවහාර කළ යුතු. එහෙයින් යම් කිසි ගෙඩියක් කඩවනු කැමැති භික්ෂුව විසින් "මේ

ගෙඩිය කැප කරවැ''යි කියා හෝ " මේ ගෙඩිය දනුවැ''යි කියා හෝ අණ කළ යුතු.]

## අමාරු වචන

**01. රුක්ඛපාතාපනං - ගස් බිම වැට්ටවීම. සමණවෝහාරෝ - ශ්‍රමණ ව්‍යවහාරය. කථං - කෙසේ. වෝහරති (වි+අව√හර+අ+ති) - ව්‍යවහාර කරයි. කප්පිය (ති) - කැප වූ, යෝග්‍ය වූ, ශික්ෂාවන්ට විරුද්ධ නොවූ. පාතාපේති (√පත+ණාපෙ+ති) - වට්ටවයි. ආණාපේති (√අණ+ණාපෙ+ති) - අණ කරයි.**

**03. සාඛාඡේදාපනං - අතු කැප්පවීම. ඡේදාපෙති (√ඡිද+ණාපෙ+ති) - කප්පවයි, කඩවයි. ජානාති (√ඤා+නා+ති) - දනියි.**

**05. පථවිඛණාපනං - බිම සෑරවීම (මූල පදය "පථවී" යනුවෙන් වුවද සමාස විෂයෙහි මධ්‍යපදය ව හ්‍රස්වව සිටී).**

**06. තදුභයං - ඒ දෙවර්ගය. ඛණාපේති (√ ඛණු+ණාපෙ+ති) - සාරවයි. ඛණාපේතුකාමෝ - හාරවනු කැමැත්තේ.**

**07. රුක්ඛරෝපනං - ගස් සිටුවීම. ඉත්වේව (ඉති+ඒව) - එසේ ම. රෝපාපේති (√රුහ+ණෙ+ණාපෙ+ති) - සිටුවවයි. සිඤ්චාපේති (√සිච+ණාපෙ+ති) - ඉසවයි. ඡායා (ඉ) - සෙවණැල්ල. වනං - වනය. රෝපිත (ති) - සිටුවන ලද. උපසම්පන්නෝ- උපසම්පදාව ලත්. සයං (නි) - තෙමේ, තමා විසින්. කප්පති - කැපය.**

**පුප්ඵූපගෝ - මල් සඳහා වූ. ඵලූපගෝ - ඵල ලබා ගැනීම සඳහා වූ. කප්පියවෝහාරෝ - කැප ව්‍යවහාරය. ආණාපනං - අණ කරවීම. සමණසාරුප්ප (ති) - ශ්‍රමණ සාරුප්‍ය,සුදුසු, යෝග්‍ය. ඵලාවචිනාපනං (ඵලං+අවචිනාපනං) - ගෙඩි රැස් කරවීම. අවචිනාපේති (අව√චි+ණාපෙ+ති) - රැස් කරවයි.**

## 30. ජාතිභූමායාදිපුච්ඡනකථා.

[උපන් පළාත ආදිය විමසන කථාව.]

**01. ත්වං ආවුසෝ කතරභූමිජාතිකෝ’සි ?**

[ඇවැත්නි, නුඹ වහන්සේ කවර පළාත් ජාතිකයෙක් වෙහි ද?]

**02. අහං භන්තේ, ෂ්වේහෝනගරස්ස දක්ඛිණදිසාභාගේ සෝළසමයිලට්ඨානේ වැලැනාම නගරං අත්ථි, තස්ස පාචීනදිසාභාගේ චතුමයිලදූරේ තයයිඩ්ගාමේ ජාතෝ.**

[ස්වාමීනි, මම ෂ්වේහෝ නගරයට දක්ෂිණ දිශාවේ සැතපුම් දහසයක් (ගිය) තැන්හි වැලැ නමින් නගරයක් ඇත. ඒ නගරයට නැගෙනහිර දිශාවේ සැතපුම් සතරක් දුර තයයිං නම් ගමෙහි උපන්නේ වෙමි.]

**03. කතිමේ සාකවස්සේ ජාතෝ’සි ?**

[කවර මරම්ම ශක වර්ෂයෙහි උපත ලද්දේ වෙහි ද? ]

**04. (1294) චතුනවුතයාධිකේ ද්විසතේකසහස්සේ සාකවස්සේ ජාතෝ’ම්හි.**

[එක් දහස් දෙසීය අනූ හතරක් වූ ශක වර්ෂයෙහි උපන්නේ වෙමි.]

**05. කතරමාසේ ?**

[කවර මාසයේ ද?]

**06. චිත්තමාසේ.**

[අප්‍රේල් මාසයේය.]

**07. කතරපක්ඛේ ?**

[කවර පක්ෂයේ ද?]

**08. ජුණ්හපක්ඛේ.**

[ශුක්ල පක්ෂයේය.]

**09. කතරදිවසේ ?**

[කවර දවසෙහි ද?]

**10. පඨමදිවසේ.**

[පළමු දවසෙහිය.]

**11. කතරවාරේ ?**

[කවර දිනයෙහි ද?]

**12. සූරවාරේ.**

[ඉරිදා දිනයේය.]

**13. කිස්මිං කාලේ පුබ්බන්හේ වා මජ්ඣන්හේ වා සායන්හේ වා ?**
[කවර කාලයෙහි ද? උදෑසන ද ? මධ්‍යහනේ ද? සවස ද? ]

**14. පුබ්බන්හේ ජාතෝ'ම්හි.**
[උදෑසන කාලයෙහි උපන්නේ වෙමි.]

**15. කතරසටියං (සටිකාය)?**
[කවර වේලාවෙහි ද?]

**16. තිංසවිනාඩිකා'තික්කන්තේ පඤ්චනාඩිකමත්තේ.**
[විනාඩි තිහක් ඉක්ම ගිය පහට පමණ ( 5. 30 ට පමණ යන්නයි).]

**17. කින්නාමා'වුසෝ තව මාතා පිතරෝ ?**
[නුඹ වහන්සේගේ මව්පියෝ කවරහු ද?]

**18. මම මාතා ඤාණවතීනාම, පිතා පන පියසේනනාම.**
[මගේ මෑණියෝ ඤාණවතී නම් වෙයි, පියා වනාහි පියසේන නම් වෙයි.]

**19. කිත්තකා'වුසෝ තව භාතුභගිනියෝ ?**
[ඇවැත්නි, නුඹට සහෝදර සහෝදරියෝ කොතරම් ද?]

**20. තයෝ මේ භාතරෝ. ඒකා භගිනී.**
[මට සොහොයුරෝ තිදෙනෙකි. එක් සහෝදරියෙකි.]

**21. සා භගිනී ජෙට්ඨිකා වා මජ්ඣිමා වා නවකා වා ?**
[ඒ සහෝදරිය වැඩිමල් සහෝදරියක් ද? වයසින් සම සහෝදරියක් ද? බාල සහෝදරියක් ද?]

**22. ජෙට්ඨිකා භන්තේ.**
[ස්වාමීනි, වැඩිමල් සහෝදරියෙකි.]

**23. ත්වං පන තේසු භාතරේසු ජෙට්ඨකෝ වා මජ්ඣිමෝ වා නවකෝ වා ?**
[නුඹ වහන්සේ වනාහි ඒ සහෝදරයන් අතුරෙන් වැඩිමල් සහෝදරයා ද? මැදි වයස් සහෝදරයා ද? බාල සහෝදරයා ද?]

**24. ජෙට්ඨකෝ භන්තේ.**
[ස්වාමීනි, වැඩිමල් සහෝදරයායි.]

**25. කතිවස්සිකකාලේ සිප්පසාලං සම්පත්තෝ'සි ?**
[කිනම් වයස් ඇති කාලයේ පාසැලට පැමිණියේ වෙහි ද?]

**26. පඤ්චවස්සිකකාලේ සිප්පසාලං සම්පත්තෝ'ම්හි.**
[පස් වයස් කාලයෙහි පාසැලට පැමිණෙයේ වෙමි.]

**27. කස්ස ආචරියස්ස සන්තිකේ විජ්ජං උග්ගණ්හි ?**

[කවර ආචාර්යන් වහන්සේ නමක් ළඟ ශිල්ප උග්තේ ද?]

**28. විජ්ජාචරියස්ස සන්තිකේ විජ්ජං උග්ගණ්හිං.**

[විද්‍යාචාර්යන් වහන්සේ ළඟ විද්‍යාව උගත්මි.]

**29. කතරවිජ්ජං පඨමං උග්ගණ්හි ?**

[කවර විද්‍යාවක් පළමුව උගත්තේහි ද?]

**30. මූලවිජ්ජං චේව මඞ්ගලසුත්තඤ්ච තතෝපරං පරිත්තාදිං ච උග්ගණ්හිං.**

[මූලික (භාෂා) දැනුම මෙන්ම මංගල සූත්‍රය ද ඉන් අනතුරුව පිරිත් ආදිය ද උගත්තෙමි.]

**31. කතරවස්සිකකාලේ සාමණේරභාවං සම්පත්තෝ'සි ?**

[කවර වයස් කාලයෙහි සාමණේර භාවයට පැමිණියේ වෙහි ද?]

**32. ද්වාදසවස්සිකකාලේ සාමණේරභාවං සම්පත්තෝ'ම්හි.**

[දොළොස් වයස් කාලයෙහි සාමණේර භාවයට පැමිණියේ වෙමි.]

**33. ඉමං ගන්ධාරාමං කුතෝ සඞ්කන්තෝ'සි ?**

[මේ ගන්ධාරාමයට කොහි සිට (කවර විහාරයක සිට) මාරු වී පැමිණියේ වෙහි ද?]

**34. අම්හාකං ගාමන්තසේනාසනතෝ සඞ්කන්තෝ'ම්හි.**

[අපගේ ග්‍රාම විහාරයේ සිට මාරු වී පැමිණියේ වෙමි.]

## අමාරු වචන.

**01. කතරභූමිජාතිකෝ - කිනම් දේශයක උපන්නේ.**

**02. දක්ඛිණදිසාභාගෝ - දකුණු දිශා භාගය.**

**පාචීන (ති) - නැගෙනහිර දිශාව පිළිබඳ.**

**ජාතෝ - ඉපැදුනේ.**

**03. කතිම (පු) - කිනම්,කවර. සාකවස්සෝ - ශක වර්ෂය.**

**04. චතුනවුත්‍යාධික - අනූ හතරට අධික වූ.**

**ද්විසතේකසහස්ස (ද්විසත+එකසහස්ස) - දෙසිය + එක්දහස (එක්දහස්දෙසිය)**

**06. චිත්තමාසෝ - අප්‍රේල් මස.**

**08. ජුණ්හ (ති) - ආලෝකය ඇති. ජුණ්හපක්ඛෝ - පුර පක්ෂය.**

**12.** **සූරවාරෝ - ඉරු දින.**

**13.** **පුබ්බන්හෝ - උදෑසන. මජ්ඣන්හෝ - දවසේ මැද කොටස, මධ්‍යාහ්නය. සායන්හෝ - සවස. ("පුබ්බණ්හෝ" ආදී ලෙසින් මූර්ධජ "ණ" යන්නෙන්ද දිස්වේ. රූපසිද්ධියෙහි දන්තජ "න" කාරයෙන් දිස් වෙන අතර මොග්ගල්ලාන වියරණයෙහි මූර්ධජ "ණ"කාරයෙන් දිස්වේ).**

**16.** **විනාඩිකා - මිනිත්තු (කලින් පාඩම් වලදී දැක්වූ පරිදි "පල" යන ශබ්දය ද භාවිත කළ හැක).**
**(තිංසවිනාඩිකාතික්කන්තේ - විනාඩි 30 ක් අතික්‍රාන්ත වූ.**
**පඤ්චනාඩිකමත්තේ - පහට පමණ/ හතරයි තිහ, හතරයි හතළිස් පහ පමණ කාලය).**

**19.** **කිත්තක (ති) - කොපමණ. භාතු (භාතා) - සහෝදරයා. භගිනී - සහෝදරිය (වැඩිහිටි සහෝදරයා සඳහා යොදන කල්හි "ජෙට්ඨභාතා" යනුවෙන් ද බාල සහෝදරයා සඳහා යොදන කල්හි "කනිට්ඨභාතා" යනුවෙන් ද යොදනු. "භගිනී" ශබ්දය ද වැඩිහිටි සහෝදරිය වෙනුවෙන් යොදන කල්හි "ජෙට්ඨිකාභගිනී" ලෙස භාවිත කරනු. බාල සහෝදරිය වෙනුවෙන් "භගිනී" යන්නම භාවිත කළ හැක).**

**21.** **ජෙට්ඨකෝ - ජ්‍යේෂ්ඨයා. මජ්ඣිමෝ - මධ්‍යමයා. නවකෝ - බාලයා (ස්ත්‍රී ලිංගයෙහි "ජෙට්ඨිකා" ආදී ලෙසින් සිටී).**

**25.** **කතිවස්සිකකාලේ - කිනම් වයස් කල්හි. සිප්පසාලා - ශිල්ප ශාලාව, පාසැල.**

**27.** **විජ්ජාචරියෝ - ආචාර්යවරයා.**

**30.** **මූලවිජ්ජා - මූලික ඉගෙනීම. පරිත්තාදි - පිරිත් ආදී.**

**33.** **සඞ්කන්ත (ති) - සංක්‍රමණය වූ, ගිය, ඉක්මවා ගිය.**

**34.** **ගාමාන්තසේනාසනං - ග්‍රාමාන්ත සෙනසුන**

## වැදගත් වචන.

### මාස දොළොස.

i. චිත්තෝ - බක් මස.
ii. වේසාඛෝ - වෙසක් මස.
iii. ජෙට්ඨෝ - පොසොන් මස.
iv. ආසළ්හෝ - ඇසළ මස.
v. සාවනෝ - නිකිණි මස.
vi. පොට්ඨපාදෝ - බිනර මස.
vii. අස්සයුජෝ- වප් මස.
viii. කත්තිකෝ- ඉල් මස.
ix. මාගසිරෝ- උඳුවප් මස.
x. ඵුස්සෝ - දුරුතු මස.
xi. මාඝෝ - නවම් මස.
xii. ඵග්ගුනෝ - මැදින් මස.

### පක්ෂ දෙක.

i. සුක්ඛෝ/ ජුණ්හෝ - ශුක්ල පක්ෂය.
ii. කාළෝ/ කණ්හෝ - කාළ පක්ෂය.

### ඒ ඒ පක්ෂයෙහි දවස්.

i. පාටිපදෝ - චන්ද්‍ර මාසයේ පළමු දිනය, පසළොස්වකට හා මාසේ පෝයට පසුදා.
ii. දුතියා - දෙවැනි දිනය. තතියා - තෙවැනි දිනය (චතුත්ථී - පෙ- දසමී, ඒකාදසමී, ද්වාදසී, තේදසී, චතුද්දසී, පන්නරසී ආදී ලෙස යොදනු/ පඨමදිවසෝ, දුතියදිවසෝ -පෙ- පන්නරසමදිවසෝ යනුවෙන් ද යෙදිය හැක).

* පන්නරසී දෙවර්ගය -
  i. පුණ්ණමාසී, පුණ්ණමී, පුණ්ණිමා, පුණ්ණමා - පසළොස්වක පොහොය.
  ii. අමාවසී - අමාවක පොහොය.

* අමාවක දෙවර්ගය -
  i. චාතුද්දසී - දින දාහතරකින් උදාවන අමාවක පොහොය.
  ii. පන්නරසී - දින පහළොවකින් උදාවන අමාවක පොහොය.

* **උපෝසථ දෙවර්ගය -**
    i. **චතුද්දසී - දින දාහතරකින් එළැඹෙන උපෝසථය.**
    ii. **පන්නරසී - දින පහළොවකින් එළැඹෙන උපෝසථය.**
* **කත්තිකමාස දෙවර්ගය -**
    i. **පුබ්බකත්තික - (බිනර මස අමාවක පොහොයේ සිට වප් මස පසළොස්වක පොහෝ දින තෙක්).**
    ii. **පච්ඡිමකත්තික - (වප් මස අමාවක පොහෝ දින සිට ඉල් මස පසළොස්වක පොහොය දින තෙක්).**

**(විමතිවිනෝදනී ටීකා)**

**<u>සෘතු තුන</u>**

i. **හේමන්ත - ශීත කාලය (ඉල් මස පසළොස්වක පොහෝ දිනට පසු දින සිට මැදින් මස පුර පසළොස්වක පෝ දින තෙක් කාලය).**
ii. **ගිම්හෝ - උෂ්ණ කාලය (මැදින් මස පුර පසළොස්වක පොහෝ දිනට පසු දින සිට ඇසළ මස පසළොස්වක පොහෝ දින තෙක් කාලය).**
iii. **වස්සානෝ (වස්සෝ) - වර්ෂාකාලය (ඇසළ මස පුර පසළොස්වක දිනට පසු දින සිට ඉල් මස පුර පසළොස්වක පොහෝ දිනය තෙක් කාලය).**

**<u>සෘතු සය</u>**

i. **හේමන්තෝ - ශීත සෘතුව (ඉල් මස පුර පසළොස්වක පොහෝ දිනට පසු දින සිට දුරුතු මස පුර පසළොස්වක පොහොය තෙක් කාලය).**
ii. **සිසිරෝ - සිසිර සෘතුව (දුරුතු මස පුර පසළොස්වක පොහෝ දිනට පසු දින සිට මැදින් මස පුර පසළොස්වක පොහෝ දිනය තෙක් කාලය).**

iii. **වසන්තෝ - වසන්ත ඍතුව (මැදින් මස පුර පසළොස්වක පෝය දිනට පසු දින සිට වෙසක් මස පුර පසළොස්වක පොහොය තෙක් කාලය).**

iv. **ගිම්හෝ - ගිම්හාන ඍතුව (වෙසක් මස පුර පසළොස්වක පොහොය දිනට පසු දින සිට ඇසළ මස පුර පසළොස්වක පොහොය තෙක් කාලය).**

v. **වස්සානෝ (වස්සෝ) - වස්සාන ඍතුව (ඇසළ මස පුර පසළොස්වක පොහොයට පසු දින සිට බිනර මස පුර පසළොස්වක පොහොය තෙක් කාලය).**

vi. **සරදෝ- ශරත් ඍතුව (බිනර මස පුර පසළොස්වක පොහොයට පසු දින සිට ඉල් මස පුර පසළොස්වක පොහොය තෙක් කාලය).**

**[සැ.යු. අභිධානප්පදීපිකාවෙහි "සිසිරං" යනුවෙන් නපුංසක ලිංග පදයක් ලෙසින් දක්වා ඇත. පෙළෙහි "වස්සානෝ" යන්නට "වස්සෝ" යැයි දිස්වේ].**

**<u>දින සත</u>**

i. **රවි (පු) - ඉරිදා.**
ii. **සෝමෝ - සඳුදා.**
iii. **මඞ්ගලෝ - අඟහරුවාදා.**
iv. **බුධෝ - බදාදා.**
v. **වාචප්පති (පු) - බ්‍රහස්පතින්දා.**
vi. **සුක්කෝ - සිකුරාදා.**
vii. **සනේචරෝ - සෙනසුරාදා.**

**(රාහු/ රාහු දිනය - බදාදා දින සවස).**

**තවත් ක්‍රමයකින්....**

i. **ආදිච්චවාරෝ/ සූරවාරෝ - ඉරිදා.**
ii. **චන්දවාරෝ - සඳුදා.**
iii. **අඞ්ගාරෝ/ භුම්මවාරෝ. - අඟහරුවාදා.**
iv. **බුධවාරෝ - බදාදා.**
v. **ගුරුවාරෝ - බ්‍රහස්පතින්දා.**
vi. **සුක්කෝ - සිකුරාදා.**
vii. **සෝරවාරෝ - සෙනසුරාදා.**

**("වාරෝ" යන්න වෙනුවට "වාසරෝ" යන්නද පරිහරණය කළ හැක.)**

<u>දිශා අට</u>

i. **පාචී (ඉ) පාචීන (ති) පුබ්බා - නැගෙනහිර දිශාව.**
ii. **පුබ්බදක්ඛිණා - ගිනිකොණ දිශාව.**
iii. **අපාචී, අවාචී, දක්ඛිණා - දකුණු දිශාව.**
iv. **දක්ඛිණපච්ඡිමා - නිරිත දිශාව.**
v. **පතීචී, පච්ඡිමා - බටහිර දිශාව.**
vi. **පච්ඡිමුත්තරා/ උත්තරාභිමුඛ - වයඹ දිශාව.**
vii. **උදිචී, උත්තරා - උතුරු දිශාව.**
viii. **පුබ්බුත්තරා - ඊසාන දිශාව.**

**තවත් ක්‍රමයකින්....**

i. **පුරත්ථිමා - නැගෙනහිර දිශාව.**
ii. **පුරත්ථිමානුදිසා - ඊසාන දිශාව.**
iii. **දක්ඛිණා - දක්ෂිණ දිශාව.**
iv. **දක්ඛිණානුදිසා - ගිණිකොන දිශාව.**
v. **පච්ඡිමාදිසා - බටහිර දිශාව.**
vi. **පච්ඡිමානුදිසා - නිරිත දිග දිශාව.**
vii. **උත්තරාදිසා - උතුරු දිශාව.**
viii. **උත්තරානුදිසා - වයඹ දිශාව.**
ix. **හෙට්ඨිමා - පහත දිශාව.**
x. **උපරිමා - ඉහළ දිශාව.**

**යනුවෙන් දිශා දහයක් වේ. "පාචීන" යන තැන්හි "පාචීනදිසාභාගෝ" ආදී වශයෙන් ද යෙදිය හැක.**

<u>වේලාව සම්බන්ධ වචන</u>

i. **දණ්ඩෝ - අඩි රූල ආදී උපකරණයන් මාර්ගයෙන් වේලාව මැනගැනීමට පාවිච්චි කරන උපකරණයි.**
ii. **සටී (සටේන ඡායාපායා සටී) - ජල කළයෙන් දත යුතු වේලාව.**
iii. **සටිකා (සටයතී'ති සටිකා) - සංවිධානය කර ගන්නා ලද කෘත්‍ය සිදු කිරීමට ගළපන්නේනුයි "සටිකා" නම්.**

iv. **නාඩී.**

v. **නාඩි.**

vi. **නාඩික.**

**(ඉහත** iv,v,vi **යන පද නඩ ධාතුවෙන් නිපන් පදයි.** ii,iii,iv,v,vi **යන පද ස්ත්‍රී ලිඞ්ගික පදයි).**

**සැ.යු - විස්තර සඳහා පෝමනිධි ශබ්ද කෝෂය බලනු. මේ සියළු පද ජල ඔරලෝසුව සඳහා යෙදූ පදයි. මේ කථාසල්ලාපසික්ඛාවෙහි "නාඩිකා, ඝටිකා" යන පද දෙක පමණක් යොදන ලදි.**

**<u>ජල ඔරලෝසුව හා යන්ත්‍ර ඔරලෝසුව සංසන්දනය කිරීම.</u>**

| | ජල ඔරලෝසුව. | | යන්ත්‍ර ඔරලෝසුව. | |
|---|---|---|---|---|
| | කාලය | සංඛ්‍යාව | කාලය | සංඛ්‍යාව |
| 1 | අනුපලං | 1 | තත්පර | 1/ 150 |
| 2 | විපලං | 1 | තත්පර | 2/5 |
| 3 | පලං | 1 | තත්පර | 24 |
| 4 | දණ්ඩෝ (ඝටිකා) | 1 | මිනිත්තු | 24 |
| 5 | පහාරෝ | 1 | පැය | 3 |
| 6 | අහෝරත්ති | 1 | පැය | 24 |

**<u>ජල ඔරලෝසුවෙන් දින ගණනා විදිය.</u>**

i. **ඇසිපිය හෙළන කාලය අනුපල එකකි.**
ii. **අනුපල සැටක් විපල එකකි.**
iii. **විපල සැටක් පල එකකි.**
iv. **පල සැටක් දණ්ඩ (නාඩිකා) එකකි.**
v. **දණ්ඩ සතක් හා පල තිසක් පහාර එකකි.**
vi. **පහාර අටක් දිනයක් හා රාත්‍රියකි (දවසකි).**

**සැ.යු - අනුපල එකක් තත්පරයෙන් 1/150 පංගුවකට සමානය. විපල එකක් තත්පරයෙන් 2/5 කට සමානය යනාදී වශයෙන් අර්ථ දත යුතු.**

**ජල ඔරලෝසුවෙහිත් යන්ත්‍ර ඔරලෝසුවෙහිත් කාල ඒකක සමාන නොවතුදු යන්ත්‍ර ඔරලෝසුවට "නාඩිකා, ඝටිකා" යනුවෙන් ද මිනිත්තුවට "පලං" යනුවෙන් ද "විඝටිකා, විනාඩිකා" යනුවෙන් ද තත්පරයට "විපලං" යනුවෙන් ද භාවිත කරන ලදි.**

## 31. වසනට්ඨානාදිපුච්ඡනකථා.

[වාසය කරන ස්ථානාදිය විමසන කථාව.]

**01. ත්වං ආවුසෝ, ඉදානි කත්ථ වසසි ?**
[ඇවැත්නි, නුඹ වහන්සේ දැන් කොහි වසහි ද?]

**02. අහං භන්තේ, ඉදානි අමරපුරනගරේ මහාගන්ධාරාමේ වසාමි.**
[ස්වාමීනි, මම දැන් අමරපුර නගරයෙහි මහා ගන්ධාරාමයෙහි වාසය කරමි.]

**03. තත්ථ තේ වසන්තස්ස කීවචිරං ?**
[එහි වසන නුඹ වහන්සේට කොතෙක් කල් ද?]

**04. තත්ථ මේ වසන්තස්ස පඤ්චවස්සානි.**
[එහි වසන මට පස් වසක් (ඉක්මුණි.)]

**05. අහෝ අතිචිරං. ඉදානි කතමේ ගන්ථේ උග්ගණ්හාසි ?**
[අහෝ බොහෝ කල්ය. දැන් කවර ග්‍රන්ථ උගන්නෙහි ද?]

**06. දිවා කච්චායනබ්‍යාකරණඤ්චේව රූපසිද්ධිඤ්ච විනයපිටකඤ්ච රත්තියං යමකවාචනාමග්ගඤ්ච උග්ගණ්හාමි.**
[දවල් කාලයෙහි කච්චායන ව්‍යාකරණය මෙන්ම රූපසිද්ධිය ද විනය පිටකය ද රාත්‍රී කාලයෙහි යමක වාචනා මාර්ගය ද උගනිමි.]

**07. න පරිචිනාසි නු පාළිභාසං ?**
[පාළි භාෂාව ප්‍රගුණ නොකරන්නෙහි ද?]

**08. පරිචිනාමි භන්තේ.**
[ස්වාමීනි,ප්‍රගුණ කරමි.]

**09. යදි ඒවං සක්කෝසි නු පාළිභාසාය කථාසල්ලාපං කාතුං ?**
[එසේ වී නම් පාළි භාෂාවෙන් කථා සල්ලාප කිරීමට සමත් වෙහි ද?]

**10. ආචරියේන පාළිභාසාය කථාසල්ලාපං කාතුං සික්ඛාපිතා'පි මයං මූගත්තා න කථෙය්‍යාම.**
[ආචාර්යන් වහන්සේ විසින් පාළි භාෂාවෙන් කථා සල්ලාප කිරීමට උගන්වන ලද්දාහු ද අපි නොතේරෙන බැවින් කථා නො කරමු.]

**11. ඒවමේව අකථෙන්තෝ තුම්හේ මූගතරා හුත්වා යාව මරණකාලා'පි කථේතුං න සක්කුණිස්සථයේව. තස්මා ඉමස්මිං විහාරේ වසන්තා සබ්බේ'ව භික්ඛුසාමණේරා අනෝලීනචිත්තා පග්ගහිතමානසා මාතුභාසායං විය පාළිභාසායං ඡේකා භවිතුං පරක්කමෙය්‍යාථ. ඒවං**

**හි සති, තුම්හාකං ආරාමෝ මරම්මරට්ඨේ පාළිභාසාය කථාසල්ලාපස්ස පභවෝ භවිස්සති.**

[මෙසේ කථා නොකරන්නා වූ නුඹ වහන්සේලා බොහෝ කොට නොතේරෙන්නාහු වී මරණ කාලය දක්වාම කථා කිරීමට අසමත් වන්නාහුමය. එහෙයින් මේ විහාරයෙහි වසන්නානාවූ සියළු භික්ෂු සාමණේරයන් වහන්සේලා නොපසු බසින සිත් ඇත්තාහු ගන්නා ලද උත්සාහ සිත් ඇත්තාහු මව් භාෂාව මෙන් පාළි භාෂාවෙහි දක්ෂයෝ වීමට උත්සාහ කරවු. එසේ ඇති කල්හි නුඹ වහන්සේලාගේ ආරාමය බුරුම රටෙහි පාළි භාෂාවෙන් කථා කිරීමේ මුල් තැන බවට පත් වන්නේය.]

**12. ඒවං භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**අමාරු වචන.**

**03. වසන්තෝ - වාසය කරන්නේ. කීවචිර (ති) - කොපමණ කල්.**

**05. අහෝ (නි) - විස්මය දනවන නිපාත පදයකි. අතිචිරං - බොහෝ කල්.**

**06. කච්චායනබ්‍යාකරණං - කච්චායන ව්‍යාකරණය. රූපසිද්ධිං - රූපසිද්ධි ව්‍යාකරණය. යමකවාචනාමග්ගෝ - යමක ප්‍රකරණය හදාරන රාත්‍රී වාචනය. දිවා - දිවා කාලයෙහි. රත්ති (ඉ) - රාත්‍රියෙහි. පරිචිනාති (පරි√චි+නා+ති) - අභ්‍යාස (ප්‍රගුණ) කරයි, රැස් කරයි.**

**09. කථාසල්ලාප (පු) - සතුටු කථාව.**

**10. සික්ඛාපිත (ති) - උගන්වන ලද. මූග (ති) - ගොළුවා, ගොළු වූ, නොතේරෙන්නා. මූගත්තං - නොතේරෙන බව.**

**11. අකථෙන්තෝ - කථා නොකරනුයේ. මූගතරෝ - බොහෝ කොට නොතේරෙනුයේ. යාවමරණකාලා'පි - මැරෙන තුරු ද. අනෝලීනචිත්තෝ - පසු නොබසින සිත් ඇත්තේ. පග්ගහිතමානස (ති) - දිරි ලැබූ සිතැත්තාහු, ග්‍රහණය කළ සිත් ඇති. ඡේකෝ - දක්ෂයා. පරක්කමති (පරා√කමු+අ+ති) - උත්සාහ කෙරේ. පභවෝ - උපදනා තැන, මුල් හට ගැනීම. සක්කෝති (√සක+ඔ+ති) (තනාදි ගණික) - හැකි වේ, සමර්ථ වේ. සක්කුණාති (√සක+උණා+ති) (ස්වාදි ගණික) - හැකි වේ. සමර්ථ වේ.**

## 32. වාතවුට්ඨිපටිසංයුත්තකථාසල්ලාපෝ.

[වැසි සුළඟ පිළිබඳ කථාව]

**01. හියෝ රත්තියා මජ්ඣිමයාමේ භුසං වාතා වායන්ති.**

[ඊයේ රාත්‍රියෙහි මැදියමෙහි බොහෝ සෙයින් සුළං හමත්.]

**02. දේවෝ ච පඨමං ඒකමේකෝ ඵුසිත්වා පච්ඡා ගළගළායන්තෝ ගජ්ජිත්වා කරකවස්සං වසති. විජ්ජුලතායෝ'පි නිච්ඡරන්ති.**

[වැස්ස ද පළමුව වැසි බිඳු බිඳු (වැටී) ස්පර්ශ කොට පසුව ගඩ ගඩ යන ශබ්ද කරමින් ගර්ජනා කොට හිම කැට සහිතව වසියි. විදුලි ද නික්මෙත්.]

**03. මම කුටිකා දෝළායති.**

[මගේ කුටිය ද දෝළාවක් මෙන් සෙළවෙයි.]

**04. මහාරුක්ඛානං සාඛායෝ'පි භිජ්ජිත්වා පතන්ති.**

[මහ ගස් වල අතු ද බිඳී වැටෙත්.]

**05. චෙතියස්ස ඡත්තම්පි[1] භූමියං පතති.**

[චෛත්‍යයේ ඡත්‍රය ද බිම වැටෙයි.]

**06. අන්තෝගාමේ ඛුද්දකගේහානි'පි භිජ්ජිත්වා පතන්ති.**

[ඇතුල් ගම් හි කුඩා ගෙවල් ද බිඳී වැටෙත්.]

**07. සකලෝ'පි ආරාමෝ ආකිණ්ණකචවරෝ.**

[සියළු විහාරය කසළ වලින් ගැවසුණේ වෙයි.]

**08. තස්මා පුරාභික්ඛාචාරා සේනාසනානි අන්තෝචේව බහි ච සෝධෙය්‍යාථ. ආකිණ්ණකචවරෝ හි ආරාමෝ න රමණීයෝ හෝති.**

[එහෙයින් පිඩු සිඟා යාමට පෙර සෙනසුන් ඇතුලෙහි මෙන්ම පිටත ද පිරිසිදු කරවු. කසළ වලින් ගැවසුණු ආරාමය රමණීය නොවේ.]

[1] බුරුම චෛත්‍ය වල මුදුනෙහි කුඩයක් ඇත්තේය. මෙහි "ඡත්තං" යන්නෙන් ඒ කුඩය අදහස් කර තිබේ.

## අමාරු වචන

**01.** **වායති (√වා+ය+ති) - හමයි.**

**02.** **දේවෝ - වැස්ස. ඒකමේක (ති) - එකිනෙක, එකෙකා.**
**ඵුසති (√ඵුස+අ+ති) - ස්පර්ශ කරයි. ගළගළායති (නාම ධාතු) - ගඩ ගඩ යන ශබ්ද කරමින් වසියි, බලවත් සේ වසියි.**
**ගජ්ජති (√ ගජ්ජ+අ+ති) - ගර්ජනා කෙරේ, නාද කෙරේ.**
**කරකවස්සං - හිම කැට මෙන් වර්ෂාව. කරකා (ඉ) - හිම කැටය,**
**විජ්ජුල්ලතා (ඉ) - විදුලිය. නිච්ඡරති (නි√චර+අ+ති) - නික්මේ, පිටවේ.**

**03.** **කුටිකා (ඉ) - කුඩා කුටිය, කුඩා ගෙය, පැල.**
**දෝලා (ඉ) - දෝලාව, ඔන්චිල්ලාව.**

**04.** **ඡිජ්ජති (√ඡිද+ය+ති) - කැපේ, කැඩේ, කපනු ලැබේ.**

**05.** **චේතියං - චෛත්‍යය.**

**06.** **ඛුද්දකගේහං - කුඩා ගෙය.**

**07.** **ආකිණ්ණකචවරෝ - ගැවසුණු කසළ ඇති.**

**08.** **පුරාභික්ඛාචාර (පු) - පිඩු පිණිස හැසිරීමට පෙර.**

## 33. සීතපටිසංයුත්තකථා.

[ශීතල සම්බන්ධ කථා]

**01. සීතකාලො න නු ආවුසො ?**

[ඇවැත්නි, (මේ) ශීත කාලය නොවේ ද?]

**02. ආම භන්තෙ, සීතකාලො.**

[ස්වාමීනි, එසේය. (මේ) ශීත කාලයයි.]

**03. අථ කස්මා ත්වං උපරිපාවුරණං න පාරුපසි ?**

[එසේ නම් කවර හේතුවෙන් නුඹ වහන්සේ උඩ පොරෝනාව නො පොරවහි ද?]

**04. පමුට්ඨො'ම්හි භන්තෙ.**

[ස්වාමීනි, අමතකවූයේ වෙමි.]

**05. සබ්බදා සීතකාලෙසු අබ්භන්තරෙ කායබන්ධනං[1] බන්ධිත්වා අතිසීතකාලෙ පාවුරණම්පි පාරුපාහි.**

[ශීත කාලයන්හි සැම කල්හි සිවුරටත් සිරුරටත් අතර දූහුල් පොරෝනාව හැඳ අතිශයින් ශීත කාලයෙහි පොරෝනාව ද පොරවනු.]

**06. ආම භන්තෙ.**

[ස්වාමීනි, එසේය.]

**07. තාදිසෙ කාලෙ කාලෙන කාලං භෙසජ්ජං ඛාදාහි.**

[එවන් කාලයෙහි කලින් කලට (සීත දුරු කරන) බෙහෙත් ද වළඳව.]

**08. ආම භන්තෙ.**

[ස්වාමීනි, එසේය.]

**09. අජ්ජ අතිසීතං. ඛාදිතං නු තයා භෙසජ්ජං ?**

[අද අතිශයින් ශීතය. නුඹ වහන්සේ විසින් බෙහෙත් වළඳන ලද්දේ ද?]

**10. ආම භන්තෙ, මයා ඛාදිතං.**

[ස්වාමීනි, එසේය. මා විසින් වළඳන ලද්දේය.]

**11. ඒකන්තෙන ඛාදිතං නු ? මා මුසා භණාහි!**

[සත්තකින්ම වළඳන ලද්දේ ද? බොරු නොකියව.]

**12. ආම භන්තෙ ඒකන්තෙන ඛාදිතං. න මුසා භණාමි.**

---

[1] **මෙහි "කායබන්ධන" යනු ඉන පටිය නොව සීත කාලයේදී බුරුම භික්ෂූහු භාවිත කරන දූහුල් පොරෝනවක් අදහස් කෙරේ.**

[ස්වාමීනි, එසේය. සත්තකින්ම (මා විසින්) වළඳන ලද්දේය. බොරු නොකියමි.]

**13. ඒවං හෝතු!**

[එසේ වේවා.]

**(අ) චන්දනං සීතලං ලෝකේ - තතෝ චන්දෝ'ව සීතලෝ**
**චන්දනචන්දසීතම්හා - සාධුවාක්‍යං සුසීතලං.**

**(ආ) සීතවාචෝ බහුමිත්තෝ - ඵරුසෝ අප්පමිත්තකෝ**
**ඕපම්මං එත්ථ ඤාතබ්බං - සූරියචන්දරාජුනං.**

අමාරු වචන

**01. පාවුරණ / පාපුරණ (න) - පෙරවීමට ගන්නා වස්ත්‍රය.**
**උපරිපාවුරණං - උඩු කය වැසීමට ගන්නා වස්ත්‍රය.**
**04. පමුට්ඨ (ති) - සිහි මුළා වූ, මතක නැති වූ.**
**05. අබ්භන්තර (න) - ඇතුළ (මෙතැන්හි ශරීරයත් තනිපොට සිවුරත් අතර අදහස් කරන ලදි).**
**කායබන්ධන (න) - බඳ පටිය, දුහුල් පොරෝනාව .**
**අතිසීතකාලෝ - අති ශීත කාලය.**
**07. කාලේන කාලං - කලින් කල.**
**09. ඛාදිත (ති) - කන ලද.**
**11. ඒකන්ත (ති) - ඒකාන්ත වූ, එක් නිශ්චයක් ඇති. මුසා - බොරුව, අසත්‍යය.**
**භණති (√භණ+අ+ති) - කියයි.**
**13. ඒවං හෝතු - එසේ වේවා.**

ගාථාර්ථ.

**(අ) ලොකේ - ලෝකයෙහි. චන්දනං - සඳුන්. සීතලං - සීතලය. තතෝ - ඒ සඳුන් වලට වඩා. චන්දෝ'ව - චන්ද්‍රයා ම. සීතලෝ - සිසිල්ය. චන්දනචන්දසීතම්හා - සඳුන් හා චන්ද්‍රයාගේ සීතලට ද**

**වඩා.**

**සාධුවාක්‍යං - සත්පුරුෂ වචනය. සුසීතලං - ඉතා සිසිල්ය.**

**(ආ) සීතවාචෝ - සිසිල් වූ වචන ඇත්තේ. බහුමිත්තෝ - බොහෝ මිත්‍රයන් ඇත්තේය. ඵරුසෝ - පරුෂ වූයේ. අප්පමිත්තෝ - අල්ප මිතුරන් ඇත්තේය. එත්ථ - මේ තැන්හි. සූරියචන්දරාජූනං - සූර්‍යචන්ද්‍රරජවරුන්ගේ. ඕපම්මං - උපමාව. ඤාතබ්බං - දත යුතු. (සැ.යු - ගාථාවෙහි ඡන්දානුරක්ෂණය පිණිස "රාජුනං" යැයි හ්‍රස්ව වශයෙන් දක්වා ඇත. පද අන්වය දක්වන තැන "රාජූනං" ලෙස දීර්ඝ වශයෙන් දැක්විය යුතු.)**

## 34. භික්ඛාචාරවේලායං මේඝවස්සනකථා.

[පිඩු පිණිස හැසිරෙන කල්හි වැසි වැසීම ගැන කථා.]

**01. භික්ඛාචාරවේලායං භන්තේ, මේඝෝ වස්සති. අම්හේහි කථං කාතබ්බං ?**

[ස්වාමීනි, පිඩු පිණිස හැසිරෙන කල්හි වර්ෂාව වසී. අප විසින් කෙසේ කළ යුතු ද?]

**02. සචේ මේඝෝ වස්සති. න පිණ්ඩාය ගන්තබ්බං.**

[ඉදින් වැසි වසියි නම් පිඩු පිණිස නො යායුතු.]

**03. සචේ පිණ්ඩාය න ගච්ඡෙය්‍යාම. කුතෝ දිවාභත්තං ලබ්භති ?**

[ඉදින් පිඩු පිණිස නො යමු ද දිවා දානය කොතැනින් ලැබේ ද?]

**04. භත්තපාචකසාමණේරා භත්තං පචිස්සති. සූපබ්‍යඤ්ජනං පන උපාසිකායෝ පචිස්සන්ති.**

[බත් පිසින සාමණේරවරු බත් පිසින්නාහුය. සූප ව්‍යඤ්ජන වනාහි උපාසිකාවෝ පිසින්නාහුය.]

**05. නත්ථි පන භන්තේ, තණ්ඩුලඤ්චේව සූපෙය්‍යපණ්ණාදීනි ච.**

[ස්වාමීනි, සහල් මෙන්ම පළා කොළ ආදිය ද නැත්තේය.]

**06. අත්ථීයේව ආවුසෝ.**

[ඇවැත්නි, ඇත්තේමය.]

**07. ඒවං සති සාධු. අහං විජ්ජංයේව පරිචිනිස්සාමි.**

[එසේ ඇති කල්හි හොඳය. මම ශිල්පම හදාරන්නෙමි.]

**08. සබ්බදා වුට්ඨිසමයේ අසති අච්චායිකේ කරණීයේ මා කායං ඔවස්සාපේථ.**

[වැසි සමයෙහි හැම කල්හි හදිසි කටයුත්තක් නැති කල්හි සිරුර නො තෙමවු.]

**09. උපාහනම්පි අනෝවස්සානට්ඨානේ ඔමුඤ්චථ. සචේ අන්තෝ වුට්ඨියං ඒකන්තේන ගමනීයං හෝති. ඡත්තං ධාරෙත්වා ගච්ඡෙය්‍යාථ.**

[සෙරෙප්පු ද නො තෙමෙන තැනෙක ගලවවු. ඉදින් වැසි වැටෙද්දී

අවශ්‍යයෙන්ම යා යුතු වෙයි නම් කුඩයක් දරා යවු.]

**10. සචේ වුට්ඨිධාරා පච්ඡිජ්ජති. කථං කාතබ්බං ?**
[ඉදින් වැසි ධාරාව නවතී නම් කෙසේ කටයුතු ද?]

**11. යථාරුචි ගන්තබ්බං.**
[කැමති පරිදි යායුතු.]

**අමාරු වචන.**

**01. මෙඝො - වැස්ස.**
**03. දිවාභත්තං - දිවා දානය.**
**04. භත්තපාචකසාමණේරෝ - බත් පිසින සාමණේරයන් වහන්සේ ("පාචකසාමණේරෝ" යනුවෙන් ද භාවිත කළ හැක). සූපබ්‍යඤ්ජන (න) - සූප ව්‍යඤ්ජන.**
**05. තණ්ඩුල (න) - සහල්. සූපෙය්‍යපණ්ණ (න) - පළා කොළ.**
**08. වුට්ඨිසමයෝ - වැසි සමය. අච්චායික (න) - හදිසි කටයුත්ත. කරණීය (ති) - කළ යුතු. ඕවස්සාපේති (අව√වස්ස+ණාපෙ+ති) - තෙමයි.**
**09. උපාහනා (න) - පාවහන්. අනෝවස්සානට්ඨානං (න+ඕවස්සානට්ඨානං) - නො තෙමෙන තැන. ඕමුඤ්චති (අව√මුච+අං+ති) - ගලවයි. අන්තෝවුට්ඨි (ඉ) - ඇතුල් වැස්ස (වැසි වසිද්දී).**
**10. වුට්ඨිධාරා (ඉ) - වැසි ධාරාව. පච්ඡිජ්ජති (ප√ඡිද+ය+ති) - සිඳ දමනු ලැබේ, පැවැත්ම නවතී.**
**11. යථාරුචි - කැමති පරිදි.**

# 35. කල්ලභාවරක්ඛණකථා.

[නිරෝගී බැව් ආරාක්ෂා කිරීම පිළිබඳ කථා.]

**01. අයමාවුසෝ ආරාමෝ "ජරෝ"ති පාකටෝ. තස්මා ඉමස්මිං ආරාමේ වසන්තා පරිබ්බාජකා උපාදාය සබ්බේ'ව භික්ඛුසාමණේරා අත්තානං කල්ලභාවත්ථං ජරතෝ අනුරක්ඛන්තු!**

[ඇවැත්නි, මේ ආරාමය " උණ විහාරය" යයි ප්‍රකටය. එහෙයින් මේ විහාරයෙහි වසන්නාවූ ආරාමික දරුවන්ගේ පටන් සියළු භික්ෂු සාමණේරයන් වහන්සේලා තමන්ගේ නිරෝගී බව පිණිස උණ රෝගයෙන් ආරක්ෂා කරත්වා!]

**02. සීතකාලේ වාතවුසනතෝ අපවජ්ජේථ!**

[ශීත කාලයෙහි සුළං වැදීමෙන් දුරු වවු!]

**03. ද්වාරවාතපානකවාටානි'පි පිදහිත්වායේව නිපජ්ජථ!**

[දොරවල් ජනෙල් කවුළු ද වසා ම නිදවු.]

**04. රත්තියං පබුද්ධකාලේ'පි මනසි කරෝථ "සීතකාලෝ වා පරිළාහෝ වා"ති.**

[" ශීත කාලය හෝ උෂ්ණ කාලය  දැ"යි රාත්‍රියෙහි නැගී සිටි කල්හි ද සිහි කරවු.]

**05. සීතකාලේ (යදි දේවෝ'පි වස්සති) පුරිමයාමේ වා පච්චූසසමයේ වා ඒකමේකං භේසජ්ජං දදාථ.**

[ශීත කාලයෙහි (ඉදින් වැසි ද වටනේ නම්) පෙරයම හෝ ඉතා උදෑසන හෝ එක් අයෙකුට එක් බෙහෙතක් බැගින් දෙවු.]

**06. අනුදිනං අන්තමසෝ ඒකවාරමත්තං විරිඤ්චාපේථ.**

[දිනපතා අඩුම තරමින් එක් වරක් පමණ විරේචනය කරවු.]

**07. ඒදිසා හි ආරක්ඛා කල්ලභාවාය මූලභූතා හෝති.**

[මෙබඳු ආරක්ෂාව නිරෝගී බව පිණිස මුල් වූවා වෙයි.]

**08. අකල්ලභාවේ පන සති උපරිගන්ථං උග්ගණ්හිතුං න සක්කුණිස්සථ. උග්ගහිතා'පි ගන්ථා පමුට්ඨා භවිස්සන්ති. තස්මා කල්ලභාවාය අනුරක්ඛථ. භගවතා'පි වුත්තං "ආරෝග්‍යපරමා ලාභා"ති.**

[නිරෝගී නොවන කල්හි මත්තෙහි (උගත යුතු) ග්‍රන්ථ උගැන්මට  සමත් නොවන්නෙහු. උගන්නා ලද  ග්‍රන්ථ ද අමතකවූවෝ වන්නාහුය. එහෙයින්

නිරෝගී බව පිණිස (තමා) රකිවු. " ලාභය නිරෝගී බව පරම කොට ඇත්තේ "යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් ද වදාරණ ලදී.]

**අමාරු වචන.**

**01.** **උපාදාය - එතැන් පටන්. අනුරක්ඛති (අනු√රක්ඛ+අ+ති) - රකියි. වාතඵුසනං - හුළං ගැටීම. අපවජ්ජේති (අප√වද+ණෙ+ති) - දුරු කරයි.**

**03.** **ද්වාරං - දොර. වාතපානං - ජනේලය. කවාට (පු / න) - කවුළුව, ජනේලය, දොර පලුව.**
**නිපජ්ජති (නි√පද+ය+ති) - හොවී, නිදයි, ලගියි.**

**04.** **පබුද්ධකාලේ - පිබිදුනු කල්හි. පරිලාහ (පු) - දාහය, දැවිල්ල.**

**05.** **උපරියාමෝ - ප්‍රථම යාමය ("පඨමයාමෝ"යනුවෙන් ද භාවිත කළ හැක).**
**පච්චූසසමය - අලුයම් කාලය.**

**06.** **අනුදිනං - දිනපතා. අන්තමසෝ - අඩුම තරමින්.**
**විරිඤ්චාපේති (වි√රිච+ණාපෙ+ති) - විරේක කරයි.**

**07.** **ඒදිස (ති) - මෙබඳු, අරබඳු. ආරක්ඛා - ආරක්ෂාව. මූලභූත- මුල් වූ.**

## 36. වත්ථධෝවනකථා.

[වස්ත්‍ර සේදීම පිළිබඳ කථා.]

**01. අජ්ජා'වුසෝ ජුණ්හපක්ඛස්ස අට්ඨමීඋපෝසථෝ. ජානාසි නු ත්වං ?**

[ඇවැත්නි, අද ශුක්ල (පුර) පක්ෂයෙහි අටවැනි උපෝසථයයි. නුඹ වහන්සේ දන්නා සේක් ද?]

**02. ජානාමි භන්තේ.**

[ස්වාමීනි, දනිමි.]

**03. සචේ තේ වත්ථං ධෝවිතබ්බං අත්ථි, උපෝසථදිවසේයේව ධෝව.**

[ඉදින් නුඹ වහන්සේ හට සේදිය යුතු වස්ත්‍රයක් වේ නම් උපෝසථ දවසේ ම සෝදනු.]

**04. අත්ථි මේ ධෝවිතබ්බානි වත්ථානි. නහානීයපිණ්ඩි පන නත්ථි. සචේ ආයස්මතෝ සන්තකං අත්ථි, ථෝකං දේහි.**

[මට සේදිය යුතු වස්ත්‍ර ඇත. සබන් නම් නැත. ඉදින් ආයුෂ්මත් ස්වාමින් වහන්සේ සන්තකව ඇත්නම් ටිකක් දෙනු මැනවි.]

**05. හන්ද....පඨමං වත්ථං උදකේන ධෝවිත්වා පච්ඡා නහානීය - පිණ්ඩියා උබ්බට්ටෙත්වා මුහුත්තං ඨපේහි, මලානං සේදාපනත්ථාය. තතෝපරං උදකේන පුනප්පුනං ධෝවාහි! යාව නහානීයපිණ්ඩිගන්ධවිගමා. යදා උදකං පරිසුද්ධං නිග්ගච්ඡති. තදා ඒව නහානීයපිණ්ඩිගන්ධෝ'පි විගතෝ.**

[මෙන්න.....පළමුව වස්ත්‍රය ජලයෙන් සෝදා කුණු තෙත් වීම පිණිස පසුව සබන් උලා මොහොතක් තබව. ඉන් පසු සබන් ගන්ධය ඉවත් වන තුරු ජලයෙන් නැවත නැවත සෝදනු. යම් කලෙක පිරිසිදු ජලය (වස්ත්‍රයෙන්) බැහැර වෙයිද එකල්හි සබන් ගන්ධය ද ඉවත් වන ලද්දේමැයි.]

**06. ආම භන්තේ, ධෝවිතකාලේ පන කිං කාතබ්බං ?**

[ස්වාමීනි, එසේය. සේදූ කළ වනාහි කෙසේ කළ යුතු ද?]

**07. ධෝවිතකාලේ උණ්හේ ඔතාපෙත්වා සුක්ඛසමනන්තරමේව පටිසංහරාහි. උදකසාටිකා වා හෝතු. අඤ්ඤං වා වත්ථං.**

**සුක්ඛසමනන්තරං පටිසංහරණමේව විනයානුලෝමං.**
[සේදූ කළ අව්වේ වේළා වියළීමෙන් අනතුරුවම හකුළනු. නාන කඩය වේවා අන්‍ය වස්ත්‍රයක් වේවා වේළීමෙන් අනතුරුවම හැකිළීම විනයානුකූලය.]

**08. ආම භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

**අමාරු වචන.**

**01. අට්ඨමිඋපෝසථ - චන්ද්‍ර මාසයෙහි අට වැනි දින එළැඹෙන පොහොය.**
**("තිථි" යන පදය අපේක්ෂා කොට "අට්ඨමී" යැයි තිබේ. මී හට හ්‍රස්වයි).**

**03. ධෝවිතබ්බ (ති) - සේදිය යුතු. ධෝවති (√ධොවු+අ+ති) - සෝදයි.**

**04. නහානීයපිණ්ඩි - සබන්.**

**05. උබ්බට්ටේති (උ√වට්ට+ණෙ+ති) - අතුල්ලයි.**
**ඨපේති (√ඨා+ණාපෙ+ති) - තබයි. මල (න) - කුණු.**
**නහානීයපිණ්ඩිගන්ධෝ - සබන් ගන්ධය.**
**යාව නහානීයපිණ්ඩිගන්ධවිගමා - සබන් ගන්ධය නැති වන තුරු.**
**පරිසුද්ධ (ති) - පිරිසිදු. නිග්ගච්ඡති (නි√ගමු+අ+ති) - බැහැර යයි.**
**විගත (ති) - පහවූ, ඉවත් වූ.**

**07. පටිසංහරණ (න) - හැකිළීම, එකතු කිරීම.**
**විනයානුලෝමං - විනයට අනුලෝම.**

## 37. කේසෝරෝපනකථා.
[හිස කෙස් බෑම සම්බන්ධ කථා.]

**01. අජ්ජා'වුසෝ කාළපක්ඛඋපෝසථෝ. ජානාසි නු ත්වං ?**
[ඇවැත්නි, අද කළුවර පක්ෂයෙහි උපෝසථ දිනයයි. නුඹ වහන්සේ (ඒ බව) දන්නා සේක් ද?]

**02. ජානාමි භන්තේ.**
[ස්වාමීනි, දනිමි.]

**03. සචේ ත්වං කේසේ ඕරෝපේතුකාමෝ'සි. උපෝසථදිවසේයේව ඕරෝපේහි.**
[ඉදින් නුඹ වහන්සේ හිස කෙස් බෑමට කැමැත්තේ වෙහි නම් උපෝසථ දිනයේම බානු.]

**04. කීවදීසා භන්තේ, කේසා ඕරෝපේතබ්බා ?**
[ස්වාමීනි, කෙතෙක් දික් වූ කෙස් බෑ යුතු ද?]

**05. භගවතා ආවුසෝ පඤ්ඤත්තං "ද්වේමාසිකා වා දුවඞ්ගුලා වා කේසා ඡින්දිතබ්බා"ති. තථා'පි ඉමස්මිං ආරාමේ අනුපෝසථං ඡින්දන්ති.**
[ඇවැත්නි, "දෙමාසයක් හෝ දැඟුලක් පමණ වූ හෝ කෙස් සිඳිය යුතු"යැයි භාග්‍යවතුන් වහන්සේ විසින් පණවන ලදී. එසේ වුවත් මේ විහාරයෙහි උපෝසථ දිනක් පාසා (සතියකට වරක් කෙස් ) සිඳිත්.]

**06. ඡින්නකේසා කථං කාතබ්බං ?**
[සිඳින ලද කෙස් කෙසේ කළ යුතු ද?]

**07. තුම්හාකං පාචරියභූතෝ පකෞගූනගරේ මහාවිස්සුතාරාමිකෝ මහාථේරෝ ඒවමාහ. "මා තුම්හේ කේසේ ඡින්දනට්ඨානේයේව ඨපෙයාථ. ඡින්දනට්ඨානේ හි විප්පකිණ්ණා කේසා ආඝාතනේ සූකරලෝමානි විය අදස්සනීයානි හොන්ති. නීතිවිදූ'පි වදන්ති. ඨානභට්ඨා න සෝභන්ති කේසා දන්තා නඛා නරා"ති.තස්මා ඡින්නකේසේ සංකඩ්ඪිත්වා පරේසං අදස්සනට්ඨානේ ඡඩ්ඩෙයාථ.**
[නුඹ වහන්සේලාගේ පාචරිය (ගුරුවරයාගේ ගුරුවරයා) වූ පකෞගූ නගරයෙහි මහාවිස්සුතාරාමික මහ තෙරුන් වහන්සේ මෙසේ වදාළ සේක. " නුඹ වහන්සේලා සිඳින ලද තැනම කෙස් නො තබවු. සිඳින තැන විසිරී ගිය කෙස් සතුන් මරණ තැන ඌරු ලොම් මෙන් දැකීමට නුසුදුසු වෙත්,

" සිය මුල් ස්ථානයෙන් වෙන්වුනා වූ කෙස්, දත්, නිය, මිනිස්සු (යන මේ දෑ) ශෝභන නොවෙත්" යැයි නීති වේදීහු ද කියත්. එහෙයින් සිදින ලද කෙස් එකතු කොට අන්‍යයන් නොදකින තැනෙක විසි කරවූ.]

**08. ඒවං භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**09. සචේ සක්කුණෙය්‍යාථ, කේසෝරෝපනකාලේ තචපඤ්චකකම්මට්ඨානං මනසි කරෙය්‍යාථ. පුරිමබුද්ධකාලේ හි ඉමස්මිං කම්මට්ඨානේ කතපරිචයා සප්පුරිසා ඉමස්මිං බුද්ධසාසනේ ඛුරග්ගේයේව අරහත්තං පාපුණිංසු.**

[ඉදින් සමත් වෙහුද කෙස් සිදින කළ තච පඤ්චක කර්මස්ථානය මෙනෙහි කරවූ. පෙර බුදුවරයන් වහන්සේලාගේ කාලයෙහි මේ කර්මස්ථානයෙහි කළ පුරුදු ඇති සත්පුරුෂයෝ මේ බුදු සසුනෙහි හිස කෙස් බෑම අවසන් වනවාත් සමඟම අරහත් බවට පැමිණියහ.]

**10. ආම භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**11. සුතපුබ්බං නු වෝ ආවුසෝ "පුරිමබුද්ධකාලේ රාජකීයපණ්ඩිතභූතෝ වා ධම්මාචරියභූතෝ වා ඉමස්මිං බුද්ධකාලේ අරහත්තං පාපුණන්ති"ති ?**

[ඇවැත්නි, " පෙර බුදු වරයන් වහන්සේලාගේ කාලයෙහි රාජකීය පණ්ඩිත උපාධියෙන් පිදුම් ලද්දේ හෝ ධර්මාචාර්ය උපාධියෙන් පිදුම් ලද්දේ හෝ මේ බුද්ධ කාලයෙහි අරහත්වයට පත් වෙත් " යැයි නුඹ වහන්සේ අසන ලද්දේද?]

**12. න සුතපුබ්බං භන්තේ.**

[ස්වාමීනි, (මා විසින්) අසන ලද්දේ නොවේ.]

**13. කථං පන වෝ සුතපුබ්බං ?**

[නුඹ වහන්සේලා විසින් කෙසේ අසන ලද්දේ ද?]

**14. ඒවං නෝ සුතපුබ්බං "පුරිමබුද්ධකාලේ කම්මට්ඨානේ කතපරිචයා ඉමස්මිං බුද්ධකාලේ අරහත්තං පාපුණන්ති"ති.**

["පෙර බුදුවරයන් වහන්සේලාගේ කාලයෙහි කර්මස්ථානයෙහි කළ පුරුදු ඇත්තාහු මේ බුද්ධ ශාසනයෙහි අර්හත්වයට පැමිණෙති" යයි මෙසේ අප විසින් අසන ලද්දේය.]

**15. ඒවමා'වුසෝ, තස්මා තුම්හේ පරියත්තිතෝ පටිපත්තිමේව ආදරං**

**කරෙයාථ.**
[ඇවැත්නි, එසේය. එහෙයින් නුඹ වහන්සේලා පරියාප්තියට වඩා ප්‍රතිපත්තිය ම ආදරයෙන් (භාවිත) කරවු.]

**16. ආම භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

**අමාරු වචන.**

**03. කේස (පු) - කෙස්. ඕරෝපේති (අව√රුප+ණෙ+ති) - බහා තබයි, පහතට ගනියි, (කෙස්) ඉවත් කරයි.**

**04. ඕරෝපේතබ්බ (ති) - බහා තැබිය යුතු/ (කෙස්) ඉවත් කළ යුතු.**

**05. ද්වෙමාසික - දෙමාසයක් ඇති. දුවඞ්ගුල - අඟුල් දෙකක් ඇති. ඡින්දති (√ඡිදි+අ+ති) - සිඳියි.**

**06. ඡින්න (ති) - සිඳින ලද.**

**07. පාචරියභූත - ගුරුවරයාගේ ආචාර්‍යයා.**

**ඡින්දනට්ඨානං - කෙස් සිඳින තැන. විප්පකිණ්ණ (ති) - විසුරු වන ලද, විසිරී ගිය. ආඝාතන (න) - සතුන් මරණ තැන. සූකරලෝමං- ඌරු ලොම්.**

**අදස්සනීය (ති) - නොදැකිය යුතු.**

**(සැ.යු - කේසෝරෝපනං = කේස+ඕරෝපනං විනයට්ඨකථාවට අනුව ඕරොපන ආදී වශයෙන් භාවිත කරන ලදි. විනය පිටකයෙහි වනාහි "කේසමස්සුං ඕහාරාපෙත්වා" යැයි තිබේ.ඊට අනුව නම් "ඕහාරාපන, ඕහාරාපේහි" යනාදී ලෙසින් යොදනු).**

**තචපඤ්චකකම්මට්ඨානං - සම පස් වැනි කොට ඇති ශාරීරික කොටස් සම්බන්ධ කර්මස්ථානය.**

**කතපරිචය (ති) - කළ පුරුදු ඇති.**

**ඛුරග්ග (න) - හිස කෙස් බාන තැන, ඛුර කර්මයේ ( කෙස් බෑම) අවසානය.**

**15. පරියත්ති (ඉ) - පර්‍යාප්තිය.**

## 38. චීවරරජනපටිසංයුත්තකථා.
[සිවුරු පඬු පෙවීම සම්බන්ධ කථා.]

**01. අජ්ජා'වුසෝ උපෝසථදිවසෝ. තව කිං කරණීයං ?**
[ඇවැත්නි, අද උපෝසථ දිනයයි. නුඹ වහන්සේට කළ යුතු කුමක් ඇත්තේද?]

**02. මය්හං භන්තේ, චීවරරජනකිච්චං අත්ථි.**
[ස්වාමීනි, මට සිවුරු පඬු පෙවීමේ කෘත්‍යය ඇත්තේය.]

**03. නිග්‍රෝධතචේන පනසසාරං මිස්සෙත්වා රජනං පචිතබ්බං.**
[නුග පොතු හා කොස් අරටුව(?) මිශ්‍ර කොට පඬු පිසිය යුතු.]

**04. නිග්‍රෝධතචෝ කුතෝ තච්ඡිතෝ ?**
[නුග පොතු කොතැනකින් සසින ලද්දේ ද?]

**05. ආරාමස්ස පච්ඡිමනිග්‍රෝධතෝ.**
[ආරාමයාගේ පිටුපස නුග ගසින්ය.]

**06. සුන්දරෝ කිර බකුලතචෝ'පි.**
[බකුල ගසෙන් ගත් පොතු ද හොඳය.]

**07. ආම භන්තේ බදිරසිලේසෝ'පි සුන්දරෝ.**
[ස්වාමීනි, එසේය. කිහිරි ලාටු ද හොඳය.]

**08. තව රජිතබ්බචීවරං කිත්තකං ?**
[නුඹ වහන්සේට සායම් පෙවිය යුතු සිවුරු කොතරම් ද?]

**09. කප්පාසිකඤ්චේකං මුදුයුගළඤ්චේකං කක්ඛළයුගළඤ්චේකං.**
[කපු පුළුන් වලින් කළ එකක් ද ඉතා වටනා යුගලක් ද නොවටනා යුගලක් ද (වෙති)]

**10. පාකතිකතෝ චීවරානි කතරවණ්ණානි ?**
[ප්‍රකෘතියෙන් කවර වර්ණ සිවුරු ද?]

**11. ඒකං යුගළං ථෝකං රත්තං. ඒකං පීතං.**
[එක් යුගලයක් ටිකක් රතුය. එකක් කහය.]

**12. මා රත්තං චීවරං පුන රජාහි. පීතං පන නිග්‍රෝධරත්තවණ්ණං රජාහි.**
[රතු පැහැති සිවුරු නැවත පැහැ නොගන්වනු. කහ පැහැති සිවුර වනාහි නුග පැහැ රතු පාටින් පැහැ ගන්වනු.]

**13. රජනකාලේ'පි රජනං පරිස්සාවෙත්වා චීවරං සාධුකං මද්දිත්වා**

**රජාහි. න මුට්ඨියා වා මුග්ගරේන වා පෝථෙත්වා රජිතබ්බං.**
[පැහැ ගත් වන කල්හිදු පඬු පෙරා සිවුර මනා කොට මැද පැහැ ගත්වනු. අත් මිටෙන් හෝ පොල්ලෙන් තලා පැහැ නොගත්වනු.]

**14. රජිත්වා පීළෙත්වා චීවරවංසේ වා චීවරරජ්ජුයං වා පසාරේතබ්බං. න ච ථේවේ අච්ඡින්නේ පක්කමිතබ්බං.**
[පැහැ ගත්වා මිරිකා සිවුරු දමන උණ ලීයෙහි හෝ සිවුරු වැලෙහි හෝ දිග හැරිය යුතු. පඬු බින්දු නොසුන් කල්හි (පඬු බින්දු වැටීම නතර වන තෙක්) නො යායුතු.]

**අමාරු වචන.**

**03. රජති (√රජ+අ+ති) - සායම් පොවයි, පාට යොදයි.**
**රජිතබ්බ (ති) - පාට පෙවිය යුතු. නිග්‍රෝධතචෝ - නුග පොතු.**
**පනසසාරෝ - කොස් සාරය, අරටුව(?) (කොස් ගසෙන් සාදා ගත් පඬු).**
**මිස්සේති (√මිස්ස+ණෙ+ති) - මිශ්‍ර කරයි, කළවම් කරයි.**
**04. තච්ඡති (√තච්ඡ+අ+ති) - සසියි, තුනී කරයි.**
**ඛදිරසිලේසෝ - කිහිරි ලාටු.**
**09. කප්පාසික (ති) - කපු පුළුන් වලින් තැනූ, කපු ගස් ඇති.**
**11. රජනකාලෝ - පඬු ගසන කාලය.**
**පරිස්සාවේති (පරි√සව+ණෙ+ති) - පෙරයි. මුට්ඨි (ඉ) - අතේ මිට.**
**මුග්ගරෝ - මුගුර, පොල්ල.**
**පසාරේති (ප√සර+ණෙ+ති) - දිග හරියි.**

**සැ.යු. උපසපන් භික්ෂූන් හා සාමණේරයන් වහන්සේලා විසින් සර්ව නිල් රතු ආදී අකැප පැහැයෙන් යුතු සිවුරු පෙරවීම නොකළ යුතු.**

**(වුසපේරගාථාවෙහි සිවුරු සම්බන්ධයෙන් ඇති අවවාදය කියවනු!)**

## 39. සූපබ්‍යඤ්ජනපචනකථා.

[සූප ව්‍යඤ්ජන පිසින කථා.]

**01. අජ්ජා'වුසෝ සූපබ්‍යඤ්ජනපාචිකා උපාසිකා කතරං සූපබ්‍යඤ්ජනං අභිසඞ්ඛරිස්සන්ති ?**

[ඇවැත්නි, අද සූප ව්‍යඤ්ජන පිසින්නා වූ උපාසිකාවෝ කිනම් සූපව්‍යඤ්ජනයක් සකසත් ද?]

**02. ලාපුසූපං චේව සෝකරබ්‍යඤ්ජනං ච කිර පචිස්සති.**

[ලබු සූපයක් මෙන්ම ඌරු මස් ව්‍යඤ්ජනයක් ද පිසින්නේය(ලු).]

**03. සාධු... ඒතානි මිස්සෙත්වා පාචෙය්‍යාසි.**

[හොඳයි.. ඒවා මිශ්‍ර කොට පිසවනු.]

**04. සාමණේරෝ භන්තේ, බුද්ධරක්ඛිතෝ නිම්මංසභෝජී. තස්මා න මිස්සෙත්වා පාචිතුං යුත්තං.**

[ස්වාමීනි, බුද්ධරක්ඛිත සාමණේරයන් වහන්සේ නිර්මාංශියෙකි. එහෙයින් මිශ්‍ර කොට නොපිසිය යුතු. ]

**05. තේනහි පච්චේකං අමිස්සෙත්වා පාචෙය්‍යාසි.**

[එසේ වී නම් අමිශ්‍ර කොට වෙන වෙනම පිසවනු.]

**06. මම පන මිස්සකබ්‍යඤ්ජනං රුච්චති.**

[මට වනාහි මිශ්‍ර වූ ව්‍යඤ්ජනය රුචි වේ.]

**07. කස්ස සාදු න රුච්චති ? මම පි රුච්චතියේව.**

[කවරෙක් හට මිහිරි වූව රුචි නොවේ ද? මට ද රුචි වේමය.]

**08. ලාපුසූපේ තේලං චේව ලෝණමච්ඡරසං ච යථානුරූපං පක්ඛිපිත්වා පාචෙය්‍යාසි. සෝකරේ පන ධූපං පක්ඛිපිත්වා තේලං අපක්ඛිපිත්වා පාචෙය්‍යාසි.**

[ලබු සූපයෙහි තෙල් මෙන්ම ලුණු මාළු රස (ඩපි නම් බුරුම රසකාරකය) ද කැමති පරිදි යොදා පිසවනු. ඌරු මසෙහි වනාහි රසකාරක දමා තෙල් නොදමා පිසවනු.]

**09. පක්කානි භන්තේ බ්‍යඤ්ජනානි. වීමංසාහි අලෝණ''න්ති වා අතිලෝණ''න්ති වා මධුර''න්ති වා අමධුර''න්ති වා.**

[ස්වාමීනි, ව්‍යඤ්ජනයෝ පිසින ලදහ. '' ලුණු රහිත දැ''යි හෝ ''ලුණු වැඩිදැ''යි හෝ ''මිහිරි දැ''යි හෝ ''අමිහිරි දැ''යි හෝ විමසනු.]

**10. ඒතං සුන්දරං. අථා'පරං මරිචානි උදුක්ඛලේ පෝථෙත්වා උත්තරිභඞ්ගං කාරාපේහි.**

[මෙය හොඳය. ඉන් පසු මිරිස් වංගෙඩියෙහි කොටා සලාදයක් සාදවනු. ]

**11. කාරිතෝ භන්තේ.**

[ස්වාමීනි, කරවන ලදී.]

**12. අජ්ජ අලමෙත්තාවතා. ස්වේ පන සූපෙය්‍යපණ්ණානි ඕචිනිත්වා පාචෙය්‍යාසි.**

[අදට මෙපමණ සෑහේය. හෙට වනාහි පළා කොළ (ව්‍යඤ්ජන සඳහා ගන්නා කොළ වර්ග) එක් රුස් කොට පිසවනු.]

## අමාරු වචන.

**01. පාචිකා (ඉ) - පිසින්නී. අභිසඞ්ඛරෝති (අභි+සං√කර+ඔ+ති) - සකස් කරයි.**

**02. ලාබු (ඉ) - ලබු ගෙඩිය. සෝකරං - ඌරු මස්.**

**03. පාචේති (√පච+ණෙ+ති) - පිසවයි.**

**04. නිම්මංසභෝජී - නිර්මාංශ භෝජන අනුභව කරන්නා. පාචිතුං - පිසවීමට.**

**05. පච්චේකං (ක්‍රි.වි) - වෙන් වශයෙන්, තනි තනිව.**

**06. මිස්සකබ්‍යඤ්ජනං - මස් සමඟ එකට පිසින ලද ව්‍යඤ්ජන.**

**07. ලෝණමච්ඡරසෝ - ඩපි නම් බුරුම ආහාරයට දෙන ලද පාළි නාමයයි.**

**08. ධූපෝ - රසකාරක. යථාරූපං - ගැළපෙන පරිදි.**

**09. වීමංසති (√මාන+ස+ති) - විමසයි, පරීක්ෂා කරයි, නුවණින් බලයි.**

**10. මරීචං - මිරිස්. උදුක්ඛල (පු/න) - වංගෙඩිය. උත්තරිභඞ්ගෝ - කට ගැස්ම, සම්බල් වැනි කෑම (සලාද). කාරාපෙති (√කර+ණාපෙ+ති) - කරවයි. කාරිත (ති) - කරවන ලද.**

**12. අලං (නි) - ඔය ඇති, ප්‍රමාණයි. එත්තාවතා (නි) - මෙපමණකින්. ස්වෙ පන - හෙට වනාහි.**

**["එත්තාවතා"යන මේ පදය අභිධානප්පදීපිකාවෙහි ද**

**සද්දනීතිසුත්තමාලාවෙහි ද පරිච්ඡේද අර්ථවාචක නිපාතයක් යැයි දක්වා තිබේ. රූපසිද්ධියෙහි "ආලුතබ්බහුලේ" සූත්‍රාවසානයෙහි ඒත පදයට පසුව පරිමාණාර්ථවාචක වන්තු ප්‍රත්‍ය තබා "ත" කාරාස්ථ අකාරයට ආකාරාදේශ කිරීමෙන් "ඒතාවා" යනුවෙන් ද, මොග්ගල්ලානාදිකණ්ඩ 43 වැනි සූත්‍රයෙහි "ආවන්තු" ප්‍රත්‍යය තැබීමෙන් "ඒතාවා" යනුවෙන් සිද්ධ වන බැව් දක්වා තිබේ. ඒ මතයන්ට අනුව ඒතාවතා යැයි "ත" හට ද්විත්ව නොවීමෙන් ලැබෙන රූපය දැක්විය යුතුය. "එත්තාවතා" යන තැන "ත" හට ද්විත්වයි.]**

## 40. චේතියපූජාකථා.
[චෛත්‍ය පූජා කථා.]

**01. උත්තරාරාමතෝ ආවුසෝ ගීතසද්දෝ සූයති. තත්ථ කිං හෝති ?**
[ඇවැත්නි, උතුරු (දෙසින් පිහිටා ඇති) ආරාමයෙන් ගීත ශබ්දයක් ඇසේ . එහි කුමක් වේද?]

**02. ස්වේ භන්තේ, උත්තරාරාමේ චේතියමහෝ භවිස්සති. තස්මා තත්ථ ගීතං වාදිතසද්දෝ කෝලාහලං හෝති.**
[ස්වාමීනි, හෙට උතුරු ආරාමයේ චෛත්‍ය පිංකමක් වන්නේය. එහෙයින් එහි ගීත වාදන ශබ්දය කෝලාහලයක් වෙයි.]

**03. තස්මිං චේතියමහේ දීයිස්සති පිණ්ඩපාතෝ'පි ?**
[ඒ චෛත්‍ය පිංකමෙහි පිණ්ඩපාතය ද දෙනු ලැබෙන්නේ ද ?]

**04. ආම දීයිස්සති.**
[එසේය. දෙනු ලැබෙන්නේය.]

**05. නිමන්තිතෝ නු පිණ්ඩපාතපටිග්ගහණාය අම්හාකං විහාරෝ?**
[පිඬු පිළි ගනු පිණිස අපගේ විහාරය ආරාධිත ද? ]

**06. ආම භන්තේ සකලෝ'පි ආරාමෝ නිමන්තිතෝ.**
[ස්වාමීනි, එසේය. සියළුම ආරාමය ආරාධිතයි.]

**07. යදි ඒවං, ස්වේ පාතෝ'ව ගමිස්සාම පඨමං පටිග්ගහණාය.**
[එසේ වී නම් පළමුව (පිණ්ඩපාතය) පිළිගැනීම පිණිස හෙට උදෑසනින්ම යමු. ]

**08. න පාතෝ ගන්තබ්බං. අම්හාකං විහාරස්ස ආසන්නත්තා. සබ්බපච්ඡා වාරෝ භවිස්සති.**
[අපගේ විහාරයට ආසන්න බැවින් උදෑසනින් නො යායුතු. සියල්ලන්ටම පසු වාරය (අවසාන වාරය අපහට) වන්නේය.]

**09. යදි ඒවං කථං ඤාතබ්බං "අම්හාකං වාරෝ සම්පත්තෝ වා නෝ වා"ති ?**
[එසේ වී නම් "අපගේ වාරය පැමිණියේ දැයි හෝ නොවේ දැ"යි කෙසේ දත යුතු ද?]

**10. පණ්ඩිතසාමණේරං පඨමං වීමංසාපෙත්වා ඤාතබ්බං "අම්හාකං වාරෝ සම්පත්තෝ වා නෝ වා"ති.**
["අපගේ වාරය පැමිණියේ දැයි හෝ නොවේ දැ"යි පළමුව නුවණැති

සාමණේරයන් වහන්සේ නමක් ලවා විමසවා දත යුතු. ]

**11. ගමනකාලේ කථං ගන්තබ්බං ?**

[යන කළ කෙසේ යා යුතු ද?]

**12. චීවරං පරිමණ්ඩලං පාරුපිත්වා පත්තං සුපග්ගහිතං පග්ගහෙත්වා ඔක්ඛිත්තචක්ඛුහි පටිපාටියා යථාවුඩ්ඪං ගන්තබ්බං. ඒවං හි ගතේ භික්ඛුසාමණේරේ දිස්වා ගහට්ඨා අතිවිය පසීදන්ති. පසන්නාකාරම්පි කරොන්ති.**

[සිවුර පිරි මඬුලු කොට පොරවා පාත්‍රය මනා කොට ගෙන බිම හෙළු නෙතැත්තෝව වැඩිහිටි පිළිවෙලින් පේළියට යා යුතු. එසේ ගිය කල්හි භික්ෂු සාමණේරයන් වහන්සේලා දැක ගෘහස්ථයෝ අතිශයින් පහදිත්. ඇඟිලි බැඳිම් වැඳීම් ආදී පැහැදුනු ආකාරයන් ද කරත්.]

**අමාරු වචන.**

**01. උත්තරාරාමෝ - උතුරු දිගින් පිහිටි වෙහෙර. ගීතසද්දෝ - ගීත ශබ්දය. සූයති (√සු+ය+ති) - ඇසේ.**

**02. චේතියමහ - චෛත්‍ය පිංකම. කෝලාහල (පු/න) - කලබලය, දබරය, මහ ඝෝෂාව.**

**05. නිමන්තිත (ති) - නිමන්ත්‍රණය කළ, පැවැරූ.**

**සැ.යු - "කෝලාහල" යන පදය පාළි ශබ්ද කෝෂවලත් සංස්කෘත ශබ්ද කෝෂවලත් පුල්ලිංග පදයක් වශයෙන් දක්වා ඇත. තවත් ශබ්ද කෝෂයක නපුංසක ලිංග පදයක් ලෙස ද දක්වා ඇත. පෙළ පොත් වලද පුල්ලිංගික නපුංසකලිංගික දෙවිදියෙන්ම හමු වේ.**

**07. පාතෝ'ව - කලියෙන්ම.**

**09. "නෝ" යන පදය "න" සමඟ අර්ථයෙන් සමාන පටිසේධ නිපාතයකි.**

**පග්ගණ්හාති (ප√ගහ+ණ්හා+ති) - ගනී, ග්‍රහණය කරයි.**

**පටිපාටි - පේළිය. යථාවුඩ්ඪං - වැඩිහිටි පිළිවෙලින්. ගහට්ඨ - ගෘහස්ථයා.**

**පසන්නාකාර - පැහැදුනවුන්ගේ ආකාරය (ඇඟිලි බැඳීම් ආදිය).**

## 41. ධම්මුස්සවකථා

[ධර්ම දේශනාවක් සම්බන්ධ කථා.]

**01. ඉමෙ බහූ මනුස්සා ගන්ධමාලාදිහත්ථා කුහිං ගච්ඡන්ති ?**
[මේ බොහෝ මනුෂ්‍යයෝ සුවඳමල් ආදිය අත ඇත්තාහු කොහි යත් ද?]

**02. ධම්මස්සවනාය ධම්මුස්සවං ගච්ඡන්ති.**
[දහම් අසනු පිණිස පිංකමකට යත්.]

**03. කත්ථ ධම්මුස්සවෝ අත්ථි ?**
[පිංකමක් කොහි වෙයි ද?]

**04. මහාගන්ධාරාමේ පන ගන්ධකුටියං නාම ගිඤ්ජකාවසථේ ධම්මුස්සවෝ අත්ථි.**
[මහාගන්ධාරාමයෙහි "ගන්ධකුටි" නමින් ගඩොලින් කළ ගොඩනැගිල්ලෙහි පිංකමක් ඇත්තේය.]

**05. තත්ථ කතරෝ ධම්මකථිකෝ ධම්මං දෙසෙස්සති ?**
[එහි කවර ධර්ම කථිකයෙකු දහම් දෙසන්නේ ද?]

**06. ආයස්මා බුද්ධරක්ඛිතෝ ධම්මං දේසෙස්සති.**
[ආයුෂ්මත් බුද්ධරක්ඛිත ස්වාමීන් වහන්සේ ධර්මය දේශනා කරන සේක.]

**07. සෝ කත්ථ කුසලෝ සුත්තන්තේ වා උදාහු අභිධම්මේ වා ?**
[උන්වහන්සේ කවරෙක්හි (කවර දේශනාවෙක්හි) දක්ෂ ද? සූත්‍රාන්තයේ ද නො එසේ නම් අභිධර්මයේ ද?]

**08. සුත්තන්තේ චේව අභිධම්මේ ච ඡේකෝ යේව.**
[සූත්‍රාන්තයෙහි මෙන්ම අභිධර්මයෙහි ද දක්ෂයෙක් ම ය.]

**09. ඉදානි කතරං දේසෙස්සති සුත්තන්තං වා උදාහු අභිධම්මං වා ?**
[දැන් කවරක් දෙසන්නේ ද? සූත්‍රාන්ත (දේශනාවක්) ද ? නො එසේ නම් අභිධර්ම දේශනාවක් ද?]

**10. සුත්තන්තං දේසෙස්සති. න අභිධම්මං.**
[සූත්‍රාන්ත (දේශනාවක්) දේශනා කරන්නේය. අභිධර්ම (දේශනාවක්) නොවේ.]

**11. සුත්තේසු'පි කතරං සුත්තං දේසෙස්සති ?**
[සූත්‍රයන් අතුරෙන් ද කවර සූත්‍රයක් දේශනා කරන්නේ ද?]

**12. ධම්මදායාදසුත්තං දේසෙස්සති.**
[ධම්ම දායාද සූත්‍රය දේශනා කරන සේක.]

**13. සාධු භන්තේ, ආයස්මතෝ බුද්ධරක්ඛිතස්ස පබ්බජ්ජා බුද්ධසාසනස්ස වුඩ්ඪියා විරුළ්හාය වේපුල්ලාය සංවත්තති.**
[ස්වාමීනි, හොඳය. ආයුෂ්මත් බුද්ධරක්ඛිතයන් වහන්සේගේ පැවිද්ද බුද්ධ ශාසනයේ වෘද්ධිය පිණිස වැඩීම පිණිස විපුලත්වය පිණිස පවත්නේය.]

**14. ඒවං භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

**අමාරු වචන.**

**03. ධම්මුස්සව (පු) - පිංකම.**

**04. ගන්ධකුටි (ඉ) - ගඳකිළිය.**

**13. පබ්බජ්ජා (ඉ) - පැවිද්ද ("ආයස්මතෝ බුද්ධරක්ඛිතස්ස" යනුවෙන් ඇති බැවින් මෙතැන්හි පැවිද්ද යනුවෙන් අර්ථ ගත යුතු).**
**වුඩ්ඪි - වෘද්ධිය.**
**විරුළ්හි (ඉ) - දියුණුව, වැඩීම, අභිවෘද්ධිය.**
**වේපුල්ලං - පැතිරුණු බව, මහත්බව, විපුලත්වය.**

## 42. සයනාසන්නකථා
[නිදා ගැනීමට ආසන්නව කථා.]

**01. සාමණේර බුද්ධරක්ඛිත! සජ්ඣායිතෝ නු රත්තිසජ්ඣායනං ?**
[ඇවැත්නි බුද්ධරක්ඛිතය! රාත්‍රී වාචනය සජ්ඣායනා කරන ලද්දේ ද? ]

**02. සජ්ඣායිතෝ'මහි භන්තේ.**
[ස්වාමීනි, සජ්ඣායනා කරන ලද්දේ වෙමි.]

**03. ඉදානි කිං කරෝසි ?**
[දැන් කුමක් කෙරේද?]

**04. පුරාසංවේසනා චිත්තපාතිකම්මං කරෝමි.**
[හොවීමට (නින්දට වැටීමට) පළමුව (නව ගුණ වැල භාවිතයෙන්) කර්මස්ථානයක් මෙනෙහි කරමි.]

**05. කිස්මිං ආරම්මණේ චිත්තපාතිකම්මං කරෝති ?**
[(ඒ නුඹ වහන්සේ) කවර ආරම්මණයෙක්හි භාවනා වඩන්නේ ද?]

**06. බුද්ධාරම්මණේ චේව මෙත්තාභාවනාය ච චිත්තපාතිකම්මං කරෝමි.**
[බුද්ධාරම්මණයෙහි මෙන්ම මෛත්‍රීයෙහි ද භාවනා වඩන්නෙමි.]

**07. සයිස්සසි නු චිත්තපාතිකම්මං කත්වා ?**
[භාවනා කොට නිදන්නෙහි ද?]

**08. ආම සයිස්සාමි.**
[එසේය, නිදන්නෙමි.]

**09. පුරා නිද්දායනා චතුපච්චයානිසංසං තාව පච්චවෙක්ඛෙය්‍යාසි.**
[නින්දට පෙර සිව් පස ආනිශංසයන් (ප්‍රත්‍යවේක්ෂා සතරෙහි ඇති ආනිසංසයන්) ප්‍රත්‍යවේක්ෂා කරව.]

**10. අහං භන්තේ, පරිභෝගේ පරිභෝගේ පච්චවෙක්ඛිං.**
[ස්වාමීනි, මම පරිභෝග කරන වාරයක් පාසා ප්‍රත්‍යවේක්ෂා කළෙමි.]

**11. ඒවං සති'පි පුරානිද්දායනා පුන පච්චවෙක්ඛෙය්‍යාසි.**
[එසේ ඇති කල්හි ද නින්දට පෙර නැවත ප්‍රත්‍යවේක්ෂා කරනු.]

**12. ආම භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

**13. තතෝපරං සතෝ සම්පජානෝ උට්ඨානසඤ්ඤං මනසි කත්වා සයෙය්‍යාසි. ඒවං හි සුපන්තෝ පාපකං සුපිනං න පස්සති, සුඛං**

**සයති, සුඛං පබුජ්ඣති, තස්මා සබ්බදායේව සතෝ සම්පජානෝ සයෙය්‍යාසි.**
[ඉන් අනතුරුව සිහි ඇත්තේ මනා දැනීම් ඇත්තේ නැගිටීමෙහි සඤ්ඤාව මෙනෙහි කොට නිදාගනු. මෙසේ සැතපෙන්නේ නපුරු සිහින නොදකියි, සුවසේ නිදයි, සුවසේ අවදිවේ, එහෙයින් හැමකල්හිම සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ (වී) නිදනු.]

14. **ආම භන්තේ.**
[ස්වාමීනි, එසේය.]

## අමාරු වචන.

**01. සජ්ඣයිත (ති) - උගත්, හැදෑරූ. රත්තිසජ්ඣයනං - රාත්‍රී වාචනය.**
**පුරාසංවේසනා - නින්දට යාමට පෙර.**
**05. චිත්තපාතිකම්ම - නවගුණ වැල උපකාරයෙන් භාවනා කිරීම.**
**09. පුරානිද්දායනා - නින්දට වැටීමට පළමුව.**
**චතුපච්චයානිසංස - සිවු පසෙහි ආනිසංස.**
**පච්චවෙක්ඛති (පති+අව√ඉක්ඛ+ති) - ප්‍රත්‍යවේක්ෂා කරයි, පස් විකයි.**
**13. සතෝ - සිහි ඇත්තේ. සම්පජාන (න) - දැනීම, මනා දැනීම.**
**උට්ඨානසඤ්ඤා - නැගී සිටීමේ සඤ්ඤාව (අරුණ වැටීමට පළමුව මෙනම් වේලාවෙක්හි පිබිදෙන්නෙමියි නැගිටින වේලාව පිළිබඳ ඇති සඤ්ඤාවයි).**
**සුපන්ත (ති) - නිදන. සුපිනං - සිහිනය.**
**පබුජ්ඣති (ප√බුද්ධ+ය+ති) - පිබිදෙයි.**

## 43. සුත්තකාලේ පවත්තිකථා.
[නිදි කළ පැවති කථා.]

**01. සුපිස්සසි නු ආවුසෝ බුද්ධරක්ඛිත ?**
[ඇවැත්නි බුද්ධරක්ඛිතය, නිදන්නෙහි ද?]

**02. ආම සුපිස්සාමි.**
[එසේය, නිදන්නෙමි.]

**03. ධම්මරක්ඛිතෝ'පි පචලායති, සුපත්වේව.**
[ධම්මරක්ඛිත ද නිදි කිරයි, නිදා ගනීවා.]

**04. න පචලායාමි භන්තේ, මෙත්තාභාවනං භාවේමි.**
[ස්වාමිනි, (මම) නිදි නොකිරමි, මෛත්‍රී භාවනාව වඩමි.]

**05. සචේ සුපිතුකාමෝ'සි මහාද්වාරඤ්ච උස්සීසකේ වාතපානඤ්ච පිදහස්සු.**
[ඉදින් නිදනු කැමැත්තේ වෙහි නම් ප්‍රධාන දොර ද හිස තබන පැත්තෙහි ජනේලය ද වසනු.]

**06. ආම භන්තේ, පිදහිතානි ද්වාරවාතපානානි.**
[ස්වාමීනි, එසේය. දොර ජනෙල් වසන ලද්දාහුය.]

**07. පඨමං සයිකා කේ ?**
[කවරෙක්හු පළමුව නිදාගත්තාහු ද?]

**08. පඨමං භන්තේ, සයිතා සංඝරක්ඛිතතිස්සදත්තනාගා.**
[ස්වාමීනි, සඞසරක්ඛිත, තිස්ස, දත්ත, නාග සාමණේරවරු පළමුව නිදා ගත්තෝය.]

**09. මජ්කෙඩ්ඹවරකේ දන්තඛාදනසද්දෝ චේව ගුරුගුරුසද්දෝ ච සූයති. කෝ දන්තං ඛාදති ? කෝ ච ගුරුගුරායති ? දස්සේහි බුද්ධරක්ඛිත අග්ගිං ජාලෙත්වා.**
[කාමරයෙහි මැද දත් මිටි කන හඬක් මෙන්ම ගොරවන හඬක් ද ඇසේ. කවරෙක් දත් මිටි කයි ද? කවරෙක් ගුරු ගුරු හඬ කෙරේද (ගොරවයිද)? බුද්ධරක්ඛිතය විදුලි පහන දල්වා පෙන්වනු!]

**10. හා... ඒතේසං සාමණේරානං අඤ්ඤතෝ උපධානං අඤ්ඤතෝ සීසං. දත්තෝ පන අත්ථරණං න පත්ථරති. උත්තරාසඞ්ගෝ'පි බහි හෝති. ඌරුනි'පි පාකටානි. අයමේව මඤ්ඤේ දන්තේ ඛාදති.**
[ හා... මේ සාමණේරයන්ගේ කොට්ටය අන් තැනෙකය. හිස අන්

තැනෙකය. දත්ත සාමණේරයා වනාහි ඇතිරිල්ල ද අතුරා නැත. තනි පට සිවුර ද පිටතය. කලවා ද ප්‍රකට (ව පෙනේ)ය. මොහුම දත් කන්නේ යැයි සිතමි.]

**11. අමුකස්මිං මඤ්චේ නාගෝ'පි උත්තානෝ සයති. මුඛතෝ'පි ලාලා පග්ඝරන්ති.**

[අතන ඇඳෙහි නාග (නැමැති) සාමණේරයා ද උඩු බැලි ව නිදයි. කටින් ද කෙළ වැගිරෙයි.]

**12. ඒතේ පබෝධෙත්වා පුන සම්මා සයාපේහි.**

[ඔවුන් නැගිටුවා නැවත හොඳින් නිදි කරවනු.]

**13. ආම භන්තේ.**

[ස්වාමීනි, එසේය.]

**අමාරු වචන**

**01. සුපිස්සසි නු - නිදන්නෙහි ද?**

**03. පචලායති (ප√චල+ආය+ති) - නිදා වැටෙයි, නිදි කිරයි.**

**සුපත්වේව (සුපතු+ඒව) - නිදාම ගනීවා.**

**04. භාවේති (භූ+ණෙ+ති) - වඩයි, මෙනෙහි කරයි.**

**උස්සීසක (ති) - හිස තබන පැත්තෙහි වූ.**

**06. පිදහිත/ පිහිත (ති) - වසන ලද.**

**07. සයිත /සුත්ත (ති) - සයනය කළ, නිදා ගත්.**

**09. මජ්ඣෙඕවරකං - කාමරයෙහි මැද (අව්‍යයීභාව සමාස බැවින් නපුංසක ලිංග පදයකි).**

**දන්තඛාදනසද්ද - දත් මිටි කන ශබ්දය.**

**ගුරුගුරුසද්ද - ගුරු ගුරු ශබ්දය/ ගොරවන ශබ්දය.**

**10. උපධාන (න) - කොට්ටය. අත්ථරණ (න) - ඇතිරිල්ල.**

**අත්ථරති (ආ√ථර+අ+ති) - අතුරයි.**

**11. අමුක (ති) - අසවල්. උත්තාන (ති) - උඩුබැලි**

**ලාලා (ඉ) - කෙළ (නින්දෙහි දී කටින් වැගිරෙන කෙළ).**

**පග්ඝරති (ප√ඝර+අ+ති) - වැගිරෙයි, වැස්සෙයි.**

**(සැ.යු. විශාල කාමරයක් සඳහා "ගබ්භ" යන පදයද කුඩා කාමරයක් සඳහා "ඕවරක" යන පදයද භාවිත කරනු).**

## 44. පාචනඟ්ගිකථා.

[පාචකාග්නිය සම්බන්ධ කථා.]

**01. තුම්හේ පච්චූසසමයේ සයනා උට්ඨහිත්වා කිං පිවනසීලා හෝථ ?**
[නුඹ වහන්සේලා ඉතා උදෑසන කාලයෙහි ඇඳෙන් නැගිට කවරක් පානය කරන පුරුදු ඇත්තාහු වෙහු ද?]

**02. (අ) බුද්ධරක්ඛිතෝ ආහ "න කිඤ්චි පිවනසීලෝ'මှී"ති.**
**(ආ) ධම්මරක්ඛිතෝ ආහ "අහං පන උදකපායී"ති.**
**(ඇ) සංඝරක්ඛිතෝ ආහ "අහං භන්තේ, පුරාරුණා උදකං පිවිත්වා අරුණෝදයේ භත්තපචනට්ඨානං සීඝං ධාවිත්වා නිස්සාවං යාචිත්වා පිවනසීලෝ'මှී"ති.**
[(අ)"(මම) කිසිවක් නොබොන පුරුදු ඇත්තේ වෙමි"යි බුද්ධරක්ඛිත සාමණේරයන් වහන්සේ කීය.
(ආ) " මම වනාහි ජලය වළඳන පුරුදු ඇත්තේ " යැයි ධම්මරක්ඛිත සාමණේරයන් වහන්සේ කීය.
(ඇ) "ස්වාමීනි, මම වනාහි අරුණට පෙර ජලය වළඳා අරුණ නැගෙන කල්හි බත් පිසින තැනට වේගයෙන් දිව බතින් පෙරූ කැඳ ඉල්වා බොන පුරුදු ඇත්තේ වෙමි"යි සංඝරක්ඛිත සාමණේරයන් වහන්සේ කීය.]

**03. මා තුම්හේ සයනා උට්ඨහිත්වා කිඤ්චි අපිවනසීලා හෝථ. පඨමං උදකං පිවිත්වා පච්ඡා අරුණේ උග්ගතේ නිස්සාවපායිනෝ හෝථ.**
[නුඹ වහන්සේලා ඇඳෙන් නැගිට කිසිවක් නොබොන පුරුදු ඇත්තාහු නොවවු. පළමුව ජලය බී පසුව අරුණ නැගුණු කල්හි කැඳ වළඳන පුරුදු ඇත්තාහු වවු.]

**04. නිස්සාවපානං භන්තේ, කිමත්ථියං ?**
[ ස්වාමීනි, කැඳ පානය කුමක් පිණිස ද?]

**05. අන්තෝඋදරේ උණ්හවාතනිබ්බාපනත්ථං. යේභුයෝ්යන හි සෝතූනං රෝගෝ උණ්හවාතසමුට්ඨානෝ. තථා හි අන්තෝඋදරේ අසිතපීතඛායිතසායිතානං පාචනිකා ගහණී නාම කුච්ඡග්ගි අත්ථි. සෝ ආහාරසඞ්ඛාතං ඉන්ධනං අලභමානෝ උදරපටලං ගණ්හාති. තතෝ තේජෝධාතු තං තං ඨානං පත්ථරති.**

**වායෝධාතු ච තේජෝසහායං ලභිත්වා අඞ්ගමඞ්ගානුසාරිනී හෝති. තතෝ පාදඵෝටාදි නානාරෝගෝ උදපජ්ජති. තස්මා උණ්හවාතස්ස අනුට්ඨාපනත්ථාය සතිං පච්චුපට්ඨාපෙත්වා නිස්සාවඤ්ච පිවෙය්‍යාථ. ගන්ථඤ්ච අප්පසද්දේන සජ්ඣායථ. ඒවං හි අත්තානං අනුරක්ඛන්තෝ යාව මරණකාලා අප්පරෝගී හෝති.**

[කුස තුළ ඇති උණු වාතය නිවීම පිණිසය. බොහෝ සෙයින් ශිෂ්‍යයන්ගේ රෝගය උෂ්ණ වාතයෙන් හට ගත්තෙකි. එතෙකුදු වුවත් කුස තුළ (ඇත්තාවූ) කන ලද බොන ලද දෑ පිසින්නා වූ පාකාග්නිය නම් උදර ගින්නක් ඇත්තේය. ඒ උදර ගින්න ආහාර සංඛ්‍යාත ඉන්ධනය නොලබන්නේ උදර පටලය ගනී. ඒ හේතුවෙන් තේජෝ ධාතුව ඒ ඒ තැන පැතිරෙයි. වායෝ ධාතුව ද තේජෝ ධාතුවේ සහාය ලැබ ලොකු කුඩා අංග අනුව යන්නේ වෙයි. එයින් පයපොල ආදී විවිධ රෝග හට ගනී. එබැවින් උෂ්ණ වාතය නො නැඟීම පිණිස සිහිය පිහිටුවා කැඳ ද බොවු. ග්‍රන්ථයන් ද අල්ප ශබ්දයෙන් සජ්ඣායනා කරවු. මෙසේ තමන්ව ආරක්ෂා කරන්නේ මැරෙන තුරු අල්ප රෝග ඇත්තේ වෙයි.]

## අමාරු වචන.

**02. පිවනසීල - පානය කිරීමේ පුරුද්ද ඇතියේ. නිස්සාවෝ - බතින් පෙරූ කැඳ.**

**04. නිස්සාවපානං - බතින් පෙරූ කැඳ බීම.**

**කිමත්ථිය (ති) - කිනම් ඕනෑ කමක් ඇති, කුමක් පිණිස.**

**05. අන්තෝඋදරං - උදරය තුළ.**

**නිබ්බාපන (න) - නිවීම, සිහිල් වීම.**

**ගහණී (ඉ) - පාකාග්නිය.**

**කුච්ඡග්ගි (කුච්ඡි+අග්ගි) - කුස ගින්න.**

**ආහාරසඞ්ඛාත (ති) - ආහාර යැයි කියන ලද.**

**පත්ථරති (ප√ථර+අ+ති) - පතුරුවයි, පැතිරෙයි.**

**පාදඵෝට - පය පොල. ඵෝට (පු) - පොළ, බිබිළි, පිළිකා.**

**උදපාදි (උ√පද+ඊ) - පහළ විය. අනුට්ඨාපන (න) - නොනැගිටීම.**

## 45. උදකවඩ්ඪනකථා
[ජල නැගීම් සම්බන්ධ කථා.]

**01. දක්ඛිණතෝ ආවුසෝ භුසං වාතා වායන්ති. ඒරාවතීනදියං[1] උදකං වුඩ්ඪිස්සති.**
[ඇවැත්නි, දකුණු දෙසින් බොහෝ සෙයින් සුළං හමත්. ඒරාවතී ගඟෙහි ජලය වැඩෙන්නේය.]

**02. කථං ත්වං ජානාසි ?**
[නුඹ වහන්සේ කෙසේ දනියි ද?]

**03. පස්සෙය්‍යාසි අපි නු ආකාසේ වලාහකේ ?**
[අහසෙහි වළාකුළු දක්නෙහි ද?]

**04. ආම පස්සාමි.**
[එසේය, දකිමි.]

**05. ඒතේ සන්නිවිට්ඨමේසෝ යේව. දක්ඛිණවාතෝ තේ උත්තරදිසං පේසේසි. තේ සම්පත්තට්ඨානේ උදකබින්දූනි හුත්වා මේඝභාවේන සම්පතන්ති. තතෝ නදියං උදකං වඩ්ඪති. තත්ථ සම්පුණ්ණත්තා අම්හාකං මහාසරේ’පි උදකං වඩ්ඪති යේව.**
[ඒ මනා සේ එක් රැස් වූ වළාකුළුමයි. දකුණු (දෙසින් හමන) සුළඟ ඒවා (වළාකුළු) උතුරු දිශාවට යැවීය. ඒවා සම්ප්‍රාප්ත තැන්හි ජල බින්දු වී වර්ෂාව වශයෙන් වැටෙත්. ඒ හේතුවෙන් ගඟෙහි ජලය වැඩෙයි. එහි (ගඟෙහි) පිරීමෙන් අපගේ මහා විලෙහි ද ජලය වැඩේමය.]

**06. අබ්භං පන කුතෝ සමුට්ඨාති ?**
[වළාකුළු වනාහි කොතැනකින් හට ගනී ද?]

**07. සුතපුබ්බෝ අපි නු තේ -**
**“දක්ඛිණදිසාභාගේ හෙට්ඨාදේසේ මහාසමුද්දෝ අත්ථී”ති ?**
[“පහළ දේශයෙහි දකුණු දිසා භාගයෙහි මහා සමුද්‍රය ඇත්තේ”යි නුඹ වහන්සේ විසින් අසන ලද්දේ ද?]

**08. ආම සුතපුබ්බෝ.**
[එසේය, අසන ලදී.]

**09. තේජෝධාතුබලේන මහාසමුද්දතෝ උස්මානෝ වුට්ඨහන්ති.**

---

**[1] ඒරාවතී යනු නදියක නමකි.**

**තේ හත්තකුම්භිපිධානේ සේදාවිය ආකාසේ සන්නිවිසන්ති. තේසං අබ්භ’න්ති සමඤ්ඤා උදපාදි.**
[තේජෝ ධාතුවේ බලයෙන් මහා සමුද්‍රයෙන් ජල වාෂ්ප නගිත්. ඒවා (හුමාලය) බත් සැළියේ පියනෙහි හුමාල දිය මෙන් අහසෙහි එක් රැස් වෙත්. ඒවා හට “ වළාකුළු” යැයි නම පහළ විය (හට ගත්තේය). ]

**අමාරු වචන.**

**01.** **වඩ්ඪති (වඩ්ඪ+අ+ති) - වැඩේ.**
**03.** **වලාහක - මේඝය, වලාකුළ.**
**05.** **සන්නිචිට්ඨමේඝ - මනා සේ එක් රැස් වූ වළාකුළු.**
**පේසේති (ප√ඉස+ණෙ+ති) - යවයි.**
**සම්පතති (සං√පත+අ+ති) - මනා ලෙස වැටෙයි.**
**සම්පුණ්ණ - සම්පූර්ණ, පිරුණු.**
**06.** **අබ්භ (න) - අහස, වළාකුළ.**
**සමුට්ඨාති (සං+උ√ඨා+අ+ති) - උපදී, හටගනියි.**
**07.** **සුතපුබ්බ (ති) - පෙර ඇසූ. උස්මා (පු) - උෂ්ණය.**
**වුට්ඨහති (උ√ඨා+අ+ති) - නැගිටියි.**
**හත්තකුම්භිපිධානං - බත් හැළියේ පියන.**
**සන්නිවිසති (සං+නි√විස+අ+ති) - මනා සේ ඇතුළු වෙයි, එක් රැස් වෙයි.**

## 46. පණ්ණපේසනකථා
[ලිපි යැවීම පිළිබඳ කථා].

**පේසිතමිදං මහාථේරස්ස සන්තිකං සිස්සභූතේන බුද්ධරක්ඛිතේන.**

**සාදරං භන්තේ, ආරෝචයාමි!**

**ආචරියස්ස මෙත්තාපුබ්බඞ්ගමං ඔවාදං සම්පටිච්ඡිත්වා ඉදානි අමරපුරනගරේ මහාගන්ධාරාමං සම්පත්තෝ. එත්ථ ආචරියස්ස චේව මාතාපිතු - ඤාතිසාලෝහිතානඤ්ච මෙත්තානුභාවේන සුඛං වසාමි.**
**අහෝරත්තං පරියත්තිඤ්චේව පටිපත්තිඤ්ච සම්මා ආරභාමි. ආවාසපුග්ගලභෝජනසප්පායානි'පි ලබ්භන්ති. උතු පන ථෝකං සීතලං විය දිස්සති. තස්මා අම්හාකං දේසඋතුනා විසභාගෝ හෝති.**
**තථා'පි ආරක්ඛමහාථේරේහි දින්නං කල්ලභාවස්ස උපායං ගහෙත්වා චේව යථානුරූපං භේසජ්ජං පටිසේවිත්වා ච පීණසරීරෝ හෝමි. යථා මම, තථා ආචරියස්ස චේව මාතාපිතුඤාතිසාලෝහිතානඤ්ච කල්ලභාවාය රත්තියං බුද්ධුපට්ඨානකාලේ මෙත්තං භාවේමි.**

**පේසිතමිදං,**
**(1316) සෝළසාධිකේ තිසතේකසහස්ස මරම්මසාකේ**
**ආසළ්හියාජුණ්හපක්ඛස්ස චතුත්ථියං සිස්සභූතේන බුද්ධරක්ඛිතේන.**
**මහාගන්ධාරාමතෝ,**
**අමරපුරනගරේ.**

### ලිපියේ පරිවර්තනය.

ශිෂ්‍ය වූ බුද්ධරක්ඛිත විසින් මහ තෙරුන් වහන්සේ වෙත මෙය (ලියමන) එවන ලදී.
ස්වාමීනි, මහත් ආදර ගෞරවයෙන් සැළකර සිටිමි!

ආචාර්යන් වහන්සේගේ මෛත්‍රී පූර්වාංගම අවවාදය පිළිගෙන දැන් අමරපුර නගරයෙහි මහා ගන්ධාරාම විහාරයට පැමිණියේ (වෙමි). ආචාර්යන් වහන්සේගේ මෙන්ම මව්පිය නෑදෑයන්ගේ ද මෛත්‍රී ආනුභාවයෙන් මෙහි (මම) සුවයෙන් වාසය කරමි.

දිවා රෑ පර්යාප්තිය මෙන්ම ප්‍රතිපත්තිය ද මනා කොට (පිරීමට) උත්සාහ කරමි. ආවාස, පුද්ගල, ආහාර සප්ප්‍රායයෝ ද ලැබෙත්. ඍතුව වනාහි ටිකක් ශීත මෙන් දිස් වෙයි. එහෙයින් අපගේ දේශයෙහි ඍතුවෙන් වෙනස් වෙයි.

එසේ වුවද (අපව) භාරව සිටින මහ තෙරුන් වහන්සේලා විසින් දෙන ලද උපාය ගෙන මෙන්ම සුදුසු පරිදි බෙහෙත් වළඳා ද පිරුණු කයක් ඇත්තේ වෙමි.

මම යම් සේ ( නිරෝගී වෙම්ද) එසේ ආචාර්යන් වහන්සේගේ මෙන්ම මව් පිය නෑදෑයන්ගේ ද නිරෝගී බව පිණිස රාත්‍රියෙහි බුදු උවැටැන් වේලාවෙහි මෛත්‍රී වඩමි.

එක් දහස් තුන්සිය දහසයක් වූ බුරුම ශක වර්ෂයෙහි ඇසළ මස පුර පක්ෂයෙහි සතර වැනිදා ශිෂ්‍ය වූ බුද්ධරක්ඛිත විසින් මේ (ලියමන) එවන ලදී.
අමරපුර නගරයෙහි මහා ගන්ධාරාමය වෙතිනි.

### අමාරු වචන

**පණ්ණ (න) - ලිපිය. පේසිත (ති) - යවන ලද. සාදර (ස+ආදර) - ගෞරව සහිත. හෝ (සං+ආදර) - ගෞරව සහිත ව.**
**ආරෝචයති (ආ√රුච+ණය+ති) - කියයි, දැනුම් දෙයි. සම්පටිච්ඡති (සං+පති√ඉස+අ+ති) - පිළිගනියි.**
**ඤාති (ඉ) - නෑයා. අහෝරත්ත (න) - දවල් හා රාත්‍රිය, රෑ දවල්.**
**ආරභති (ආ√රභ+අ+ති) - උත්සාහ කෙරේ. සප්පාය (ති) - හිතවත් දෙය, යෝග්‍ය ආකාරාදිය.**
**විසභාග (ති) - වෙනස් වූ, සමාන නොවූ.**

## කථාසල්ලාපසික්ඛා සම්පරිනිට්ඨිතා.

[කථා සල්ලාප සික්ඛාව හෙවත් පාළි කථා පුහුණුව මනා සේ නිමාවට පැමිණි වගයි.]

ධර්මාරක්ෂක කඳවුර වන්නේ උදාර පුද්ගල සන්තානයයි. ඒ ශ්‍රේෂ්ඨ පුද්ගල සන්තානයයි. ඒ ශ්‍රේෂ්ඨ පුද්ගල නමැති කඳවුර ඇතුළේ ජීවමාන වන ධර්මය අපරිමාණ අධර්ම වේග මැඩගෙන ආලෝකය පතුරුවමින් අපරාජිතව බබළන්නේය. ධර්මයේ රක්ෂාස්ථානය වූ ධර්මයේ ආධාරකය වූ මහා පුරුෂ සන්තානය කුමන හේතුවකින් හෝ අබල දුබල වීම නිසා, අභාවයට යාම නිසා ධර්මය නිරාධාර වන්නේය. නිරාලම්බ වන්නේය. ධර්මය අතුරුදහන් වී අධර්ම අන්ධකාරයෙන් ලෝකය වැසී යන්නේ එහෙයිනි.

ඔබත්, අපත් මේ පේළි වී පෙළ ගැසෙන්නේ “ධර්මයේ ආරක්ෂක කඳවුරු” බවට පත්වෙනු සඳහාය. ධර්මයේ ප්‍රබල කඳවුරු වීම අපගේ ප්‍රාර්ථනයයි. ඔබත් ඒ ධර්ම කඳවුරු පන්තියේ බව සිහි කරන්න. ධර්මය උදෙසා පේවී ආත්ම, ජීවිත නිරපේක්ෂකව ඒ මහා ධර්මවීර උතුමන් නොපැකිළව ගමන් කළ ධර්ම විජයේ ශාන්ති මාර්ගයට අපිත් අනුයාත වී සිටිමු. අධර්ම මාර බලය සහස්‍ර ගුණයෙන් නැගී ඒවා.

“ධුනාථ මච්චුනෝ සේනං - නළාගාරං ව කුඤ්ජරෝ”

“මහා හස්ති රාජයකු බටකොළ ගෙයක් පොඩිකර බිඳ දමන්නාක් මෙන් මර සෙනඟ මැඩ පලවා හරිවු!” යන බුද්ධාඥාවෙන් උත්තේජිතව පරාක්‍රම ගුණයෙන් සැදී අපි ඉදිරියට ගමන් කරමු. ධර්මාරක්ෂාව සඳහා මෙතෙක් ප්‍රගුණ කළ ආත්ම මහිමයේ තරම පළවිය යුත්තේ හිරිහැර පීඩා නැමැති මාර උවදුරු පියමං කරගෙන ඉදිරියට යන ප්‍රතිශ්‍රෝතගාමී තත්ත්වයෙනි.

කිසිම ආමිස ලාභාපේක්ෂාවක් නොමැතිව පවිත්‍ර වූ ධර්ම ප්‍රාර්ථනාවෙන්, ශාසනය රැක ගැනීමේ මහා අධිෂ්ඨානයෙන් යුතුව සමාරබ්ධ වූ “ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව” ගමන් මඟ නිවමින් සනසමින් නොනැවතී ගලායන ගංගා ප්‍රවාහයක් මෙන් පුරා වසර අට සාලිස් වසක් පැවැත්වූ උදාර ශාසනික මෙහෙවර සැළකිය යුත්තේ හොඳහිතේ ප්‍රාතිහාර්‍යයක් වශයෙනි.

(ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක බෝධිසත්ත්ව ගුණෝපේත රාජකීය පණ්ඩිත අපවත් වී වදාළ කඩවැද්දුවේ ශ්‍රී ජිනවංස මා හිමි)